## දෙවැනි කොටස

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පිටුව


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 61 |
| 3. | බැංකු විදු පියෙස | 64 |
| 4. | සන්නිවේදන | 64 |
| 5. | ව්‍යවහාර මුදල් | 66 |
| 6. | දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාල | 68 |
| 7. | දේශීය කටයුතු | 69 |
| 8 | ආර්ථික පර්යේෂණ | 73 |
| 9. | සේවක අර්ථසාධක අරමුදල | 78 |
| 10. | විනිමය පාලනය | 83 |
| 11. | පහසුකම් කළමනාකරණ | 84 |
| 12. | මූල්‍ය කටයුතු | 85 |
| 13. | මූල්‍ය බුද්ධි ඒකකය | 86 |
| 14. | මූල්‍ය අංශ පර්යේෂණ | 88 |
| 15. | මානව සම්පත් කළමනාකරණ | 89 |
| 16. | තොරතුරු තාක්ෂණ | 94 |
| 17. | අභ්‍යන්තර විගණන | 96 |
| 18. | ජාත්‍යන්තර මෙහෙයුම් | 97 |
| 19. | නීති සහ අනුකූලතා කටයුතු | 100 |
| 20. | ගෙවීම් සහ පියවීම් | 101 |
| 21. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 103 |
| 22. | රාජ්‍ය ණය | 104 |
| 23. | ප්‍රාදේශීය සංවර්ධන | 106 |
| 24. | අවදානම් කළමනාකරණ | 111 |
| 25. | ලේකම් දෙපාර්තමේන්තුව | 115 |
| 26. | ආරක්ෂක සේවා | 115 |
| 27. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 116 |
| 28. | සංඛ්‍යාන | 117 |
| 29. | ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ | 121 |
| 30. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 122 |
| 31. | පුහුණු හා සංවර්ධන | 125 |

## 1. ගිණුම්කරණ සහ මූල්‍ය

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2015 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහබැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. } බීජ්එෆ්/එච්/සීබීඑස්එල්/1/15/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. } | දිනය<br>திகதி<br>Date } 2016 අප්‍රේල් 19 දින |

ගරු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන් සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්වලට අනුකූලවීම පිළිබඳව වූ විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය වන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ වගකීම**

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම මුදල් මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ. උචිත පරිදි සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීමේ දී හා යොදා ගැනීමේදී සහ අවස්ථානුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

එච්.එම්.ගාමිණී විජේසිංහ
**විගණකාධිපති**


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකා. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2015 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | 557,474,685 | 487,070,771 |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 5 | 35,779,665 | 61,495,307 |
| විකුණුම් සඳහා වූ ආයෝජන | 5 | 352,054,482 | 408,189,500 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | 4,145 | 1,580,237 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 7 | 83,636,350 | 79,816,029 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | 5,075 | 7,105,914 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 1,028,954,402 | 1,045,257,758 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8 | 102,866,967 | 124,443,452 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 9 | 151,131,671 | 143,897,971 |
| බැංකු සඳහා දෙන ලද ණය | 10 | 886,357 | 1,489,372 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 11 | 41,095 | 41,095 |
| අනිකුත් වත්කම් | 12 | 11,164,452 | 10,019,985 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | 266,090,542 | 279,891,875 |
| **මුළු මූල්‍ය වත්කම්** | | 1,295,044,944 | 1,325,149,633 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 13 | 97,723,836 | 100,190,635 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 14 | 3,419,964 | 3,620,480 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | 14,347,811 | 27,375,394 |
| දේපල පිරියත සහ උපකරණ | 15 | 15,422,315 | 14,686,696 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | 240,610 | 306,084 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | 131,154,536 | 146,179,289 |
| **මුළු වත්කම්** | | 1,426,199,480 | 1,471,328,922 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 17 | 12,048,241 | 11,678,483 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | 24,280,308 | 19,207,822 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 18 | 68,887,459 | 57,230,304 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 19 | 251,644,344 | 308,011,133 |
| අනිකුත් | 20 | 217,924,142 | 72,146,159 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | 574,784,494 | 468,273,901 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 21 | 181,726,732 | 161,009,323 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 22 | 428,142 | 311,950 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 23 | 105,465,000 | 328,252,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 24 | 7,212 | 2,209,782 |
| සංසරණයෙහි පවතින මුදල් | 25 | 491,699,948 | 416,895,362 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 26 | 6,850,998 | 8,867,823 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | 786,178,032 | 917,546,240 |
| **මුළු මූල්‍ය බැරකම්** | | 1,360,962,526 | 1,385,820,141 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 27 | 106 | 515 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 44 | 10,942,541 | 3,599,035 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 28 | 199,325 | 197,380 |
| **මුළු අනිකුත් බැරකම්** | | 11,141,972 | 3,796,930 |
| **මුළු බැරකම්** | | 1,372,104,498 | 1,389,617,071 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | 50,000,000 | 50,000,000 |
| සංචිත | | 4,094,982 | 31,711,851 |
| **මුළු හිමිකම් ප්‍රාග්ධනය** | | 54,094,982 | 81,711,851 |
| **මුළු බැරකම් සහ හිමිකම් ප්‍රාග්ධනය** | | 1,426,199,480 | 1,471,328,922 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2016 අප්‍රේල් 04 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන් - අධිපති

පී.ඒ. විජේරත්න - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 07 සිට 60 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ආදයම් ප්‍රකාශනය

| | සටහන | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 31 | **13,047,314** | 22,221,503 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව) | | **(34,853,795)** | (7,966,791) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය | | **6,686,252** | 12,626,457 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **(15,120,229)** | 26,881,169 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 32 | **(3,622,737)** | (3,103,257) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(3,622,737)** | (3,103,257) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය / (පාඩුව) | | **10,589,267** | (32,266,690) |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම / (පාඩුව)** | | **(8,153,699)** | (8,488,778) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 31 | **9,323,553** | 4,616,684 |
| පොළී වියදම | 32 | **(8,919,984)** | (17,748,037) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම / (වියදම)** | | **403,569** | (13,131,353) |
| අනිකුත් ආදායම් | 33 | **1,577,442** | 1,367,666 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව)** | | **(6,172,688)** | (20,252,465) |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 34 | | |
| - වැටුප් සහ වේතන | | **(4,201,583)** | (3,256,096) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(629,357)** | (457,274) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ දායකත්වය | | **(1,329,578)** | (1,289,040) |
| | | **(6,160,518)** | (5,002,410) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(557,158)** | (396,811) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | **(3,311,761)** | (1,829,350) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 35 | **(1,611,537)** | (4,050,858) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(11,640,974)** | (11,279,429) |
| බදු වලට පෙර ලාභය / (අලාභය) | | **(17,813,662)** | (31,531,894) |
| රඳවා ගැනීම් මත බද්ද | 36 | **(1,788,157)** | (777,496) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)** | | **(19,601,819)** | (32,309,390) |

පිටු අංක 07 සිට 60 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2015 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය/(අලාභය) | **(19,601,819)** | (32,309,390) |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| **පසු කාලපරිච්ඡේදයේ ලාභ/(අලාභ) වලට නැවත වර්ගීකරණය විය යුතු විස්තීරණ ආදායම** | | |
| විකුණුම් සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභය/(අලාභය) | **(624,957)** | 9,229,796 |
| **පසු කාලපරිච්ඡේදයේ ලාභ/(අලාභ) වලට නැවත වර්ගීකරණය නොවිය යුතු විස්තීරණ ආදායම** | | |
| විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වියදම | **(7,257,078)** | 1,487,603 |
| මුළු විස්තීරණ ආදායම/(අලාභය) | **(27,483,854)** | (21,591,991) |

පිටු අංක 07 සිට 60 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු. 000 | ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිතය රු. 000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. 000 | අනිකුත් සංචිතය (සටහන 29) රු. 000 | සමුච්චිත ලාභ රු. 000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 දිනට** | 15,000 | 34,985,000 | 5,986,602 | 68,306,848 | 5,613,763 | 114,907,213 |
| ශුද්ධ අලාභය | - | - | - | - | (32,309,390) | (32,309,390) |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | - | 212,124 | (212,124) | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | 1,511,182 | (1,511,182) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | - | 1,487,603 | 1,487,603 |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | - | (32,266,690) | 32,266,690 | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | - | (103,198) | (103,198) |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය/(අලාභය) | - | - | - | 9,229,796 | - | 9,229,796 |
| උකස් අත්තිකාරම් සඳහා වූ ණය ඇපකර යෝජනාවලියට අරමුදල් මාරු කිරීම | - | - | - | (500,000) | 500,000 | - |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | - | (173) | (173) |
| ශ්‍රී.ලං.ම.බැ. ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා පොදු සංචිතයන් සිට අරමුදල් මාරු කිරීම | - | 15,000,000 | - | (15,000,000) | - | - |
| ශ්‍රී.ලං.ම.බැ. ප්‍රාග්ධනය වර්ධනය කිරීම | 49,985,000 | (49,985,000) | - | - | - | - |
| 2013 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | - | - | - | - | (3,000,000) | (3,000,000) |
| 2014 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | - | (8,500,000) | (8,500,000) |
| **2015 ජනවාරි 01 දිනට** | 50,000,000 | - | 5,986,602 | 31,493,260 | (5,768,011) | 81,711,851 |
| ශුද්ධ අලාභය | - | - | - | - | (19,601,819) | (19,601,819) |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | - | 256,478 | (256,478) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | - | (7,257,078) | (7,257,078) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | - | 10,589,267 | (10,589,267) | - |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිතවලට මාරු කිරීම | - | - | - | - | (132,839) | (132,839) |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය/(අලාභය) | - | - | - | (624,957) | - | (624,957) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | - | (176) | (176) |
| නව විශ්‍රාම යෝජනා ක්‍රමය පිහිටුවීමට විශ්‍රාම අරමුදල් සංචිතයෙන් අරමුදල් මාරු කිරීම | - | - | - | (2,000,000) | 2,000,000 | - |
| **2015 දෙසැම්බර් 31 දිනට** | 50,000,000 | - | 5,986,602 | 39,714,048 | (41,605,668) | 54,094,982 |

පිටු අංක 07 සිට 60 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා

### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොලිය - විදේශීය මුදල් | | **14,641,329** | 25,984,366 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - අනිකුත් | | **600,046** | 530,779 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **6,686,252** | 12,626,457 |
| උපලබ්ධි වූ විනිමය වාසිය / (පාඩුව) | | **(13,838,368)** | (553,996) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,570,072** | 1,360,447 |
| | | **9,659,331** | 39,948,053 |
| **විය පැහැදම්:** | | | |
| ගෙවන ලද පොලිය - විදේශීය මුදල් | | **3,740,805** | 3,406,299 |
| ගෙවන ලද පොලිය - දේශීය මුදල් | | **10,967,407** | 15,828,575 |
| සේවකයින්ට ගෙවීම් | | **6,267,998** | 4,729,643 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **6,645,579** | 5,601,065 |
| ගෙවන ලද බදු | | **1,817,747** | 929,097 |
| | | **29,439,536** | 30,494,679 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | 37 | **(19,780,205)** | 9,453,374 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(823,124)** | (790,741) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **1,523,438** | 1,490,027 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **749** | 940 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(222,787,000)** | 243,651,000 |
| | | **(222,085,937)** | 244,351,226 |
| **විය පැහැදම් :** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(89,998,376)** | 31,566,311 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(289,309)** | (746,122) |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(139,352,884)** | (26,570,161) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **2,274** | (375) |
| දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් - අඩු කිරීමෙන් පසු) | | **1,206,040** | 835,014 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **21,627** | 290,656 |
| කල්බදු වත්කම් මිලදී ගැනීම් | | **14,361** | 2,640 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(5,124,212)** | 1,348,440 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් | | **920,424** | 1,604,003 |
| | | **(232,600,055)** | 8,330,406 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **10,514,118** | 236,020,820 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **(504,508,531)** | (431,825,813) |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **579,313,118** | 508,950,194 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **74,804,587** | 77,124,381 |
| **විය පැහැදම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 38 | **(23,208,921)** | 139,339,459 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 39 | **(20,944,825)** | (12,199,430) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **(44,153,746)** | 127,140,029 |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **118,958,333** | (50,015,648) |
| **විය පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **68,788,313** | 93,842,868 |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **175** | 173 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **-** | 11,500,000 |
| | | **68,788,488** | 105,343,041 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **50,169,845** | (155,358,689) |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **40,903,760** | 90,115,505 |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **29,500,154** | (28,721,497) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **487,070,771** | 425,676,763 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 40 | **557,474,685** | 487,070,771 |

පිටු අංක 07 සිට 60 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන**

## 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2016 අප්‍රේල් 04 වැනි දින අනුමත කරන ලදී.

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි, රන් සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

### 2.1.1 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. මුදල් නීති පනත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් පත්‍රයේ පල කර ඇත. ජා.මූ.වා.ප්‍ර. වල සමහර අවශ්‍යතා මත ගැසට් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල, ඒවායෙහි වර්ගීකරණය සහ එම නිසා අගයන් මෙම මූල්‍ය ප්‍රකාශන සමග වෙනස් විය හැකිය.

### 2.1.3 වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ නිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

### 2.2.1 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

සැලකිය යුතු ලෙස සහ අඛණ්ඩව සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළට යනවිට, විකිණීම සඳහා ඇති ආයෝජන අගය හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. මෙම ආයෝජන සම්බන්ධයෙන් සැලකිය යුතු බව හෝ අඛණ්ඩ බව යන කරුණු නිශ්චය කිරීමේ දී යම් විනිශ්චයක් කිරීම අවශ්‍ය වේ.

### 2.2.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 44 හි දැක්වේ.

### 2.2.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී නිගමන මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

### 2.3 ප්‍රකාශිත කර ඇති නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකු බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

### 2.3.1 ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ

2014 ජූලි මස අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති (අ.ගි.ප්‍ර.) ආයතනය විසින් ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ ප්‍රමිතියේ අවසාන සංස්කරණය නිකුත් කරන ලද අතර, එමගින් මූල්‍ය උපකරණ ව්‍යාපෘතීන්හි සියලුම අවධීන් නිරූපණය වන අතර අ.ගි.ප්‍ර. 39: හඳුනාගැනීම හා මිනුම් කිරීම සහ ජා. මූ. වා. ප්‍ර. 9 හි සියලුම පසුගිය සංස්කරණයන් අහෝසි විය. මෙම ප්‍රමිතිය මගින් වර්ගීකරණය සහ මිනුම් කිරීම, හානිකරණය හා ඉදිරි රැකුම් ගිණුම්කරණය සම්බන්ධ නව අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. 2018 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වාර්ෂික කාලච්ඡේදයන් සඳහා ජා.මූ.වා.ප්‍ර. 9 බලපැවැත්වෙන අතර කලින් අදාළ කිරීම වලංගු වේ. අතීතයට බලපාන පරිදි අදාළ කළයුතු නමුත් සන්සන්දනාත්මක තොරතුරු අත්‍යාවශ්‍ය නොවේ. ජා.මූ.වා.ප්‍ර. 9 හි කලින් කළ සංස්කරණයන් (2009, 2010 සහ 2013) කලින් අදාළ කිරීම වලංගු වනුයේ ආරම්භක අදාළ කිරීම 2015 පෙබරවාරි 01 දිනට පෙර සිදුකළේ නම් පමණි. ජා.මූ.වා.ප්‍ර. 9 යොදා ගැනීම බැංකුවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මිනුම් කිරීම සම්බන්ධයෙන් බලපානු ලබන අතර බැංකුවේ මූල්‍ය වගකීම් වර්ගීකරණය හා මිනුම් කිරීම සම්බන්ධයෙන් බල නොපායි.

### 2.3.2 ජා.මූ.වා.ප්‍ර. 14 නියාමන විලම්භිත ගිණුම්

ජා.මූ.වා.ප්‍ර. 14 විසින් සිය කාර්යයන් අනුපාත නියාමනය යටතේ ආයතනයකට ජා.මූ.වා.ප්‍ර. ප්‍රථම වරට අදාල කරගැනීම මත ඇතිවන නියාමන විලම්භිත ගිණුම්හි ශේෂයන් සඳහා බොහොමයක් පවතින ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කිරීමට අවසර ලබා දේ. ජා.මූ.වා.ප්‍ර 14 අදාළ කරගන්නා ආයතන විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම අයිතමයකින් නියාමන විලම්භිත ගිණුම් පෙන්නුම් කළ යුතු අතර ආදායම් ප්‍රකාශනයේ සහ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වෙනමම අයිතමයකින් එම ගිණුම් ශේෂයන්ගේ වර්තමාන වෙනස්වීම පෙන්විය යුතු ය. ප්‍රමිතිය මගින් ආයතනයේ අනුපාත නියාමනයේ ස්වභාවය සහ සම්බන්ධිත අවදානම පිළිබඳ හෙළිදරව් කිරීම සහ එහි මූල්‍ය ප්‍රකාශන මත එම අනුපාත නියාමනයේ බලපෑම පිළිබඳ හෙළිදරව් කිරීම නියම කර තිබේ. 2016 ජනවාරි 01 දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ජා.මූ.වා.ප්‍ර. 14 බලපැවැත්වේ. මෙම ප්‍රමිතිය යොදාගැනීම තුලින් බැංකුව කෙරෙහි බලපෑමක් ඇති කිරීම අපේක්ෂා නොකරයි.

### 2.3.3. ජා.මූ.වා.ප්‍ර. 15 - ගනුදෙනුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදයම

2014 මැයි මස ජා.මූ.ව.ප්‍ර 15 නිකුත් කරන ලද අතර එමගින් ගනුදෙනුකරුවන් සමඟ වූ කොන්ත්‍රාත්තු වලින් ජනනය වන ආදායම් හඳුනාගැනීමට පස් වැදෑරුම් ආකෘතියක් පිහිටුවන ලදී. ජා.මූ.ව.ප්‍ර. 15 අනුව ආදායම් හඳුනාගනු ලබන්නේ ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් ආයතනය හිමිකම් ලබන ප්‍රතිශ්ඨාව අගය කිරීමෙනි. ආදායම් මිණුම්කරණයට හා හඳුනාගැනීමට ජා.මූ.ව.ප්‍රා. 15 හි මූලධර්ම විසින් වඩාත් ව්‍යුහගත ප්‍රවේශයක් සපයනු ලබයි. මෙම නව ආදායම් ප්‍රමිතිය සියලුම ආයතනවලට අදාලවන අතර දැනට ජා.මූ.ව.ප්‍ර යටතේ පවතින සියලුම ආදායම් හඳුනාගැනීමේ අවශ්‍යතාවය අභිභවනය කරයි. 2017 ජනවාරි 01 වන දිනට හෝ ඊට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්වලට ගැලපෙන පරිදි මුළුමනින් හෝ වෙනස් කරන ලද අතීතානුයෝගී ගැලපුමක් අවශ්‍ය වන අතර මුලින් යොදාගැනීමක් සඳහා ද අවසර දේ. බැංකුව විසින් මෙම ප්‍රමිතීන් බලපැවැත්වෙන විට යොදා ගනී. සවිස්තර නිරීක්ෂණයක් සම්පූර්ණ කරන තුරු හෝ මෙම මූල්‍ය ප්‍රකාශනයන් පල කරන දිනය වන විටත් මූල්‍ය බලපෑම් සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැක.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ ගනුදෙනු සඳහා භාවිතා වන සහ ඒවා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | 105.3888 | 107.3616 |
| කැනේඩියානු ඩොලර් 1 | 103.7278 | 113.0558 |
| යූරෝ 1 | w | 159.2568 |
| ජපන් යෙන් 1 | 1.1970 | 1.0962 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | 199.6310 | 189.8640 |
| ස්ටර්ලින් පවුම් 1 | 113.5508 | 204.1803 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | 144.0623 | 131.0486 |
| චීන යුවාන් (අක්වෙරළ) | 21.9285 | 21.0483 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 3.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් මූල්‍ය සුරකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ ඉඩම් හා ගොඩනැගිලි ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 45 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ හවුල්කරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,

- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වත්කම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් ලාභදායී වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරනු ලබන්නේ වෙළෙඳපොළ හවුල්කරුවන් ඔවුන් උපරිම ආර්ථික වාසියක් ලබාගැනීම උදෙසා හැසිරෙනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක් හෝ වගකීමක් මිලකිරීමේදී යොදාගන්නා උපකල්පනයන් යොදා ගැනීමෙනි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්ගත කිරීමේ දී වෙළෙඳපොළ හවුල්කරුවන්ගේ වත්කමක් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීම මගින් හෝ උපරිම හා විශිෂ්ට වාසි ලැබෙන ලෙස භාවිතාවේ යොදා ගන්නා වෙනත් වෙළෙඳපොළ හවුල් කරුවකුට විකිණීම මගින් හෝ, ආර්ථික වාසි ජනනය කිරීමේ හැකියාව සලකා බලනු ලබයි.

බැංකුව විසින් සාධාරණ අගයයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරීක්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

මූල්‍ය වාර්තාවන්හි පුනරාවර්තන පදනම මත හඳුනාගන්නා ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන්, මෙම ධූරාවලියෙහි මට්ටම් අතර හුවමාරු වීම් සිදුවී ඇත්දැයි බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම්කරණය උදෙසා සමස්තයක් වශයෙන් වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව මෙම වර්ගීකරණය නැවත තක්සේරු කිරීම තුළින් වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේ තීරණය කරනු ලබයි.

### 3.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

#### 3.3.1 ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(අවාසිය)" ලෙස වාර්තා කරනු ලැබේ.

#### 3.3.2 අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශ විනිමය සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයන් (මූල්‍ය තත්ත්වය පිළිබඳ

ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

**3.3.3 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් සහ පොලී අනුපාත හුවමාරු වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමණාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

**3.3.4 එක් දින වෙනස**

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) ඉක්මනින්ම උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු) ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශණ තුළින් ඉවත්ව ගිය විට පමණක් අදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

**3.3.5 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය එසැනින් ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.3.6 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 37 සහ සටහන් 38 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායැම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**3.3.7 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනිමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදි ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

### 3.3.8 නිත්‍ය තැන්පතු පහසුකම්

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය මිලදී ගැනුම් පහසුකම). සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව මෙම පහසුකම යටතේ ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම් (පෙර නිත්‍ය ප්‍රතිවිකිණුම් පහසුකම), නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සර්ව සම වේ.

### 3.3.9 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරයි. මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

### 3.3.10 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරෙන බැවින් එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

### 3.3.11 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

### 3.3.12 අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයන් සඳහා වූ මුදල් අඩුකර, ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

### 3.3.13 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශවයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

### 3.3.14 සේවක ණය

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.ගි.ප්‍ර. 39 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

වට්ටම් අනුපාතය - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මඟින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මඟින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය ලෙස භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම් බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක් අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගයකරන ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන් :**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදුවී නොමැත.

### 3.3.15 මූල්‍ය වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් වාර්තාකරණ දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

### 3.3.16 ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්,

එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයන් වට්ටම් කළ අගයත් අතර වෙනසය. වත්කමක ධාරණ අගය සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ශණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ශණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**3.3.17 විකිණීමට ඇති ආයෝජන හානිකරණය**

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

**3.3.18 විදේශීය මුදල් කාලීන බැරකම්**

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

**3.3.19 වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්**

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

**3.4 අනිකුත් වත්කම් සහ බැරකම්**

**3.4.1 රන්**

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටි රන්වල අගය 2015 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 109.51 කි (බෙදා වෙන්කළ හැකි රන් රුපියල් බිලියන 97.72 ක් සහ බෙදා වෙන් කළ නොහැකි රන් රුපියල් බිලියන 11.79 ක් වශයෙන්). මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

**3.4.2 තොග**

**3.4.2.1 මුදල් තොග**

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**3.4.2.2 අනෙකුත් තොග**

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන් කිරීමක් සලසා ඇත.

**3.4.3 දේපළ, පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයට පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර, ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවාගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පවත්වා ගෙන යනු ලබන අතර, එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 5කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්ත ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂ පත්‍රයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම් ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

### 3.4.4 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

### 3.4.5 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

### 3.4.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

### 3.4.7 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

### 3.4.8 සංසරණයේ පවතින මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

### 3.4.9 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 44 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

### 3.4.10 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂිත සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

**3.4.11 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

**3.4.12 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**3.4.13 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**3.4.14 ක්‍රියාත්මක කල්බදු**

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හි දී, කල්බදු ගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.4.15 බදුකරණය**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. තවද 2013 අංක 06 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත යටතේ සහ 2013 අංක 17 දරණ එකතුකළ අගය මත බදු (සංශෝධිත) පනත යටතේ ආර්ථික සේවා ගාස්තු සහ මූල්‍ය සේවා සැපයීම මත වන එකතුකළ අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

**3.4.16 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත. ආදායම් වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන් ද සපුරාලිය යුතුය.

**3.4.16.1 පොළිය**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කුපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**3.4.16.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**3.4.16.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාග නු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**3.4.17 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා ප්‍රාග්ධන බැඳීම් අයිතම ලෙස හඳුනාගෙන ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

## 4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.

- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

### 4.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් හඳුන්වා ඇත.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 4.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 4.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

## 5. විදේශීය සුරැකුම්පත්වල අයෝජනයන්

| | 2015<br>රු. 000 | 2014<br>රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **35,779,665** | 61,495,307 |
| විකිණීම සඳහා ඇති ආයෝජන | **352,054,482** | 408,189,500 |
| එකතුව | **387,834,147** | 469,684,807 |

## 6. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

අ) පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟ වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු Currency SWAPS | **-** | **13,989,728** | **379,377,271** | 1,579,560 | 2,758,093 | 285,044,665 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | **2,259** | **169** | **4,725,243** | 630 | - | 425,908 |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය විකල්පයන් (Currency Option) | **-** | **10,290,162** | **157,782,073** | - | 16,449,303 | 159,213,437 |
| පොලී අනුපාත හුවමාරු (Interest Rate SWAP) | **1,886** | **249** | **1,440,623** | 47 | 427 | 1,310,486 |
| එකතුව | **4,145** | **24,280,308** | **543,325,210** | **1,580,237** | **19,207,822** | **445,994,496** |

ආ) ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප, ඉදිරි විදේශ විනිමය ගිවිසුම්, සහ පොලී අනුපාත හුවමාරුවලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත

අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සමග හුවමාරු ගිවිසුම්වලට එළඹීම මගින් විදේශ අරමුදල් මට්ටම ඉහල නැංවීමත්, ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් දිගුකාලීනව රටතුලට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

ඇ) ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

ඈ) කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ග යක් සමග එකග වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

ඉ) ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකග වූ අනුපාතයකට එකග වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

(ඊ) පොලී අනුපාතික හුවමාරුවේදී බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට නිශ්චිත අනුපාතිකයක් (හුවමාරු අනුපාතිකය) ගෙවනු ලබන අතර නිර්දේශිත අනුපාතික දර්ශකයක් වන විචල්‍ය අනුපාතිකයක් හිමි වේ. (තෙමසක අන්තර් බැංකු අර්පණ අනුපාතිකය + ආන්තිකය)

උ) සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

**7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්**

| | 2015<br>රු. 000 | 2014<br>රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම | 970,272 | 1,199,895 |
| ජා.මූ.අ. පංගුව | 82,527,455 | 78,489,778 |
| ජා.මූ.අ. තැන්පතුව | 138,623 | 126,356 |
| මුළු ජා.මූ.අ. වත්කම් | 83,636,350 | 79,816,029 |

**අ) විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා වි.ගැ.හි. හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටිම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. විශේෂ වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

**ආ) ජා.මූ.අ. පංගුව**

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විදේශ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය.

ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ. ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 19 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මූ.අ. සමග රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

i.) **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

ii.) **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

iii.) **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 200 ක් ද සමුච්චිත වශයෙන් සියයට 600 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී සහ නිශ්චිත ගැටළු විසඳා ගැනීම සඳහා ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

iv.) **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

**ඈ) ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව**

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භීත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව (act as an outright grant) 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි.

### 8. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

### 9. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

### 10. බැංකුවලට දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| **මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය** | | |
| සම්බන්ධිත පාර්ශවයන් | **33,534** | 35,729 |
| **සුසහන සුනාමි ණය යෝජනා ක්‍රමය (I සහ II අදියර)** | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **10,665** | 54,270 |
| **පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය** | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **233,867** | 598,273 |
| **සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය** | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **175,296** | 251,191 |
| අනෙකුත් | **47,864** | 65,106 |
| **නැගෙනහිර ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම** | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **212,265** | 311,186 |
| අනෙකුත් | **76,984** | 101,090 |
| **උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය** | | |
| සම්බන්ධිත පාර්ශවයන් | **36,267** | 42,250 |
| **පිබිදෙන උතුර (අදියර II)** | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **84,140** | 54,978 |
| අනෙකුත් | **2,778** | 2,601 |
| **අඩුකළා:** | | |
| අඩමාන ලැබිය යුතු මුදල් සඳහා වෙන් කිරීම | **(27,302)** | (27,302) |
| **ශුද්ධ ලැබිය යුතු මුදල** | **886,357** | 1,489,372 |

අඩමාන ණය සඳහා වෙන් කිරීමේ චලනය

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| ආරම්භක ශේෂය | **27,302** | 27,302 |
| අඩමාණ ණය කපා හැරීම | **-** | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | **27,302** | 27,302 |

### 11. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

(i) ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | දරණ ප්‍රතිශතය 2015 | 2014 |
|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **19.66** | 19.66 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | **10.00** | 10.00 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **7.50** | 7.50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **19.30** | 19.30 |

(ii) අදාළ ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම

| ආයතනය | 2015<br>රු. 000 | 2014<br>රු. 000 |
|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | **5,845** | 5,845 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 2,250 |
| මුළු ආයෝජනය | **41,095** | 41,095 |

## 12. අනිකුත් වත්කම්

| | 2015<br>රු. 000 | 2014<br>රු. 000 |
|---|---|---|
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **4,302,590** | 3,430,085 |
| කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැයට | **4,234,875** | 3,648,436 |
| භාණ්ඩාගාරය සහ අනෙකුත් අමාත්‍යංශවලින් ලැබිය යුතු දෑ | **1,378,695** | 1,399,832 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු දෑ | **311,572** | 490,318 |
| ණයකරවල ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට | **10,564** | 9,328 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **27,131** | 21,922 |
| | **10,265,427** | 8,999,921 |
| මූල්‍ය නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **899,025** | 1,020,064 |
| | **11,164,452** | 10,019,985 |

ණයකරවල ආයෝජන මගින් නියෝජනය වන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම වෙත 1988 දී බැංකුව විසින් ලබා දී තිබූ සහ 2011 දී සම්පූර්ණයෙන්ම කපා හරින ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ලැබුණු ණයකරවල වටිනාකමයි. මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු තවමත් සම්පූර්ණ කර නොමැති අතර ඉතිරි මුදල ඈවර කිරීමෙන් උත්පාදනය වන මුදලින් පියවා ගනු ඇත.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව නිකුත් කරනු ලදුව බැංකුව වෙත හිමි වූ රු. 10,839,500 වටිනාකමින් යුත් ණයකර ක්‍රමක්ෂය පිරිවැයට වාර්තා කර ඇත. සුරැකු නොලත් මෙම ණයකර වර්ෂ 10 ක් සඳහා යටත්, නිදහස් කල හැකි හා 5% වාර්ෂික පොළී හිමිකමක් හෝ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභ අනුපාතයන් අතුරින් අඩු අගයට වාර්ෂිකව උපචිත කරයි.

## 13. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. 67(2) වගන්ති ප්‍රකාරව රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙස හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස ඍජුව හෝ වක්‍රව රන් දරා සිටීමට මුදල් මණ්ඩලය ඉඩ ලබා දී ඇත.

## 14. තොග

| | 2015<br>රු. 000 | 2014<br>රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **2,179,294** | 1,675,897 |
| සංසරණය සඳහා ඇති කාසි | **961,716** | 1,553,451 |
| මාර්ගස්ථ කාසි | **143,336** | 165,110 |
| මාර්ගස්ථ නෝට්ටු | **128,026** | 231,380 |
| | **3,412,372** | 3,625,838 |
| *අඩුකළා :* සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (45,000) |
| | **3,367,372** | 3,580,838 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **52,259** | 39,331 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **333** | 311 |
| පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය | **3,419,964** | 3,620,480 |

## 15. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් - කියවීම් උපකරණ | අනිකුත් - නොනිමි ඉදිකිරීම් | එකතුව 2015 | එකතුව 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 13,207,653 | 1,237,954 | 808,029 | 454,475 | 793,714 | 51,892 | 869,047 | **17,422,764** | 16,701,909 |
| එකතු කිරීම් | 161,748 | 45,534 | 427,781 | 35,000 | 37,307 | 1,115 | 1,118,265 | **1,826,750** | 2,071,625 |
| අපහරණයන්/මාරු කිරීම් | - | - | (5,309) | - | (20,447) | - | (620,709) | **(646,465)** | (1,350,770) |
| දෙසැම්බර් 31 දිනට අගය | 13,369,401 | 1,283,488 | 1,230,501 | 489,475 | 810,574 | 53,007 | 1,366,603 | **18,603,049** | 17,422,764 |

| ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් - කියවීම් උපකරණ | අනිකුත් - නොනිමි ඉදිකිරීම් | එකතුව 2015 | එකතුව 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 477,388 | 655,431 | 593,381 | 289,017 | 688,283 | 32,568 | - | **2,736,068** | 2,472,994 |
| වර්ෂය සඳහා ක්ෂය | 185,105 | 63,003 | 118,105 | 51,828 | 50,273 | 1,360 | - | **469,674** | 377,786 |
| නැවත වර්ග කිරීම | - | - | - | - | - | - | - | **-** | (1,452) |
| අපහරණයන් | - | - | (4,674) | - | (20,334) | - | - | **(25,008)** | (113,260) |
| දෙසැම්බර් 31 දිනට අගය | 662,493 | 718,434 | 706,812 | 340,845 | 718,222 | 33,928 | - | **3,180,734** | 2,736,068 |
| ශුද්ධ පොත් අගය | 12,706,908 | 565,054 | 523,689 | 148,630 | 92,352 | 19,079 | 1,366,603 | **15,422,315** | 14,686,696 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2012 මාර්තු 31 දිනට වරලත් තක්සේරුකරුවකු වන පී.බී. කළුගලගෙදර මහතා විසින් සිදු කරන ලද අතර 2012 අප්‍රේල් 30 දින වාර්තා ගත කර තිබුණි. මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 1,206.04 (2014 - රු.මි. 835.01) මුළු වටිනාකමකින් යුත් දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගන්නා ලදී.

2015 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු.මි. 1,897.17 ක් වේ. (2014 - රු.මි. 1,783.22)

**ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය**

| | ධාරණ අගය 2015 රු. 000 | ධාරණ අගය 2014 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | 5,689,063 | 5,643,100 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | 6,935,388 | 7,002,418 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | 82,457 | 84,748 |
| | 12,706,908 | 12,730,266 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වූයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 9,998.75 ක් වේ. (2014 - රු.මි. 10,011.91).

## 16. අස්පෘශ්‍ය වත්කම්

| පරිගණක මෘදුකාංග : | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| **පිරිවැය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **927,022** | 638,020 |
| එකතු කිරීම් | **21,626** | 290,657 |
| අපහරණයන් | **-** | (1,655) |
| දෙසැම්බර් 31 දිනට අගය | **948,648** | 927,022 |
| **ක්‍රමක්ෂය සහ හානිකරණය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **620,938** | 602,422 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **87,100** | 20,136 |
| අපහරණයන් | **-** | (1,620) |
| දෙසැම්බර් 31 දිනට අගය | **708,038** | 620,938 |
| **ශුද්ධ පොත් අගය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **306,084** | 35,598 |
| දෙසැම්බර් 31 දිනට අගය | **240,610** | 306,084 |

මෙම මූල්‍ය වර්ෂය තුල දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 21.63 (2014 - රු.මි. 290.66) මුළු වටිනාකමකින් යුතු අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

## 17. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **11,524,984** | 11,365,076 |
| අනිකුත් විදේශීය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **523,257** | 313,407 |
| | **12,048,241** | 11,678,483 |

**18. ආසියානු නිශ්කාෂණ සංගමය**

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, ඉරානය, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය, මියන්මාරය සහ මාලදිවයින එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් සියයට 0.02 ක සිට සියයට 0.23 ක් දක්වා වූ පොළියක් ඇ.එ.ජ. ඩොලර් සඳහා ද (2014 දී එය සියයට 0.03 ක් සහ සියයට 0.07 ක් විය) යුරෝ සඳහා සියයට 0.00 ක සිට සියයට 0.00 දක්වා වූ පොළියක් (2014 - සියයට 0.00 සහ සියයට 0.12) මෙම පහසුකම් සඳහා ගෙවනු ලැබේ. එය බේරුම් කිරීමේ දිනයන් අතර ශුද්ධ ණය හිමියන්ගේ දෛනික පරිශේෂ ශේෂයන්ට මාරු කරනු ලැබේ. එම ශේෂයෙන් අදාල වාර්තාකරණ දිනට ආ.නි.ස. වෙත ගෙවිය යුතු ප්‍රමාණය නියෝජනය වේ.

**19. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)**

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| පොළිය දරන ණය - ප්‍රවර්තන නොවන | **34,386,440** | 94,841,815 |
| පොළිය දරන ණය - ප්‍රවර්තන | **65,334,236** | 68,678,555 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **78,946,116** | 75,083,657 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **47,512,222** | 47,039,094 |
| පංගු බැරකම් | **25,465,330** | 22,368,012 |
| | **217,257,904** | 213,169,318 |
| ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම් | **251,644,344** | 308,011,133 |

අ) 2014 වසරේ සිට ජා.මූ.අ. සම්බන්ධ බැරකම් ජා.මූ.අ. වෙතින් ලබාගන්නා ලද හදිසි ආධාර පහසුකම්වලින් සමන්විත වේ.

ආ) සම්පස්ථ ණය පහසුකම (SBA) යනු ණය ගනු ලබන රටවල්වල සාර්ව ආර්ථික කළමණාකරණ කටයුතු සඳහා වූ නිශ්චිත කොන්දේසිවලට යටත් ව ගෙවුම් ශේෂ කටයුතු මූල්‍යකරණය සඳහා ලබා දෙනු ලබන තවත් පහසුකමකි. ජා.මූ.අ. විසින් 2009 ජූලි මස වි.ගැ.හි. බිලියන 1.65ක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.6ක) සම්පස්ථ ණය පහසුකමක් ගෙවුම් ශේෂ කටයුතුවලට සහය දීම සඳහා අනුමත කරන ලදී. 2012 ජූලි මස අවසාන වාරිකය හිමිවීමත් සමග සම්පස්ථ ණය පහසුකම 2012 වසර තුළදී සාර්ථකව අවසන් වන ලදී. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 5ක කාලසීමාවක් හිමිවන අතර එය 2012 ඔක්තෝබර් මසින් ආරම්භ වුනි. මෙම ණය පහසුකම සඳහා අයකරන පොළී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර ආන්තිකය යන කොටස් දෙකකින් සමන්විත වේ. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් පොළී අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300% තෙක් වන අවස්ථාවකදී ස්ථාවර ආන්තිකය වාර්ෂිකව 1% වේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300%ක් ඉක්මන අවස්ථාවකදී වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් අයබදු ලෙස ගෙවිය යුතුවේ. 2012 ඔක්තෝබර් 25 වන දින වි.ගැ.හි. මිලියන 25.80 ක මුදලක් ප්‍රථම ආපසු ගෙවීම ලෙස පියවන ලදී. වි.ගැ.හි. මිලියන 292.83 ක්, වි.ගැ.හි. මිලියන 473.69 ක් සහ වි.ගැ.හි. මිලියන 361.73 මුදලක් පිළිවෙළින් 2013, 2014 සහ 2015 වසරවලදී ආපසු ගෙවන ලද අතර 2015 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශේෂය වි.ගැ.හි. මිලියන 499.53 වේ.

පොළී දරණ ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීමට අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | සඵල පොළී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|---|---|
| ප්‍රවර්තන සම්පස්ථ ණය පහසුකම (SBA) | **1.05** | | **65,334,236** | 68,678,555 |
| | | | **65,334,236** | 68,678,555 |
| ප්‍රවර්තන නොවන සම්පස්ථ ණය පහසුකම (SBA) | **1.05** | **2017** | **34,386,440** | 94,841,815 |
| | | | **34,386,440** | 94,841,815 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **99,720,675** | 163,520,370 |

ඇ) **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අ. වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි) සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකාරජයවෙනුවෙන්අත්සන්කරනලදගිවිසුමේසඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 7 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අ. වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ

සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොතත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

ඈ) **ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් :** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

ඉ) **පංගු බැරකම:** අංක 7 දරන සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 20. අනිකුත්

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය (අ) | **1,413,418** | 8,017,222 |
| මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය (ආ) | **11,957,787** | 14,046,678 |
| DST CDB (ඇ.එ.ජ.) - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (ඇ) | **21,701,612** | 34,106,960 |
| DST CDB (ඇ.එ.ජ.) - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (ඇ) | **14,406,230** | 13,104,860 |
| DST විශේෂ ඩොලර් ගිණුම - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) සහ ගෝලීය හරිත ශක්ති ණය (ඉ) | **-** | 1,222,595 |
| DST විශේෂ යූරෝ ගිණුම - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) සහ ගෝලීය හරිත ශක්ති ණය (ඉ) | **7,483,465** | - |
| DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය (ඊ) | **720,312** | - |
| සා(ර්)ක් විනිමය හුවමාරුව (SAARC SWAP facility) යටතේ ඉන්දියානු මහ බැංකුවට (Reserve Bank of India) ගෙවිය යුතු මුදල (උ) | **158,468,530** | - |
| අනෙකුත් විදේශීය බැරකම් | **1,772,788** | 1,647,843 |
| | **217,924,142** | 72,146,159 |

**(අ) එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය.**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී ලංකා රජය හා චීන සංවර්ධන බැංකුව (CDB) අතර පහසුකම් එකගතාවක් සඳහා අත්සන් තබන ලදී. මෙම පහසුකම් එකගතාවේ අරමුදල් ප්‍රමුඛතා මාර්ගයන් සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා යොදා ගැනේ. පහසුකම් එකගතාවය අනුව, බැංකුව එස්කෝරු නියෝජිතයා ලෙස පත් කරන ලදී. ඒ අනුව ණය තැන්පත් කිරීම හා එලෙස ලැබෙන මුදල් මාර්ග ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ හුදු අරමුණ ඇතුව එස්කෝරු ගිණුමක් බැංකුවේ විවෘත කරන අතර සහ එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා (චීන සංවර්ධන බැංකුව) හා ණය ගැනුම්කරු (ශ්‍රී ලංකා රජය) යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බල පවත්වනු ලබයි.

මෙම ණය පහසුකම යටතේ ඇ.එ.ජ. ඩොලර් මිලියන 326 මුදලක් ප්‍රථම වාරිකය ලෙස 2011 ජූනි 29 දින ලැබුණු අතර දෙවන වාරිකය වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 174 ප්‍රමාණය 2011 ඔක්තෝබර් 28 දින ලංකාවට ලැබුණි.

වැය අනුමත නිවේදනය එස්කෝරු නියෝජිතයා වෙත එවීම මගින් ණයහිමියා විසින් එස්කෝරු ගිණුමේ ඇති මුදල් වැය ඉල්ලුම් පත්‍රයේ සඳහන් ගිණුම් වෙත වැය කිරීම සඳහා උපදෙස් ලබාදේ.

ඒ අනුව චීන සංවර්ධන බැංකුවෙන් වැය අනුමත නිවේදනයක් ලැබීමෙන් අනතුරුව 2011 ඔක්තෝබර් 18 දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.77 ප්‍රමාණයක් ප්‍රථමයෙන් බෙදා හරින ලදී.

චීන සංවර්ධන බැංකුවෙන් කරන ලද වැය ඉල්ලුම් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 සහ 2012 වර්ෂයන් තුළ ඇ.එ.ජ. ඩොලර් මිලියන 157.50 ක මුදලක් බෙදා හැර ඇත.

ඇ.එ.ජ. ඩොලර් මිලියන 118.52 ක්, ඇ.එ.ජ. ඩොලර් මිලියන 161.01 ක් සහ ඇ.එ.ජ. ඩොලර් මිලියන 51.37ක මුදලක් පිළිවෙලින් 2013, 2014 සහ 2015 වර්ෂයන් හිදී බෙදා හැරීම් කර ඇත. 2015 දෙසැම්බර් මස 31 වන දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.81 කි.

**(ආ) මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය**

ඇ.එ.ජ.ඩො. මිලියන 214.20 සඳහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය හිමියා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැනුම්කරු) අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

2012 ජූනි 29 ඇ.එ.ජ. ඩොලර් මිලියන 214.20 ක ණය මුදලක් චීන සංවර්ධන බැංකුවෙන් ලැබී ඇත. 2012 අගෝස්තු 24 දින ප්‍රථම බෙදාහැරීම ලෙස ඇ.එ.ජ. ඩොලර් මිලියන 64.34 ක ගෙවීම් කර ඇත. 2013 - 2014 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 42.66 ක් බෙදා හැර ඇත.

2015 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 24.18 ක් බෙදා හරින ලද අතර 2015 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ.ඩො. මිලියන 83.00 කි.

**(ඈ) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු මුදල.**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය හිමියා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැණුම්කරු) අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නඟා සිටුවීම සඳහා වන වියදම් මුල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2014 මාර්තු 28 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් ලැබුණි. 2014 සහ 2015 වර්ෂයන් තුළ දී ඇ.එ.ජ. ඩොලර් මිලියන 149.36 ක් බෙදා දී ඇති අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 150.64 කි.

**(ඈ) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු මුදල.**

II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක ගිවිසුම 2014 නොවැම්බර් 24 වන දින හිමි විය.

**(ඉ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණය**

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුරෝපීය ආයෝජන බැංකුව අතර 2013 නොවැම්බර් 13 වන දින ඇති වූ මූල්‍ය ගිවිසුමකි. මෙම පහසුකම් එකඟතාවය අනුව, ශ්‍රී ලංකා රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තෝරා ගැණිනි. ඒ අනුව, හුදෙක් ලැබෙන ණය මුදල් තැන්පත් කිරීමට සහ එම මුදල් ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ පරමාර්ථය ඇතිව පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2014 ඔක්තෝම්බර් 06 වන දින මෙම ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 21.13 ක් ලැබිණි. 2014 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 11.80 ක් බෙදා හැර ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිව ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.33 කි. ඉතිරිව ඇති ශේෂය 2015 වසර තුළදී බෙදා හරින ලදී.

ඉහත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණයෙහි දෙවන වාරිකය 2015 ජූලි 09 වන දින යුරෝ වලින් ලැබුණි. ඒ අනුව හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුණු මුදල් ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2015 ජූලි 09 සහ 2015 දෙසැම්බර් 23 දිනයන්හි දී ඉහත ගිණුමට පිළිවෙලින් යුරෝ මිලියන 26.68 ක් සහ යුරෝ මිලියන 46.87 ක් ලැබුණි.

2015 වර්ෂය තුළ දී යුරෝ මිලියන 26.01 ක් බෙදා දී ඇති අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය යුරෝ මිලියන් 47.54 කි.

**(ඊ) DST විශේෂ ඩොලර් ගිණුම 45020 අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය.**

මෙම ණය පහසුකම් ගිවිසුම Agence Francaise de Development (ණය හිමියා) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ණය ගැණුම්කරු) අතර 2014 සැප්තැම්බර් 29 වන දින අත්සන් කර ඇත. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2015 සැප්තැම්බර් 14 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 5 ක් ලැබුණි.

**(උ) සා(ර්)ක් විනිමය හුවමාරුව යටතේ ඉන්දියානු මහ බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය**

සා(ර්)ක් රටවල් සඳහා මුදල් හුවමාරු ගිවිසුම් රාමුවට 2011 සැප්තැම්බර් 25 වන දින වොෂින්ටන් ඩී.සී. හිදී පැවැත් වූ සා(ර්)ක් රටවල්වල මූල්‍ය අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය විසින් මූල්‍යමය එකඟතාවය ලබා දෙන ලදී. සා(ර්)ක් ජාතීන්ට විධිවිධානයන් පිරිනැමීමේ දින සිට වර්ෂ 3 ක් යන තෙක් හුවමාරු ගිවිසුම වලංගු වේ. මෙම විධිවිධානය යටතේ ඉන්දියානු මහ බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව ද්විපාර්ශ්වික හුවමාරු ගිවිසුමකට එළඹ ඇත.

ගිවිසුමෙහි වලංගු කාලය තුල දී අරමුදල් ලබා ගැනීම් වාරික කිහිපයකින් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත. සෑම ගැනීමක් ම මාස 3 ක් සඳහා වන අතර එක් වරක් පමණක් තවත් මාස 3 ක් සඳහා දීර්ඝ කිරීමට අවසරය ඇත. මෙම ලබා ගැනීම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය වන්නේ, දිනයේ දී පවත්නා මාස 3 ඇ.එ.ජ. ඩොලර් අන්තර් බැංකු අර්පණ අනුපාතිකයෙහි සහ 200 පදනම් අංක පොලී අනුපාතිකයෙහි එකතුවයි.

2015 අප්‍රේල් 30 වන දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 400 ක් වන පළමු අරමුදල් ලබා ගැනීම සිදු කළ අතර එය තවත් මාස 3 ක් දක්වා 2015 ජූලි 30 වන දින දීර්ඝ කරන ලදී. මෙම දීර්ඝ කල කාලය අවසාන වන විට, ඉන්දියානු මහ බැංකුවට ඇ.එ.ජ. ඩොලර් මිලියන 402.32 ක් 2015 ඔක්තෝම්බර් 30 වන දින ආපසු ගෙවන ලදී.

2015 සැප්තැම්බර් 03 වන දින ඇ.එ.ජ. ඩොර් බිලියන 1.1 ක් වන දෙවන වාරිකය සපයන ලද අතර මෙම පහසුකම ද මාස 3 ක් සඳහා 2015 දෙසැම්බර් 03 වන දින දීර්ඝ කරන ලදි. ඒ අනුව ආපසු ගෙවීම 2016 මාර්තු 03 වන දින ගෙවිය යුතුව ඇත.

**21. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු**

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා

සහභාගී පාර්ශවයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුලදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරකුම් සහිත පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරන හෙළිදරව් කිරීම අවශ්‍යතාවයන් මත තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද මෙම තැන්පතු අදාල ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ පවත්වාගෙන යනු ලබන අතර බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **89,340,293** | 84,976,155 |
| - අනිකුත් | **92,380,448** | 76,028,176 |
| | **181,720,741** | 161,004,331 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **729** | 167 |
| - අනිකුත් | **5,262** | 4,825 |
| | **5,991** | 4,992 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **181,726,732** | 161,009,323 |

**22. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු**

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **174,871** | 166,583 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **253,271** | 145,367 |
| | **428,142** | 311,950 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

**23. ප්‍රති මිලදී ගැනීමේ එකගතාවය මත අලෙවි කළ සුරැකුම්පත්**

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් | **23,650,000** | 321,220,000 |
| නිත්‍ය තැන්පතු පහසුකම (සටහන 3.3.8) | **81,815,000** | 7,032,000 |
| | **105,465,000** | 328,252,000 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකගතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකගතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

**24. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්**

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරන සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැරට රඳවා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් මෙසේය.

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් හි ශේෂය | **7,212** | 2,209,782 |
| | **7,212** | 2,209,782 |

**25. සංසරණයේ ඇති මුදල්**

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,703** | 5,703 |
| සත 5 | **23,247** | 23,247 |
| සත 10 | **39,208** | 39,208 |
| සත 25 | **120,558** | 120,558 |
| සත 50 | **185,371** | 185,564 |
| රුපියල් 1 | **794,975** | 734,733 |
| රුපියල් 2 | **1,155,840** | 1,048,861 |
| රුපියල් 5 | **3,473,827** | 3,130,691 |
| රුපියල් 10 | **3,345,748** | 2,252,507 |
| අනිකුත් සමරු කාසි | **582,423** | 577,523 |
| | **9,730,531** | 8,122,226 |
| නෝට්ටු | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,696** | 26,697 |
| රුපියල් 5 | **37,194** | 37,194 |
| රුපියල් 10 | **1,449,773** | 1,519,817 |
| රුපියල් 20 | **4,882,579** | 4,121,289 |
| රුපියල් 50 | **4,671,924** | 4,273,372 |
| රුපියල් 100 | **18,979,404** | 17,029,514 |
| රුපියල් 200 | **131,246** | 132,526 |
| රුපියල් 500 | **31,656,334** | 28,205,681 |
| රුපියල් 1,000 | **133,243,521** | 127,258,019 |
| රුපියල් 2,000 | **38,973,585** | 67,438,978 |
| රුපියල් 5,000 | **247,912,180** | 158,725,070 |
| | **481,969,417** | 408,773,136 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **491,699,948** | 416,895,362 |

**26. අනෙකුත් ගෙවිය යුතු දෑ**

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| දේශීය පොලී වෙනුවෙන් ගෙවිය යුතු මුදල් | **26,006** | 2,120,819 |
| වෙන්කිරීම් සහ අයකිරීම් | **556,337** | 733,824 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **2,314,645** | 2,688,215 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් | **3,221,244** | 2,655,909 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **732,766** | 669,056 |
| | **6,850,998** | 8,867,823 |

අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී බැංකු හා මූල්‍ය ආයතනවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

**27. විලම්භිත ප්‍රදානයන්**

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 01 වන දිනට | **515** | 1,449 |
| වර්ෂය තුල ක්‍රමක්ෂය | **(409)** | (934) |
| දෙසැම්බර් 31 දිනට | **106** | 515 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

**28. විවිධ බැරකම් හා උපචිතයන්**

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති ගිණුම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් රැස් කර ගන්නා ලද රජයට ගෙවිය යුතු දඩ මුදල් අන්තර්ගතය.

**29. හිමිකරු ප්‍රාග්ධනය**

(අ) හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය

ප්‍රාග්ධන අරමුදල්

*දායක ප්‍රාග්ධනය :* මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ දායක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් දායක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 තෙක් වැඩි කරන ලදී.

(ආ) **ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණ සංචිතය**- ජා.ගි.ප්‍ර. අංක 16 ප්‍රකාරව දේපළ පිරියත, හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයන් තුළින් මෙම සංචිතය ගොඩනැගී ඇත.

(ඇ) **අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ.**

**i.** *ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය* ***(IRR)***- ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයක්ය. මෙම වගන්තිය ප්‍රකාර, රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**ii.** **වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය** - ජාත්‍යන්තර වෙළඳපල තුල සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ හෝ අලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී.

මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

**iii.** **අනෙකුත් සංචිත** - පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකාර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුල ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

**iv.** **විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)** - විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරැකුම්පත් සහ ඒකක ආයෝජනයන් ප්‍රත්‍යාග ණනයෙන් උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**v.** **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** - තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල් ගොඩනගා ඇත. මෙම අරමුදල ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන සඳහා සීමාකර ඇත.

**vi.** **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බාහිර අවදානම් තත්ත්වයන් යටතේ බැංකුවේ ආදායම් ඉපැයීමේ ධාරිතාවයේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා මෙය යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1 ක් මෙම සංචිතයට මාරු කරන ලදී. MB/HR/11/12/2015 දරණ මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව නව විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූනි මාසය තුළදී විශ්‍රාම ප්‍රතිලාභ සංචිතයෙන් රුපියල් බිලියන 2ක් නව විශ්‍රාම ගිණුමට මාරු කරන ලදී.

**vii.** **තාක්ෂණික අභිවර්ධන සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හෝ නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**viii.** **පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල** - 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.90 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රධානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

**ix.** **විශේෂිත ණය ඇප ක්‍රම අරමුදල** - මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රුපියල් බිලියන 2 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රුපියල් බිලියන 1 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර අදියර II, නැගෙනහිර පළාත තුල ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රුපියල් බිලියන 1 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වානිජ බැංකු මගින් විශේෂිත ණය ඇප ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

අනෙකුත් සංචිතවල වෙනස් වීම පහත පරිදි වේ.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිත | වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් සංචිත | විශේෂිත ණය ඇප ක්‍රම සංචිත | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ අගය/අලාභය | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය යෝජනාක්‍රම අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2015 ජනවාරි 01 දිනට | 2,925,000 | 4,650,806 | 2,489,920 | 2,000,000 | 1,076,150 | 8,567,855 | 1,883,529 | 4,000,000 | 1,000,000 | 2,900,000 | 31,493,260 |
| තත්කාලීන දළ පියවුම සංචිතයට මාරු කිරීම | - | - | - | - | 256,478 | - | - | - | - | - | 256,478 |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභය මාරු කිරීම. | - | - | - | - | - | 10,589,267 | - | - | - | - | 10,589,267 |
| විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ පාඩුව | - | - | - | - | - | - | (624,957) | - | - | - | (624,957) |
| නව විශ්‍රාම අරමුදලට මාරු කිරීම. | - | - | - | - | - | - | - | (2,000,000) | - | - | (2,000,000) |
| 2015 දෙසැම්බර් 31 දිනට | 2,925,000 | 4,650,806 | 2,489,920 | 2,000,000 | 1,332,628 | 19,157,122 | 1,258,572 | 2,000,000 | 1,000,000 | 2,900,000 | 39,714,049 |

## 30. ලාභ බෙදාහැරීම

මුදල් නීති පනතට සහ 2015 වසරේ සිට බලපැවැත්වෙන මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී ජා.මූ.වා.ප්‍ර ප්‍රකාර ලාභය / අලාභය සඳහා පහත දැක්වෙන ගැලපීම් කරනු ලැබේ.

(අ) මුදල් නීතිපනතේ වගන්ති අංක 41 ට අනුකූලව විදේශ විනිමය ප්‍රත්‍යාගණනයෙන් ලාභ/අලාභ ඉවත්කරනු ලැබේ.

(ආ) විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාග ණනයන්ගෙන් ඇතිවන්නාවූ පාඩු ගලපනු ලබන අතර (ඉවත්කිරීමක් නොකෙරේ) උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ වාසි ඉවත් කෙරේ (ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තීන්ට අනුකූලව).

(ඇ) මුදල් නීතිපනතේ වගන්ති අංක 39 අනුව කළ යුතු ගැලපුම් කරනු ලැබේ.

තවද ගිණුම්කරණ ප්‍රමිති සහ කළමණාකාරීත්වයේ තීරණ අනුව කළ යුතු ගැලපුම් ද බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී ගලපනු ලැබේ.

ඉහත සඳහන් ගැලපුම් වලට අනුව ගණනය කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට බෙදිය හැකි ලාභය පහත පරිදි වේ.

| අයිතම | 2015<br>රු. 000 |
|---|---|
| ජා.මූ.වා.ප්‍ර. ප්‍රකාර ලාභය / (අලාභය) | (19,601,819) |
| අඩුකළා : | |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම. (මුදල් නීති පනතේ වගන්ති අංක 41 ප්‍රකාර) | 10,589,267 |
| අභ්‍යන්තර අරමුදල් සඳහා වූ පොලී ආදායම් අදාළ අරමුදල් වෙත මාරු කිරීම. | 389,544 |
| අනෙකුත් විස්තීරණ ආදායමට අයකිරීම (ජා.ගි.ප්‍ර 19 ට අනුකූලව සේවක ප්‍රතිලාභ) | 7,257,078 |
| එකතු කළා: | |
| නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා සමුච්චිත ලාභය වෙත විශ්‍රාම අරමුදල් සංචිතයෙන් අරමුදල් මාරු කිරීම | 2,000,000 |
| මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභය බෙදා හැරීමේ ප්‍රතිපත්තීන් සහ අනෙකුත් ගැලපුම්වලට අනුකූලව බෙදා හරින ලද ලාභය/(අලාභය) | (35,837,708) |
| සංචිත සඳහා මාරු කිරීම් (මුදල් නීති පනත් වගන්ති අංක 38 ප්‍රකාර) | - |
| රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් සහ මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම්. (මුදල් නීති පනතේ වගන්ති අංක 39 ප්‍රකාර) | - |

මුදල් නීති පනතට අනුව 2015 වසර සඳහා බෙදිය හැකි ලාභයක් නොමැති හෙයින් සංචිත වෙත මාරු කිරීම්, මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම් සහ රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් කිසිවක් සිදු නොකෙරේ.

**31. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම**

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| මුදල් හා කෙටිකාලීන තැන්පතු | **1,464,525** | 3,209,460 |
| මූල්‍ය වත්කම් | **6,635,778** | 6,853,354 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **4,947,011** | 12,158,689 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **13,047,314** | 22,221,503 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත් | **8,749,944** | 4,085,660 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **573,609** | 531,024 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **9,323,553** | 4,616,684 |
| **මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **22,370,867** | 26,838,187 |

**32. මූල්‍ය බැරකම් මත පොළී වියදම**

| | 2015 රු. 000 | 2014 රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල | **38,009** | 13,854 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **1,394,723** | 2,546,454 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **341,117** | 525,898 |
| වෙනත් විදේශ ගෙවිය යුතු මුදල් | **1,848,888** | 17,051 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම** | **3,622,737** | 3,103,257 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරකුම්පත් | **4,067,059** | 15,919,782 |
සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා බැංකුව ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 - ධාරණ අගය - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 36.29 (2014 - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 - ධාරණ අගය - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 36.54) යුරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30 (2014 - ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ණය පහසුකම් ලබාගෙන ඇත. ඔඩපන කරන ලද සුරැකුම්පත් යුරෝ ක්ලියර් හි වෙනම ගිණුමක රඳවා ඇත.

එම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ 'විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්' ලෙස ඉදිරිපත් කර තිබේ. "Collateral Agreement Governing Secured Borrowings by participants in the Euroclear System" හා "General Conditions Governing Extensions of credit to participants in the Euroclear System" යන මාර්ග නිර්දේශයන් මත පදනම් වී එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

**48.7 බැඳුම්කර ණයට ගැනුම්**

පාදක අංක 30 ක කොමිස් පදනමකට යටත්ව බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලින් බැඳුම්කර ණයට ගෙන ඇත. 2015 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර ණයට ගැනුම් යටතේ වූ ශේෂයක් නොමැත (2014 - රු.මි. 191,781.43).

**49. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අන් විශ්වාසනා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ) විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි වැය පියවීම් සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) වෙනුවෙන් සිදු කිරීම කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

ආ) බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර

සමිති සඳහා විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දාතම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

ඇ) 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් පාලිත තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 77 කි. ගැසට් පත්‍රයේ 5.2 වගන්තියට අනුව විශේෂිත අතහැරීම් හා සියලුම ණය උපකරණ හැර සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් රක්ෂණය කෙරේ.

රු.මි. 350.20 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2015 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. බිලියන 25.40 ක් (තාවකාලික) වන අතර, දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු.මි. 0.30 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ඒකකය මගින් සිදුකරන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් වෙන්වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

ඉ) ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

ඊ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා "විස්කම්" ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2015 දෙසැම්බර් 31 දිනට එසේ රැස්කළ මුළු මුදල රු.මි. 40.11 (2014 - රු.මි. 188.93) කි. වර්ෂය අවසන් දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපා. විසින් රු. මි. 200.45 (2014 රු.මි. 367.78) මුදලක ණය ලබා දී ඇති අතර එමගින් රු. මි. 90.82 පොළී ආදායමක් උපයන ලදී. තවද රු.මි. 188.18 (2014 රු.මි. 188.18) ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

උ) බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය දායකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. තව ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අරමුදල් සපයන ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | | | | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 | | | | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම | 351.06 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 | | | | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණාත්වයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණාත්වය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම | 94.59 | | | | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | | | | |
| අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන ව්‍යාප්ත කිරීමට ආධාර කිරීම. | 1,362.00 | | | | |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | | | | |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | | | | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් වර්ධනය හා ස්ථිර කිරීම | 249.06 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | | | | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පවතින මිනිස් ජීවිත හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | | | | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | | | | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් පිරිවැය ඵලදායී සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | | | | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | | | | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | | | | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 | | | | |
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට මාරු කළ යුතුය. | | | |
| සුසහන අදියර II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | | | | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2.000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීම | 1,000.00 | | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම | 1,199.82 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 100.00 | | | | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පසු සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | | | | |
| පසු සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.09 | සුනාමියේ බලපෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ගොඩනංවා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා පදනම දැමීම හා ආදායම උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා සහාය දීම. | 190.77 | | | | |
| විස්කම් (කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම, විවිධාංගීකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 881.00 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්ය අවශ්‍යතා සම්පූර්ණ කළ පසු අරමුදල් නැවත ලබාදීම සිදුකරයි. | | | |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,900.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත මාරු කල යුතුය. | | | |
| වියලි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ආදායම ජනනය වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.95 | | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,000.00 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර III | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,428.47 | | | | |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාල සීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 600.00 | | | | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන්ට අරමුදල් සපයාදීම හා ආදායම් ඉහළ නැංවීම | 113.13 | | | | |

## ඉදිරියට යන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම. | 947.00 | | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන බාහිර විගණකයින් විගණනය කළ යුතුය. | අදාල සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාවය නොමැතිව ගිවිසුම්වල අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම් හෝ සංශෝධනය හෝ අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදුකරනු නොලැබේ. |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම. | 424.50 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරීම. | 3,213.20 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරීම. | 4,079.90 | | | | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුල පිළිගත් වෘත්තිය පුහුණු ආයතන වලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම. | 232.39 | | | | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් වැඩි දියුණු කිරීම. | 1,475.35 | සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම. | 250.34 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1,031.28 | අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික තත්වය ශක්තිමත් කිරීම. | 3,426.23 | | | | |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | රුපියල් | 14,124.00 | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 14,124.00 | | | | |
| පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2,361.00 | | | | |

ප්‍රා.සං.දෙ. විසින් තම භාරකාරත්ව ක්‍රියාකරකම් යටතේ, දෙපාර්තමේන්තුව සතු අතිරික්ත අරමුදල් ප්‍රතිමිලදී ගැනුම් ආයෝජනවල ආයෝජනය කරයි. 2015 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 1.4 ක මෙවැනි ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන, සුරැකුම් රහිත ආයෝජන බව සොයාගෙන ඇත. ප්‍රා.සං.දෙ. විසින් විවිධ ණය යෝජනා ක්‍රම හා ව්‍යාපෘති ක්‍රියත්මක කිරීම සඳහා වෙන් කර ඇති අරමුදල් තුලින් මෙම ආයෝජන අරමුදල් ජනනය කර ඇති අතර මෙසේ භාවිත කරන අරමුදල් වහා ආපසු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැත. මෙම ආයෝජන නැවත අය කර ගත නොහැකි නම්, එය දෙපාර්තමේන්තුවේ අනාගත කාර්යයන් සඳහා මෙන්ම දැනට පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා ද බලපානු ඇත. තවද, නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද කළ නොහැකි විය හැක. මෙම ආයෝජන නැවත අය කර ගත නොහැකි වුවහොත් එමඟින් අරමුදලේ පදනම ද ඒ හා සමාන අගයකින් අඩු විය හැක.

**50. අනෙකුත් ආයතන වෙත ඇති බැඳියාව**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සුසහන, සුසහන අදියර II, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර II), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීමේ අදියර II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසහටන සඳහා බැංකුව විසින් අරමුදල් සපයා ඇති අතර එහි ප්‍රාග්ධන ශේෂය හා හිඟ පොලී බැංකුවේ වත්කම් ලෙස වාර්තා කර ඇති අතර ආදායම බැංකුවේ ආදායම ලෙස සලකා ඇත.

තවද, ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන, ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ඇතැම් ව්‍යාපෘතිවල පරිපාලන වියදම් ආවරණය වෙනුවෙන් බැංකුව විසින් ප්‍රකාශිත ප්‍රතිශතයක් ලබා ගනී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා වූ බැංකුව විසින් නිකුත් කරන ලද ණය ඇපකර මත හටගත් අසම්භාව්‍ය වගකීම් සටහන් අංක 48.2 හි හෙළිදරව් කර ඇත.

**51. ශේෂ පත්‍ර දිනට පසු ඇති වූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරිමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසු ඇති නොවීය.

## 2. බැංකු අධීක්ෂණ

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ සහ කාලීන පරීක්ෂා කටයුතු සිදුකිරීම සඳහා විශේෂ බලතල සහ කාර්යයන් සහිතව, මුදල් නීති පනතෙහි 28 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබිණි. මෙයට අමතරව, බැංකු නියාමනය සහ අධීක්ෂණය, 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතෙහි විධිවිධාන මගින් ද පාලනය වේ. මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද විචක්ෂණශීලී විධාන, මාර්ගෝපදේශ සහ අනුමැතීන් සකස් කිරීම සහ නිකුත් කිරීම, අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකිරීම, කාලීන පරීක්ෂා සිදුකිරීම සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි පරිපාලන කටයුතු සිදුකිරීම, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයන් වේ. මෙයට අමතරව, බැංකු අංශයේ දැනුම්වත් කිරීම් සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා වන වැඩකටයුතු කිහිපයක ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව නිරත වේ. 2015 වසර අවසන් වනවිට මුදල් නීති පනත සහ බැංකු පනත යටතේ නියාමනයට සහ අධීක්ෂණයට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 ක් පැවතුණි. මෙම බැංකුවල නාම ලේඛනයක් II-1 ඇමුණුමෙහි අන්තර්ගත වේ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2015 වසර තුළදී සිදුකළ ප්‍රධාන කාර්යයන් සහ වැඩකටයුතුවල සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1 විචක්ෂණශීලී විධාන, අවසරයන් නිකුත් කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදනය

#### 2.1.1 විචක්ෂණශීලී විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විචක්ෂණශීලී විධානයන් මෙම වාර්තාවේ III කොටසෙහි දක්වා ඇත. ඒ අතරින් ප්‍රධාන විචක්ෂණශීලී විධානයන් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

**(අ) බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය:**

2015 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු විසින් සියයට 60 ක ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් පවත්වාගත යුතු වන අතර, 2019 ජනවාරි මස 01 දින වනවිට එම අනුපාතය සියයට 100 දක්වා ක්‍රමිකව ඉහළ නැංවිය යුතු වේ. එමෙන්ම, බාසල් III හි නිර්දේශ කර ඇති අධීක්ෂණ විධි ක්‍රම අනුව තම ද්‍රවශීලතා තත්ත්වය අධීක්ෂණය කළ යුතු වේ.

**(ආ) අපනයනකරුවන්ට ලබාදුන් ණය පහසුකම් අයකර ගැනීම**

2014 ඔක්තෝබර් 16 දින අවලංගු කළ මීට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛ, ණය අයකර ගැනීම ප්‍රමාද වීමේදී අයකරන අමතර පොලී අනුපාතිකය පදනම් අංක 1000 සිට පදනම් අංක 500 දක්වා අඩු කිරීමේ සංශෝධනය සහිතව 2015 ජුනි මස 01 දින නැවත නිකුත් කරන ලදී.

**(ඇ) මෝටර් වාහන සම්බන්ධයෙන් ලබාදෙන ණය සහ අත්තිකාරම් සඳහා වටිනාකම මත ණය අනුපාතිකය**

මෝටර් වාහන සම්බන්ධයෙන් ලබාදෙන ණය සඳහා බැංකුවල අධික නිරාවරණය වීමෙන් ඇති විය හැකි පද්ධති පුරා පැතිරෙන අවදානම වැළැක්වීමේ සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ගයක් ලෙස මෝටර් වාහන මිලදී ගැනීම සහ භාවිතා කිරීම සඳහා ප්‍රදානය කරන ණය සඳහා සියයට 70 ක උපරිම වටිනාකම මත ණය අනුපාතිකයක් පනවමින් බලපත්‍රලාභී බැංකු වෙත 2015 සැප්තැම්බර් මස 14 දින විධානයක් නිකුත් කළ අතර, එය 2015 දෙසැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

#### 2.1.2 නියාමනයන් සමාලෝචනය කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ආයතනික යහපාලනය, කොටස් හිමිකම් සීමාවන්, බලපත්‍රලාභී බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය, කෘෂි අංශය සඳහා අනිවාර්ය ණය ලබාදීම, බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා ණය පහසුකම් ලබාදීම හා බැංකු සඳහා විගණකවරුන් තෝරා ගැනීම පිණිස යෝග්‍ය නිර්ණායකයන් වැනි විධානයන් සමාලෝචනය කිරීම 2015 වසරේදී ආරම්භ කරන ලදී. තවද, බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සහ තෝලන අනුපාතය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් නිකුත් කළ තොරතුරු විමසීමේ පත්‍රිකාව සඳහා බැංකු වෙතින් අදහස් ලබාගත් අතර, ප්‍රාග්ධන ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මූලික ඇගයීමක් ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

#### 2.1.3 මුදල් මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලද අවසරයන්

**(අ) බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක**

නව බැංකු ශාඛා 34 ක්, සිසු ඉතුරුම් ඒකක 01 ක් සහ ජංගම බැංකු ඒකක 03 ක් විවෘත කිරීමට, ශාඛා 99 ක් ප්‍රතිස්ථාපනය කිරීමට, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 240 ක් පිහිටුවීමට හා ජපාන බැංකුවක ශ්‍රී ලංකා නියෝජිත කාර්යාලයක් පිහිටුවීමට අවසර ලබාදෙන ලදී. අදාළ බැංකුවල මූල්‍ය කාර්ය සාධනයන්, යෝජිත ශාඛාව සඳහා වන මූල්‍ය පුරෝකථනයන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බැංකු ඝණත්වය වැනි සාධක සලකා බලමින් මෙම නව බැංකු ශාඛා සඳහා අනුමැතිය ලබාදෙන ලදී. 2015 වසර තුළදී, ඉන්දියාවේ බෙංගලූරු හි බැංකු ශාඛාවක් විවෘත කිරීමට, බැංකු නියෝජිත කාර්යාලයක් මියන්මාරයේ ඇරඹීමට සහ බැංකු පරිපාලිත සමාගමක් මාලදිවයින් ජනරජයේ ඇරඹීමට වාණිජ බැංකු 3 කට අනුමැතිය දෙන ලදී. 2015 වසර අවසන් වනවිට, බැංකු ශාඛා 3,538 ක්, සිසු ඉතුරුම් ඒකක 3,045 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,714 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**(ආ) වෙනත් නියාමන අනුමැතීන්**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී එහි පරිපාලිත සමාගමක් වූ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී සමග ඒකාබද්ධ වීමට අනුමැතිය ලබාදුන් අතර, 2015 ඔක්තෝබර් මස 01 දින සිට වාණිජ බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත නව බලපත්‍රයක් නිකුත් කරන ලදී. තවද, උපරිම ණය ප්‍රමාණය ඉක්මවීම සම්බන්ධයෙන් අනුමැතීන් 5 ක් හා විදේශ ණය ගැනීම් සම්බන්ධ අනුමැතීන් 2 ක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් අතර, දෙවන පෙළ ප්‍රාග්ධනය යටතේ ණයකර ඇතුලත් කිරීමට බැංකු 6 කට අවසර ලබාදෙන ලදී.

## 2.2 අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදු කිරීම

(I) බැංකුවල මූල්‍ය තත්ත්වය ඇගයීම සහ පැන නැගිය හැකි ගැටළු පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් කල්තබා හඳුනා ගැනීම මගින් සුදුසු නිවැරදි කිරීමේ පියවර කඩිනමින් ගැනීමෙහි අරමුණින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී. වෙබ් අඩවි පාදක කරගත් (Web-based) ෆින්නෙට් පද්ධතිය හරහා බැංකු විසින් කලින් කලට ඉදිරිපත් කළ මූල්‍ය සහ කාර්ය සාධන තොරතුරු පදනම් කර ගනිමින් මෙම අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකෙරිණි. ආසන්න වශයෙන්, එක් බැංකුවක් සඳහා මූල්‍ය සහ විචක්ෂණශීලී තොරතුරු ඇතුලත්, ව්‍යවස්ථාපිත වාර්තා 27 ක් පමණ මෙම ෆින්නෙට් පද්ධතිය වෙත සපයනු ලැබේ. 2015 වසරේදී සයිබර් ප්‍රහාර වාර්තා කිරීම සඳහා නව වාර්තාවක් ද හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රියාවලිය මගින් බැංකුවල අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතියට තොරතුරු සැපයීමට හා බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ මගින් හඳුනාගත් දුර්වලතාවයන් නියමිත කාලසීමාව තුළදී නිවැරදි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග යන්හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය තොරතුරු සපයන ලදී. තවද, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, ද්‍රවශීලතාවය හා ආයතනික යහපාලනය වැනි අංශයන්හි ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(II) මීට අමතරව, විවිධ අහිතකර වත්කම් හා වගකීම් බුබුළු හා කේන්ද්‍රගතවීම් තුළින් ඇති වන අවදානම් සඳහා බැංකු පද්ධතියේ හෝ එක් බැංකුවක නිරාවරණය වීම් වැනි සාර්ව විචක්ෂණශීලී ඇගයීම් ඇතුලත් කිරීම සඳහා වත්කම්වල ගුණාත්මකභාවය, ද්‍රවශීලතාවය, ඉපැයීම්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය හා වර්ධනය ඇතුලත් බැංකු පද්ධතියේ කාර්ය සාධනය සම්බන්ධයෙන් කලින් කල පිළියෙල කරන වාර්තාවන්හි ආකෘතිමය වෙනස්කම් සිදුකරන ලදී.

## 2.3 කාලීන පරීක්ෂණ සිදු කිරීම

(I) පසුගිය වසරේ සිට ඉදිරියට ගෙන ආ පරීක්ෂණ 12 ක් ද ඇතුළුව, 2015 වසරේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ 45 ක් සිදුකරන ලදී. 2015 වසර තුළදී, අදාළ බැංකුවල කළමනාකාරිත්වය සමග විධිමත් සාකච්ඡාවන්හි නිරත වීමෙන් සහ මුදල් මණ්ඩලය වෙත අදාළ වාර්තා යොමු කිරීමෙන් අනතුරුව, බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ 30 ක් අවසන් කෙරුණු අතර, පරීක්ෂණ 15 ක කටයුතු අවසන් වෙමින් පැවතුණි. මෙම පරීක්ෂණවලදී හඳුනාගත් ප්‍රධාන කරුණු ලෙස අඩු කාර්යක්ෂමතාව, ආයතනික යහපාලනය පිළිබඳ දුර්වලතාවයන්, පද්ධති සහ පාලන දුර්වලතාවයන් සහ ව්‍යවස්ථාපිත වාර්තා ඉදිරිපත් කිරීමේ අඩුපාඩු ඇතුළත් විය. මෙයට අමතරව, විචක්ෂණ ස්වභාවයේ විශේෂ කරුණු සඳහා සීමිත විෂය පථයකින් යුතු පරීක්ෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කළ අතර, මෙහෙයුම් අවදානම් කළමනාකරණය, මූලික ආරක්ෂණ ප්‍රමිතීන් සහ තොරතුරු තාක්ෂණ පද්ධති ආදී ක්ෂේත්‍ර ශක්තිමත් කිරීමට අදාළ නිර්දේශයන් බැංකුවලට සන්නිවේදනය කරන ලදී.

(II) වර්ෂයේ දෙවන භාගය තුළදී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවදානම මත පදනම් වූ නව පරීක්ෂණ/අධීක්ෂණ ප්‍රවේශයක් යොදාගැනීම ගවේෂණය කරන ලදී. මෙම ප්‍රවේශය මගින් බැංකුවල පැවැත්ම සඳහා අවදානම් හඳුනාගැනීම පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්හි විශ්ලේෂණයන් සහ සොයා ගැනීම්, කාර්යක්ෂමතාව, අවදානම් දර්ශක මත පදනම් වූ ශක්තිමත් බව සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණාත්මකභාවය මත පදනම් වේ. අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් අධීක්ෂණයේදී පෙන්වාදුන් කරුණු සඳහා විසඳුම් සෙවීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සමග වන ලෙසින් එම කරුණු අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වෙත සන්නිවේදනය කරන ලදී. මෙම ප්‍රවේශය මගින් දීර්ඝකාලීන ස්ථාවරත්වය පිළිබඳ අවධානය යොමු කරමින්, සියලු බැංකුවල වැඩි දියුණු කළ කාර්යක්ෂමතාව, ශක්තිමත්භාවය සහ අවදානම් කළමනාකරණ පද්ධති හරහා බැංකු පද්ධතියේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට සැලසුම් කෙරේ. මෙම ප්‍රවේශය 2015 වර්ෂයේ දෙවන භාගයේ සිදුකළ ව්‍යවස්ථාපිත පරීක්ෂණ සඳහා යොදාගනු ලැබීය.

## 2.4 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම

(I) 2015 දෙසැම්බර් මස 31 දිනට, සමස්ත අරමුදලෙහි වටිනාකම ආසන්න වශයෙන් රුපියල් බිලියන 25 ක් (විගණනය නොකළ) පමණ වූ මෙම යෝජනා ක්‍රමය සාමාජික ආයතන 77 කින් සමන්විත විය. රුපියල් බිලියන 18 ක් වන රජයේ සුරැකුම්පත්වල සිදුකළ ආයෝජනයන් සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඇති ද්‍රවශීලතා පහසුකම යටතේ සාමාජික ආයතනයක් වෙත සැපයූ රුපියල් බිලියන 6 ක ද්‍රවශීලතා ආධාරක පහසුකමින් අරමුදලෙහි ආයෝජනයන් සමන්විත වේ. ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේදී, සියයට 14 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් පවත්වාගනු ලැබූ බලපත්‍රලාභී බැංකු විසින්, සුදුසුකම් ලැබූ තැන්පතු ප්‍රමාණය මත වසරකට සියයට 0.1 ක් සහ අනෙකුත් සියලුම බැංකු විසින් වසරකට සියයට 0.125 ක් අරමුදල සඳහා වාරික වශයෙන් ගෙවිය යුතු විය. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අදාළ වාරික මුදල වසරකට සියයට 0.15 ක් විය. වසර තුළදී, රුපියල් බිලියන 5.6 ක මුදලක් සාමාජික ආයතනවලින් වාරික සහ දඩ මුදල් වශයෙන් රැස්කර ගන්නා ලදී.

(II) 2015 අයවැය තුළින් අනුමත වූ යෝජනාවකට අනුව, 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, තැන්පතු රක්ෂණ ආවරණය එක් ආයතනයක එක් තැන්පතුකරුවකු සඳහා රුපියල් 200,000 සිට රුපියල් 300,000 දක්වා ඉහළ නංවන ලදී.

**II-1 සංඛ්‍යා සටහන** **ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන මූල්‍ය තොරතුරු**

| අයිතමය | රුපියල් මිලියන | |
|---|---|---|
| | 2015.12.31 දිනට * | 2014.12.31 දිනට |
| අරමුදලේ ප්‍රමාණය | 25,419 | 18,549 |
| මුළු ආදායම | 7,374 | 6,572 |
| මුළු වියදම | 504 | 249 |
| වර්ෂය සඳහා ලාභය (බදු පෙර) | 6,870 | 6,323 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 18,123 | 12,562 |
| ණය සහ ලැබිය යුතු දෑ | 6,227 | 6,009 |
| වෙළෙඳාම පිණිස පවතින වත්කම් සඳහා ඇති සංචිත | 259 | 1,129 |

* තාවකාලික

## 2.5 බැංකු අංශයේ දැනුම්වත්භාවය සහ ශක්‍යතා වැඩි දියුණු කිරීම

### (අ) ශක්‍යතා වැඩි දියුණු කිරීම

ආයතනික යහපාලනය, අවදානම් කළමනාකරණය, බැංකු පරීක්ෂණ, භාණ්ඩාගාර මෙහෙයුම්, මූල්‍ය ආයතනවල ඇති වන වංචාවන් සහ බැංකු සහ මූල්‍ය අංශයට අදාළ ව්‍යවස්ථාවන් වැනි ක්ෂේත්‍රයන්හි දැනුම ඉහළ නැංවීම හරහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, බැංකු අංශයෙහි ශක්‍යතා වර්ධනයට අඛණ්ඩව දායක විය. 2015 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියෙසේ සහ අනෙකුත් දේශීය හා විදේශීය බාහිර ආයතනවල සම්පත් දායකයන් වශයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්බන්ධ විය. තවද, බලපත්‍රලාභී බැංකුවල නිලධාරීන් සඳහා බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය ගණනය කිරීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුම හුවමාරු කර ගැනීමේ සැසියක් ද පවත්වන ලදී.

### (ආ) බැංකුවල කළමනාකාරිත්වය සහ විගණකවරුන් සමග පැවති රැස්වීම්

ශ්‍රී ලාංකීය ආර්ථිකයේ හා බැංකු අංශයෙහි වර්ධනයන් සහ නියාමන හා අධීක්ෂණ වැඩි දියුණුවීම් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමේ හමුවක් ලෙස ක්‍රියාත්මක වූ, බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් සමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා පැවැත් වූ රැස්වීම් සඳහා ලේකම් කාර්යාලය ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මෙයට අමතරව, බැංකුවලට විශේෂිත වූ කරුණු සාකච්ඡා කිරීමට සහ නිසි අධීක්ෂණය හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමට බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හා බාහිර විගණකවරුන් සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

### (ඇ) මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

2015 වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව, මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබාදී ඇති මූල්‍ය ආයතන සහ නීති විරෝධී යෝජනා ක්‍රමවලට සම්බන්ධවීමේ අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මහජන දැන්වීම් දෙකක් භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් කිහිපයක පළ කරන ලදී. තවද, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ පොලී යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය නිවේදන දෙකක් නිකුත් කරන ලදී.

### (ඈ) නව කටයුතු පවත්වාගෙන යෑම

2015 වර්ෂයේ පළමු භාගය තුළදී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව සහ නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතනවල ද සහාය ඇතිව ප්‍රමුඛ සේවින්ග්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ් හි කටයුතු, විනිමය පාලන විධානයන්ට අදාළ කටයුතු, තහනම් යෝජනා ක්‍රමවලට අදාළ විමර්ශන කටයුතු යන කරුණුවලට අදාළ නඩු හැසිරවිය. 2015 ජුනි මසදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමග මෙම නඩු කටයුතු පවත්වාගෙන යාම එම දෙපාර්තමේන්තුවට පවරන ලදී.

**ඇමුණුම II-1** **බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පීඑල්සී
2. ඇක්සිස් බෑන්ක් ලිමිටඩ්
3. ලංකා බැංකුව
4. කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ්
5. සිටි බෑන්ක් එන්.ඒ.
6. කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
7. ඩොයිෂ් බෑන්ක් ඒජී
8. ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී
9. හබීබ් බෑන්ක් ලිමිටඩ්
10. හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී
11. අයිසීඅයිසීඅයි බෑන්ක් ලිමිටඩ්
12. ඉන්දියන් බෑන්ක්
13. ඉන්දියන් ඕවර්සීස් බෑන්ක්
14. එම්සීබී බෑන්ක් ලිමිටඩ්
15. නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී
16. නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී
17. පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී
18. මහජන බැංකුව
19. පබ්ලික් බෑන්ක් බර්හාඩ්
20. සම්පත් බෑන්ක් පීඑල්සී
21. සෙලාන් බෑන්ක් පීඑල්සී
22. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බෑන්ක්
23. ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා
24. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ්
25. යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

26. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
27. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
28. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
29. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
30. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
31. ශ්‍රී ලංකා සේවිංග්ස් බැන්ක් ලිමිටඩ්
32. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## 3. බැංකු විද්‍යා පියෙස

බැංකු විද්‍යා පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු හස්තය වශයෙන්, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ වෘත්තිකයන්ගේ ධාරිතා ප්‍රවර්ධනය කිරීම උදෙසා පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සැලසුම් කිරීම හා මෙහෙයවීම සම්බන්ධ කාර්යභාරයෙන් බැඳී ඇත. 2015 වසර තුළ දී බැංකු විද්‍යා පියෙස මූලිකව යොමු වූයේ එමගින් පැවැත්වූ පුහුණු වැඩසටහන් සහ සපයන ලද පහසුකම් හා සේවාවන්හි ගුණාත්මකභාවය වඩාත් ඉහළ මට්ටමක් කරා ගෙන යැමටයි. බැංකු විද්‍යා පියෙස මගින් පැවැත්වූ දේශීය හා විදේශීය වැඩසටහන් තුළින් මූල්‍ය අංශය, රාජ්‍ය අංශය හා මහජනතාව විසින් ප්‍රතිලාභ අත්කර ගන්නා ලදී.

2015 වසර තුළ දී බැංකු විද්‍යා පියෙස විසින් පුහුණු පාඨමාලා සැලසුම් කරන ලද අතර, බැංකු මෙහෙයුම් හා නියාමනය, මූල්‍ය කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ග්‍රාමීය සංවර්ධනය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ භාෂා හා සන්නිවේදන කුසලතා යන පුළුල් පරාසයකින් යුතු ක්ෂේත්‍රයන්හි පාඨමාලා පවත්වන ලදී. මූල්‍ය ආයතනයවල ප්‍රධාන කටයුතු හා උපකාරක සේවා පිළිබඳ පුහුණු අවශ්‍යතා උපරිම ලෙස ආවරණය කරමින් 2015 වසර තුළ දී පුහුණු පාඨමාලා 116 ක් පැවැත්වූ අතර, එයට බැංකු විද්‍යා පියෙස තුළින් ප්‍රකාශයට පත් කරන ලද පාඨමාලා 70 ක්ද, හඳුනාගත් දැනුම් පරතරයන් පියවීම සඳහා විවිධ ආයතනවලින් කෙරෙන ඉල්ලීම් මත සැලසුම් කළ විශේෂ පාඨමාලා 35 ක්ද, ඩිප්ලෝමා පාඨමාලා හා සහතික පත්‍ර පාඨමාලා 07 ක්ද, ජාත්‍යන්තර පාඨමාලා 04 ක්ද පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය හා ආර්ථික සාක්ෂරතාව ඉහළ නැංවීමෙහි සමාජීය වගකීම ඉටු කරමින් බැංකු විද්‍යා පියෙස විසින් දැනුම ලබාදීම මුල් කොටගත් මහජනතාවට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 07 ක්ද, විශ්වවිද්‍යාල සිසුන් සඳහා වූ වැඩසටහන් 03 ක්ද, පාසැල් සිසුන් හා ආර්ථික විද්‍යා ගුරුභවතුන් සඳහා වූ වැඩසටහන් 13 ක්ද පවත්වන ලදී. පුහුණු වැඩසටහන් සඳහා විදේශීය අයදුම්කරුවන් 115 ක්ද ඇතුළුව සහභාගී වූ මුළු පුහුණුවන්නන් ගණන 4,838 ක් විය. එමෙන්ම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරණ සිසුන් සඳහා සැලසුම් කළ 'තක්ෂිලාව' (Thakshilawa) සහ 'අරිවූට්රු' (Ariwootroo) යන රූපවාහිනී වැඩසටහන් මාලාවන් දෙකක් සිංහල හා දමිල මාධ්‍යයේ විකාශනය කිරීමේ කටයුතු 2015 තුළ දී බැංකු විද්‍යා පියෙස මගින් සම්බන්ධීකරණය කරන ලදී.

බැංකු විද්‍යා පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ පළාත් කාර්යාල මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් කාර්යාල සමඟ ඒකාබද්ධව ප්‍රාදේශීය මට්ටමින් ද වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. 2015 වසර තුළ දී, ප්‍රධාන බැංකු කටයුතුවල සිට උපකාරක සේවා දක්වා විෂයන් ආවරණය කරමින් එවැනි පාඨමාලා 09 ක් පවත්වන ලදී.

ශ්‍රී ලංකාව තුළ හා එතෙර සීමාවන්හි දැනුම උත්පාදනය හා බෙදා දීමේ කේන්ද්‍රස්ථානය වීමේ මධ්‍යකාලීන අරමුණ ඇතිව, බැංකු විද්‍යා පියෙස මගින් 2015 වසර අවසාන භාගයේ දී සිදු කරන ලද පුහුණු අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණයෙන් සොයා ගැනීම් ද පදනම් කර ගනිමින් 2016 වසර සඳහා පාඨමාලා ගණනාවක් සැලසුම් කරන ලදී.

## 4. සන්නිවේදන

2015 වර්ෂයේදී ද සන්නිවේදන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධානතම අරමුණු වන ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව රැකගැනීමෙහි ලා දායක විය. විවිධ අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන ප්‍රවිෂ්ටයන්, මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය මගින් එම අරමුණු ඉටුකර ගත හැකි විය.

### බාහිර සන්නිවේදනය

මහ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය වන www.cbsl.gov.lk ප්‍රධාන සන්නිවේදන බිහිදොර වනවා මෙන්ම එය මහ බැංකු කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රධාන සන්නිවේදන මූලාශ්‍රය වශයෙන් ද ජනප්‍රියත්වයක් හිමිකර ගෙන ඇත. 2014 වසරට සාපේක්ෂව 2015 වසර තුළදී වෙබ් අඩවිය වෙත පිවිසීම් ප්‍රමාණය සියයට 67කින් වර්ධනය වීම එයට සාක්ෂි දරයි. අපගේ විද්‍යුත් තැපැල් සේවාව සහ කෙටි පණිවුඩ සේවාව හරහා තොරතුරු ලබාගැනීමේ වර්ධනය පහත වගුවෙන් දැක්වේ.

**II-2 සංඛ්‍යා සටහන** — **බාහිර සන්නිවේදන ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු**

| මාධ්‍යය | 2014 | 2015 |
|---|---|---|
| මහ බැංකු වෙබ් අඩවිය වෙත පිවිසීම් | මිලියන 89.6 | මිලියන 145.18 |
| ෆේස්බුක් | ෆේස්බුක් පෝස්ට් 567 | ෆේස්බුක් පෝස්ට් 524 |
| ට්විටර් | ට්වීට්ස් 567 | ට්වීට්ස් 524 |
| යූ ටියුබ් | වීඩියෝ 51 | වීඩියෝ 33 |
| විද්‍යුත් තැපැල් මගින් දැනුම් දීමේ සේවාවන් | 1,800 (වර්ෂය අවසානයේ) | 2,392 (වර්ෂය අවසානයේ) |
| කෙටි පණිවුඩ සේවාව මගින් දැනුම් දීමේ සේවාවන් | 913 | 1,073 |

සන්නිවේදන දෙපාර්තමේන්තුව සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යයන් හරහා ද දිගින් දිගටම තොරතුරු බෙදා හැරීමේ නිරත විය. පුවත්පත් නිවේදන 1,529ක් (මුදල් ප්‍රතිපත්ති විවරණ, විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය, උද්ධමනය ආදී ප්‍රධානතම නිවේදන 187 ක් ඇතුළුව) ගැසට් නිවේදන 23ක් සහ දැන්වීම් 100ක් (මුදල් ගෙවා පළ කරන ලද දැන්වීම් ද ඇතුළුව) 2015 වර්ෂයේ දී සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලදී.

මහ බැංකුවට අදාළ වැදගත් ප්‍රතිපත්තිමය තීරණ දැනුම් දීම උදෙසා මාධ්‍ය දැනුම්වත් කිරීම් නවයක් 2015 වසර තුළ දී පවත්වනු ලැබීය. මීට අමතරව මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් මිය ගිය පුද්ගලයින් සැමරීම උදෙසා පැවැත්වූ 19 වන අනුස්මරණ වැඩසටහන් මාලාව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ 65 වන සාංවත්සරික සැමරුම අලළා ඉන්දියානු මහ බැංකුවේ අධිපති ආචාර්ය රඝුරාම් රාජන් මහතා විසින් "The Global Financial System and the Rules of the Game" යන මැයෙන් පැවැත්වූ දේශනය ආදී වැඩසටහන් රාශියක් සංවිධානය කිරීම උදෙසා සන්නිවේදන දෙපාර්තමේන්තුව සිය දායකත්වය ලබා දුනි.

තවද, ජාතික මට්ටමින් පැවැත්වෙන වැඩසටහනක් වන කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති "කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය" සඳහා 2015 වසරේ දී ද මහ බැංකුව නියෝජනය කරමින් සන්නිවේදන දෙපාර්තමේන්තුව සහභාගී විය.

### අභ්‍යන්තර සන්නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලද "CBSLdaily" අභ්‍යන්තර වෙබ් අඩවිය වෙනුවට, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කෙරුණු "මන්සල" වෙබ් අඩවිය සක්‍රීය කොට පවත්වාගෙන යෑම 2015 වසරේ දී සිදු විය. මහ බැංකුවේ නිල අභ්‍යන්තර ප්‍රවෘත්ති පත්‍රිකාව වන කවුළුවේ කලාප තුනක් නිකුත් කෙරුණි. 2015 වසරේ දී මාධ්‍ය අධීක්ෂණ අංශය විසින් කාලීන ආර්ථික තොරතුරු හා මහ බැංකුවට අදාළ පුවත් කෙරෙහි මහ බැංකු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දැනුම්වත් කිරීම උදෙසා ත්‍රෛභාෂා මාධ්‍යයෙන් පළ වන ජාතික පුවත්පත් පහළොවක පළ වූ පුවත් 3,629ක් ඔවුන් වෙත සපයන ලදී.

### මහජනයා දැනුම්වත් කිරීම

ආර්ථික සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ පුළුල් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ කාර්යයන් අතරින් ප්‍රමුඛ ස්ථානයක් ගත්තේ ය. මෙහි දී කැපී පෙනුණු අවස්ථාවක් ලෙස "ඉකෝන් අයිකන් සීසන් III" දැනුම මිනුම තරගාවලියෙහි ප්‍රථම අදියර ගෙනහැර දැක්වන්නට පුළුවන. ප්‍රථම අදියරේ දී දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි, සිංහල හා දමිළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දෙන පාසල්වල සිසු දරු දැරියන් අතර ලිඛිත පරීක්ෂණයක් පවත්වා එමගින් රූපවාහිනී මාධ්‍යය හරහා විකාශය වීමට නියමිත අන්තර් පාඨශාලීය දැනුම මිනුම තරග වටය සඳහා සිසු සිසුවියන් තෝරාගන්නා ලදී. මෙහි දී සිංහල මාධ්‍ය පාසල් 317ක් ද දමිළ මාධ්‍ය පාසල් 204ක් ද සහභාගී විය. තවද, පහත දැක්වෙන පරිදි වැඩසටහන් හා දැනුම්වත් කිරීම් වැඩසටහන් 56ක් පවත්වනු ලැබූ අතර එම වැඩසටහන් සඳහා පුද්ගලයින් 3,668ක් සහභාගී වූහ. මේ අතුරින් වැඩසටහන් 14ක් ක්‍රියාත්මක වූයේ මහ බැංකු ප්‍රධාන කාර්යාලයෙන් බැහැරවය.

**II-3 සංඛ්‍යා සටහන** **2015 වසරේ ක්‍රියාත්මක කරන ලද මහජනයා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු**

| ආයතනය | වැඩසටහන් ගණන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසල් | 44 | 3,136 |
| ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක විශ්වවිද්‍යාලය | 3 | 138 |
| විදෙස් ආරක්ෂක විශ්වවිද්‍යාල නියෝජිත පිරිස් | 3 | 56 |
| තානාපති නිලධාරීන් ලෙස නම් කෙරුණු හා විදෙස් සේවයට සම්බන්ධ නිලධාරීන් | 2 | 57 |
| පාසල් ගුරු භවතුන් | 2 | 51 |
| මුළු ගණන | 56 | 3,668 |

මීට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අධ්‍යාපනික වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කිරීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසා දෙනු ලැබූ අතර බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් දෙමළ භාෂාවෙන් පවත්වන ලද "ඇරිවුනූ" (දැනුමේ උල්පත යන අර්ථය ඇති) වැඩසටහනට සම්පත් දායකත්වය ලබා දෙන ලදී. තවද, 2015 වසර තුළ රු. මිලියන 5.54ක වටිනාකමකින් යුත් මහ බැංකු ප්‍රකාශන ප්‍රමාණයක් අලෙවි කිරීමටත් තවත් මහ බැංකු ප්‍රකාශන 21,909ක් නොමිලයේ පාසල් දරුවන් හා ගුරු භවතුන් අතර බෙදා දීමටත් සන්නිවේදන දෙපාර්තමේන්තුව සමත් විය.

### දෙමළ භාෂා පරිවර්තන සේවා

ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු ම ප්‍රකාශන දෙමළ භාෂාවෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා උර දෙමින් භාෂාත්‍රයෙන්ම තොරතුරු සැපයීමේ කටයුත්තට දෙමළ භාෂා පරිවර්තන ඒකකය තම දායකත්වය සපයන ලදී.

### බැංකුවේ වැදගත් අවස්ථා ඡායාරූපගත කිරීම

නිශ්චල ඡායාරූප සහ වීඩියෝ යන දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ මහ බැංකුවේ වැදගත් අවස්ථා ලෝකය වෙත ගෙන යෑම ඡායාරූප ඒකකයේ අරමුණ විය. එම ඒකකය විසින් අදාළ කාලය තුළ බැංකුවේ සිදු වූ වැදගත් සිදුවීම් 145ක් ආවරණය කළ අතර ඡායාරූප සංස්කරණය, මුද්‍රණය, රාමුගත කිරීම සහ ඇල්බම සැකසීම, වීඩියෝ සංස්කරණය සහ සංගත තැටි සැකසීම වැනි ඒ හා සම්බන්ධ සියලු ම සේවා වෘත්තීය මට්ටමේ ඉහළ ප්‍රමිතියකින් යුතු ව සිදු කරන ලදී.

### මුද්‍රණාලය

2015 වසර තුළ මුද්‍රණාලය විසින් මහ බැංකුවේ මුද්‍රණ කාර්යයන් 467ක කටයුතු නිමා කරන ලදී. 'News Survey', 'සටහන', 'Bulletin', 'සැඳැව', 'Provincial News', 'කවුළුව' වැනි වාර සඟරා මෙන් ම 'මූල්‍ය බුද්ධි ඒකකයේ වාර්ෂික වාර්තාව (2013 සහ 2014)' ද, මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති පී. සමරසිරි මහතා විසින් ලියන ලද 'ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති' ග්‍රන්ථයේ නැවත මුද්‍රණයක් ද, මහ බැංකුවේ සහකාර අධිපති සී. ජී. ඒ. කරුණාතිලක මහතා විසින් ලියන ලද 'ආර්ථික විද්‍යා මූලධර්ම හැඳින්වීමක්' ග්‍රන්ථයේ සිංහල සහ දෙමළ මුද්‍රණ ද, 'Staff Studies' ග්‍රන්ථයේ 44 වැනි වෙළුමේ අංක 1 සහ 2 ද, ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ග්‍රන්ථ සහ 65 වැනි සංවත්සර සමරු ප්‍රකාශනය ද මේවාට ඇතුළත් වේ. තව ද, බැංකුවට අවශ්‍ය විවිධ ආකෘති පත්‍ර, ලිපි ද්‍රව්‍ය යනාදිය මුද්‍රණය කිරීම සහ සැපයීම ද සිදු කරන ලදී.

### පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය එය සතුව ඇති පොත් 29,498ක්, වාර්තා 18,819ක්, සංගත තැටි 1,935ක් සහ වාර සඟරා පිටපත් 40,000ක එකතුවක් තුළින් බැංකු කාර්ය මණ්ඩලයට සහ ඉල්ලීම් කරන ලද බාහිර පුද්ගලයන් ට ද සිය සේවාව සපයන ලදී. එය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂයයන් පිළිබඳ දැනුම් සම්භාරයක් පහසුවෙන් පරිශීලනය කරනු පිණිස "සයන්ස්ඩිරෙක්ට්" (ScienceDirect) හා "ඉකොන්ලිට්" (EconLit) මංගත දත්ත පදනම් (online data bases) වෙත ආයතනයේ සියලුම සේවකයන්ට ප්‍රවේශ වීමේ හැකියාව තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. මෙයට අමතරව මහ බැංකුවේ කාර්යයන්ට අදාළ වන විෂයයන් පිළිබඳව මෙතෙක් මංගත දත්ත ප්‍රභව කීපයකටත් පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය දායක වී ඇත.

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය දායකත්වය ලබා ඇති දේශීය සහ විදේශීය පර්යේෂණ සඟරා සංඛ්‍යාව පිළිවෙලින් 96ක් සහ 25ක් වේ. එමඟින් "Recent Additions" (පුස්තකාලයට ලැබෙන අලුත් පොත්) "Current Contents", (වාර සඟරා පටුන) "News Alert" (දේශීය හා විදේශීය ආර්ථික, බැංකු හා මූල්‍ය තොරතුරු එකතුව) සංස්කරණය කර විද්‍යුත් ප්‍රකාශන ලෙස බැංකුවේ අභ්‍යන්තර පරිගණක ජාලය ඔස්සේ කාර්ය මණ්ඩලය වෙත බෙදා හරිනු ලැබීය. තවද, පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය මගින් බැංකුවේ අභ්‍යන්තර පරිගණක ජාලය ඔස්සේ මහ බැංකු කාර්ය මණ්ඩලය වෙත පුස්තකාල සේවා සපයන ඩිජිටල් පුස්තකාලයක් (digital library) ද පවත්වාගෙන යනු ලබයි.

මහ බැංකුවේ පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය දිවයිනේ සාමාජික පුස්තකාල 24ක් අතරේ විද්‍යුත් තැපැල මගින් තොරතුරු හුවමාරු කර ගන්නා "ශ්‍රී ලංකා ආර්ථික සහ බැංකුකරණ පුස්තකාල ජාලය" (e-BanklibnetSL) පවත්වාගෙන යයි. එසේම එය ලොව වටා මහ බැංකු පුස්තකාල අතර තොරතුරු, තොරතුරු මූලාශ්‍ර හා අත්දැකීම් හුවමාරු කරගන්නා "ජගත් මහ බැංකු තොරතුරු වෘත්තිකයන්ගේ ජාලය" (CBFAList) හි ද උද්‍යෝගිමත් සාමාජිකයෙකි.

## 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකාව තුළ නෛතික ගෙවීම් මාධ්‍ය වශයෙන් ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය මුදල් මණ්ඩලය වෙත පවරා ඇත. මුදල් මණ්ඩලය සතු මෙම ව්‍යවස්ථාපිත වගකීම සම්බන්ධ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව එහි ප්‍රධාන කාර්යයන් ලෙස, ව්‍යවහාර මුදල් නෝට්ටු මුද්‍රණය, කාසි ටංකනය, මහජන ඉල්ලුම සපුරාලීම සඳහා නෝට්ටු හා කාසි නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලැබෙන ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම, සේවා අනිසි නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම, ව්‍යවහාර මුදල් සම්බන්ධව මුදල් නීති පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝණය කිරීමේ අවස්ථා පිළිබඳව කටයුතු කිරීමට නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහයෝගය ලබා දීම සහ නිසි ලෙස භාවිතය මගින් ව්‍යවහාර මුදල්වල ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම සම්බන්ධයෙන් මහජන දැනුම්වත්භාවය ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

### 5.1 ව්‍යවහාර මුදල් නිකුතුව

#### (අ) සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

2015 වර්ෂය තුළ දී, රටෙහි ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නව මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම සහ සේවා නිසි (භාවිතයට සුදුසු) මුදල් නෝට්ටු නැවත නිකුත් කිරීම බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සිදු කරනු ලැබීය. ඒ අනුව, සංඛ්‍යා සටහන II-4 හි දක්වා ඇති පරිදි, 2015 දෙසැම්බර් 31 දිනට සංසරණයේ පැවති සමස්ථ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසිවල වටිනාකම රුපියල් බිලියන 491.1 ක් වූ අතර එය 2014 දෙසැම්බර් 31 පැවති තත්ත්වයට සාපේක්ෂව සියයට 18 ක වර්ධනයකි.

**II-4 සංඛ්‍යා සටහන** — **සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් (වර්ෂය අවසාන වන විට)**

| අයිතම | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස ප්‍රතිශතයක් (%) ලෙස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| නෝට්ටු | 287.1 | 311.2 | 332.4 | 408.8 | 482.0 | 14.8 | 8.4 | 6.8 | 23.0 | 17.9 |
| කාසි* | 5.6 | 6.3 | 6.8 | 7.5 | 9.1 | 8.9 | 13.5 | 7.5 | 10.7 | 21.3 |
| එකතුව | 292.7 | 317.5 | 339.2 | 416.3 | 491.1 | 14.7 | 8.5 | 6.8 | 22.7 | 18.0 |

*සමරු කාසි ඇතුළත් නොවේ.

#### (ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ව්‍යවහාර මුදල් නිකුතුව

2015 වර්ෂය තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට රුපියල් බිලියන 503.4 ක මුදල් නෝට්ටු සහ රුපියල් බිලියන 1.6 ක කාසි නිකුත් කරන ලදී (සංඛ්‍යා සටහන II-5).

**II-5 සංඛ්‍යා සටහන** **බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි**

| අයිතම | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2013 | 2014 | 2015 |
| නෝට්ටු | 401.9 | 431.8 | 503.4 | 13.1 | 7.4 | 16.6 |
| කාසි | 0.5 | 0.8 | 1.6 | (27.7) | 41.1 | 112.8 |
| එකතුව | 402.4 | 432.6 | 505.0 | 13.0 | 7.5 | 16.7 |

මහජනතාවගේ අවධානයට ලක් වූ කාසි හිඟය විසඳීම සඳහා වැඩිපුර කාසි නිකුත් කිරීමට ක්‍රියාමාර්ග රාශියක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 2015 වර්ෂය තුළ දී ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි මහජන මුදල් කවුළුව හරහා සහ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා කාසි නිකුත් කිරීම වැඩි කළ අතර මහජන බැංකුව සමඟ, එහි ශාඛා ජාලය හරහා දිවයින පුරා ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මහජනතාවට නිකුත් කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර හා සැසඳීමේ දී 2015 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කරන ලද කාසි ප්‍රමාණය සියයට 112.8 ක වර්ධනයක් පෙන්නුම් කළේය.

### (ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම.

ව්‍යවහාර මුදල් මෙහෙයුම්වල දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යැමේ කාර්යය සඳහා මූලික වශයෙන් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම සිදු කරන ලදී. සංඛ්‍යා සටහන II-6 හි දක්වා ඇති පරිදි, ප්‍රධාන වශයෙන්ම මෙම තැන්පතු, සේවා නිසි (භාවිතයට සුදුසු) සහ සේවා අනිසි (භාවිතයට නුසුදුසු) නෝට්ටු ලෙස දෙයාකාරයකි. පසුගිය වසර හා සසඳන විට 2015 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ එවැනි තැන්පතු ප්‍රමාණය සියයට 21.1 කින් වැඩි වී ඇත.

**II-6 සංඛ්‍යා සටහන** **බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කරන ලද ව්‍යවහාර මුදල් තැන්පතු**

| අයිතම | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2013 | 2014 | 2015 |
| නෝට්ටු | 381.0 | 354.7 | 429.6 | 15.0 | (6.9) | 21.1 |

සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කරන කාසිවල වටිනාකම ඉතා කුඩා අගයක් ගනී. නිදසුනක් ලෙස, 2015 වර්ෂය තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරන ලද කාසිවල මුළු වටිනාකම රුපියල් 266,000 ක් විය.

### (ඈ) පවිත්‍ර මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කළ සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු නැවත සංසරණය සඳහා නිකුත් කරන ලද අතර සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කරන ලදී. 2015 වර්ෂය තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුහුණත වටිනාකම රුපියල් බිලියන 16.46 ක් වන සේවා අනිසි මුදල් නෝට්ටු මිලියන 115.68 ක් විනාශ කරන ලදී.

මුදල් නෝට්ටුවල ආයු කාලය දීර්ඝ කිරීම තුළින් මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට වැය වන පිරිවැය අඩු කිරීම, අව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සඳහා නෝට්ටුවල ඇති ආරක්ෂණ සලකුණු පැහැදිලිව දැක ගැනීමට හැකි වීම, භාවිතා කිරීමට පහසු වීම සහ රටේ ජනතාව පිළිබඳ පැහැදිලි ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම උදෙසා මුදල් පරිහරණය කිරීමේ හොඳ පුරුදු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලදී. ඒ අනුව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් කළමනාකරුවන් සමඟ රැස්වීම් පවත්වමින් මුදල් නෝට්ටු තේරීමේ හා මුදල් පරිහරණ ක්‍රියාවලියට සහ කාර්යක්ෂමව මුදල් කළමනාකරණයට ඇති බාධක පිළිබඳව සාකච්ඡා කිරීම ද සිදු කරන ලදී.

### (ඉ) මුදල් හුවමාරු කවුළුව

මහජනතාවගේ අවශ්‍යතා අනුව ව්‍යවහාර මුදල් හුවමාරු කර ගැනීමට ඉඩ සලසන අරමුණින් ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි මුදල් හුවමාරු කවුළුව තවදුරටත් පවත්වා ගෙන යන ලදී. 2015 වසරේ දී රුපියල් මිලියන 1,645.3 ක් වටිනා මුදල් නෝට්ටු හා රුපියල් මිලියන 275.6 ක් වටිනා කාසි මේ හරහා හුවමාරු කරනු ලැබීය.

### (ඊ) සමරු කාසි නිකුත් කිරීම

2015 වර්ෂයේ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සමරු කාසි 4 ක් නිකුත් කරන ලදී. මෙයට ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 150 වැනි ජන්ම දින සැමරුම, අති උතුම් ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සම්ප්‍රාප්තිය (සුදතුම් පිය ශ්‍රී ලංකා ගමන - 2015) සැමරීම සහ කොළඹ මහ නගර සභාවේ 150 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් සංසරණය සඳහා භාවිතා නොකරන රු.500 සමරු කාසි 3 ක් සහ ලංකා බැංකුවෙහි 75 වෙනි සංවත්සරය සැමරීම සඳහා නිකුත් කරන ලද සංසරණය සඳහා භාවිතා කළ හැකි රු.5 සමරු කාසියක් ද ඇතුළත් වේ. තවද, සමරු අයිතම 62,168 ක ප්‍රමාණයක් කොළඹ කොටුවෙහි ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හරහා අලෙවි කරන ලදී.

## 5.2 නෝට්ටු මුද්‍රණය සහ කාසි ටංකනය කිරීම

ආර්ථිකය තුළ ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහාත්, උසස් තත්ත්වයේ නෝට්ටු සංසරණයේ යෙදවීම තහවුරු කිරීම සඳහාත්, ප්‍රමාණවත් ආරක්ෂිත මුදල් සංචිත පවත්වා ගෙන යැම සඳහාත්, 2015 වසර තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 630 ක් මුද්‍රණය කිරීමට සහ කාසි මිලියන 215 ක් ටංකනය කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලදී.

### 5.3 මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම

මුදල් මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සහ මෙවලම් සැපයීම මගින් ස්වයංක්‍රීය ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව තවදුරටත් පියවර ගන්නා ලදී. ඒ අනුව, අවම මිනිස් මැදිහත්වීමකින් යුතුව හා ආරක්ෂිතව මුදල් නෝට්ටු විනාශ කිරීම සඳහා සම්පූර්ණ ස්වයංක්‍රීය මුදල් නෝට්ටු විනාශ කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා පියවර ගන්නා ලදී.

### 5.4 නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරින්ට ලබාදුන් සහාය

ව්‍යවහාර මුදල් සම්බන්ධව මුදල් නීති පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාජ ලෙස ප්‍රතිනිර්මාණය කිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය දීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව 2015 වසර තුළ දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නයන්ට අදාළව පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් කාර්යාංශයට හා නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට අවශ්‍ය සහයෝගයන් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව ලබා දෙන ලදී. 2015 වසර තුළ දී හඳුනාගත් ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 6,410 ක් විය.

(ආ) ව්‍යාජ මුදල් නෝට්ටු සකස් කිරීම පිළිබඳව පැවති නඩු විභාගවලට අවශ්‍ය කටයුතු සඳහා අභියෝග කළ නොහැකි සාක්ෂියක් වශයෙන් අදාළ උසාවිවලට අධිපතිතුමාගේ අත්සන සහිත සහතික 192 ක් නිකුත් කෙරිණි.

(ඇ) ව්‍යාජ මුදල් සැකසීම පිළිබඳව අධිකරණ නඩු විභාගවල සාක්ෂිකරුවන් වශයෙන් නඩු විභාග 15 කට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පෙනී සිටියහ.

### 5.5 මහජනතාව දැනුම්වත් කිරීම

ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සහ මුදල් නෝට්ටු හා කාසි භාවිතයේ දී ඇති කර ගත යුතු යහපත් පුරුදු පිළිබඳව මහජන අවබෝධය වැඩිදියුණු කිරීමේ අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

(අ) පවිත්‍ර මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සහ ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු පිළිබඳව සම්මන්ත්‍රණ/වැඩමුළු 33 ක් බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ, විවිධ බලපත්‍රලාභී වාණිජ බැංකුවල, මාර්ග සංවර්ධන අධිකාරියෙහි, ජාතික ප්‍රවාහන කොමිසමෙහි සහ ජාතික පාසැල්වල දී පැවැත්වීම.

(ආ) කොටුගොඩ, බණ්ඩාරවෙල, බෙලිහුල්ඔය සහ පන්නිපිටියෙහි පවත්වන ලද ප්‍රදර්ශනවල දී ජංගම මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කිරීම.

(ඇ) 2015 වසර තුළ දී, පාසල් සිසුන්, විදේශික සංචාරකයින් සහ සාමාන්‍ය මහජනතාව ඇතුළුව 13,000 ක පමණ පිරිසක් ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් මුදල් කෞතුකාගාර නැරඹීමට පැමිණි අතර පවිත්‍ර මුදල් නෝට්ටු භාවිතය සහ ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය කිරීමේ අහිසි ප්‍රතිඵල සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ අත්පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා බෙදා හැරීම.

### 5.6 ව්‍යවහාර මුදල් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අවසර ලබාදීම

2015 වර්ෂයේ දී, දැන්වීම් සඳහා මුදල් නෝට්ටු ප්‍රතිනිර්මාණය කිරීමේ අවස්ථාවන් 3 ක් සඳහා එවැනි ප්‍රතිනිර්මාණයන් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තියට අනුකූලව අනුමැතිය ලබා දෙන ලදී.

## 6. දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාල

මුදල් නීති පනතේ 33 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව 2015 සැප්තැම්බර් මාසයේ දී රටෙහි සියලුම පළාත් ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය සහ සංවර්ධන කටයුතු සඳහා දෙපාර්තමේන්තු පහක් පිහිටුවන ලදී. ඒ අනුව, සබරගමුව, ඌව සහ මධ්‍යම යන පළාත් ආවරණය වන පරිදි කඳුරට සඳහා එක් දෙපාර්තමේන්තුවක් ද, පරිපාලන සහ මෙහෙයවීම් කටයුතුවල පහසුව සඳහා උතුරු හා නැගෙනහිර දෙපළාත සහ උතුරු මැද හා වයඹ දෙපළාත සඳහා දෙපාර්තමේන්තු දෙකක් ද, බස්නාහිර සහ දකුණු පළාත් සඳහා වෙනම දෙපාර්තමේන්තු දෙකක් ද පිහිටුවන ලදී.

මුදල් නීති පනතේ 7 වන වගන්තියට අනුව, උතුරු පළාත් සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහභාගිත්වය පුළුල් කිරීමේ අරමුණෙන්, 2015 මැයි මාසයේ දී කිලිනොච්චියේ අරිවියල්නගර්හි නව ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලදී. සංවර්ධනය සඳහා දෙනු ලබන ණය ප්‍රවර්ධනය කිරීම සහ මහ බැංකුවේ අනෙකුත් කටයුතු සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුව 2016 ජනවාරි මාසයේ දී නුවරඑළියේ ද නව ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලදී. මෙම ප්‍රාදේශීය කාර්යාලය ස්ථානගත කිරීමේ දී නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල වැවිලි අංශයේ සේවක සංකේන්ද්‍රණය සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් හා සම්බන්ධ කටයුතුවලට පහසුකම් සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඉහත කී ප්‍රාදේශීය කාර්යාල දෙකත් සමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල ගණන හතක් වූ අතර අනෙක් ප්‍රාදේශීය කාර්යාල මාතර, අනුරාධපුරය, මාතලේ, ත්‍රිකුණාමලය සහ යාපනය යන නගරවල පිහිටුවා ඇත.

මෙම ප්‍රාදේශීය කාර්යාලවල භූගෝලීය පිහිටීම මත පදනම්ව ඒවායේ කටයුතු අධීක්ෂණය කිරීම නව දෙපාර්තමේන්තුවලට පැවරී ඇත.

### 6.1 සංවර්ධන කාර්යයන්

2015 වර්ෂයේ දී මාතර, අනුරාධපුරය, මාතලේ, යාපනය, ත්‍රිකුණාමලය සහ කිලිනොච්චි යන ප්‍රාදේශීය කාර්යාල ඒවායේ පරිපාලනයට යටත් වන ප්‍රදේශවල සංවර්ධන කටයුතුවල නිරත වූ අතර එහිදී විශේෂ අවධානය යොමු කරන ලද්දේ ණය බෙදා හැරීමේ යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම මගින් මුදල් පහසුකම් නිසි වේලාවට බාධාවකින් තොරව සැපයීම තුළින් කෘෂිකර්මය, සත්වපාලනය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර අංශ ප්‍රවර්ධනය කිරීම කෙරෙහිය. වාණිජ බැංකු, සංවර්ධන ණය දෙන ආයතන සහ අනෙකුත් රාජ්‍ය නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් සංවර්ධන ව්‍යාපෘති සඳහා ණයලාභීන්ගේ සහ ණය අපේක්ෂිත පුද්ගලයින්ගේ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලයන් සහාය විය. පුහුණු වැඩ සටහන් සහ ණය වැඩමුළු පැවැත්වීම මගින් ණයලාභීන්ටත්, ග්‍රාමීය ප්‍රජා මූල සංවිධානවල සාමාජිකයින්ටත්, මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය, තාක්ෂණික දියුණුව සහ විශිෂ්ට ව්‍යවසායකත්ව පරිචයන් පිළිබඳ දැනුම ලබා දෙන ලදී. ණයලාභීන්ගේ අලෙවිකරණය පහසු කරලීම සඳහා වෙළඳපොළ සබඳතා ඇති කිරීම, ගැනුම්කරුවන්ගේ සහ විකුණුම්කරුවන්ගේ හමු පැවැත්වීම සහ උත්සව කාලවල දී වෙළඳ සල්පිල් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ද ප්‍රාදේශීය කාර්යාල විසින් සිදු කරන ලදී. විවිධ හේතු නිසා ණය වාරික ගෙවීමට අපහසු වූ ණයකරුවන් සඳහා ණය උපදේශන සේවාවන් ද සපයන ලදී. වර්ෂය තුළ දී ව්‍යවසායකයින් 7,138 කට නොයෙකුත් සේවාවන් සපයමින් ණය කඳවුරු 70 ක් පවත්වන ලදී. මූල්‍ය පහසුකම් සඳහා පිවිසුම් මග ප්‍රවර්ධනය කරමින් ව්‍යවසායකයින්ට ණය සම්බන්ධතා 1,975 ක් ගොඩනගා දෙන ලදී. එමෙන්ම, ව්‍යවසායකයින් 5,800 ක් පමණ සහභාගිවූ මූල්‍ය සාක්ෂරතාවය, නව තාක්ෂණික යෙදවුම් සහ විශිෂ්ට පරිචයන් යන ක්ෂේත්‍ර ආවරණය කරමින් වැඩ සටහන් 100 ක් පමණ මෙහෙයවන ලදී.

කඳුරට දෙපාර්තමේන්තුව සහ උතුරු මැද සහ වයඹ පළාත් දෙපාර්තමේන්තුව අදාළ පළාත් ආණ්ඩුකාරවරුන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, පළාත් රාජ්‍ය නිලධාරීන් සහ අදාළ ප්‍රදේශවල මූල්‍ය ආයතනවල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් රැස්වීම් දෙකක් පවත්වන ලදී. මෙම රැස්වීම් පැවැත්වීමේ අරමුණ වූයේ එම පළාත්වල සංවර්ධනය සඳහා මූල්‍ය සහ බැංකු පහසුකම් සැපයීම, මූල්‍ය ප්‍රවේශය වර්ධනය කිරීම සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම පිළිබඳව වූ ගැටලු හඳුනා ගැනීම හා ඒවා පිළිබඳ සාකච්ඡා කිරීමයි.

### 6.2 ප්‍රාදේශීය කටයුතු සඳහා මහ බැංකුව නියෝජනය කිරීම

අදාළ පළාත්වල මහ බැංකුවේ විවිධ වැඩ සටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මගින් ප්‍රාදේශීය වශයෙන් මහ බැංකුව නියෝජනය කිරීම ප්‍රාදේශීය කාර්යාල විසින් සිදු කරන ලදී. ඒ අනුව, පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම, නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන, තහනම් යෝජනා ක්‍රම, රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළඳපොළ, විදේශ විනිමය පාලන රෙගුලාසි ආදිය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ගුරුවරුන් සහ සිසුන් සඳහා වූ අධ්‍යාපනික වැඩසටහන් ද ඇතුළත්ව වැඩසටහන් 122 ක් රටපුරා පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා සහභාගිවූවන්ගේ ගණන 13,010 ක් විය. අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට අවශ්‍ය සේවාවන් සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද අතර ඒ අනුව, අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් 33,679 කට අවශ්‍ය සේවාවන් සැපයීමට හැකි විය. මීට අමතරව, වසර තුළ දී සේවායෝජකයන් සහ අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් සඳහා වැඩ සටහන් 12 ක් පවත්වන ලද අතර ඒවාට සහභාගිවූවන්ගේ ගණන 1,213 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පළාත් මට්ටමින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් 9 ක් ප්‍රාදේශීයව පැවැත්වීම සඳහා අවශ්‍ය සහාය ලබා දුන් අතර මෙම වැඩසටහන්වලට බස්නාහිර පළාතෙන් පිටත පිහිටුවා ඇති බැංකු ශාඛා සහ මූල්‍ය ආයතන ශාඛාවල නිලධාරීහු 440 ක් සහභාගි වූහ.

## 7. දේශීය කටයුතු

### 7.1 දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මූල්‍ය නීති පනත යටතේ පැවරී ඇති විධිවිධාන අනුව දේශීය කටයුතු දෙපාර්තමේන්තුවට කාර්යයන් කීපයක් පැවරී ඇත. ඒවා නම්, (අ) විවෘත වෙළඳ කටයුතු පවත්වා ගෙන යෑම, (ආ) වාණිජ බැංකුවල සංචිත නියාමනය, (ඇ) රජයට, රාජ්‍ය නියෝජිත ආයතන සහ රජය වෙනුවෙන් කටයුතු කරන අනෙකුත් ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතුව ලෙස ක්‍රියාකිරීම, (ඈ) රජය සඳහා තාවකාලික අත්තිකාරම් සැපයීම, (ඉ) ඍජු වෙළඳුන් සහ ඍජු සහභාගිත්ව ආයතන සඳහා ගිණුම් පවත්වා ගෙන යෑම, (ඊ) සහභාගිත්ව ආයතන සඳහා එක් දින ණය ලබාදීම, සහ (එ) අවශ්‍ය අවස්ථාවලදී, බැංකු ආයතන සමඟ ණය කටයුතුවල යෙදීමය.

### 7.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මගින් සැකසෙන නිත්‍ය පහසුකම් කොරිඩෝව තුළ, මුදල් මණ්ඩලය විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන මට්ටමක කෙටි කාලීන පොලී අනුපාතිකයන් පවත්වා ගනිමින් දෙපාර්තමේන්තුව තවදුරටත් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. අන්තර් බැංකු වෙළඳපොළ තුළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම මගින් කෙටි කාලීන පොලී අනුපාතිකයන්ගේ ස්ථාවරත්වය සහතික කිරීම පහසු විය.

තිරසාර මිල ස්ථායීතාවයක් පවත්වා ගැනීම පිණිස කෙටි කාලීන පොලී අනුපාතිකවල අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම, මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යන්නට ඇතුළත් වේ.

මෙම අරමුණ සඳහා, දෙපාර්තමේන්තුව ප්‍රධාන මූල්‍ය කටයුතු උපකරණය ලෙස විවට වෙළඳපොළ කටයුතු භාවිතා කරන ලදී. මීට අමතරව නිත්‍ය පහසුකම් සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා මගින් ද කෙටි කාලීන පොලී අනුපාතික අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කෙරිණි. සති දෙකක සංචිත ගණනය කිරීමේ හා පවත්වා ගැනීමේ කාලය මගින් ලැබුණු අතිරේක අවකාශයෙන් ලද පහසුව නිසා ඒක්ෂණ වෙළඳපොළ පොලී අනුපාතිකයන්ගේ විචල්‍යතාවයන් අවම වන පරිදි වාණිජ බැංකු සිය ද්‍රවශීල අවශ්‍යතාවය සඵලදායී ලෙස කළමනාකරණය කරන ලදී. වසර තුළ ක්‍රියාත්මක කරන ලද මුදල් ක්‍රියාමාර්ගයන් පහත දැක්වේ.

- එක් දින පොලී අනුපාතිකයන් නිත්‍ය පහසුකම් කොරිඩෝව තුළ ස්ථාවර වීම පහසු කිරීම සඳහා, 2014 සැප්තැම්බර් මස හඳුන්වාදුන් සියයට 5 ක විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම, 2015 පෙබරවාරි මස දී ඉවත් කිරීම.
- අඩු අරමුදල් පිරිවැය තුළින් ණය ප්‍රවාහයන් සහ ආයෝජන ඉහළ නංවමින් ආර්ථික ක්‍රියාකාරකම් ධෛර්යමත් කිරීමත්, පොලී අනුපාතිකයන්ගේ හැසිරීම අපේක්ෂිත ආර්ථික වර්ධන වටපිටාවට ගැලපෙන ආකාරයෙන් පවත්වා ගැනීමේත් අරමුණින් 2015 අප්‍රේල් මස දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය සියයට 6.50 සිට සියයට 6.00 දක්වාත්, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.00 සිට සියයට 7.50 දක්වාත් අඩු කරමින් සංශෝධනය කිරීම.
- මෝටර් රථ ආනයනයේ දී අධික ලෙස විදේශ විනිමය පිටතට ගලා යෑම පාලනය කිරීම සඳහා 2015 ඔක්තෝබර් 30 දින සිට 2015 දෙසැම්බර් 01 දින දක්වා එවැනි ආනයනයන් සඳහා විවෘත කළ ණයවර ලිපි (LC) මත සියයට සියයක ආන්තික මුදල් අවශ්‍යතාවන් හඳුන්වා දීම.
- ආර්ථිකයේ අනාගත උද්ධමනය ඉහළ යෑමට හේතු විය හැකි ආකාරයෙන් මුදල් සමස්තයන්ගේ අනිසි විස්තාරණය වැළැක්වීම සඳහා 2016 ජනවාරි 16 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 6.00 සිට සියයට 7.50 දක්වා, 2015 දෙසැම්බර් 30 දින වැඩි කරන ලදී.

## 7.3 වෙළඳපොළ ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම නිසා පසුගිය වසර තුළ පැවති ඉහළ අතිරික්ත සංචිත ප්‍රවණතාවය, 2015 ජනවාරි දක්වා පැවතිණි. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විදේශ විනිමය විකිණීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම සහ කල්පිරීමට පෙර පියවීම යන සාධක නිසා අතිරික්ත සංචිත මට්ටම 2015 ජනවාරි මස අග සිට 2015 අගෝස්තු මස අග දක්වා ක්‍රමයෙන් පහත වැටිණි. ඉන්පසු අතිරික්ත සංචිත මට්ටම ඉහළ ගිය මුත් පසුගිය වසරට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විදේශ විනිමය විකිණීම, භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලැබුණු විදේශ විනිමය මහ බැංකුව විසින් මිලදී ගැනීම නිසා 2015 නොවැම්බර් මස දක්වා අතිරික්ත සංචිතයන්හි විටින් විට විචලනයන් දක්නට ලැබුණි. ස්වෛරීත්ව බැඳුම්කර මගින් ලැබුණු විදේශ විනිමය මහ බැංකුව විසින් මිලදී ගැනීමත් සමඟ 2015 නොවැම්බර් මස සිට අතිරික්ත සංචිත ප්‍රමාණය ඉහළ ගොස් වසර අවසානය වන විට ඉහළ මට්ටමක පැවතුණි. එනමුත් උත්සව සමයේ කාසි හා නෝට්ටු ඉල්ලුම ඉහළ යෑමත් සමඟ අතිරික්ත සංචිතයන්හි යම් පහළ යෑමක් දක්නට ලැබුණි.

2015 අප්‍රේල් මස මැද දක්වා බරිත සාමාන්‍යය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි යම් විචලනයන් දක්නට ලැබුණි. විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හඳුන්වා දීමත් සමඟ දක්නට ලැබුණු, මාසය මුලදී ඒක්ෂණ මුදල් අනුපාතික ඉහළ ගොස් මාසයේ ඉතිරි දිනවල දී පහළ යෑමේ ප්‍රවණතාවය මෙම වසරේ මුල් මාස දෙක තුළ දී ද දක්නට ලැබුණි. විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය ඉවත් කිරීමෙන් පසුව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2015 අප්‍රේල් මස මැද භාගයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 කින් අඩු කරන තෙක්, සියයට 6.70 ක් දක්වා ඉහළ ගොස් ස්ථාවර මට්ටමක පැවතිනි. මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන්හි අඩු කිරීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද එම පදනම් අංක ප්‍රමාණයෙන්ම පහළ වැටුණ නමුත් වසරේ දෙවන භාගයේ දී වෙළඳපොළ ද්‍රවශීලතාවය පහළ වැටීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ යෑමට යම් බලපෑමක් ඇති විය. එනමුත් වසරේ දෙවන භාගයේ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පහසුකම් කොරිඩෝවේ පහළ සීමාව ආසන්නයේ පැවතුණි.

දෛනික ඒක්ෂණ වෙළඳපොළ පරිමාව රුපියල් බිලියන 0.33 සහ රුපියල් බිලියන 31.47 ත් අතර ප්‍රමාණයක වූ අතර බැංකු කිහිපයක් තමන්ගේ ණය ප්‍රසාරණයෙන් කොටසක් ඒක්ෂණ වෙළඳපොළ තුළින් මූල්‍යනය කිරීම හේතුවෙන්, එම බැංකු ඒක්ෂණ වෙළඳපොළින් නිරන්තරයෙන් ණය ගැනීම් සිදු කරන ලදී. ඒක්ෂණ වෙළඳපොළෙහි ණය ගැනීම්හි ව්‍යාප්තිය සලකා බැලූ විට එයින් සියයට 65.13 ක් බැංකු හතරක් විසින් පමණක් සිදු කර තිබුණි.

ඒක්ෂණ මුදල් අනුපාතික සමඟ සමීපව හැසිරෙන සහ ඒ සමඟ විචලනය වන වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය වෙළඳපොළෙහි පවතින බඳු හා සම්බන්ධ ගැටළු සහ ව්‍යුහාත්මක ගැටළු නිසා වරින්වර යම් විචලනයක් පෙන්නුම් කරන ලදී. ඒ වසර තුළ ඒක්ෂණ මුදල් අනුපාතික සහ වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතික අතර පරතරය පදනම් අංක 0 සහ 131 ත් අතර විචලනය විය.

පෙර වසර හා සසඳන විට, පැවැති මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අනුව මෙම වසර තුළ දී විවට වෙළඳපොළ වෙන්දේසි පවත්වන ලද්දේ අවස්ථා කිහිපයකදී පමණි. මහ බැංකුව සතුව ප්‍රමාණවත් රාජ්‍ය සුරැකුම් තිබීමත්, නිතිපතා දෛනිකව වෙන්දේසි නොපැවැත්වීමත් නිසා, රාජ්‍ය සුරැකුම් ණයට ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගිනි.

**II-1 රූප සටහන** **සමස්ත ද්‍රවශීලතාව සහ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව**




### 7.3.1 විවට වෙළඳ කටයුතු

**(අ) ද්‍රවශීලතා පුරෝකථනය**

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළේ එදිනෙදා මැදිහත් වීම තීරණය කිරීම සඳහා දෛනිකව වෙළඳපොළ ද්‍රවශීලතාවය පුරෝකථනය කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සමග කරන ලද ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හසුරුවන ලද රජයේ විදේශ ණය ලැබීම් සහ ගෙවීම්, රජය විසින් විදේශීයව සහ දේශීයව නිකුත් කරන විදේශ විනිමය බැඳුම්කර, බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් තැන්පතු සහ ආපසු ගැනීම්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙහි සිදුවන වෙනස්වීම් සහ විදේශ මුදල් වෙළඳපොළෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන මැදිහත්වීම් යනාදී සාධක මත ද්‍රවශීලතා පුරෝකථනය පාදක වේ.

**(ආ) දෛනික වෙන්දේසි**

**(i) ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

පැවති සමස්ත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ පසුගිය වසරට සාපේක්ෂව, 2015 වසරේ දී සමස්ත ද්‍රවශීලතාවයේ ක්ෂණික පසුබෑම යන හේතු නිසා ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි නොකඩවා පැවැත්වීම අවශ්‍ය නොවීය. ඒ අනුව, 2015 වසරේ දී දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි 7 ක් පමණක් පවත්වන ලදී. සාමාන්‍ය වශයෙන් දෛනිකව රුපියල් බිලියන 21.3 ක පමණ වෙන්දේසියට ඉදිරිපත් කරන ලද අතර, එයින් රුපියල් බිලියන 12.6 ක ප්‍රමාණයක් පිළිගන්නා ලදී. මෙම ප්‍රමාණය අතිරික්තයක් පැවති දිනයන්හි පැවති අතිරික්ත සංචිතයෙන් සියයට 3.3 ක ප්‍රමාණයක් විය. මෙම දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසිවල බර තබන ලද සාමාන්‍ය එළඳා අනුපාතිකය සියයට 5.91 ත් සියයට 6.14 ත් අතර පැවතිණ.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2015 වසර පුරාවටම, වෙළඳපොළ ද්‍රවශීලතාවය අතිරික්තව පැවති බැවින් ද්‍රවශීලතාවය සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදහත් වීමේ අවශ්‍යතාවය අවම විය. එනමුත්, දෛනික පොලී අනුපාතිකය ඉහළ යෑමට පැවති පීඩනය මැඩපැවැත්වීම සඳහා අවස්ථා කිහිපයක දී ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රතිවිකුණුම් වෙන්දේසි 8 ක් පැවැත් වූ අතර, එයින් රුපියල් බිලියන 5.5 ක ප්‍රමාණයක් පිළිගන්නා ලදී. දෛනික ප්‍රතිවිකුණුම් වෙන්දේසිවල බර තබන ලද සාමාන්‍ය එළඳා අනුපාතිකය සියයට 6.15 ත් සියයට 6.30 ත් අතර පැවතිණ.

**(ඇ) කෙටි කාලීන වෙන්දේසි**

**(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි**

එක් දින පියවීමේ පදනම මත, සතියක කාලයක් දක්වා ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමේ උපායමාර්ග යක් ලෙස කෙටි කාලීන වෙන්දේසි පවත්වනු ලබයි. 2015 වසරේ දී කෙටි කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි 17 ක් පමණක් පවත්වන ලදී. සාමාන්‍ය වශයෙන්, දිනකට රුපියල් බිලියන 28.2 ක් පමණ කෙටිකාලීන වෙන්දේසියකට පිරිනැමූ අතර, එයින් රුපියල් බිලියන 22.4 ක ප්‍රමාණයක් අවශෝෂණය කරගත් අතර, එහි බර තබන ලද සාමාන්‍ය එළඳා අනුපාතිකය සියයට 5.86 ත් සියයට 6.28 ත් අතර පැවතිණ.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

වෙළඳපොළ නිරන්තරවම අතිරික්ත මට්ටමක පැවතුණ බැවින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව කෙටි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නොපවත්වන ලදී.

**(ඇ) දිගුකාලීන වෙන්දේසි**

**(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි**

2015 වසරේ ජනවාරි, පෙබරවාරි සහ දෙසැම්බර් මාසවල දී පමණක් දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි 14 ක් පවත්වන ලදී. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසිවල කාලසීමාව දින 10 ත් දින 77 ත් අතර පැවතුණ ද, වෙළඳපොළ ගනුදෙනු දින 34 ට වඩා අඩු කාලයට බෙහෙවින් සීමා විය.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2015 වසරේ දී, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව කිසිදු දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසියක් නොපවත්වන ලදී.

**(ඉ) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා සිය ආයෝජන කළඹෙහි

ඇති භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත අලෙවි කිරීමට වෙන්දේසි පවත්වන ලදී. 2015 වසරෙ දී ස්ථිර පදනම මත වූ වෙන්දේසි 29 කින් අවශෝෂණය කරන ලද ප්‍රමාණයේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 128 ක් විය. සාමාන්‍ය වශයෙන් වෙන්දේසියකට රුපියල් බිලියන 5.2 ක් පිරිනැමූ අතර, වෙන්දේසියකින් රුපියල් බිලියන 4.4 ක් පිළිගන්නා ලදී.

### 7.3.2 නිත්‍ය පහසුකම්

සහභාගිත්ව ආයතන සඳහා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය පහසුකම් සැපයීම වසර පුරාම සිදු කරන ලදී. දෛනික අතිරික්ත ද්‍රවශීලතාවය නිරූපනය කරනු ලබන නිත්‍ය තැන්පතු පහසුකම්වල මුළු වටිනාකම රුපියල් බිලියන 17,990 ක් වූ අතර, එහි දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 75 ක් විය. 2015 වසරේ දී නිත්‍ය ණය පහසුකම්වල සමස්ත වටිනාකම රුපියල් බිලියන 23 ක් විය.

### 7.3.3 ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ කොන්දේසි සහ විධිවිධානවලට අනුකූලව සෑම වාණිජ බැංකුවක් විසින්ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම පදනම් කරගෙන මහ බැංකුවෙහි පවත්වාගෙන යන ජංගම ගිණුමේ අනිවාර්යයෙන් පවත්වා ගෙන යා යුතු අවම සංචිත ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ලෙස හඳුන්වනු ලැබේ. වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය වූයේ සියයට 6 කි. කෙසේ වුවද ආර්ථිකයේ ඉදිරි උද්ධමන තත්ත්වයන් උග්‍ර වීමට තුඩු දිය හැකි මුදල් සමස්තයන්ගේ අනිසි ප්‍රසාරණය වැළැක්වීමේ අරමුණින්, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 7.5 ක් දක්වා ප්‍රතිශතාංක 1.5 කින් 2016 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කිරීමට 2015 දෙසැම්බර් මස දී තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් බිලියන 52 ක පමණ අතිරික්ත ද්‍රවශීලතා ප්‍රමාණයක් මුදල් වෙළඳපොළින් 2016 වසර ආරම්භයේ දී මහ බැංකුව විසින් අවශෝෂණය කර ගන්නා ලදී.

### 7.3.4 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නෙවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, මෙම පොලී අනුපාතිකය යටතේ වාණිජ බැංකු වලට මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් මෙම වසර තුළ දී ඇති නොවුණු අතර, මෙම බැංකු අනුපාතිකය හුදෙක් ශාස්ත්‍රීය වැදගත්කමක් පමණක් දැරීය.

## 7.4 වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

### 7.4.1 මූල්‍ය ආයතනවල ගිණුම්

වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටුකරමින්, කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් හා පියවීම් පද්ධතියක් සහතික කරනු පිණිස දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් හට ජංගම ගිණුම් පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. 2015 වසර අවසානය වන විට මහ බැංකුව විසින් වාණිජ බැංකු සඳහා ගිණුම් 25 ක් ද ප්‍රාථමික වෙළඳුන් සඳහා ගිණුම් 8 ක් ද පවත්වා ගෙන යන ලදී. මෙම ගිණුම් තත්කාලීන දළ පියවුම් පදනම මත ක්‍රියාත්මක විය.

### 7.4.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටුකරමින් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු නියෝජිත ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි ගිණුම් පවත්වා ගෙන යමින් ඔවුන්ට අවශ්‍ය බැංකු පහසුකම් සපයන ලදී. 2015 වසර අවසාන වනවිට මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ එවැනි මුළු ගිණුම් සංඛ්‍යාව 59 කි. ඒ අනුව, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන් රුපියල් බිලියන 16,495.46 ක් වටිනා ගනුදෙනු 20,976 ක් සිදු කරන ලදී. එම ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 90 කට වැඩි ප්‍රතිශතයක්, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය. එමෙන්ම, 2015 වසර තුළ දී රජයේ ඉල්ලීම පරිදි එක් ගිණුමක් වසාදැමීම ද සිදු කරන ලදී.

මුදල් නීති පනතේ 89 වැනි වගන්ති ප්‍රකාරව, රජයේ ඉදිරි වසරේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව මහ බැංකුව විසින් රජයට පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබාදීමට කටයුතු කරන ලදී. 2015 වසර සඳහා රජයේ ඇස්තමේන්තුගත ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2015 වසර ආරම්භයේ දී රජයට සැපයිය හැකි වූ තාවකාලික අත්තිකාරම්වල වටිනාකම් ප්‍රමාණය 2014 වසරට සාපේක්ෂව රුපියල් බිලියන 13.1 කින් ඉහළ ගිය අතර, ඒ අනුව මුළු තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 159.4 ක් විය. එසේ වුව ද 2015 පෙබරවාරි මස දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව රජයට සැපයිය හැකි මුළු තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 153.2 ක් දක්වා අඩු විය. ඒ අනුව 2015 වසර අවසානයේ දී ලබාගත් මුළු තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 151.1 ක් වූ අතර, එය 2014 වසර අවසානයේ දී පැවතියේ රුපියල් බිලියන 143.9 ක් වශයෙනි.

එමෙන්ම, 2016 වසර සඳහා ඇස්තමේන්තු කළ රජයේ ආදායම අනුව රජයට සැපයිය හැකි මුළු තාවකාලික අත්තිකාරම් වටිනාකම රුපියල් බිලියන 185.1 ක් වූ අතර, ඒ අනුව 2016 වසර ආරම්භයේ දී, 2015 වසරට සාපේක්ෂව, රුපියල් බිලියන 31.9 ක් අමතර තාවකාලික අත්තිකාරම් වශයෙන් මහ බැංකුව විසින් රජයට සපයන ලදී.

### 7.5 එක් දින ද්‍රවශීලතා පහසුකම් සැපයීම

තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව සිදු කිරීම සහතික කිරීමට දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන වෙත දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් ලබා දෙන මෙම පහසුකම් සැපයීම, ගාස්තුවකින් තොරව සිදු කළ අතර, එකී සුරැකුම්පත්වල වර්තමාන මිල ගණන් අනුව මිල කරන ලද අතර, එම දිනය තුළ සිදු විය හැකි මිල උච්චාවචනයන් ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් ගැලපීමක් එහිදී සිදු කරන ලදී.

2015 වසර තුළ ලබාගත් මුළු එක්දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රමාණය සහ දෛනික සාමාන්‍යය, පිළිවෙළින් රුපියල් බිලියන 5,594 ක් සහ රුපියල් බිලියන 23.3 ක් විය. පසුගිය වසරේ මෙම අගයන් පිළිවෙළින් රුපියල් බිලියන 5,144 ක් සහ රුපියල් බිලියන 21.3 ක් විය.

**II-2 රූප සටහන** **2015 වසරේ දී ලබාගත් එක් දින ද්‍රවශීලතා පහසුකම්**




### 7.6 මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

මුදල් තැරැව්කරුවන් විසින් මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළවල අතරමැදි කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඔවුන් එම වෙළඳපොළ තුළ අදාළ උපකරණවල මිල ගවේෂණ ක්‍රියාවලියේ දී සැලකිය යුතු කාර්යයක් සිදු කරනු ලබයි. ඒ අනුව, ඔවුන් වෙළඳපොළ විශ්ලේෂණය සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල දී තොරතුරු ලබා ගැනීම සඳහා ඉතා වැදගත් මූලාශ්‍රයක් වේ. ආර්ථිකය තුළ ක්‍රියාත්මක වන විවිධ මූල්‍ය ආයතනවල කටයුතු නියාමනය කිරීමේ වැඩපිළිවෙළ පුළුල් කිරීම අරමුණු කරගනිමින් 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ අංක 10 (ඇ) වගන්තිය යටතේ 2013 පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2013 අංක 01 දරන මුදල් තැරැව්කාර නියාමනය නිකුත් කරන ලදී. මුදල් තැරැව්කරුවන්ගේ සමාගම් 9 ක් සඳහා 'බලය පැවරීමේ සහතික' මෙම නියාමනය අනුව 2013 දී නිකුත් කරන ලද අතර, ඒවා 'බලයලත් මුදල් තැරැව්කරුවෝ' ලෙස නම් කරන ලදී. 2015 වසර තුළ බලයලත් මුදල් තැරැව්කාර ආයතන සංඛ්‍යාව නොවෙනස්ව පැවතුණි. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වසර තුළ දී බලය ලත් මුදල් තැරැව්කාර සමාගම් 6 ක එතැන් පරීක්ෂණ පවත්වන ලද අතර, එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සමග රැස්වීම් 4 ක් පවත්වන ලදී.

**මුදල් තැරැව්කරණ සමාගම් ලැයිස්තුව**

1. බාට්ලීට් මැක්ලේයි ඇන්ඩ් රෝයි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ෆස්ට් එලයන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) ලිමිටඩ්
4. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
5. නවාරා ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (පීවීටී) එල්ටීඩී
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. ටැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විශ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

## 8. ආර්ථික පර්යේෂණ

1949 මුදල් නීති පනතේ 25 වැනි වගන්තියට අනුව, 1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන අවස්ථාවේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ආර්ථික හා සමාජ සංඛ්‍යාලේඛන සකස් කිරීම, ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලය හා අධිපතිවරයා වෙත මාර්ගෝපදේශ ලබා දීම සඳහා ආර්ථික පර්යේෂණ සිදු කිරීම මෙන්ම බැංකු හා මුදල් සහ මහජනයා උනන්දුවක් දක්වන අනෙකුත් ආර්ථික විෂයයන් පිළිබඳ මහජනතාවට තොරතුරු ලබා දීම යන කාර්යයන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඉහළ තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ බාහිර කම්පනවලට ඔරොත්තු දීමට රටට ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම යන සිය ප්‍රධාන වගකීම් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. තවද, රජයේ ආර්ථික උපදේශක ලෙස මහ බැංකුව කටයුතු කිරීමේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව නැගී එන ආර්ථික ගැටලු සහ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්බන්ධ නිර්දේශ සහ ප්‍රතිපත්ති උපදෙස් අඛණ්ඩව සැපයූ අතර, රජය විසින් දැනටමත් ක්‍රියාවට නංවා ඇති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් ඇතිවන බලපෑම විශ්ලේෂණය

කිරීමට කටයුතු කළේය. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය ව්‍යවස්ථාපිත හා අනෙකුත් ප්‍රකාශන නියමිත කාලය තුළ දී අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. එළඹෙයි සන්නිවේදන අවශ්‍යතාව ඉටු කිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදන හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම තුළින් සියලු පාර්ශවකරුවන්ට හා පොදු ජනතාවට තොරතුරු බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී. 2015 වසර තුළ දී ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කාලීන වැදගත්කමක් සහිත දේශීය, කලාපීය හා ගෝලීය ගැටලු සම්බන්ධයෙන් සවිස්තරාත්මක පර්යේෂණ සිදු කිරීමට කටයුතු කළේය.

## 8.1 ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මිල ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වාගෙන යෑමේ අරමුණ ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන්ට අනුකූල වන පරිදි, වසර ආරම්භයේ දී උද්ධමන හා මුදල් ප්‍රසාරණය සඳහා අපේක්ෂිත දිශාව ප්‍රකාශයට පත් කළ අතර ඉන් පසු තවදුරටත් ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය වන ආකාරයේ වෙනස්කම් සිදු වේ දැයි නිර්ණය කර ගැනීම සඳහා වසර පුරාම එහි ප්‍රවණතා හා වර්ධනයන් නිරීක්ෂණය කරන ලදී. නැගී එන මුදල් සහ සාර්ව ආර්ථික තත්ත්වයන් ඇගයීමට ලක් කරමින් ඉදිරි මුදල් ප්‍රතිපත්තියේ දිශාව සම්බන්ධයෙන් උචිත නිර්දේශ මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන මුදල් ප්‍රතිපත්ති කමිටුව සඳහා අවශ්‍ය කරනු ලබන ආර්ථික දත්ත සම්පාදනය කිරීම සහ විස්තරාත්මක විශ්ලේෂණ ලබා දීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මතුපිට හා මූලික උද්ධමන පුරෝකථන සම්පාදනය කරන අතරම නිමැවුම් පරතර විශ්ලේෂණය සිදු කිරීමට ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් කටයුතු කරන ලදී. මූර්ත, විදේශීය, රාජ්‍ය සහ මුදල් යන අංශවල වර්ධනයන්ගෙන් පැන නැගිය හැකි අවදානම් පිළිබඳව මෙන්ම එම වර්ධනයන් මගින් ආර්ථික වර්ධනයට හා උද්ධමනයට ඇති විය හැකි බලපෑම පිළිබඳව මුදල් මණ්ඩලය අඛණ්ඩව යාවත්කාලීන කිරීමට ද කටයුතු කරන ලදී. ඉදිරි ප්‍රතිපත්ති තීරණ ගැනීම වඩාත් ශක්තිමත් කළ හැකි ආකාරයේ ගතික අනුමානික පොදු සමතුලිතතා (Dynamic Stochastic General Equlibrium) ආකෘතියක් ශ්‍රී ලංකාව සඳහා නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමට මෙරටට පැමිණි අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහයක කණ්ඩායම සම්බන්ධීකරණ කිරීමේ කටයුතු ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. පරිගණක මත පදනම් වූ ක්‍රියාකාරකම් සහ ආකෘති සම්බන්ධ වූ මාතෘකා පිළිබඳව කරනු ලැබූ සාකච්ඡා මාලාවක් උපයෝගී කර ගනිමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සමඟ ආකෘති නිර්මාණය කිරීම සහ පුරෝකථනය කිරීම පිළිබඳව, මෙම කණ්ඩායම කටයුතු කරන ලද අතර පුද්ගල ආකෘති අංග සහ අවශ්‍ය කරන ශක්‍යතා හා දක්ෂතා ගොඩනගා ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් පිළිබඳව ද කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කරන ලදී. එම තාක්ෂණික සහයක කණ්ඩායම, 2016 පෙබරවාරි මාසයේ දී දෙවන වරට ද ශ්‍රී ලංකාවට පැමිණියේය. තවද ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය වැඩසටහනක් සකස් කර ගැනීමට සහ ණය තිරසාරව පවත්වාගෙන යෑමේ විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා අභ්‍යන්තර කමිටු දෙකක් පත් කරන ලදී. මෙම විශ්ලේෂණයට අදාළ මූලික කටයුතු වසර තුළ දී සම්පූර්ණ කර ඇත. තවද, 2014 මැයි මාසයේ දී හඳුන්වා දුන් නව ණය හා තැන්පතුවලට අදාළ බරිත සාමාන්‍ය පොලී අනුපාතික ගණනය කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් කටයුතු කළේය. මූලික කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය දර්ශකයක් ද සම්පාදනය කරනු ලැබූ අතර එය දෙපාර්තමේන්තුව තුළ දී පවත්වනු ලැබූ දේශනයක දී කාර්යය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මේ අතර, වර්ෂය තුළ දී දාම බරිත විධි ක්‍රමය (Chain Weighted Methodology) මත පදනම් වූ කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය සම්පාදනය කිරීමට අවශ්‍ය පසුබිම් ක්‍රියාවලිය ද සම්පූර්ණ කරන ලදී.

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව මුදල් මණ්ඩලයේ තීරණ පුවත්පත් නිවේදන මගින් වෙළඳපොළ වෙත දැනුම් දෙන ලදී. උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමට සහ ප්‍රතිපත්ති පිළිබඳ විශ්වසනීයත්වය පවත්වාගෙන යන අතරතුර මහජන විශ්වාසය ගොඩනැංවීම සඳහා ප්‍රතිපත්තිවල තාර්කිකත්වය සන්නිවේදනය කිරීමට මෙම පුවත්පත් නිවේදන උපකාරී විය. වසර හතකට වඩා වැඩි කාලයක් අඛණ්ඩව තනි අගයක උද්ධමනය පවත්වා ගෙන යෑමෙන් සාපෙක්ෂ වශයෙන් පොලී අනුපාතික අඩු මට්ටමක පවත්වාගැනීමට හැකි වූ අතර එමගින් පෞද්ගලික අංශයට ණය ගලා යෑම තහවුරු කිරීම තුළින් රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය දිරිගැන්වීම් ලබා දීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද ප්‍රතිපත්ති නිර්දේශ හා එම ප්‍රතිපත්ති නිසි කලට ක්‍රියාත්මක කිරීම උපකාරී විය.

## 8.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

රටෙහි විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වීම පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ සංවර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ඇගයීම සිදු කරන ලදී. ගෙවුම් තුලනයේ මාසික වෙනස්වීම් සහ විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත මෙන්ම විශ්ලේෂණ, මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත සපයන ලද අතර එමගින් යෝග්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමට පහසුකම් සලසන ලදී. වසර තුළ දී රජය විසින් ගනු ලැබූ විදේශීය ණය 23 ක් සඳහා වූ මූල්‍යමය බලපෑම අගයන ලද අතර, අමාත්‍යාංශ විසින් එවන ලද සහනදායී නොවන ණය කොන්දේසි යටතේ ලබා ගන්නා වූ ණය යෝජනා 5 ක් සම්බන්ධව නිරීක්ෂණ, කැබිනට් මණ්ඩලය මගින් පත් කළ ස්ථාවර සමාලෝචන කමිටුවෙහි (SCARC) අවශ්‍යතාවය යටතේ ලබා දෙන ලදී. විදේශීය සංචිත සඳහා වූ ප්‍රශස්ත මට්ටම හඳුනා ගැනීම සඳහා සංකල්පමය පත්‍රිකාවක් සහ විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීමේ දී ඇති වූ නව වෙනස්කම් සහ වැඩිදියුණු කිරීම් ඇතුළත් අත්පොතක් සකස් කරන ලද අතර එය 2016 වසරේ දී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

2015 වසරේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය සහ ප්‍රසිද්ධ කිරීම තවදුරටත් වැඩිදියුණු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2013 සහ 2014 වසරවලදී හඳුන්වා දුන් පරිදි ගෙවුම් තුලනය පිළිබඳ අත්පොතෙහි හයවන සංස්කරණයට අනුව (BPM6) කාර්තුමය පදනම මත ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සහ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම සහ විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුවට ඉදිරිපත් කිරීම, වාර්ෂික පදනම මත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණයට (CDIS) දායක වීම සහ මාසිකව ජාත්‍යන්තර සංචිත දත්ත සටහන (RDT) ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. මෙම නව සංවර්ධනයන් සමඟ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂිත දත්ත ප්‍රචාරණ සම්මතයට (SDDS) පිවිසීම සඳහා වූ විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්බන්ධයෙන් සියලු අවශ්‍යතා සපුරා තිබේ. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශයෙහි සමාගම් 1,200 ක පමණ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු රැස් කෙරෙන ජාත්‍යන්තර ආයෝජන පිළිබඳ වාර්ෂික සමීක්ෂණය, විදේශ සේවා නියුක්තිකයින්ගේ විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් පිළිබඳ වූ මාසික සමීක්ෂණය, විදේශීය ණය පිළිබඳ වූ කාර්තුමය සමීක්ෂණය සහ සේවා අංශය සඳහා වූ සමීක්ෂණ යනාදී සමීක්ෂණ කිහිපයක් අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සඳහා සංචාරක පරිවාර ගිණුම් (TSA) පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර වසර තුළ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් සමඟ ඒ පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී.

## 8.3 දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබාදීම

දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබාදීම සම්බන්ධයෙන් ගත්කල, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී සලකා බැලිය යුතු අංශ අවධාරණය කරමින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන පත්‍රිකා ගණනාවක් කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී. පෙර වසරවල දී මෙන්ම, ආර්ථිකය පිළිබඳ රහස්‍ය විස්තරාත්මක විශ්ලේෂණයක් සහ අයවැය ලේඛනය සකස් කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාට වැදගත් වන ප්‍රතිපත්ති යෝජනාවලියක් ඇතුළත් සැප්තැම්බර් 15 වාර්තාව මුදල් නීති පනතේ අංක 116 (1) වගන්තිය පරිදි මුදල් අමාත්‍යවරයා වෙත භාර දෙන ලදී. මීට අමතරව, මැදි කාලීනව රටේ අයවැය තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය වන විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් විවිධ වාර්තා ද ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනතේ අංක 64 (2) හා (3) වගන්ති යටතේ වන අවශ්‍යතාව පරිදි ආර්ථික සංවර්ධනයට සහ දේශීය මුදල් හා මිල ස්ථායීතාව කෙරෙහි ඇති විය හැකි අවදානම් අවධාරණය කරමින් සකස් කළ වාර්තා 4 ක් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. වසර තුළ දී රජය විසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද විවිධ විෂයයන් සඳහා නිරීක්ෂණ සපයන ලදී. වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මහ බැංකුව තුළ මෙන්ම බාහිර ආයතනවල කමිටු සහ මණ්ඩල සඳහා තම දායකත්වය ලබා දෙන ලදී. බාහිර කමිටු අතර ජාතික දත්ත කමිටුව, සාක්ෂි මත පදනම්ව තීරණ ගැනීම සඳහා වන ජාතික තොරතුරු කමිටුව, මධ්‍යම පාන්තික කුටුම්භ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන අධ්‍යයන කණ්ඩායම, ගිවිසුම් කාල නිම වූ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගේ වලංගු කාලසීමාව දීර්ඝ කිරීම විශ්ලේෂණය කිරීම සඳහා වන තාක්ෂණික ආර්ථික උප කමිටුව, පාර්ශවයන්ට විවෘත වූ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේ කමිටුව, ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමේ සමාලෝචන කමිටුව, සංචාරක පරිවාර ගිණුම් පද්ධතිය වැඩිදියුණු කිරීමේ කමිටුව සහ රාජ්‍ය මූල්‍ය දත්ත සම්බන්ධීකරණ කමිටුව යනාදිය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නියෝජනය කරන ලද බාහිර කමිටුවලට ඇතුළත් වේ. තවද, නිලධාරීන් දෙදෙනෙක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි මණ්ඩල සාමාජිකයින් ලෙස කටයුතු කර ඇත. මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් සම්බන්ධීකරණය කිරීමට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, මූල්‍ය අංශ ස්ථායීතා කමිටුව සහ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව වැනි මහ බැංකුවේ විවිධ අභ්‍යන්තර කමිටු සඳහා ද තම දායකත්වය ලබා දෙන ලදී.

## 8.4. ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශන නියමිත වේලාවට ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් වාර්තා සකස් කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මූලික වගකීමකි. අනෙකුත් දෙපාර්තමේන්තුවල ද සහාය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසරවල දී මෙන්ම 2014 වසර සඳහා ද භාෂා ත්‍රිත්වයෙන්ම වාර්ෂික වාර්තාව සකස් කර නියමිත කාල පරාසය තුළ දී ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, 2015 නොවැම්බර් මාසයේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් "මෑත කාලීන ආර්ථික ප්‍රවණතා: 2015 සුවිශේෂී සිදුවීම් සහ 2016 අපේක්ෂාවන්" යන මධ්‍ය වාර්ෂික ආර්ථික සමාලෝචන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

පොදු මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ආර්ථිකයේ විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳව වැදගත් ආර්ථික දත්ත සහ තොරතුරු බෙදා හැරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම් අතුරින් එකකි. මෙම අවශ්‍යතාවය සපුරාලමින්, ආර්ථිකයේ නවතම සංවර්ධනයන් සන්නිවේදනය කිරීමට සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්ගේ විනිවිදභාවය වර්ධනය කිරීම සඳහා විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පුවත්පත් නිවේදන 11 ක් හා මුදල් අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පුවත්පත් නිවේදන 12 ක් නිකුත් කරන ලදී.

තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් වසර තුළ දී මාසික විවරණිකා මෙන්ම අනෙකුත් ආර්ථික හා මූල්‍ය දර්ශක දිනපතා, සතිපතා, මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද අතර තොරතුරු ලබා දීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ප්‍රයෝජනවත් ආර්ථික හා මූල්‍ය තොරතුරු ඇතුළත් සාර්ව ආර්ථික ප්‍රස්ථාර ගොනුව භාෂා ත්‍රිත්වයෙන් ම අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මේ අතර, මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "2015 සහ ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙරදැක්ම" 2015 ජනවාරි 2 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී.

## 8.5 ප්‍රතිපත්තිමය පර්යේෂණවල නිරත වීම හා කාලීන ප්‍රශ්න පිළිබඳව මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීම

මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට දූරදර්ශී මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සවිස්තරාත්මක ආර්ථික හා මුදල් විශ්ලේෂණ පිළියෙල කිරීමේ කටයුතුවල අඛණ්ඩව නිරත විය. ලෝක ආර්ථිකයේ සංවර්ධනයන් හා එමගින් දේශීය ආර්ථිකයට වන බලපෑම, ඉල්ලුම් හා සැපයුම් අංශයේ විශ්ලේෂණයන් ඇතුළත්ව උද්ධමනය වෙනස්වීම්, ප්‍රධාන සාර්ව ආර්ථික අංශවල සංවර්ධනයන් හා ගැටලු සහ ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළවල වර්ධනයන් පිළිබඳ විශ්ලේෂණයන් අඛණ්ඩව ලබා දීම තුළින්, ආර්ථිකයේ තත්ත්වය පිළිබඳව මුදල් ප්‍රතිපත්ති කමිටුව යාවත්කාලීන කිරීමෙන් මුදල් මණ්ඩලයට මුදල් ප්‍රතිපත්ති නිර්දේශයන් ලබා දීම සඳහා පහසුකම් සපයන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ හා දැනුම බෙදා ගැනීම සඳහා ස්ථාපිත කරන ලද පර්යේෂණ උපදේශක මණ්ඩලය 2015 වසර තුළ දී ද එහි කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පර්යේෂණ හැකියාවන් ඉහළ නැංවීම සඳහා පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව වැඩමුළුවක් සාර්ථකව පවත්වා නිම කරන ලදී. මෙම වැඩමුළුවට සහභාගි වූ නිලධාරීන් සඳහා පර්යේෂණ සිදු කිරීමට මඟපෙන්වීම හා පර්යේෂණ පත්‍රිකා ලිවීම සඳහා සහාය වීම පිණිස අධීක්ෂකයින් පත් කරන ලදී. සම්පූර්ණ කරන ලද පර්යේෂණ පත්‍රිකා 2016 වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සම්මන්ත්‍රණ මාලාව තුළින් සාකච්ඡා කිරීමට හා එයට අනුරූපීව ප්‍රකාශයට පත්කිරීමට නියමිතය. 2012 වසරේ දී පිහිටුවන ලද සාර්ව ආර්ථික ආකෘතිකරණ ඒකකය (Macroeconomic Modelling Unit) මගින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පර්යේෂණ කටයුතුවල නියැලීම සඳහා තාක්ෂණ මෘදුකාංග ලබාදීම හා පර්යේෂණ සඳහා හිතකර පරිසරයක් ලබා දීම සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකුගේ පර්යේෂණ පත්‍රිකා ද ඇතුළත් කරමින් මහ බැංකුවේ පර්යේෂණ ප්‍රකාශනය වන මාණ්ඩලික පත්‍රිකා 44 වන කලාපය ප්‍රකාශයට පත් කරන ලදී. තවද "ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය" පිළිබඳව අධ්‍යයන ග්‍රන්ථය කෙටුම්පත් කර ඇති අතර එය 2016 වසර තුළ දී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක් තුර්කියේ පැවති ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයකට සිය පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළාය. නිලධාරීන් දෙදෙනෙක් අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN) විසින් සංවිධානය කරන ලද "උච්චාවචනයන් සමඟ ජීවත් වීම" සහ "අග්නිදිග ආසියානු මහබැංකු ආර්ථිකයන්හි මුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය" යන මැයෙන් පැවැත්වූ පර්යේෂණ වැඩමුළු දෙකකට සහභාගි වූ අතර එම වැඩමුළුවල අවශ්‍යතාවය අනුව පර්යේෂණ පත්‍රිකා සකස් කර නිම කරන ලදී. වසර තුළ දී කාලීන ආර්ථික ගැටලු පිළිබඳ දැනුම වැඩිදියුණු කර හුවමාරු කර ගැනීමේ අරමුණෙන් යුතුව දෙපාර්තමේන්තුව තුළ සම්මන්ත්‍රණ 16 ක් පවත්වන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් දෙපාර්තමේන්තුව සහ පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව විවිධ ක්ෂේත්‍රයන්හි වෘත්තීයවේදීන්ට ඇරයුම් කර ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් බැංකු නිලධාරීන් හා බෙදා ගැනීම සඳහා මාසික ආර්ථික සම්මන්ත්‍රණ මාලාව සංවිධානය කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුව තුළ හා ඉන් පිටත ආර්ථිකය පිළිබඳ දැනුම වර්ධනය කිරීමට එහි කාර්යමණ්ඩලය සතු ප්‍රවීණත්වය බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බැංකු විදු පියෙස මෙන්ම විශ්ව විද්‍යාල, පාසල් වැනි අධ්‍යාපනික ආයතනවල සහ වෙනත් විවිධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල සම්පත්දායකයින් ලෙස කටයුතු කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බැංකුව වෙත පැමිණි දෙස් විදෙස් නියෝජිතයන්ට මහ බැංකු කටයුතු සහ සාර්ව ආර්ථික සංවර්ධනයන් පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා සැකසීමට අඛණ්ඩව සහාය ලබා දුණි. ඒ අනුව, 2015 වසර තුළ දී පර්යේෂණ පත්‍රිකා 17 ක් සහ පර්යේෂණ යෝජනා 29 ක් ඇගයීමට ලක් කර ඇත. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙක් උසස් පෙළ සිසුන්ගේ ප්‍රයෝජනය උදෙසා "තක්ෂිලාව" අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහනට සම්පත්දායකයින් ලෙස තම සේවය ලබා දුන් අතර, ඊට සමගාමීව පළමුවරට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන් "අරිවූට්රු" (Arivootru) නමින් දෙමළ මාධ්‍යයෙන් වැඩසටහනක් විකාශනය විය. තවද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් පවත්වනු ලැබූ "අන්තර් බැංකු ප්‍රශ්න විචාරාත්මක තරගාවලිය" සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහාය විය.

වත්මන් පර්යේෂණ තේමා පිළිබඳ උනන්දුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව මහබැංකුකරණය සම්බන්ධයෙන් වූ කරුණු ගැන මෑතකාලීන න්‍යායාත්මක හා ආනුභවික අධ්‍යයනයන් සඳහා පර්යේෂකයන්ට අවස්ථාවක් සලසා දෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව අටවන වසරටත් ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සාර්ථකව සංවිධානය කරන ලදී. මෙම සමුළුව "ගෝලීය ආර්ථික අභියෝග සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි වන බලපෑම" යන පුළුල් තේමාව යටතේ පවත්වන ලදී. අධ්‍යාපනික ආයතන, මහ බැංකු, රාජ්‍ය ආයතන, ප්‍රතිපත්ති සම්පාදන ආයතන සහ පර්යේෂණ ආයතනවල සාමාජිකයින් එකට එක් කරනු ලබන ජාත්‍යන්තර සමුළුවක් ලෙස කලාපය තුළ ජනප්‍රියතාව ඉහළ යෑමක් පෙන්නුම් කරමින් 2015 වසරේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව වෙත පර්යේෂණ යෝජනාවලි 100 කට අධික ප්‍රමාණයක් ලැබුණි. පරීක්ෂාකාරී හා දැඩි නිරීක්ෂණ ක්‍රියාවලියකින් පසුව ප්‍රංශය, පෘතුගාලය, නෙදර්ලන්තය සහ ඉන්දියාව නියෝජනය කරමින් විවිධ ආයතනයන්හි පර්යේෂකයන් මෙන්ම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂකයන් තිදෙනෙක් විසින් සමුළුවේ දී මුදල් ප්‍රතිපත්තිය සහ සාර්ව ආර්ථික ගැටලු මෙන්ම මූල්‍ය අංශයේ ගැටලු සම්බන්ධයෙන් වූ පර්යේෂණ පත්‍රිකා අටක් ඉදිරිපත් කරන ලදී. මේ වසරේ සමුළුවේ දී ඉදිරිපත් කෙරුණු හොඳම පර්යේෂණ පත්‍රිකාවට ඩී.එස්. විජේසිංහ අනුස්මරණ තිළිණ ප්‍රදානය ලබා දුණි. ඒ අතරම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දී පවත්වන ලද ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ සම්මන්ත්‍රණ පත්‍රිකා ප්‍රකාශයට පත් කරන ලදී.

### 8.6 ජාත්‍යන්තර සංවිධාන සමග පවත්නා වූ සබඳතාව ශක්තිමත් කිරීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුව සහ රජය වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය, නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA), සහ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC) වැනි ජාත්‍යන්තර බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන සමග සබඳතා අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයට සහාය ලබා දෙන ලදී. සාර්ක් මූල්‍ය ජාලයේ කණ්ඩායම් රැස්වීම, සාර්ක් මූල්‍ය ජාලයේ අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය, සාර්ක් මූල්‍ය ජාලයේ සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම සහ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායම් රැස්වීම වැනි සාර්ක් මූල්‍ය ක්‍රියාකාරකම්වලදී කලාපීය මහ බැංකුවල සම්බන්ධීකාරකවරුන් සමඟ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධීකරණ කටයුතු සඳහා දායක විය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සාර්ක් මූල්‍ය ජාලය කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන් සඳහා පුහුණු හා හුරුවීමේ වැඩසටහන් ගණනාවක් සම්බන්ධීකරණය කරන ලද අතර සාර්ක් මූල්‍ය දත්ත ගබඩාව වෙනුවෙන් දත්ත, තොරතුරු සහ ලියවිලි මෙන්ම අර්ධ වාර්ෂික විද්‍යුත් ප්‍රවෘත්ති පත්‍රිකා හා අනෙකුත් සාර්ක් මූල්‍ය වාර්තා ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ IV වන වගන්තිය යටතේ වන විශේෂ මෙහෙයුම සහ සිව්වන පසු වැඩසටහන් අධීක්ෂණ සාකච්ඡා මෙහෙයුම, විශේෂ දත්ත සම්මත ප්‍රකාශන ක්‍රමය පිළිබඳ මෙහෙයුම, රාජ්‍ය මූල්‍ය දත්ත පිළිබඳ මෙහෙයුම, මුදල් සංඛ්‍යා දත්ත මෙහෙයුම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දකුණු ආසියානු කලාපීය පුහුණු හා තාක්ෂණික සහාය මධ්‍යස්ථානය විසින් සිදු කළ මෙහෙයුම ඇතුළත්ව ජාත්‍යන්තර ආයතනවල නියෝජිතයන්ගේ පැමිණීම් සඳහා පහසුකම් සලසන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති සංවාදවල නිරත වෙමින් ජාත්‍යන්තර රැස්වීම්, සංසද සහ සම්මන්ත්‍රණවලදී මහ බැංකුව නියෝජනය කරන ලදී. මේ අතර ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් "සේවා වෙළඳාම සම්බන්ධ විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත වැඩිදියුණු කිරීම" පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවක් සංවිධානය කළ අතර විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගන්නා ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර සංවිධානවලට මෙන්ම ජාත්‍යන්තර ආයෝජකයන්, ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන හා උපදේශකයින්, තානාපතිවරුන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සඳහා නිතිපතා ආර්ථික දත්ත යාවත්කාලීන කිරීම් සහ සාර්ව ආර්ථික සංඛ්‍යා දත්ත ලබාදීම සිදු කරන ලදී. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීප අධීක්ෂණය යටතේ පැවැත්වූ සාර්ථක අත්හදා බැලීමේ ක්‍රියාවලියකින් පසුව ශ්‍රී ලංකාව සාමාන්‍ය දත්ත ප්‍රකාශන සම්මතයේ සිට 2015 නොවැම්බර් මාසයෙන් පසු විශේෂ දත්ත සම්මත ප්‍රකාශන ක්‍රමයට පත් කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ප්‍රධාන වශයෙන්ම දත්ත සම්පාදනයේ ස්ථාවරභාවය, වැඩිදියුණු කළ දත්තවල ගුණාත්මකභාවය සහ විනිවිදභාවය හරහා විශේෂ දත්ත සම්මත ප්‍රකාශන ක්‍රමය ලබාගැනීම මගින් ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලබාගනු ඇත. ෆිච් රේටින්ස් (Fitch Ratings), ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (S & P) සහ මූඩීස් රේටින්ග්ස් සර්විසස් (Moody's Ratings Services) නම් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන තුන සමඟ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමීපව කටයුතු කළේය. තවද, 2015 වසරේ මැයි හා ඔක්තෝබර් මාසවලදී සාර්ථකව නිම කරන ලද හත්වන සහ අටවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු සඳහා අවශ්‍ය සියලු ප්‍රතිපත්ති පිළිබඳ විමසීම් සහ සියලු වාර්තා සැපයීම මගින් සහයෝගය ලබා දුන් අතර යාවත්කාලීන කරන ලද ආර්ථික තොරතුරු ලබාදීමට ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

# 9. සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනයන්හි සේවය කරනු ලබන සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීමේ අරමුණ පෙරදැරි කරගෙන 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ස්ථාපිත සේවක අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාමික ප්‍රතිලාභ අරමුදලයි. පනතේ විධි විධානවලට අනුව අරමුදලෙහි සියළුම පරිපාලන බලතල හා එම කාර්යයන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, අරමුදලෙහි මූල්‍ය භාරකරු ලෙස අරමුදල් කළමනාකරණයට අදාළ සියළුම බලතල, කාර්යයන් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. පනත මගින් තමන් වෙත පැවරී ඇති කාර්යභාරයන් මුදල් මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදල් (සේ.අ.අ.) දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

## 9.1. දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, පොදු ගිණුම් හා සේවායෝජක/සාමාජික ගිණුම් පවත්වා ගෙන යාම, සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම, සාමාජිකයින්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම හා පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරණ පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම යනාදිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කාර්යයන් වේ. 2015 වසරේ දී එම කාර්යයන් ඉටු කිරීමේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්ති හා නිර්දේශයන්ට අනුව කටයුතු කළ අතර කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සමග සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී.

## 9.2. කාර්යයන්හි කාර්යසාධනය

### (අ) සාමාජිකත්වය, සාමාජික ගිණුම් ශේෂ හා ප්‍රතිලාභ ගෙවීම්

අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව 2015 වසර අවසානයේ දී මිලියන 16.0 ක් වූ අතර, එය 2014 වසර අවසානයේ වූ මිලියන 15.8 හා සසඳන විට සියයට 1.3 ක ඉහළ යාමකි (සංඛ්‍යා සටහන II-7).

2015 වසර අවසානයේ දී සේ.අ. අරමුදලෙහි මුළු වටිනාකම රුපියල් බිලියන 1,664.9 ක්වූ අතර, එය 2014 වසර අවසානයේ වූ රුපියල් බිලියන 1,486.9 හා සසඳන විට සියයට 12.0 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වසර තුළ දී අරමුදල් ආයෝජනය කිරීම මගින් ඉපැයූ ආදායම සහ සාමාජික ශුද්ධ දායක මුදල් ලැබීම් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) අරමුදලේ වර්ධනයට හේතු විය. 2014 වසරේ සාමාජික පොලී ගෙවීම් ද ඇතුළු රුපියල් බිලියන 1,445.5 ක්ව පැවති සාමාජිකයන් සඳහා වූ අරමුදලෙහි මුළු වගකීම 2015 වසර අවසන් වන විට රුපියල් බිලියන 1,625.5 ක් දක්වා සියයට 12.5 කින් වර්ධනය විය (සංඛ්‍යාන සටහන II-7). ශුද්ධ දායක මුදල් ලැබීම් පසුගිය වසරට සාපේක්ෂව රුපියල් බිලියන 24.9 සිට රුපියල් බිලියන 24.7 දක්වා අඩු විය. වසර තුළ දී අරමුදලේ සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 77.8 ක මුදලක් ගෙවන ලදී. එය පෙර වසරේ ගෙවන ලද මුදල හා සසඳන විට සියයට 19.5 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ප්‍රතිලාභ ගෙවීම්වල වර්ධනයට සාමාජිකයන්ගේ ශේෂය මත වන සියයට 30 පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් වැඩසටහන ද දායක විය. අරමුදලේ ශුද්ධ ආදායම 2015 වසරේ දී රුපියල් බිලියන 156.9 ක් වූ අතර, එය 2014 වසරේ උපයන ලද රුපියල් බිලියන 150.7 හා සසඳන විට සියයට 4.1 ක වර්ධනයකි.

**II-7 සංඛ්‍යා සටහන** — **අරමුදල පිළිබඳ ප්‍රධාන දත්ත**

| අයිතමය | 2014 | 2015 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 15.8 | 16.0 | 1.3 |
| වර්තමානයේ දී දායක මුදල් එවනු ලබන ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 2.4 | 2.4 | - |
| වර්තමානයේ දායක මුදල් එවනු නොලබන ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 13.4 | 13.6 | 1.5 |
| දායක මුදල් එවනු ලබන සේවායෝජකයින් සංඛ්‍යාව | 69,683 | 72,917 | 4.6 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 90.0 | 102.5 | 13.9 |
| ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 65.1 | 77.8 | 19.5 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 127,951 | 127,107 | (0.7) |
| ශුද්ධ ආදායම (රුපියල් බිලියන) | 150.7 | 156.9 | 4.1 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 1,445.5 | 1,625.5 | 12.5 |
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 1,486.9 | 1,664.9 | 12.0 |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ආ) අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභ

**(i) ආයෝජන කළඹ :**

2015 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රුපියල් බිලියන 1,604.2 (පොත් අගයක්) ලෙස වාර්තා වූ අතර, එය 2014 වසරේ පැවති රුපියල් බිලියන 1,437.7 ට සාපේක්ෂව සියයට 11.6 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-8). අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට හා අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින්, අරමුදලේ සාමාජිකයින් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොටගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 92.7 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස්වල සියයට 5.5 ක් සහ භාරකාර සහතිකපත්, වාණිජ පත්‍රිකා සහ සාංගමික ණයකරවල සියයට 1.6 ක් ආයෝජනය කර තිබුණි. ඉතිරි සියයට 0.2 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රතිවිකුණුම් ගිවිසුම්

වැනි ඉහළ ද්‍රවශීලතාවයන් සහිත වත්කම්වල ආයෝජනය කර තිබුණි. රාජ්‍ය සුරැකුම් කල්පිරීමේ ව්‍යුහය සහ ඵලදා අනුපාතයන් සංඛ්‍යා සටහන II-9 හි දක්වා ඇත.

**II-8 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2014 | | 2015 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 1,287.5 | 89.6 | 1,487.0 | 92.7 |
| රජයේ රුපියල් ණය | 23.1 | 1.6 | - | - |
| සමාගම් කොටස් | 96.6 | 6.7 | 87.6 | 5.5 |
| සාංගමික ණය | 22.4 | 1.5 | 25.5 | 1.6 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | 8.1 | 0.6 | 4.1 | 0.2 |
| එකතුව | 1,437.7 | 100.0 | 1,604.2 | 100.0 |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-9 සංඛ්‍යා සටහන**

**2015 අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් කළඹේ කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | පරිණත වටිනාකම (රු. බිලියන) (අ) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 49.77 | 3.08 | 9.60 |
| වසර 1-2 | 181.07 | 11.22 | 10.78 |
| වසර 3 - 4 | 168.41 | 10.43 | 10.01 |
| වසර 5 ට වැඩි | 1,215.01 | 75.27 | 11.13 |
| **එකතුව** | **1,614.26** | **100.0** | **10.93** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) ආයෝජන ආදායම :**

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2015 වසරේදී රුපියල් බිලියන 171.5 ක් ලෙස සටහන් වූ අතර, එහි 2014 වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේ දී සියයට 5.1 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. (සංඛ්‍යා සටහන II-10). පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය (එය ආදායමෙන් සියයට 83.4). 2015 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 143.1 ක් වූ අතර, එය 2014 වසරේ උපයන ලද රුපියල් බිලියන 127.5 හා සැසඳීමේ දී සියයට 12.2 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. තවද, ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් 2015 වසර තුළ දී රුපියල් මිලියන 4,065.0 ක් උපයන ලද අතර, එය 2014 වසරේ දී ආදායම වූ රුපියල් මිලියන 5,598.0 සමඟ සැසඳීමේ දී සියයට 27.4 ක අඩු වීමකි. මෙම ප්‍රතිලාභයන්හි වසර තුළ උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ අන්තර්ගත වේ. කෙසේ වුවත්, වට්ටම් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර මගින් උපයන ලද ක්‍රමක්ෂය ලාභ 2014 වසරේ උපයන ලද රුපියල් බිලියන 25.9 හා සැසඳීමේ දී 2015 වසර තුළ රුපියල් බිලියන 26.6 දක්වා සියයට 2.7 කින් වැඩි විය (සංඛ්‍යාන සටහන II-10).

**II-10 සංඛ්‍යා සටහන**

**ආයෝජන මගින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2014 | | 2015 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) |
| පොලී | 127,499 | 78.1 | 143,055 | 83.4 |
| ක්‍රමක්ෂය ලාභ | 25,897 | 15.9 | 26,591 | 15.5 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 4,082 | 2.5 | 1,171 | 0.7 |
| වෙළඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/(පාඩු) | 89 | 0.1 | (394) | (0.2) |
| ප්‍රාග්ධන ලාභ/ව්‍යාපාර කොටස් | 2,277 | 1.4 | 553 | 0.3 |
| ලාභාංශ | 3,321 | 2.0 | 3,512 | 2.0 |
| ආයෝජන හානිකරණ අලාභ | - | - | (2,956) | (1.7) |
| **එකතුව** | **163,165** | **100.0** | **171,532** | **100.0** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(iii) වියදම් :**

2015 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,191 ක් වූ අතර, එය පෙර වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 1,043 හා සසඳන විට සියයට 14.2 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 2015 වසරේ දී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.69 ක් ලෙස සටහන් වූ අතර, එය 2014 වසරේ දී සියයට 0.64 ක් විය (සංඛ්‍යා සටහන II-11). අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම වසර ගණනාවක් පුරාම අරමුදලේ කැපී පෙනෙන ලක්ෂණයක් විය.

**II-11 සංඛ්‍යා සටහන**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2014 | 2015 (අ) | |
| සේවක පිරිවැය | 579 | 749 | 29.4 |
| පරිපාලන වියදම් | 421 | 397 | (5.7) |
| වෙනත් වියදම් | 43 | 45 | 4.7 |
| **එකතුව** | **1,043** | **1,191** | **14.2** |
| මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.64 | 0.69 | - |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්**

අරමුදලේ සාමාජිකයන් වෙත පොලිය ලෙස බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම 2014 වසරේ පැවති රුපියල් බිලියන 141.6 සමඟ සැසඳීමේ දී 2015 වසර අවසානයේ දී රුපියල් බිලියන 154.4 ක් විය (සංඛ්‍යා සටහන II-12).

**II-12 සංඛ්‍යා සටහන** සාමාජිකයන්ට ගෙවන ලද පොලිය

| අයිතමය | වටිනාකම (රු.මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2014 | 2015 (අ) | |
| දළ ආදායම | 163,873 | 171,855 | 4.9 |
| මුළු මෙහෙයුම් වියදම | (1,043) | (1,191) | 14.2 |
| ආදායම් බදු | (12,169) | (13,727) | 12.8 |
| වසරේ ශුද්ධ ආදායම | 150,662 | 156,937 | 4.2 |
| පෙර වසරට අදාළ ගැළපුම් | - | - | - |
| පෙර වසරේ රඳවාගත් ලාභ | 141 | 311 | 120.6 |
| වසර තුළ සිදු කළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | (3,201) | (2,833) | (11.5) |
| ලාභාංශ වෙන් කිරීම | (6,000) | - | 100 |
| සාමාජිකයන් වෙත බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළදී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 141,602 | 154,416 | 9.0 |
| සංචිතවලින්/(සංචිතවලට) මාරුකිරීම | (4,000) | - | 100 |
| සංචිතවලින්/(සංචිතවලට) මාරුකිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම | 137,602 | 154,416 | 12.2 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | (137,291) | (154,200) | 12.3 |
| රඳවාගත් ශුද්ධ ආදායම | 311 | 216 | (30.5) |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතිකය % | 10.5 | 10.5 | - |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-13 සංඛ්‍යා සටහන** සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික

| වසර | ගෙවන ලද පොලී අනුපාතිකය (%) | සඵල පොලී අනුපාතිකය (%)[1] |
|---|---|---|
| 2005 | 9.00 | 9.13 |
| 2006 | 10.10 | 10.30 |
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 | 11.00 | 11.14 |
| 2014 | 10.50 | 10.60 |
| 2015 (අ) | 10.50 | 10.57 |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

[1] සඵල පොලී අනුපාතිකය = (සාමාජිකයින්ට ගෙවූ පොලිය) / [(ආරම්භක සාමාජික ශේෂය + පොලී ගෙවීම්වලට පෙර අවසන් සාමාජික ශේෂය)/2]

## 9.3. සාමාජික සේවාවන්

### (අ) සාමාජික ගිණුම් ප්‍රකාශන

2015 වසරේ පළමු අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවායෝජකයින් මගින් සාමාජිකයන් වෙත නිකුත් කිරීම 2016 වසරේ ජනවාරි මාසයේ සිට ආරම්භ කරන ලදී. 2015 වසරේ දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන 2016 වසරේ ජූලි මාසය අවසානය වන විට නිකුත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. තවදුරටත් අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන මුද්‍රණය කිරීම සහ තැපැල් කිරීම කාර්යක්ෂමතාවය වැඩි කිරීමට අදාළ ක්‍රියාමාර්ග සමඟ බාහිර පාර්ශවයන්ට පවරා ඇත.

### (ආ) සාමාජිකයින් සඳහා වූ නිවාස ණය පහසුකම

සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) සාමාජිකයින් හට සිය ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ යෝජනා ක්‍රමයක් 1988 වසරේ දී හඳුන්වා දුන් අතර, එමගින් අරමුදලේ සාමාජිකයන් හට ඉතා වැදගත් සේවයක් සලසමින් එම ණය පහසුකම ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව හා සමුපකාර ග්‍රාමීය බැංකු යන සහභාගිත්ව ණය දෙන ආයතන මගින් 2015 වසර තුළ දී ද අඛණ්ඩව ලබා ගැනීමට හැකි විය. වසර තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 13,132 ක් අදාළ ආයතන වෙත නිකුත් කරන ලද අතර, අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 5,489 කි (සංඛ්‍යා සටහන II-14). තවද, 2014 වසරේ දී පැහැර හරින ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,522 කට ආසන්න මුදල් ප්‍රමාණයක් අදාළ සාමාජික ගිණුම් වලින් අඩුකර සහභාගීත්ව ණය දෙන ආයතන වෙත 2015 වසර තුළ දීප්‍රේෂණය කරන ලදී.

**II-14 සංඛ්‍යා සටහන** නිවාස ණය සේවාව

| වසර | නිකුත් කළ සහතිකපත් (සංඛ්‍යාව) | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 (අ) | 13,132 | 5,489 | 2,522 |
| එකතුව | **157,916** | **49,639** | **19,064** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඇ) සේ.අ.අ. ජංගම සේවා වැඩසටහන

සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි කටයුතු ඒකාබද්ධ ආකෘතියකට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම සඳහා සේ.අ.අ. කටයුතු පිළිබඳව දැනුම්වත්භාවය ඉහළ නැංවීම දෙපාර්තමේන්තුවේ

එක් ප්‍රධාන අරමුණක් වේ. ඒ අනුව, ඉහත අරමුණ ලඟාකර ගැනීමේ ප්‍රධාන යාන්ත්‍රණය වශයෙන් 2015 වසර තුළ දී ද ජංගම සේවාවන් සංවිධානය කරන ලදී.

යාපනය, කිලිනොච්චිය, සඳලංකාව හා හැටන් යන ප්‍රදේශ ඇතුළත්ව විවිධ ප්‍රදේශයන්හි සේ.අ.අ. දෙපාර්තමේන්තුව ජංගම සේවාවන් හයක් 2015 වර්ෂය තුළ දී පවත්වන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ අදාළ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනයන් හි ද සහයෝගීත්වය මත මෙම ජංගම සේවාවන් පවත්වන ලදී.

සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි ජංගම සේවාවන් තුලින් සාමාජිකයන්ට ඔවුන්ගේ ප්‍රදේශයන්හි දී හා සේවා ස්ථානයන්හි දී සාමාන්‍යයෙන් කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි සේවාවන් ලබා දීම සිදු කරනු ලැබේ. ඒ අනුව, වසර තුළ පවත්වන ලද ජංගම සේවාවන් ඔස්සේ සේ.අ.අ. සාමාජිකයන්ට හා මහජනතාවට පහත දැක්වෙන සේවාවන් ලබා දෙන ලදී.

i. සාමාජිකයින් සඳහා ශේෂ වාර්තා නිකුත් කිරීම.
ii. සාමාජික තොරතුරු හා ගිණුම් නිවැරදිව සකස් කිරීම.
iii. සාමාජිකයින්ගේ තොරතුරු නැවත ලියාපදිංචි කිරීම.
iv. කෙටි පණිවිඩ (SMS) හා අන්තර්ජාලය යටතේ තොරතුරු ලබා ගැනීම සඳහා සාමාජිකයින් දිරිමත් කිරීම.
v. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්මේන්තුවේ නිලධාරීන් විසින් සේ.අ.අ. සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සහ අනෙකුත් අදාළ සේවාවන් ලබාදීම.
vi. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සේ.අ.අ. සාමාජිකයින්ට උප්පැන්න සහතික/අනුමාන වයස් සහතික/අවලංගු වාර්තා සහ අදාළ සේවාවන් ලබා දීම.
vii. සමස්ත සේ.අ.අ. ක්‍රියා පිලිවෙළ පිළිබඳව උපදෙස් ලබාදීම.

ඊට අමතරව පෝස්ටර්, අත් පත්‍රිකා, වීඩියෝ පට සහ විවිධ ඉදිරිපත් කිරීම් වැනි සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ජංගම සේවාවන්ට සමගාමීව, සේවායෝජකයන් හා අනෙකුත් පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් සිදු කෙරුණි.

ජංගම සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීමේ අරමුණින් සෑම ජංගම සේවාවකට ප්‍රථම, අදාළ සේවායෝජකයන්, කළමනාකරුවන් හා අනෙකුත් පරිපාලන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම ද සිදු කෙරිණි.

**(ඇ) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන.**

2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනත සහ ඉන් පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් සම්මත වූ නියෝගයන් වලට අනුව, සුදුසුකම්ලාභී සාමාජිකයන් හට තම ගිණුමේ ශේෂයෙන් සියයට 30 කට නොවැඩි ප්‍රතිලාභ නිදහස් කිරීමේ වැඩසටහන 2015 ජූලි මස සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී.

ඒ අනුව,

අ) අරමුදලට වසර දහයකට නොඅඩු කාලයක් සඳහා දායක මුදල් ලැබී ඇති,

ආ) දැනට සේවයේ යෙදී සිටින (වර්තමානයේ දී අරමුදලට දායක මුදල් ලැබෙන) සහ

ඇ) තමාගේ ගිණුමේ රුපියල් ලක්ෂ තුනක අවම ශේෂයක් ඇති,

සෑම සාමාජිකයෙක්ම නිවාස කටයුත්තක් හෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා තම ගිණුම් ශේෂයෙන් සියයට 30 ප්‍රමාණයක උපරිමයකට යටත්ව සේවක අර්ථසාධක අරමුදල් පූර්ව විශ්‍රාම ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.

2015 වසර අවසානයට මෙම වැඩසටහන යටතේ, සාමාජිකයන් 10,000 ඉක්මවූ ප්‍රමාණයක් වෙත රු. බිලියන 8.5 ක් නිදහස් කර ඇත.

**(ඉ) ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය**

සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් පරිසරය අවම ලේඛන සහිත විද්‍යුත් පරිසරයක් බවට පරිවර්තනය කර කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය (ISP) ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අදියර 4 කි.

i. දැනට පවත්නා ලේඛන විද්‍යුත් මාධ්‍යයට හැරවීම.
ii. ලේඛන තත්කාලීනව ඡායාස්ථගත කිරීම.
iii. විද්‍යුත් ලේඛන ගබඩාවක් ස්ථාපනය කිරීම සහ
iv. ලේඛන කළමනාකරණ පද්ධතිය දැනට පවත්නා සේ.අ.අ. පරිගණක පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම.

ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර සේ.අ.අ. දෙපාර්තමේන්තුව තුළ සැලකිය යුතු ආකාරයෙන් මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි වන පරිදි 2015 වර්ෂය තුළ දී සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

මෙහිදී, වාර්තාවල වැරදි නිවැරදි කිරීම, යාවත්කාලීන කිරීම, ඡායා පිළිබිඹුව මත සටහන් යෙදීම සහ අනෙකුත් අදාළ කාර්යයන්, ආසන්න වශයෙන් සේ.අ.අ. නිලධාරීන් 300 කට පමණ තමන්ගේ පෞද්ගලික පරිගණකය හරහා එකවර භාවිතා කළ හැකි වන පරිදි සියළුම ප්‍රධාන ලිපිගොනු වාර්තා, ''ඩී'' පෝරම සහ නැවත ලියාපදිංචි කිරීමේ වාර්තා ඡායාස්ථගත කර, ලැයිස්තුගත කර විද්‍යුත් වාර්තා කළමනාකරණ පද්ධතිය තුලට ඇතුළත් කිරීම සිදු කර ඇත.

සම්ප්‍රදායික ආකෘතියේ පැවැති සේ.අ.අ. වාර්තා කාමරය ඉලෙක්ට්‍රොනික වාර්තා බවට හැරවීම මෙම ව්‍යාපෘතියේ

පළමු අදියර තුළදී සිදු විය. මේ මගින් බෙහෝ ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කිරීම නිසා සේවක මැදිහත් වීම අවම වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය යුතු ලෙස කාලය, ඉඩකඩ හා මානව සම්පත් ඉතිරි විය.

ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම තුළින් ඇති වූ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ පද්ධති ස්වයංක්‍රීයකරණය සමඟ දෙපාර්තමේන්තුවට දියුණු තාක්ෂණය ඇතුළත් වීම මගින් ඇති වූ අවස්ථා සලකා බලා අනෙකුත් නිතර නිවැරදි කළ යුතු දෘඪ වාර්තා ද මෙම ක්‍රමයට පරිවර්තනය කිරීමේ අදහසින් ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර සේ.අ.අ. විසින් ක්‍රියාත්මක කරන ලදී. 2016 වසර තුළ දී මෙම කාර්යය පෞද්ගලික බාහිර පාර්ශවයන්ට ටෙන්ඩර් ක්‍රියාවලියක් තුළින් පැවරීමට කටයුතු කරන ලදී.

**(ඊ) පූර්ණ සේ.අ.අ. ඒකක ප්‍රාදේශීය මට්ටමෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීම.**

ප්‍රාදේශීය මට්ටමෙන් මාතර, මාතලේ, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, යාපනය, කිලිනොච්චි හා නුවරඑළිය යන ප්‍රදේශ තුළ පූර්ණ සේ.අ.අ. ඒකක 07 ක් ස්ථාපිත කර සේ.අ.අ. අදාළව සියළුම සේවාවන් ප්‍රාදේශීය මට්ටමෙන් සැපයීමට පියවර ගැනිණි. ස්වයංක්‍රීය වාර්තා කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම තුළින් මෙවැනි ප්‍රාදේශීය මෙහෙයුම් කටයුතු හඳුන්වා දීම පහසු කළේය.

සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන සාමාජික සේවාවන් ප්‍රාදේශීය වශයෙන් ලබා ගැනීම සඳහා සැලකිය යුතු ඉල්ලුමක් බිහි වී තිබෙන අතර, මෙම සේවාවන් ප්‍රාදේශීය වශයෙන් සපුරාලීම තුළින් දුෂ්කර ප්‍රදේශවල වාසය කරන සේ.අ.අ. සාමාජිකයින්ට තවදුරටත් පහසුකම් සැලසීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුව අපේක්ෂා කෙරේ. දිවයිනේ සෙසු ප්‍රදේශයන්ට මෙම සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා සේ.අ.අ. දැනටමත් සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ ජනවාරි මාසයේ නව සේ.අ.අ. ඒකකයක් නුවරඑළියේ පිහිටුවන ලදී.

**(උ) වේගවත් සහ පහසු සේවාවක් සාමාජිකයන් සඳහා නිර්මාණය කිරීම.**

සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් අයදුම්පත් සම්බන්ධව කාරණා විමසීමටත් සාමාජිකයන් සහ සේ.අ.අ. දෙපාර්තමේන්තුව අතර අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ''කෙටි පණිවිඩ සේවා'' පහසුකම වසර තුළ දී හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම 2015 වසරේ දී සාර්ථකව දියත් කරන ලදී.

මෙම සේවාව ලබා ගැනීමට බලාපොරොත්තු වන සාමාජිකයන් ඔවුන්ගේ ජංගම දුරකථන අංකය ප්‍රතිලාභ ලබා ගැනීමේ අයදුම්පත් සමඟ කම්කරු දෙපාර්තමේන්තුවට භාර දිය යුතු අතර, මෙම සේවාව තුළින් සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලියේ විවිධ අදියර පසු කිරීමේ දී සාමාජිකයන් හට අදාළ වන උපදෙස් හා නිවේදනයන් ලබාගත හැකිය.

ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලියට ගතවන කාලය අඩුවීම, ඒ පිළිබඳ විමසීම සඳහා එදිනෙදා පැමිණෙන සාමාජිකයන් අඩු වීම සහ ඉක්මණින් ගැටළු හඳුනා ගැනීම හා විසඳා ගැනීමට හැකි වීමෙන් අදාළ සියලු පාර්ශවයන්ගේ වියදම් අඩු වීම මගින් ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමත්වය වැඩි කිරීම පිණිස මෙම වැඩසටහන හඳුන්වා දී ඇත.

කුඩා හා මධ්‍යම පරිමාණ සේවායෝජකයින් (සේවකයන් 50 ට අඩු) හට දායක මුදල් ගෙවීම් කිරීමේ පහසුව ඇති කරනු පිණිස මහජන බැංකු ශාඛා මගින් දායක මුදල් චෙක්පත් භාර ගැනීමේ හා ''සී'' වාර්තා එකතු කිරීමේ පහසුකම් සලසා ඇත. මෙම වසර තුළ දී බස්නාහිර පළාතේ මහජන බැංකු ශාඛා මගින් දායක මුදල් හා ''සී'' වාර්තා එක්රැස් කිරීමේ ක්‍රමය දියත් කරන ලදී.

**(ඌ) විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය**

සාමාජික දායක මුදල් විස්තරවලට අදාල “සී” වාර්තා සහ “සී3” වාර්තා විද්‍යුත් පද්ධති භාවිතයෙන් තොරව එවීම වෙනුවට විද්‍යුත් මාධ්‍යයෙන් (e-return) එවීමට සේවායෝජකයන් උනන්දු කරවීම සඳහා සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කරන ලදී. විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. රැස්කිරීම වනාහි මුළුමනින්ම කඩදාසි රහිත විසඳුමක් වන අතර, මෙයින් පිරිවැය, ප්‍රමාද වීම් අඩු වීම සහ කාර්යක්ෂමතාවය වර්ධනය වීම මගින් සාමාජිකයන් සඳහා වඩා හොඳ සේවාවක් සැපයීමට හැකි වී ඇත. සේ.අ.අ. දායක මුදල් හා විස්තර විද්‍යුත් මාධ්‍යය මගින් සැපයීම ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීමේ දර්ශකයේ ඉලක්ක ගත ඉහළ ශ්‍රේණියක් ලඟා කර ගැනීමේ අවශ්‍යතාවයක් වන අතර, මෙම විදේශීය ආයෝජන රට තුළට ආකර්ෂණය කර ගැනීමට ද ඉවහල් වේ.

2013 වර්ෂයේ සිට, විද්‍යුත් මාධ්‍ය මගින් දායක මුදල් තොරතුරු සැපයීම සේවකයන් 50 ට වැඩි සේවායෝජකයන් සඳහා අනිවාර්ය කරන ලදී. කෙසේ වුවද, 2015 දක්වා මෙය ප්‍රායෝගිකව අනිවාර්ය කිරීමක් සිදු නොවීය. 2015 අගෝස්තු මාසයේ සිට සේවකයන් 50 ක් හෝ ඊට වැඩි සේවකයන් සිටින සේවායෝජකයන් විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් වාර්තා එවීම අනිවාර්ය වේ. සේවායෝජකයන් වෙත කාර්යක්ෂම සේවාවක් සැලසීම සඳහා සේ.අ.අ. දෙපාර්තමේන්තුව විද්‍යුත් මාධ්‍ය මගින් දායක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස ප්‍රධාන බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක් පත් කර ඇත.

**(එ) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

සේ.අ.අ. සාමාජිකයන්ට කාර්යක්ෂම සේවයක් සැපයීමේ අරමුණින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි (ජා.හැ.ප.) තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (UID) ලෙස භාවිතා කිරීමට හැකි වන ආකාරයේ විශේෂ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙමගින් ආයතන දෙකටම පොදුවේ භාවිතා කළ හැකි සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවක් (MCD) සකස් කරන ලදී.

2015 අවසාන වනවිට මිලියන 1.7 කට ආසන්න සාමාජිකයන්ගේ ජා.හැ.ප. තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමානයේ දායක මුදල ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අතුරින් සියයට 79 ක් (ගිණුම් මිලියන 1.3) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින යම් යම් ගැටලු නිසා රැස්කරන ලද ඉතිරි තොරතුරු අදාළ සේවායෝජකයන් මගින් නැවත තහවුරු කිරීම ලබා ගැනීමෙන් පසුව ලියාපදිංචි කිරීම සඳහා යොමු කරනු ලැබේ.

සේ.අ.අ. ට සම්බන්ධ වන නව සාමාජිකයන් තත්කාලීනව ලියාපදිංචි කිරීම 2010 නොවැම්බර් මාසයේ සිට ආරම්භ කරන ලදී. ඒ අනුව පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයින්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු රැස්කර ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලියන් ද පවත්වා ගෙන යනු ලැබේ. මේ අනුව, වර්ෂය තුළ වර්තමාන හා නව සාමාජිකයන් 167,747 ක් නව සාමාජික තොරතුරු ගොනුවට (NMR) ඇතුළත් කරන ලදී. එමෙන්ම සාමාජිකයින් 152,532 ක් වර්ෂය තුළ දී ලියාපදිංචි කරන ලදී.

## 10. විනිමය පාලනය

1953 අංක 24 දරන විනිමය පාලන පනතේ 2(2) වගන්තිය ප්‍රකාරව, එකී පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඒ අනුව, බලයලත් වෙළෙඳුන් හට විධානයන් නිකුත් කිරීම, ගැසට් නිවේදන නිකුත් කිරීම, විශේෂ විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතීන් ප්‍රදානය කිරීම, විවිධ විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය කිරීම, විනිමය පාලන පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම යනාදිය තුළින්, විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව පැවරී ඇති බලතල, රාජකාරි හා කාර්යයන් ඉටු කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. 2015 වර්ෂය තුළ දී විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

### 10.1 ගැසට් නිවේදන නිකුත් කිරීම

2015 වර්ෂය තුළ දී, විනිමය පාලන ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීමේ අරමුණින් ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක්ම ගනු ලැබිණි. ඒ අනුව, අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) පවත්වා ගෙන යනු ලබන පුද්ගලයන් හට එම ගිණුම්වල පවත්නා අරමුදල් බාධාවකින් තොරව ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීම සඳහා ඉඩ සලසා දෙමින් නව විධානයන් නිකුත් කරන ලදී.

ඉහත ලිහිල් කිරීම් සඳහා පහසුකම් සලසාලමින් පහත සාරාංශ ගත කර ඇති ආකාරයට 2015 වර්ෂය තුළ දී නව ගැසට් නිවේදන තුනක් නිකුත් කරන ලදී. එම ගැසට් නිවේදනයන් වාර්ෂික වාර්තාවේ III කොටසේ දැක්වේ.

(අ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමි ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් සඳහා පහත අවසර ප්‍රදානය කරන ලදී. (2015 දෙසැම්බර් 29 දිනැති ගැසට් අංක 1947/13):

- ඉහත ගිණුම්වල පවත්නා ශේෂයන් උපයෝගී කර ගනිමින්, ශ්‍රී ලංකාවෙන් පිටතදී නිකුත් කරන ලද සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, දැරීමට හා පැවරීමට;
- ඉහත ප්‍රතිපාදනයන් ප්‍රකාරව අත්පත් කරගෙන ඇති කොටස් මත වන ප්‍රතිලාභයක් ලෙස සංචිත හෝ පවත්නා වර්ෂයේ ලාභ ප්‍රාග්ධනීකරණය මගින් හෝ කොටස් උප විභජනය හෝ විභජනය කිරීමක් ආකාරයෙන් නිකුත් කරනු ලබන කොටස් අත්පත් කර ගැනීමට, දැරීමට හා පැවරීමට.

(ආ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් සඳහා එම ගිණුම්වල පවත්නා ශේෂයන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් හට පහත දැ සම්බන්ධයෙන් ගෙවීම් කිරීම සඳහා අවසර ප්‍රදානය කරන ලදී. (2015 දෙසැම්බර් 29 දිනැති ගැසට් අංක 1947/14):

- ඉහත (අ) හි සඳහන් කරන ලද ගැසට් නිවේදනයෙන් අවසර ලබාදී ඇති සුරැකුම්පත් අත්පත් කර ගැනීමට;
- ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් ඕනෑම වත්කමක් අත්පත් කර ගැනීමට හෝ ජංගම ගිණුම් ගනුදෙනු සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට.

ඇ) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් පහත සඳහන් දැ සම්බන්ධයෙන් විනිමය පාලන පනතේ 6AB වගන්තියේ අවශ්‍යතාවයන් අදාළ වීමෙන් නිදහස් කරන ලදී. (2015 දෙසැම්බර් 29 දිනැති ගැසට් අංක 1947/15):

- ඉහත (අ) හි සඳහන් කරන ලද ගැසට් නිවේදනයෙන් ලබාදී ඇති අවසරය ප්‍රකාරව අත්පත් කරගත්, රඳවාගත් හෝ පවරනු ලැබූ සුරැකුම්පත්.
- ඉහත (ආ) හි සඳහන් කරන ලද ගැසට් නිවේදනයෙන් ලබාදී ඇති අවසරය යටතේ අත්පත් කරගත් ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් ඕනෑම වත්කමක්.

### 10.2 අනුමැතීන්/අවසර පත්‍ර නිකුත් කිරීම

අ) අනුමැතීන්: ඇ.එ.ජ. ඩොලර් මිලියන 65.66 ක මුදලක් පිටරට ආයෝජනය කිරීම සඳහා සමාගම් 11 ක් සඳහා ද, ඇ.එ.ජ. ඩොලර් මිලියන 280 ක මුදලක් විදේශයන්ගෙන් ණයට ලබා ගැනීම සඳහා සමාගම් තුනක් සඳහා ද අනුමැතිය ලබා දෙන ලදී.

ආ) අවසර පත්‍ර නිකුත් කිරීම: 2015 වර්ෂයේ දී, සීමාසහිත සමාගම් තුනකට නව මුදල් මාරු කිරීමේ බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ අනුව, 2015 දෙසැම්බර් 31 දින වනවිට බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 6 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 2 කින්, එක් සුපිරි වෙළඳසැලකින්, එක් සංචාරක හෝටලයකින් සහ තවත් සීමිත සමාගම් 68 කින් සමන්විත වන ආකාරයට බලයලත් මුදල් හුවමාරු කරන්නන්ගේ මුළු ගණන 78 ක් බවට පත්විය.

තවද, 2015 වර්ෂය අවසාන වනවිට, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 6 ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 2 ක්, එක් සුපිරි වෙළඳසැලක්, සීමාසහිත සමාගම් 5 ක් ඇතුළුව විදේශ ව්‍යවහාර මුදල් විකිණීම සඳහා බලයලත් මුළු මුදල් හුවමාරු කරන්නන් ගණන 14 ක් විය.

### 10.3 සංක්‍රමණික අරමුදල් ප්‍රේෂණය කිරීම

2015 වර්ෂය තුළ දී, 2013 ජුනි 12 දිනට පසුව වෙනත් රටක ස්ථිර නේවාසික බලපත්‍ර ලබාගෙන ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් හට හිමි සංක්‍රමණික දීමනාව නිදහස් කිරීම සඳහා නව සංක්‍රමණික ආවෘත ගිණුම් (MBA) 335 ක් විවෘත කිරීම පිණිස බලයලත් වෙළඳුන් හට අවසර ලබා දෙන ලදී. තවද, 2013 ජුනි 12 දිනට පෙර වෙනත් රටක ස්ථිර නේවාසික බලපත්‍ර ලබා ගෙන ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් 464 දෙනෙකුට අනේවාසික ආවෘත ගිණුම් (NRBA) හරහා ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීමට අවසර ලබා දෙන ලදී.

### 10.4 සුපරීක්ෂණය/විමර්ශන

විනිමය පාලන රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් විමර්ශන 203 ක් 2015 වර්ෂය තුළ දී සිදු කරන ලද අතර, එබඳු විනිමය පාලන නීතිරීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පනවන ලද දඩ මුදල් වශයෙන් අයකර ගත් රුපියල් මිලියන 26.36 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. විමර්ශනවලින් බහුතරයක්ම නේවාසිකයන් විසින් අනේවාසිකයන්ට කරන ලද අනවසර ගෙවීම්, බලයලත් ආයතන විසින් බලපත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම් සහ පොදු අවසරයන්හි දක්වා ඇති ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් නිකුත් කිරීම හා පැවරීම සමඟ සම්බන්ධ වේ.

### 10.5 මහජනතාව දැනුම්වත් කිරීම

බැංකු, මහජනතාව, විදේශ සේවයේ නියුතු නිලධාරීන් සහ විනිමය පාලන නීතිරීති දැන ගැනීමට උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන් ඉලක්ක කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රය සමඟ විනිමය පාලනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩ සටහන් අටක් පවත්වන ලදී. තවද, දුරබැහැර ප්‍රදේශවල වාසය කරන පුද්ගලයන්ට විනිමය පාලන රෙගුලාසි පිළිබඳව මූලික අවබෝධයක් ලබාදීම සහ බැංකු, සංස්ථාපිත ආයතන සහ ආයෝජකයන් ඇතුළු විවිධ පාර්ශ්වයන් අතර විනිමය පාලන සාක්ෂරතාවය හා ප්‍රාග්ධන ගිණුම් ලිහිල් කිරීම් පිළිබඳ දැනුම ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල දී දැනුම්වත් කිරීමේ වැඩසටහන් හතක් පවත්වන ලදී. තවද, විනිමය පාලන රෙගුලාසි පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා 2014 ජනවාරි 01 දින දියත් කරන ලද විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කිරීම ද සිදු කරන ලදී.

## 11. පහසුකම් කළමනාකරණ

රාජකාරී කටයුතු සඳහා උචිත පරිසරයක් ගොඩනැගීම තුළින් සේවක කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේ දී ද බැංකු පරිශ්‍රයේ සංවර්ධන කටයුතු සහ නඩත්තු කටයුතු නොකඩවා සිදු කරන ලදී. එමෙන්ම බැංකු කාර්ය මණ්ඩලයේ සහ බැංකුව සතු රථවාහනවල ද සුරක්ෂිතබව රැකෙන පරිදි මෙන්ම වියදම් කාර්යක්ෂමව ආරක්ෂා කර ගත හැකි වන පරිදි, මහ බැංකුවේ රථවාහන සංචිතය මනාව පවත්වාගෙන යෑමට ද කටයුතු කෙරිණි.

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2015 වසරේ දී ද විදුලිය, වායු සමීකරණ, ජල සම්පාදන, ප්‍රවාහන සහ රක්ෂණ ආදී සියලු වැදගත් සේවා පහසුකම් ඉහළ විශ්වසනීයත්ව මට්ටමකින් පවත්වා ගෙන යෑමට කටයුතු කළේය. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට මෙම පහසුකම් ඉතා උසස් මට්ටමකින් යුතුව සැපයීමට හැකි වූ අතර එමගින් මහ බැංකුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට පුළුල් දායකත්වයක් සැපයීමට හැකි විය.

වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ප්‍රවීන නිලධාරී මඬුල්ලක් විසින් ව්‍යාපෘති ඇගයීම සහ කළමනාකරණ කටයුතු කිරීම හේතුවෙන් වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා වැය කළ පිරිවැයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වූ අතර, පිළිගත් කොන්ත්‍රාත්කරුවන් වෙත ව්‍යාපෘති පිරිනැමීම සහ මෙම ව්‍යාපෘති සමීප අධීක්ෂණයකට ලක් කිරීම හේතුවෙන් නියමිත කාලසීමාවන් තුළ අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුව මෙම ව්‍යාපෘති නිම කිරීමට හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ උතුරු පළාත් කාර්යාලය පිහිටුවීමට අවශ්‍ය නව ගොඩනැගිලි සංකීර්ණයක් මෙම වසර තුළ දී නිම කිරීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය. එසේම 2015 වසර අග භාගයේ දී, නුවරඑළිය නගරයෙහි පිහිටි, රජයෙන් ලබාගත් පැරණි ගොඩනැගිල්ලක් කඳුරට නව පළාත් කාර්යාලය පිහිටුවීමට සුදුසු වන සේ ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම පළාත් කාර්යාලය 2016 ජනවාරි මස දී විවෘත කෙරිණි. “වයිට්අවෙස්” ගොඩනැගිල්ලේ පෞරාණික වටිනාකම සුරැකෙන සේ එහි ප්‍රතිසංස්කරණ කටයුතු 2015 වසරේ දී නිම කරන්නට යෙදිණි. ප්‍රේක්ෂකයන්ට වඩාත් හොඳ අත්දැකීමක් ලබා දීම අරමුණු කරගෙන මහ බැංකුවේ සන්ථාගාරය වැඩිදියුණු කර අලංකරණය කිරීමට

පියවර ගන්නා ලදී. මහ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලේ ආරක්ෂිත බව සහ නිසි ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම පිණිස එම ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ශක්තිය පරීක්ෂා කිරීම, බහුමහල් රථගාල තවදුරටත් වැඩිදියුණු කිරීම සහ මහ බැංකු පරිශ්‍රයේ බලශක්ති පරිභෝජනය සඵලදායී කිරීම ආදී ව්‍යාපෘති ගණනාවක් 2015 වසර තුළ දී නිම කිරීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය.

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේ දී සිදු කරන ලද වෙනත් ගොඩනැගීම් කටයුතු අතර හදිසි ආපදා අවස්ථාවක දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ආපදා අවස්ථා මධ්‍යස්ථානය ලෙස භාවිතා කිරීමට නව ගොඩනැගිලි සංකීර්ණයක් රාජගිරිය බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍ර පරිශ්‍රයේ ඉදිකිරීම ද වෙයි. කතරගම නිවාඩු නිකේතනයේ අමතර නවාතැන් ඒකක නවයක් ඉදිකිරීම, රථ ගාලේ 10 වන මහලේ නව ගෘහස්ත ක්‍රීඩාගාරයක් ඉදිකිරීම සහ අනුරාධපුරයේ නව නිවාඩු නිකේතනයක් ඉදිකිරීම ආදී කටයුතු තවදුරටත් කෙරෙමින් පවතී. ඉහත සඳහන් ව්‍යාපෘති 2016 වසරේ දී නිම කිරීමට සැලසුම් කර තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමාන්‍ය ප්‍රවාහන කාර්යයන්ට අමතරව 2015 වසරේ දී මහ බැංකුව විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සමුළු ගණනාවක් සහ වෙනත් උත්සව සඳහා බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් ලබා දීමට ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය.

## 12. මූල්‍ය කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට මුදල් නීති පනතේ අදාළ විධිවිධාන සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතියක් පවත්වාගෙන යෑම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වා ගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 13 ක් කළමනාකරණය කිරීම, ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුළත් වේ.

### 12.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය:** මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව, 2014 වසරේ දෙසැම්බර් මාසය හා 2015 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙළ කරන ලද අතර, ඒවා රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම 2015 වර්ෂය තුළ දී සිදු කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා:** කාර්තුමය මූල්‍ය ප්‍රගති/කාර්යය ඵල තත්ත්වයන් සහ මූල්‍ය ක්‍රියාකාරිත්වයන්හි සාර්ව ආර්ථික බලපෑම 2015 වසරේ දී මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන:** 2002 වර්ෂයේ සිට මෙම කාර්යය සඳහා ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාළ කර ගන්නා ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන මහ බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2015 වර්ෂය තුළදීත් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ පදනමකින් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කරන ලදී. 2015 වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද සහ මහ බැංකු අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් අත්සන් කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ II වන කොටස ආරම්භයේ දී ඉදිරිපත් කර ඇත.

### 12.2 වාර්ෂික අයවැය ලේඛනය හා ක්‍රියාකාරකම් මත පදනම් වූ අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම්වල කාර්යයන්ට අනුකූලව සිදු කරන ලදී. කාර්යයන් මත පදනම් වූ සහ ක්‍රියාකාරකම් මත පදනම් වූ අයවැය පිළියෙල කිරීම ද වාර්ෂික අයවැය සමඟ සිදු කළ අතර, එමගින් මහ බැංකුවේ කාර්යයන් මත පිරිවැය සහ ක්‍රියාකාරකම් මත වූ පිරිවැය පෙන්නුම් කරන ලදී. මෙම ක්‍රියාවලිය 2015 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් මස අවසන් විය. වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2015 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, අනුමත අයවැය 2016 වසරේ මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තු වලට ලබා දෙන ලදී. 2015 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා ඵලදායී අයවැය පාලනය සඳහා සියළුම දෙපාර්තමේන්තු හා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

### 12.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතිය

(අ) 2015 වසර තුළ දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය ගෙවන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝගය යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2015 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 4,599 ක් සිදු කරන ලද අතර, ඉන් 4,344 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 255 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) 2015 වසර තුළ දී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා ණය අරමුදල් නිදහස් කිරීම් 2,915 ක් සහ විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 558 ක් ආසන්න වශයෙන් සිදු කර ඇත.

### 12.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව අභ්‍යන්තර අරමුදල් 13 ක් කළමනාකරණය කරන අතර, එයට සේවකයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6 ක් ද, වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් 3 ක් සහ විශේෂ අරමුදල් 4 ක් ද ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ කළමනාකරණය, අරමුදල් ආයෝජනය, ගෙවීම් හා පියවීම් සිදු කිරීම, ගිණුම් තැබීම හා වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම මේ හා සම්බන්ධ ප්‍රධාන කාර්යයන් වේ. මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, බැංකු තැන්පතුවල හා ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල ආයෝජනය කරන අතර, 2015 වසරේ ආයෝජනය සඳහා වූ සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය සියයට 7.31 ක් විය. 2014 වසර සඳහා වූ මෙම අරමුදල් වලට අදාළ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීතිරීති අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**II-15 සංඛ්‍යා සටහන**

**අරමුදල් කළමනාකරණ කාර්යය සාධනය - 2015**

(රුපියල් මිලියන)

| අරමුදල් | ලැබීම් | ගෙවීම් | ආයෝජන | වසර අවසාන ආයෝජන | සාමාන්‍ය වාර්ෂික ඵලදාව (%) |
|---|---|---|---|---|---|
| විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් | 21,137.60 | 3,681.54 | 17,450.12 | 41,562.90 | 7.31 |
| වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් | 58.97 | 4.52 | 54.05 | 1,428.99 | 7.95 |
| විශේෂ අරමුදල් | 1,632.10 | 25.64 | 1,603.60 | 2,812.48 | 7.18 |
| එකතුව | **22,828.67** | **3,711.70** | **19,107.77** | **45,804.37** | **7.31** |

### 12.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් ඒකකය යටතේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වා ගෙන යනු ලබයි. සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම් හා ඒවායේ ස්ථානගත කිරීම, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ප්‍රත්‍යාගණනයන්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2015 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තාගත කර ඇත. අයිතමයන් අත්පත් කර ගැනීම් 1,192 ක් සහ ඉවත් කිරීම් 377 ක් සමගින් 2015 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

### 12.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහය ඇතිව මහ බැංකු කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2015 වසර තුළ දී පහසුකම් සපයන ලදී.

### 12.7 අනෙකුත් කාර්යයන්

(අ) **මිලදී ගැනීම් ක්‍රියාවලිය:**

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිරීතිවලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියලුම තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩලවලට සහ සමීක්ෂණ මණ්ඩලවලට සහභාගි විය යුතුය. 2015 වසර තුළ දී ආසන්න වශයෙන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 237 ක් සහ එවැනි සියලුම මිලදී ගැනීම් හා සම්බන්ධ සියලු තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහභාගි වී ඇත.

(ආ) **ආයෝජන සමාලෝචන කමිටුව:**

මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ආයෝජන සමාලෝචන කමිටුව සඳහා ලේකම් කාර්යභාරය ඉටු කරන ලදී. මුදල් මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල්වල ආයෝජන කටයුතු පිළිබඳ උපදේශකත්වය සැපයීම සහ නිරීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. මෙම කමිටුව සඳහා අදාළ ආයෝජන කළමනාකරණ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හා අනෙකුත් නිලධාරීන් ඉදිරිපත් වන අතර මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරනු ලබන සහකාර අධිපති විසින් මෙහි සභාපතිත්වය දරනු ලබයි. 2015 වසර තුළ දී කමිටුව රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර, 2015 ආයෝජන අපරානුමත කිරීම සඳහා කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී. 2015 වසර අවසාන වන විට කළමනාකරණය යටතේ ඇති අරමුදල් වටිනාකම රුපියල් බිලියන 65.9 ක් වේ. මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද නව ප්‍රතිපත්තියට අනුව 2016 දී ආයෝජන සමාලෝචන කමිටුව වෙනුවට නියෝජ්‍ය අධිපතිවරයෙකු විසින් සභාපතිත්වය දරන ආයෝජන කමිටුව ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. මෙම නව ප්‍රතිපත්තිය යටතේ සේවක අර්ථසාධක අරමුදල හැර අනෙකුත් සියලුම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන් මූල්‍ය දෙපාර්තමේන්තුව තුළ මධ්‍යගතව කළමනාකරණය කිරීම සඳහා වෙන් වූ ආයෝජන ඒකකයක් ස්ථාපනය කරනු ඇත.

## 13. මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදනයන්ට අනුව පිහිටුවා ඇති මූල්‍ය බුද්ධි ඒකකය, 2007 වසරේ මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ක්‍රියාත්මක වේ. මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති නීත්‍යුනුකූල නොවන අනෙකුත් ක්‍රියාවන්වලට අදාළ සම්බන්ධතාවන් අනාවරණය කර ගැනීම පිණිස මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ තොරතුරු ලබා ගැනීම, සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විශ්ලේෂණ සිදු

කිරීම සහ නෛතික බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සඳහා අදාළ නියාමන සහ/හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට, එම විශ්ලේෂණවලට තොරතුරු හා විස්තර ලබා දීම ඇතුළත් වේ. 2015 වසර තුළ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයන්හි සහ අනෙකුත් කටයුතුවල සාරාංශයක් පහත දැක්වේ.

## 13.1 අන්‍යෝන්‍ය ඇගයීම පැවැත්වීම

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (Asia Pacific Group on Money Laundering) විසින් මූල්‍ය කාර්ය සාධක බලකායේ (Financial Action Task Force) සංශෝධිත නිර්දේශයන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියා රාමුව ඇගයීම අරමුණු කරගෙන තෙවන වටයට අදාළ අන්‍යෝන්‍ය ඇගයීම 2014/15 කාලය තුළ දී පැවැත්විණි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන පළමු අන්‍යෝන්‍ය ඇගයීම 2006 වසරේ දී පවත්වන ලද අතර මෙය දෙවන අන්‍යෝන්‍ය ඇගයීම වේ. ඒ අනුව මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සාමාජික රටවල්වල සහ එම ලේකම් කාර්යාලයේ විශේෂඥයින් අට දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ නෛතික සහ ආයතනික ව්‍යුහය මෙන්ම ඒ තුළින් අදාළ කටයුතු ක්‍රියාවට නැංවීමේ ඵලදායිත්වය ද ඇගයීමට ලක් කරන ලදී. අන්‍යෝන්‍ය ඇගයීමේ අවසන් අදියරේ දී ඉහත කී ඇගයීම් මණ්ඩලය එතැන් පරීක්ෂාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඒ අනුව රාජ්‍ය සහ පෞද්ගලික අංශය නියෝජනය වන පරිදි ආයතන 50 කට වැඩි ගණනක් සමග සාකච්ඡා ද පවත්වන ලදී. මෙම අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාව 2015 ජූලි මාසයේ දී නවසීලන්තයේ පැවති ආසියා ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණ කණ්ඩායම් සැසියේ දී සම්මත වූ අතර, ඒ අනුව "කඩිනම් සහ පුළුල් පසුවිපරම් ක්‍රියාවලිය" (Expedite enhanced follow up) යටතේ ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රියාමාර්ග රැසක් නිර්දේශ කර ඇත. තවද, අන්‍යෝන්‍ය ඇගයීමේ දී හඳුනා ගත් දුර්වලතා නිවැරදි කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සෑම මාස හයකට වරක්ම මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමට ඉදිරිපත් කළ යුතු වේ.

## 13.2 තොරතුරු එක්රැස් කිරීම, විමර්ශනය කිරීම සහ බෙදාහැරීම

බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කරුවන් හා රක්ෂණ සමාගම් විසින්, රුපියල් මිලියනයක් හෝ ඊට වැඩි මූල්‍ය ගනුදෙනු හා විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු හෝ ඒ හා සමාන අගයකින් යුතු විදේශ ව්‍යවහාර මුදල් (දේශීය සහ විදේශීය), මූල්‍ය බුද්ධි ඒකකයෙහි මාර්ගගත දත්ත කළමනාකරණ පද්ධතිය වන "ලංකාෆින්" (LankaFIN) හරහා වාර්තා කිරීම නොකඩවා කරගෙන යන ලදී. තවද, 2013 වසරේ ජනවාරි මාසයේ සිට මූල්‍ය බුද්ධි ඒකකයේ විෂය පථයට යටත් වන බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ද එම ක්ෂේත්‍රය අධීක්ෂණය සහ නියාමනය කරන විනිමය පාලකවරයා හරහා රුපියල් මිලියනයක් සහ ඊට වැඩි වන්නා වූ අගයකින් යුත් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වාර්තා කරන ලදී. ඒ අනුව 2015 වසර තුළ දී මිලියන 6.9 කට වඩා වැඩි මුදල් ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ සංඛ්‍යාවක් වාර්තා වූ අතර සැක කටයුතු ගනුදෙනු වාර්තා සංඛ්‍යාව 783 ක් විය. ඒ අනුව මූල්‍ය විශ්ලේෂණයන්ගෙන් අනතුරුව සැක කටයුතු ගනුදෙනු වාර්තා 426 ක් වැඩිදුර විමර්ශනය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහ නියාමන අධිකාරීන්ට යොමු කරන ලදී.

## 13.3 වාර්තාකරණ ආයතන විමර්ශනය කිරීම

ප්‍රධාන වශයෙන් බැංකු සහ මූල්‍ය සමාගම් ආවරණය වන පරිදි වාර්තාකරන ආයතනයන් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ කටයුතුවලට පාත්‍රවීමේ අවදානම සොයා බැලීමට සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රකාශිත නියාමනයන්ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න සොයා බැලීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය මගින් 2015 වසර තුළ දී විමර්ශනයන් 10 ක් සිදු කරන ලදී. තවද, ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත්ව යොමු කළ යුතු වාර්තාවන්හි හඳුනාගත් අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2015 වසරේ දී වාර්තාකරණ ආයතන සමග සාකච්ඡා 10 ක් පවත්වන ලදී.

## 13.4 වෙනත් කටයුතු

### i. අවදානම් පදනම් වූ ප්‍රවේශයකට යොමු වීම

මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් පදනම් වූ ප්‍රවේශය ඉතා වැදගත් වේ. අවදානම් පදනම් වූ නියාමන ප්‍රවේශයක් ලබා ගැනීම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ කටයුතුවල වර්තමාන ගෝලීය භාවිතාව වේ. වර්ෂය තුළ දී, අවදානම් පදනම් වූ ප්‍රවේශය යටතේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම හඳුනාගෙන එය අවම කිරීම සඳහා මූල්‍ය ආයතනයන් විසින් අනුගමනය කළ යුතු ගනුදෙනුකරු පිළිබඳව සුපරීක්ෂාකාරී වීමේ රීතීන්, සියලුම පාර්ශ්වකරුවන්ගේ ද සහභාගිත්වය ඇතිව කෙටුම්පත් කරන ලදී.

### ii. ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ කටයුතුවලට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම

සම්බන්ධයෙන් ඇති දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් නියෝජනය කළ නිලධාරීන් 980 කට පමණ දැනුම්වත් කිරීමේ වැඩසටහන්/පුහුණු වැඩමුළු 15 ක් පවත්වන ලදී. ත්‍රිකුණාමලය සහ හම්බන්තොට යන ප්‍රදේශයන්හි දී මූල්‍ය ආයතන සහ ශ්‍රී ලංකා පොලීසියෙහි නිලධාරීන් සඳහා ඔවුන්ගේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන් දෙකක් ද මෙයට ඇතුළත් වේ. තවද, අන්‍යොන්‍ය ඇගයීමක් සිදු කිරීමට අදාළ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා බංග්ලාදේශ මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට විශේෂ වැඩසටහනක් ද 2015 වසරේ දී පැවැත්විය. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන වාර්ෂික සමුළුව මෙම වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් නියෝජනය කරමින් අනුකූලතා නිලධාරීන් 190 ක පමණ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

**iii. ජාත්‍යන්තර සම්බන්ධතා**

(අ) එග්මොන්ට් කණ්ඩායම (EGMONT Group)

විමර්ශන පවත්වාගෙන යාමේ දී අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මූල්‍ය බුද්ධි ඒකක 151 කින් සමන්විතව පිහිටුවා ඇති එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලබා ගන්නා ලදී. 2015 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවස්ථා 19 ක දී විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමග තොරතුරු හුවමාරු කර ගනු ලැබීය.

(ආ) මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (Asia-Pacific Group on Money Laundering)

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමෙහි ආරම්භක සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව 2015 ජූලි මාසයේ දී නවසීලන්තයේ ඕක්ලන්ඩ්හි දී පැවැත්වූ 18 වන වාර්ෂික වැඩමුළුවට ද , 2015 නොවැම්බර් මාසයේ දී නේපාලයේ පැවති මුදල් විශුද්ධිකරණ උපාය මාර්ග පිළිබඳ 18 වන වාර්ෂික වැඩමුළුවට ද සහභාගි විය. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ 2016/2018 කාලපරිච්ඡේදය සඳහා සම සභාපතිත්වය දරන ශ්‍රී ලංකාව 2017 වසර සඳහා වන වාර්ෂික සමුළුව කොළඹ දී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් සිටියි.

**iv. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම**

සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විමර්ශන කටයුතු සහ චෝදනා ගොනු කිරීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය පහසු කර ගැනීමට, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදන අනුව, මූල්‍ය බුද්ධි ඒකකය 2015 වසරේ දී කිර්ගිස්ථාන් ජනරජයේ මූල්‍ය බුද්ධි ඒකකය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව, 2015 වසර අවසන් වන විට අත්සන් කර ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 28 ක් දක්වා ඉහළ යන ලදී.

# 14. මූල්‍ය අංශ පර්යේෂණ

2006 වසරේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව ලෙස මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. පසුකාලීනව, මූල්‍ය ස්ථායීතාව ආශ්‍රිත අධ්‍යයන සහ පර්යේෂණවල වැදගත්කම සැලකිල්ලට ගනිමින් 2011 වසරේ දී සහ 2014 වසරේ දී මෙම දෙපාර්තමේන්තුවේ නම පිළිවෙළින් ''මූල්‍ය ස්ථායීතා අධ්‍යයන දෙපාර්තමේන්තුව'' සහ ''මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව'' ලෙස වෙනස් කරන ලදී. එසේ වුවද, අවශ්‍ය තාක්ෂණික සාමාර්ථ සහ මානව සම්පත් සලකා බැලීමේ දී, දෙපාර්තමේන්තුව තවමත් ආරම්භක අදියරෙහි පවතී. 2015 වසර තුළ දී මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අංශයේ වර්ධනය සඳහා වූ අවශ්‍යතා සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව කේන්ද්‍ර කොට ගනිමින් මූලික මට්ටමේ පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව, මෙම වසර තුළ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ප්‍රධාන කාර්යභාරයන් අතර මූල්‍ය පද්ධතිය ආශ්‍රිත විශේෂ අංශ පර්යේෂණ සිදු කිරීම, මූල්‍ය අංශයේ ප්‍රවණතා හා ස්ථායීතාව ආශ්‍රිත කාලීන වාර්තා නිකුත් කිරීම සහ මහ බැංකු වාර්ෂික වාර්තාවෙහි 8 වැනි පරිච්ඡේදය සම්පාදනය කිරීම යනාදිය අඩංගු විය.

**(අ) මූල්‍ය පද්ධතිය ආශ්‍රිත විශේෂ අංශ පිළිබඳව පර්යේෂණ**

අභ්‍යන්තර ප්‍රතිපත්තිමය තීරණ සඳහා උපයෝගී කර ගැනීම් වස් මෙම දෙපාර්තමේන්තුව විසින් 2015 වසර තුළදී පර්යේෂණාත්මක අධ්‍යයනයන් දහයක් සිදුකරනු ලැබීය. එකී පර්යේෂණයන් මගින් හුදෙක් දේශීය මූල්‍ය අංශයට අදාළ ක්ෂේත්‍රයන් හතරක් ආවරණය කරන ලදී එනම්; කල්බදු හා කුළීපිට ගැණුම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය දීමේ ක්‍රියාකාරකම්; මූල්‍ය අංශයේ අක්‍රිය වූ වත්කම්; බැංකු නොවන මූල්‍ය අංශයේ විවිධාංගීකරණය සහ බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවලින් පෞද්ගලික අංශය විසින් ලබා දී ඇති ණය යනාදිය වේ.

**(ආ) මූල්‍ය අංශයේ ප්‍රවණතා හා ස්ථායීතාව පිළිබඳ කාලීන වාර්තා**

(i) නියාමනය වන මූල්‍ය ආයතනවල අක්‍රිය වූ ණය කළමනාකරණය කිරීමට වත්කම් කළමනාකරණ සමාගමක් පිහිටුවීමට සහ රාජ්‍ය සුරැකුම්පත්වල ගනුදෙනු සඳහා බැඳුම්කර නිෂ්කාශන ආයතනයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව දැක්වෙන යෝජනා දෙකක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒවාට 2016 ජාතික අයවැය තුළ ප්‍රතිපාදන සලසන ලදී.

(ii) මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන සම්මත කාර්යසාධන දර්ශක සහ ආතති පරීක්ෂා මගින් පෙන්නුම් කෙරෙන මූල්‍ය අංශයේ ප්‍රවණතා සහ වර්ධනයන් අනාවරණය කරමින්

මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව වෙත මූල්‍ය අංශයේ අවදානම් තක්සේරු කරමින් මාසික වාර්තා ඉදිරිපත් කළ අතර මූල්‍ය අංශයේ ප්‍රවණතා පිළිබඳව කාර්තුමය වාර්තා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. මීට අමතරව මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල මෙවැනි කාර්යභාරයන්ට අවැසි මූල්‍ය අංශයේ දත්ත සැකසීම, කලින් කලට ඉදිරිපත් කරන වාර්තා සහ ප්‍රකාශනයන්ට දායක වීම යනාදිය ද මෙම දෙපාර්තමේන්තුව විසින් 2015 දී සිදුකරන ලදී.

(iii) මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ විෂයානු බද්ධ දැනුම්වත්භාවය ඉහළ නැංවීම හා මූල්‍ය පද්ධති ස්ථායිතාවට බලපාන විවිධ අංශ පිළිබඳව විවාදාත්මක කතිකාවතක් ගොඩ නැංවීමේ අභිප්‍රාය පෙරදැරිව, ''2015 මූල්‍ය පද්ධති ස්ථායීතා විවරණය'' (FSSR 2015), 2016 ජනවාරි මස එළිදැක්වූ අතර එය 2004 වසරේ සිට නිකුත් වූ කාණ්ඩ අතරින් 11 වන ප්‍රකාශනයයි. 2015 වසරේ මූල්‍ය පද්ධති ස්ථායිතා විවරණයෙහි, දේශීය මූල්‍ය පද්ධති ස්ථායීතාව පිළිබඳ සමාලෝචන හා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග, දේශීය හා විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා, දේශීය මූල්‍ය වෙළඳපොළවල ක්‍රියාකාරිත්වය, බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය හා අවදානම්, අනෙකුත් මූල්‍ය ආයතනවල වර්ධනයන් හා අවදානම් මෙන්ම ප්‍රධාන ගෙවීම් හා පියවීම් පද්ධතිවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සමස්ත ඇගයීමක් අන්තර්ගත විය.

(iv) 2015 වසරේ පළමු මාස අටක කාලපරිච්ඡේදය තුළ මූලය පද්ධතියෙහි ප්‍රධාන උපඅංශවල කාර්යසාධනය හා එමගින් මූල්‍ය පද්ධති ස්ථායිතාවයට ඉදිරියේ ඇතිවිය හැකි බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් ද ඉදිරිපත් කරන ලද කාලීන වාර්තා ද පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ප්‍රකාශනයක් වන ''2015 මෑතකාලීන ආර්ථික ප්‍රවණතා" ප්‍රකාශනයෙහි අටවන පරිච්ඡේදය වන ''මූල්‍ය අංශ ප්‍රවණතා හා ස්ථායීතාවය'' යන පරිච්ඡේදය මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී.

**(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ අටවන පරිච්ඡේදය සම්පාදනය කිරීම.**

අදාළ දෙපාර්තමේන්තු හා බාහිර ආයතන මගින් ඉදිරිපත් කරන ලද වාර්තා පදනම් කරගනිමින් 2014 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ අටවන පරිච්ඡේදය වන ''මූල්‍ය අංශ ප්‍රවණතා හා ස්ථායීතාවය'' යන පරිච්ඡේදය මෙම දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී. මෙම පරිච්ඡේදයෙහි, රටෙහි මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළ හා මූල්‍ය යටිතල පහසුකම් යන ප්‍රධාන අංශ තුන ආශ්‍රිත කාර්යසාධනය, අවදානම් කළමනාකරණය, සම්පත් උපයෝජ්‍යතාව හා එක් එක් ක්ෂේත්‍රයට අදාළ නියාමන ප්‍රවණතාවයන් පිළිබඳ විශේෂයෙන් අවධාරණය කරමින් රටෙහි සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට එක් එක් අංශයෙන් 2014 වසර තුළ ඇති කළ බලපෑම හා ඇතිවිය හැකි ඉදිරි බලපෑම් පිළිබඳ ඇගයීමක් අන්තර්ගත වේ.

**(ඇ) අනෙකුත් ක්‍රියාකාරකම්**

මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවෙහි ලේකම් කාර්යාලය ලෙස 2015 වසර තුළ දී ද අඛණ්ඩව මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබීය. මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම, අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය වැඩිදියුණු කිරීමේ ප්‍රයත්න සම්බන්ධීකරණය සඳහා පිහිටුවන ලද, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය අධිපතිතුමා විසින් මුලසුන හොබවනු ලබන මහ බැංකුවේ අභ්‍යන්තර අන්තර් දෙපාර්තමේන්තු කමිටුවකි. තවද, මූල්‍ය අංශ ශක්‍යතා වර්ධනය හා සම්බන්ධව විදේශීය දූත මණ්ඩල සම්බන්ධීකරණය කිරීමද මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් 2015 වසරේ දී සිදු කරන ලදී.

## 15. මානව සම්පත් කළමනාකරණ

2015 වසර තුළ දී, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා ඉහළ ඵලදායීතාවයකින් යුත්, අභිප්‍රේරිත හා කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ ඇති කිරීම අරමුණු කොට ගෙන, සේවක අභිප්‍රේරණය, නව සේවකයන් බඳවා ගැනීම්, කාර්යසාධන කළමනාකරණය, උසස්වීම් ලබා දීම්, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම්, සේවක ගැටළු කළමනාකරණය සහ සේවක පාරිශ්‍රමිකය ලබා දීම වැනි කටයුතු ක්‍රියාත්මක කරන ලදී. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩල සහ වෘත්තීය සමිති සමඟ සුහද සබඳතා පවත්වා ගැනීම, කාර්මික සාමය වැඩිදියුණු කිරීම සහ බැංකුවේ සමස්ත ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම සඳහා විවිධ පියවර ක්‍රියාත්මක කරන ලද අතරම, මහ බැංකුවේ විශ්‍රාමිකයන්ගේ සුභසාධන අවශ්‍යතා පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. මානව සම්පත් ව්‍යුහය සහ 2015 වසර තුළදී මානව සම්පත් දෙපාර්මේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### 15.1 මානව සම්පත් ව්‍යුහය

2015 දෙසැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,422 ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 638 කින් ද, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 623 කින් හා සුළු සේවක කාර්ය මණ්ඩලය 161 කින් සමන්විත විය. කාර්ය මණ්ඩලයේ සංයුතිය පන්තීන් අනුව, ස්ත්‍රී-පුරුෂ භාවය අනුව සහ වයස අනුව පහත රූප සටහන් මගින් දක්වා ඇත.

**II-3 රූප සටහන** **2015 දෙසැම්බර් 31 දිනට සේවක සංයුතිය**

(අ) පන්ති අනුව සේවක සංයුතිය




(ආ) ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සේවක සංයුතිය




(ඇ) වයස අනුව සේවක සංයුතිය




## 15.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

ප්‍රධාන වශයෙන්, මාණ්ඩලික පන්තියේ හා මාණ්ඩලික නොවන පන්තියේ කාර්ය මණ්ඩලයේ විවිධ හැකියාවන්ගෙන් යුක්ත වූ දක්ෂ සේවා නියුක්තිකයින් පිරිසකින් සමන්විත වන ලෙස පවත්වා ගැනීමට 2015 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වී ඇත. 2015 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු පහත II-16 සංඛ්‍යා සටහනෙහි දැක් වේ.

ඉහත සඳහන් නිලධාරීන්ගේ සුදුසුකම්, හැකියාවන්, නිපුණතාවන් හා අත්දැකීම් සැලකිල්ලට ගනිමින්, මහ බැංකුවේ දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය කාර්යාලවල ඒ ඒ කාර්යයන් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට හැකිවන පරිදි ස්ථානගත කර තිබිණ.

## 15.3 මානව සම්පත් කළමනාකරණය

(අ) බඳවා ගැනීම්

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී කළමනාකරණ අභ්‍යාසලාභීන්, බැංකු සහායකයින් (පුහුණු) සහ කණිෂ්ඨ පෞද්ගලික සහකාරවරුන් (සිංහල සහ ඉංග්‍රීසි) බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු වල යෙදුණි. මීට අමතරව, 2015 වසරේ දී පාර්ශ්වික බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට කණිෂ්ඨ පෞද්ගලික සහකාරවරුන් (දෙමළ ලඝුලේඛිකාවන්) බඳවා ගන්නා ලදී.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ලේකම් දෙපාර්තමේන්තුවට බාහිර සේවා සැපයුම්කරුවන් මගින් සේවා ලබා ගැනීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

(ආ) කාර්යසාධන කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රධාන කොටස් 4 කින් සමන්විත වේ. එනම්, සේවකයන්ගේ රැකියා පිරිවිතර සකස් කිරීම, උපායමාර්ගික සැලැස්ම හා අනුගත වන පරිදි ඉලක්ක පිහිටුවීම, අඛණ්ඩ පදනමක් මත කාර්යසාධනය නිරීක්ෂණය හා කාර්යසාධනය ඇගයීමයි. කාර්යසාධනය ඇගයීම් ක්‍රියාවලියේ දී එක් එක් සේවකයාගේ කාර්යසාධන මට්ටම, කාර්යසාධන ඇගයීම් ආකෘතියෙහි

**II-16 සංඛ්‍යා සටහන** **2015 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්**

| කාණ්ඩ | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි | පශ්චාත් උපාධි හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධි හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධි | වෘත්තීය සුදුසුකම් |
| මාණ්ඩලික පන්තිය | 69 | 165 | 12 | 79 | 178 | 18 |
| මාණ්ඩලික නොවන පන්තිය | 4 | 10 | 6 | 15 | 52 | 32 |
| **එකතුව** | **73** | **175** | **18** | **94** | **230** | **50** |

දක්වා ඇති පරිදි, එක් එක් ඉලක්කය ළඟා කරගත් මට්ටම සහ එම ඉලක්ක ළඟා කර ගැනීමට සේවකයා සතු වූ සාමාන්‍ය නිපුණතා හා තාක්ෂණික නිපුණතා මට්ටම්වලට සුදුසු අගයන් ලබා දෙමින් සිදු කරනු ලබයි. අවසාන කාර්යසාධන මට්ටම්, සේවක උසස්වීම් පටිපාටියේ එක් සංරචකයක් ලෙස යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ සියලුම සේවකයන්ගේ කාර්යසාධනය ඇගයීම සැලසුම් කළ පරිදි වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තවද, දෙපාර්තමේන්තු විසින් සිදු කළ මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය හා 2015 වර්ෂය සඳහා සේවකයන්ගේ රැකියා ඉලක්ක ලබා ගැනීම ද සිදු කරන ලදී.

**(ඇ) උසස්වීම්**

ශ්‍රී ලංකා මහ බැංකු උසස් කිරීම් පටිපාටිය යටතේ සේවකයන් 397 දෙනෙකුට ශ්‍රේණි උසස්වීම් ලබා දීමට 2015 වසර තුළ දී කටයුතු කරන ලදී. ඒ අනුව, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 139 දෙනෙකු, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ නිලධාරීන් 190 දෙනෙකු සහ සුළු සේවක පංතියේ සේවකයන් 68 දෙනෙකු සඳහා අදාළ උසස්වීම් පටිපාටියට අනුගතව ලබා දෙන ලදී.

**(ඈ) සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම**

මහ බැංකුවේ සමස්ථ ඵලදායීතාව ඉහළ නැංවීමේ හා විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමේ අරමුණින් යුක්තව, ශ්‍රී ලංකා මහ බැංකුව සිය සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීමේ ක්‍රියාවලියක් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ 2015 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මාණ්ඩලික නිලධාරීන් 74 ක්, මාණ්ඩලික නොවන නිලධාරීන් 74 ක් හා සුළු සේවකයින් 77 ක් ඔක්තෝබර් මස 01 දින සිට දෙපාර්තමේන්තු අතර මාරු කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ) සේව්‍ය සේවක සබඳතා**

කාර්මික සාමය ආරක්ෂා කර ගැනීම සඳහා පහසුකම් සලසන්නාගේ කාර්යභාරය අඛණ්ඩ ලෙස සාර්ථකව පවත්වා ගෙන යමින්, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින්, 2015 දී කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.

**(ඊ) සේවක ගැටළු කළමනාකරණය**

2015 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු සේවකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ ගැටළු සඳහා සහන ලබා දීමට කටයුතු සලස්වන ලදී.

## 15.4 නව දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම

ඉහළ කළමනාකාරිත්වයේ අවශ්‍යතාවය මත නව දෙපාර්තමේන්තු පිහිටුවීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව මූලිකත්වය දරනු ලැබීය.

1. ඒ අනුව, බැංකුවෙහි අවදානම් කළමනාකරණය සහ නීති හා අනුකූලතා ආශ්‍රිත බැංකු කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව 2015 පෙබරවාරි 09 දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවන ලදී.
2. බැංකු සේවකයන් සඳහා වඩාත් ක්‍රමෝපායී පුහුණු අවස්ථා ලබා දීම සඳහා 2015 ජූලි 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.
3. ප්‍රාදේශීය සංවර්ධනයෙහිලා රජයේ අරමුණු හා අනුගත වෙමින් දිවයිනේ ප්‍රධාන පළාත් නවයක් (09) නියෝජනය වන පරිදි, දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාල 2015 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවන ලදී. ඇතැම් ප්‍රදේශයන් යෝග්‍ය ලෙස ඒකාබද්ධ කරමින් බස්නාහිර පළාත, දකුණු පළාත, උතුරු සහ නැගෙනහිර පළාත් සහ උඩරට, උතුරු මැද හා වයඹ පළාත් ආදී වශයෙන් දෙපාර්තමේන්තු ස්ථාපිත කරන ලදී.
4. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණය සහ විධිමත් පාලනය යන අවශ්‍යතා සලකා බලා, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2015 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවන ලදී.

## 15.5 දෙපාර්තමේන්තු වසා දැමීම

1. 2015 පෙබරවාරි 09 වන දින සිට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව වසා දැමුණු අතර, එහි කාර්යයන් ලේකම් දෙපාර්තමේන්තුවට පවරන ලදී.
2. 2015 ඔක්තෝබර් 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණ දෙපාර්තමේන්තුව වසා දමන ලදී.

## 15.6 2015 වසර තුළ අධිපති විසින් විදේශයන්හි සහභාගි වූ රැස්වීම්

1. පෙබරවාරි මාසයේ දී වොෂින්ටන් හි දී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂවරුන් සමඟ පවත්වන ලද රැස්වීම් සහ ආයෝජකයන් සමඟ නිව්යෝර්ක් හා බොස්ටන්හි පැවති රැස්වීම්.
2. මාර්තු මාසයේ දී, සිංගප්පූරුව, ඇමෙරිකානු එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස් හා සැන් ෆ්‍රැන්සිස්කෝ හි දී අයෝජකයන් සමඟ පැවති රැස්වීම්.
3. ජුනි මාසයේ දී, ගරු මුදල් අමාත්‍යතුමා සමඟින් සහභාගි වූ ජපානයේ නිල රැස්වීම්.
4. ජුලි මාසයේ දී, නවසීලන්තයේ ඔක්ලන්ඩ් හි දී පැවති මුදල් විශුද්ධිකරණය සඳහා වූ ආසියා පැසිෆික් කණ්ඩායමේ (Asia/Pacific Group on Money Laundering) 18 වන වාර්ෂික සමුළුව.
5. සැප්තැම්බර් මාසයේ දී, ඉන්දුනීසියාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් බැංකුව මගින් පැවැත්වූ "ආසියාවේ

මූල්‍ය තත්වයෙහි අනාගතය: සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලැස්වීම - 2015" (Future of Asia's Finance: Financing for Development 2015) සමුළුවට සහභාගි වීම සහ ශ්‍රී ලංකා බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ ප්‍රධාන නියෝජිත ලෙසට ඩුබායි හා අබුඩාබි හි දී ඉහළ මට්ටමේ බැංකු නිලධාරීන් සමඟ පැවති රැස්වීම්.

6. ඔක්තෝබර් මාසයේ දී, මාලදිවයිනේ මූල්‍ය අධිකාරියෙහි අධිපතිගේ ආරාධනයෙන් එහිදී පැවති 'ඩි ලා රූ ප්‍රාදේශීය සමුළුවේ' (De La Rue Regional Conference) ප්‍රධාන දේශනය පැවැත්වීම, ගරු අගමැතිතුමාගේ සිංගප්පූරු සංචාරයට පෙර, සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් සමඟ, ද්විපාර්ශ්වික සහයෝගිතා සම්බන්ධයෙන් පැවති සාකච්ඡා සහ ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මූලිකව, ප්‍රභුවරුන්ගෙන් සමන්විත නියෝජිත මණ්ඩලය සමඟින් සිංගප්පූරුවේ දී සහභාගි වූ නිල රැස්වීම.

7. නොවැම්බර් මාසයේදී, ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් පෙරටුව සිංගප්පූරුවේ මධ්‍යම අර්ථසාධක අරමුදල් මණ්ඩලයේ සහ නිවාස සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සමඟ පැවති රැස්වීම්, සිංගප්පූරුවේ දී එහි ආයෝජකයින් සහ මධ්‍යම අර්ථසාධක අරමුදල් මණ්ඩලයේ සහ නිවාස සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සමඟ ගරු මුදල් අමාත්‍යතුමන් සමඟින් පැවති රැස්වීම්, ඉන්දියානු සංචිත බැංකුවේ කේරළ සහ ලක්ෂද්වීප් හි ප්‍රාදේශීය අධ්‍යක්ෂගේ ආරාධනයෙන් තිරුවානන්තපුරම් ප්‍රාදේශීය කාර්යාලයෙහි සිදුකළ සංචාරය, පිලිපීනයේ මැනිලා නුවරදී පැවති 51 වන SEACEN අධිපතිවරුන්ගේ සමුළුව සහ SEACEN අධිපතිවරුන්ගේ මණ්ඩලයේ 35 වන රැස්වීම.

8. දෙසැම්බර් මාසයේ දී, සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයේ, ලී ක්වාන් යූ ජන ප්‍රතිපත්ති පාසලේ පැවති නිල ඒකාබද්ධ මූල්‍යමය හා මූල්‍ය ආයතන රැස්වීමේ දී (Joint Office Monetary and Financial Institutions Forum) ප්‍රධාන දේශනය පැවැත්වීම, සිංගප්පූරුවේ Fitch Ratings සහ Singapore Cooperation Enterprise සමඟ පැවති රැස්වීම්, සෞදි අරාබියානු රාජධානියේ බැංකුකරණ අංශයේ නිලධාරීන් හා ශ්‍රී ලංකාවේ බැංකුකරණ අංශයේ නියෝජිතයන් සමඟ පැවති සාකච්ඡා සහ ඉන්දියානු සංචිත බැංකු කාර්යාලයේ චෙන්නායි ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයාගේ ආරාධනය මත එහි නිලධාරීන් හා අභ්‍යාස විද්‍යාලයේ කාර්ය මණ්ඩලය සමඟ පැවති සාකච්ඡා.

## 15.7 පත්කිරීම්

1. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඊ.ඒ. හෙට්ටිආරච්චි මහතා 2015 පෙබරවාරි 09 දින සිට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 සැප්තැම්බර් 21 දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

2. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආර්.බී. වීරසිංහ මහත්මිය 2015 පෙබරවාරි 09 දින සිට කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 සැප්තැම්බර් 21 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - බස්නාහිර පළාතෙහි අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

3. මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, එච්.එම්. ඒකනායක මහතා 2015 පෙබරවාරි 09 දින සිට ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

4. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී, සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මහත්මිය 2015 පෙබරවාරි 09 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස ද, අනතුරුව 2015 සැප්තැම්බර් 21 දින සිට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

5. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, එම්.ජේ.එස්. අබේසිංහ මහතා 2015 පෙබරවාරි 09 දින සිට බැංකු විද්‍යා පීයෙසෙහි අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 සැප්තැම්බර් 21 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - දකුණු පළාතෙහි අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

6. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආර්.ඒ.එස්.එම්. දයාරත්න මහත්මිය 2015 පෙබරවාරි 09 දින සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

7. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, එස්.ජේ.ඒ. හඳගම මහතා 2015 පෙබරවාරි 09 දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

8. මුදල් අමාත්‍යාංශය වෙත මුදා හැර සිටි, කේ.එම්.ඒ.එන්. දවුලගල මහත්මිය 2015 පෙබරවාරි 09 වන දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 සැප්තැම්බර් 21 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උතුරු මැද හා වයඹ පළාත්හි අධ්‍යක්ෂ ලෙස හා ඉන් අනතුරුව 2015 නොවැම්බර් 05 දින සිට මුදල් මණ්ඩලයේ නියෝජ්‍ය ලේකම් ලෙස පත් කරන ලදී.

9. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී, එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා 2015 පෙබරවාරි 09 දින සිට මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

10. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී, පී.ඩබ්.ඩී.එන්.ආර්. රොද්‍රිගෝ මහතා 2015 පෙබරවාරි 09 දින සිට දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

11. දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආර්.ඒ.ඒ. ජයලත් මහතා 2015 පෙබරවාරි 09 දින සිට සේවක

අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

12. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ජේ.පී.ආර්. කරුණාරත්න මහතා 2015 පෙබරවාරි 09 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

13. බැංකු විදු පියෙසෙහි වැඩබලන අධ්‍යක්ෂ, සී.එන්.විජයසේකර මහතා 2015 පෙබරවාරි 09 දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 පෙබරවාරි 28 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

14. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ, ඒ.ඒ.එම්. තාසිම් මහතා 2015 පෙබරවාරි 09 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 පෙබරවාරි 28 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

15. අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. දසනායක මහත්මිය 2015 පෙබරවාරි 10 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

16. මුදල් අමාත්‍යාංශය වෙත මුදා හැර සිටි, කේ.එම්.එම්. සිරිවර්ධන මහතා 2015 මැයි 01 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2015 නොවැම්බර් 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

17. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී, පී.වී.එල්. නන්දසිරි මහතා 2015 ජුනි 09 දින සිට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

18. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රධාන ගණකාධිකාරී, පී.ඒ. විජේරත්න මහතා 2015 ජුනි 09 දින සිට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩබලන ප්‍රධාන ගණකාධිකාරී ලෙස ද, අනතුරුව 2015 දෙසැම්බර් 09 දින සිට එම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන ගණකාධිකාරී ලෙස ද පත් කරන ලදී.

19. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කේ. ගුණතිලක මහත්මිය 2015 ජුනි 19 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

20. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඒ.එම්.එන්. ගුණවර්ධන මහතා 2015 ජුනි 19 දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

21. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, කේ.එම්. අබේකෝන් මහතා 2015 අගෝස්තු 03 දින සිට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධූරයෙහි වැඩ බැලීමට පත් කරන ලදී.

22. විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පාලක, ඩී.එම්.රූපසිංහ මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ පළාත් කාර්යාලය - උඩරට හි අධ්‍යක්ෂ ලෙස ද, එම තනතුරට අමතරව 2015 නොවැම්බර් 05 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ පළාත් කාර්යාලය - උතුරු මැද හා වයඹ පළාත් හි අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

23. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, යූ.එච්.ඊ. සිල්වා මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට බැංකු විදු පියසෙහි අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

24. වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා සිට නැවත සේවයට පැමිණි යූ.පී. අලවත්තගේ මහතා 2015 සැප්තැම්බර් මස 21 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

25. ලේකම් දෙපාර්තමේන්තුවේ ලේකම්, එම්.අයි. සුෆියාන් මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උතුරු හා නැගෙනහිර පළාත් හි අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

26. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මහත්මිය 2015 සැප්තැම්බර් 21 දින සිට විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විනිමය පාලක ලෙස පත් කරන ලදී.

27. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී, එස්.එච්. ගුණවර්ධන මෙනෙවිය 2015 සැප්තැම්බර් 21 දින සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

28. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ටී.එච්.බී. සරත්චන්ද්‍ර මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩබලන අධිකාරී ලෙස පත් කරන ලදී.

29. ලේකම් දෙපාර්තමේන්තුවේ අතිරේක ලේකම්, බී.ඩබ්. ජිනසේන මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධූරයෙහි වැඩ බැලීමට පත් කරන ලදී.

30. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී, එම්.එස්.කේ. ධර්මවර්ධන මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

31. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී, ටී.ඩී.එච්. කරුණාරත්න මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස ද, අනතුරුව 2015 ඔක්තෝබර් 01 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

32. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී, ආචාර්ය එම්.ඉසෙඩ්.එම්. ආසිම් මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

33. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, කේ.එච්.ඒ.එස්. ආරියරත්න මහතා 2015 සැප්තැම්බර් 21 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ ලේකම් ධුරයෙහි වැඩබැලීමට පත් කරන ලදී.

34. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ටී.එම්.ඉසෙඩ්. මුතාලිෆ් මහතා 2015 ඔක්තෝබර් 01 දින සිට මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

35. ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඩී.ඒ.ජී.කේ. විජේතුංග මහතා 2015 ඔක්තෝබර් 22 දින සිට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

36. ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, වී. බාස්කරන් මහතා 2015 ඔක්තෝබර් 22 දින සිට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

### 15.8 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

1. සහකාර අධිපති, එස්.ආර්. ආටිගල මහතා නියෝජ්‍ය ලේකම් ලෙස මුදල් අමාත්‍යාංශය වෙත.

2. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ, එස්. ගුණරත්න මහත්මිය විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

3. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ, ආචාර්ය ආර්.ඒ. පෙරේරා මහත්මිය රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත.

4. මාණ්ඩලික පංතියේ III (2) ශ්‍රේණියේ, ඩී.එස්.ඩබ්. සමරතුංග මහත්මිය මුදල් අමාත්‍යාංශය වෙත.

5. මාණ්ඩලික පංතියේ III (2) ශ්‍රේණියේ, ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර මහතා මුදල් අමාත්‍යාංශය වෙත.

6. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, එස්.ජී.එස්.ඩී. ජයසේකර මහතා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත.

7. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, එස්.ජේ.කේ. ගුරුගේ මහතා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත.

8. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, එච්.එස්.එස්. සිල්වා මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

9. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ, එන්.බී. ජනගන් මහතා මුදල් අමාත්‍යාංශය වෙත.

10. රියදුරු, එස්.එන්.ඩබ්. කරුණාදාස මහතා විදුලිබල හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය වෙත.

### 15.9 විශ්‍රාම ගැනීම්

1. සහකාර අධිපති, ආචාර්ය ඩබ්.එම්. හේමචන්ද්‍ර මහතා, 2015 සැප්තැම්බර් 12 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

2. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, සී.බී පත්බේරිය මහතා 2015 පෙබරවාරි 02 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

3. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, එල්.ඩී.ඩී.වයි. පෙරේරා මහතා 2015 අප්‍රේල් 07 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

4. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, එච්. ශ්‍රියාරත්න මහතා 2015 අප්‍රේල් 19 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

5. මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, එච්.පී.ජී.එස්. රත්නසිරි මහතා 2015 මැයි 23 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

6. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ටී.ඩබ්. ආරියරත්න මහතා 2015 නොවැම්බර් 06 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

7. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ, ඒ.ජේ.එල්. පීරිස් මහතා 2015 දෙසැම්බර් 17 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## 16. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සියලු මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පහසුකම් සැලසීම උදෙසා 1981 වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. 2015 වර්ෂය තුළ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 4 ක් යටතේ තම දායකත්වය සපයන ලදී.

(අ) පිරිවැය - ඵලදායිතා සහිතව තොරතුරු තාක්ෂණ පහසුකම් ලබාදීම.

(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම.

(ඇ) ජාතික ගෙවීම් පද්ධති යටිතල පහසුකම් ස්ථාපනය කිරීමට දායක වීම.

(ඈ) තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය කිරීම.

**(අ) පිරිවැය - ඵලදායිතා සහිතව තොරතුරු තාක්ෂණ පහසුකම් ලබාදීම**

පසුගිය වසර තුළ දී නව ව්‍යාපෘති 33 ක් යටතේ තොරතුරු තාක්ෂණ පහසුකම් ලබාදීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සැලසුම් කරන ලදී. මෙහිදී, ව්‍යාපෘති 6 ක් ආර්ථික ප්‍රතිපත්ති උපදේශන ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහාත්, ව්‍යාපෘති 8 ක් මූල්‍ය අංශ නියාමන හා අධීක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහාත් සැලසුම් ව්‍යාපෘති 14 ක් ශක්‍යතා දියුණු

කිරීම් සහ පහසුකම් සැපයීම් ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහාත් සැලසුම් කරන ලදී. වසර අවසානය වන විට මින් ව්‍යාපෘති 23 ක් සාර්ථකව අවසන් කර ක්‍රියාවට නැංවීමට හැකි වූ අතර, ව්‍යාපෘති 7 ක් අදාළ දෙපාර්තමේන්තු අත්හදා බැලීම් අදියරෙහි ද ව්‍යාපෘති 3 ක් මෘදුකාංග නිර්මාණය කිරීමේ අදියරෙහි ද පැවතුණි.

වර්ෂය තුළ දී සිදු කෙරුණු ප්‍රධාන මෘදුකාංග පද්ධති ව්‍යාපෘතීන් පහත දැක්වේ;

(i) මුදල් සුරක්ෂිතාගාරයන් අතර පවතින ව්‍යවහාර මුදල්හි ප්‍රවාහය සුමටව පාලනය කිරීම සහ එම මුදල්හි නාමික අගයන් අනුව ලේඛන (inventory) තත්කාලීනව සහ නිරවද්‍යව ලබාගැනීම සඳහා නවීනතම ව්‍යවහාර මුදල් ලේඛන කළමනාකරණ පද්ධතියක් (CIMS) ඇති කිරීම.

(ii) බැංකුවෙහි මානව සම්පත් කළමනාකරණ පද්ධතියෙහි (eHRNet) නව මොඩියුල 4 ක් ක්‍රියාවට නැංවීම සහ විවිධ වූ සේවක ගෙවීම් සිදු කිරීමට අමතර මොඩියුල 4 ක් නිර්මාණය කිරීම.

(iii) කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සහ අනෙකුත් ගෙවීම් උප පද්ධති ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය තුළින් (SLIPS) සුමටව කරගෙන යාම සඳහා ඒකාබද්ධ ගෙවීම් පද්ධතියක් (IPS) නිර්මාණය කිරීම.

(iv) ණය උපකරණයන්ට අදාළ තොරතුරු ගබඩා කිරීම සඳහා සහ ප්‍රාථමික නිකුතුන් සහ ණය උපකරණයන් ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය මධ්‍යගත කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙනුවෙන් පොදු දත්ත ගබඩාවක් නිර්මාණය කිරීමෙන් පසු පරිශීලක අත්හදා බැලීම් සඳහා අදාළ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

(v) බැංකු අධීක්ෂණ සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල නියාමනය පහසු කරවීම සඳහා වාර්තා ලබාගැනීමේ පහසුකම් එක් කරමින් නියාමක මූල්‍ය වාර්තා පද්ධතිය (FinNet) වැඩි දියුණු කිරීම. ඒ අනුව, වසර අවසානය වනවිට නියාමක මූල්‍ය වාර්තා පද්ධතිය මගින් (FinNet) විවිධ වාර්තා වර්ග 250 ක් පමණ ලබාගැනීමේ පහසුකම් සලසන ලදී.

(vi) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික දායක මුදල් එකතු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා තත්කාලීන දත්ත වලංගුකරණය (Real time data validation) සහිතව නව අන්තර්ජාල සේවා හඳුන්වා දීම සහ සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබා ගැනීමේ සහ නිවාස ණය අයදුම්පත්වල තත්ත්වය දැන ගැනීම සඳහා කෙටි පණිවුඩ සේවාවක් හඳුන්වා දීම.

(vii) පුළුල් පරාසයකින් යුතුව විවිධ දෙපාර්තමේන්තු මගින් නිකුත් කරන සමාජ හා ආර්ථික දත්ත, පොදු ආකෘතියකින් ලබා ගැනීමට හැකිවනසේ පොදු විද්‍යුත් පර්යේෂණ දත්ත ගබඩාක් (Common Electronic Research Database) නිර්මාණය කිරීම.

(viii) ශ්‍රී ලංකා මහ බැංකුවේ නව නිලධාරීන් බඳවා ගැනීම කාර්යක්ෂම කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුවට අන්තර්ජාලය පදනම් කරගත් නව බඳවා ගැනීමේ පද්ධතියක් (Recruitment System) හඳුන්වා දීම.

**(ආ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම්හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම**

2015 වසර තුළදී ද ඉහළ සේවා උපයෝජ්‍යතාවයක් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට අනුකූලව යටිතල පහසුකම් නඩත්තු කරන ලද අතර, වැඩිදියුණු කිරීම් ද සිදු කරන ලදී. පසුගිය වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එසේ නඩත්තු කරන ලද සහ වැඩිදියුණු කරන ලද පද්ධතීන් කිහිපයක් පහත දැක්වේ.

(i) තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම

වසම් පාලකය, ඉලෙක්ට්‍රොනික තැපැල් සේවාව ඇතුළු අනිකුත් සේවා දායකයන් යාවත්කාලීන කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වර්ධනය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල අතර තොරතුරු හුවමාරුව හා සහකරණය සඵලදායීව සිදුකරගෙන යෑමට අවශ්‍ය අභ්‍යන්තර කාර්යාලයීය පරිසරය යාවත්කාලීන කිරීම.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස පරිපාලනය සහ දෝෂාවේක්ෂණය සඳහා නව අධීක්ෂණ පද්ධතියක් හඳුන්වා දීම.

(ii) ජාල පද්ධති වැඩිදියුණු කිරීම

කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලයේ සිට ශ්‍රී ලංකා මහ බැංකු ආයතනික ජාලයට සහ සේවක අර්ථසාධක අරමුදල් පද්ධතියට ප්‍රවේශ වීම සඳහා නව දත්ත ජාලයක් ස්ථාපනය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ ප්‍රකාශ තන්තු මූල බන්ධකය (Fibre optic backbone) සම්පූර්ණ කිරීම සහ තොරතුරු සන්නිවේදන ජාලය ප්‍රතිසංවිධානය කිරීම මගින් විශ්වාසනීයතාව වැඩිදියුණු කිරීම සහ දෝෂාවේක්ෂණ ක්‍රියාවන් ඉක්මණින් සිදුකිරීමට පහසුකම් සැලසීම.

වැඩිවන අවශ්‍යතා සපුරාලීම සහ අධිවේගී අන්තර්ජාල උඩමතු බැලීමක් (Browsing) සඳහා මහ බැංකු ප්‍රධාන කාර්යාලයෙහි අන්තර්ජාල පොදු ප්‍රවේශ මාර්ගවල ධාරිතාව දෙගුණ කිරීම සහ රැහැන් රහිත අන්තර්ජාල සේවාවන් යාවත්කාලීන කිරීම.

**(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායක වීම**

2015 වර්ෂය තුළදී ද තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු ව විසින් ජාතික ගෙවීම් පද්ධතියේ පහසුකම් වර්ධනය කිරීමෙහිලා වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා උපදේශනය සහ තාක්ෂණ ප්‍රවීණතාව අඛණ්ඩව සපයන ලදී.

- ලංකා ක්ලියර් පුද්ගලික සමාගම (LCPL) විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන පොදු කාඩ්පත් සහ ගෙවීම් ස්විචය (CCAPS) යටතේ පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය (CAS), පොදු විද්‍යුත් අරමුදල් හුවමාරු ස්විචය (CEFTS), පොදු ජංගම ගෙවීම් ස්විචය (CMobs) සහ පොදු විකුණුම් ස්ථාන ස්විචය (CPOS) ස්ථාපිත කිරීමෙහිලා තාක්ෂණික ඇගයීම් කටයුතුවලට අවශ්‍ය දායකත්වය ලබාදීම.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL), මැතිවරණ දෙපාර්තමේන්තුව, ණය තොරතුරු කාර්යාංශය (CRIB) යන ආයතනවල ඉල්ලීම පරිදි තාක්ෂණික ඇගයීම් කටයුතුවලට දායකත්වය ලබාදීම.
- දේශීය ණය වෙළඳපොළ වර්ධනය සඳහා විද්‍යුත් වෙළඳපොළ පහසුකම් (e-trading platform) සහ මධ්‍යගත ප්‍රතිපාර්ශ්ව පද්ධතිය (Central Counter Party System) කොළඹ කොටස් වෙළඳපොළෙහි ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා දායකත්වය ලබාදීම.

**(ඈ) තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය**

තොරතුරු සුරක්ෂිතභාවය වැඩිදියුණු කොට සිදු විය හැකි තර්ජන අවම කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය කිරීම ඕනෑම ආයතනයකට තීරණාත්මක වේ. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර තුළ දී පූර්ව විචාරීව අවදානම අඩු කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී.

- අන්තර්ජාතික ISO 27001 ප්‍රමිතිය මත පදනම් වූ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහිත ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම. ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීමේ විද්‍යාගාරයක් ද එහි ඇතුළත් වේ.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ආරක්ෂණ පරීක්ෂණ කටයුතු විශේෂ පුහුණුව ලත් තාක්ෂණ විශේෂඥයින් මගින් අඛණ්ඩව සිදු කරන ලදී.
- අඛණ්ඩ මෙහෙයුම් තුළින් අභ්‍යන්තර හා බාහිර ආරක්ෂණ තර්ජන අවම කර, ආරක්ෂණ බිඳවැටීම්වලින් තොර වූ, සුරක්ෂිත දත්ත ජාලයක් පවත්වාගෙන යෑම.
- උපාය මාර්ගික ලෙස වැදගත් තොරතුරු තාක්ෂණ පද්ධතිවල ආපදා සඳහා පෙර සූදානම පරීක්ෂා කර බැලීම සඳහා අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සැසි දෙකක් ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ සිට සාර්ථකව අත්හදා බලන ලදී.

# 17. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුව එහි අභ්‍යන්තර විගණන කටයුතු 1951 වර්ෂයේ සිට අඛණ්ඩව සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ මෙහෙවර සහ කාර්ය වපසරියත්, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ සහ කාර්ය මණ්ඩලයේ වගවීම්, ස්වාධීනත්වය, වගකීම සහ අධිකාරියත්, අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයෙහි අන්තර්ගත වී ඇත. විගණන කටයුතු ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සහ ක්ෂේත්‍රයේ ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් 2015 වසර තුළ සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

## 17.1 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

**අ) වාර්ෂික විගණන සැලැස්ම**

වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණනයට භාජනය විය යුතු ක්‍රියාකාරකම් සමුදාය (Audit Universe) සැලකිල්ලට ගනු ලැබිය. මේ සඳහා ක්‍රියාකාරකම් පදනම් කරගත් පිරිවැය පද්ධතිය (Activity Based Costing System) තුළ අන්තර්ගත ක්‍රියාකාරකම් එක්රැස් කොට, තක්සේරු කොට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථ හා ඊට අනුයාත පරමාර්ථයන්ට අදාළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය දෙමින්, නියෝජිත කාර්යයන් හා වෙනත් කාර්යයන් ද ඇතුලත් කොට වාර්ෂික විගණන සැලැස්ම සකස් කරන ලදී. තවද, තොරතුරු පද්ධති විගණනයන් ද එකී සැලැස්මට ඇතුලත් විය. මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවේ අනුමැතිය සහිතව වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාවට නංවන ලදී.

**ආ) අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටිය**

සෑම විගණන පැවරුමක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය කිරීම සහ නිරාකරණයට අදාළ කටයුතු කිරීම යන අදියර හතරකින් සිදුකරන ලදී. ක්‍රියාත්මක කිරීමේ අදියරේ දී, විගණන තොරතුරු රැස් කිරීම සහ ලේඛන ගත කිරීම සිදු කෙරේ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ දී පියවර හතරක් අනුගමනය කරන ලදී. එනම්, විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිමකිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන නිරීක්ෂණ ලිඛිතව දැනුම් දීම, විගණන කෙටුම්පත් වාර්තාව නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තාව නිකුත් කිරීම වේ. තවද, දෙපාර්තමේන්තුවල ක්‍රියාවලි හිමිකරුවන් (process owners) විසින් එකඟ වූ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණනයන් ද නියමිත කාල පරාසයන් තුළදී සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තු භාවිතා කරන පද්ධතීන් (තොරතුරු පද්ධතීන් ද ඇතුළත්ව) සහ එම දෙපාර්තමේන්තුවලට අදාල අභ්‍යන්තර පාලනයන්, අත්පොත්, ප්‍රතිපත්ති සහ පටිපාටීන් වලට ඇති අනුකූලතාවය විමර්ශනය කරනු ලබයි. ඒ අනුව, දෙපාර්තමේන්තු රාශියක විගණනයන් සිදු කරන ලද අතර අභ්‍යන්තර පාලන දුර්වලතාවයන් සහ පද්ධතිවල අඩුලුහුඩුකම්

පෙන්වා දෙමින් එම නිරීක්ෂණයන් හා බැඳුණු අවදානම් අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගයන් ද නිර්දේශ කරන ලදී. එපරිද්දෙන්, එම දෙපාර්තමේන්තුවල කරනු ලබන කාර්යයන්හි කාර්යක්ෂමතාව ඉහළ නංවාලීමට හා බැංකුව තුළ සිදු විය හැකි වංචා, අපතේ යෑම් සහ සැළකිය යුතු මට්ටමේ අලාභ සිදුවීමේ අවධානම අවම කර ගැනීමට ද එකී නිර්දේශ ඉවහල් විය.

ඊට අමතරව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ ඉල්ලීම මත ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන ආයෝජන ක්‍රියාපටිපාටීන්, අරමුදල් කළමනාකරණ කටයුතු, තොරතුරු පද්ධති පාලන, වෙනත් අභ්‍යන්තර පාලන සහ අත්පොත්, ප්‍රතිපත්ති හා පටිපාටීන් පිළිපැදීම යනාදිය ඉලක්ක කරගත් විමර්ශන සිදු කරන ලදී. එකී විමර්ශන මගින් විවිධ දෙපාර්තමේන්තු කරනු ලබන කර්තව්‍යයන් ආවරණය කරනු ලැබීය. එම විමර්ශන තුළින් සොයාගත් කරුණු සහ නිර්දේශ, සැළකිල්ලට ගනිමින් මහ බැංකුව මගින් සිදු කරනු ලබන ආයෝජන සඳහා වෙනමම ඒකකයක් ස්ථාපිත කිරීමට මුදල් මණ්ඩලය තීරණය කරන ලදී. එමගින් පද්ධතීන් විධිමත් කිරීමත්, අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීමත් අපේක්ෂා කෙරේ. අදාළ දෙපාර්තමේන්තු විසින් එම නිර්දේශයන් මේ වනවිටත් ක්‍රියාවට නංවා ඇත. මහ බැංකු ආයෝජනයන් සඳහා ස්ථාපිත කර ඇති විශේෂිත වූ ඒකකය නිදසුනක් ලෙස දැක්විය හැකිය.

#### ඇ) විගණන කටයුතුවල ප්‍රගතිය වාර්තා කිරීම

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවට කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී. එමෙන්ම, විගණකාධිපති වෙත විගණන කටයුතු පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා සපයන ලදී.

### 17.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා පුහුණුකිරීම්

ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දැනුම බෙදා ගැනීමේ සැසි පවත්වනු ලැබීය. තවද, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය සිය දැනුම බෙදා ගැනීම සහ වර්ධනය කර ගැනීම සඳහා අභ්‍යන්තර සැසි පවත්වන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි උපාධිධාරීන්, උපාධි අපේක්ෂකයන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ශිෂ්‍යයන් සඳහා අභ්‍යන්තර විගණනය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳව පුහුණු කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුව විසින් 2015 වසර තුළදීත් අඛණ්ඩව සිදුකරනු ලැබිණි.

### 17.3 මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව

මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව මුදල් මණ්ඩලයේ එක් සාමාජිකයෙකු සහ බාහිර විගණන වෘත්තිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් මණ්ඩලයේ ලේකම් එම කමිටුවේ ලේකම් වන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එකී කමිටුවේ සහකාර ලේකම් වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් එම කමිටුවෙහි ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයන ලදී. තවද, මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටු රැස්වීම් සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු නිරීක්ෂකයෙකු ලෙසින් සහභාගී වේ.

අදාළ විධිවිධානයන්ට අනුව, උපදේශාත්මක විගණන කමිටු රැස්වීම් හයක් වසර තුළ පවත්වා ඇත. එම රැස්වීම් වලදී අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය සහ අභ්‍යන්තර විගණන වාර්තා සඳහා වූ කළමනාකරණ ප්‍රතිචාර සමාලෝචනය කරන ලද අතර රැස්වීම් වලදී ගන්නා ලද තීරණ මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

### 17.4 බාහිර විගණන කටයුතු සඳහා පහසුකම් සැපයීම

විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සිදු කරනු ලබන අතර, මුදල් මණ්ඩලයේ ලේකම් මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව බාහිර විගණනය සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කරයි. අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති විසින් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young), වරලත් ගණකාධිකාරීවරුන් පත්කර ඇත. ඒ අනුව, අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය සහ සන්නිවේදනය කිරීම සඳහා මුදල් මණ්ඩලයේ ලේකම් වෙත තාක්ෂණික සහය සැපයීම ද දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී.

## 18. ජාත්‍යන්තර මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ නිල විදේශ විනිමය සංචිත කළමනාකරණය සඳහා වගකීම මුදල් නීති පනත අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. ඒ අනුව, ජාත්‍යන්තර සංචිත කළමනාකරණය පිළිබඳ වගකීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ අධීක්ෂණය පිළිබඳ වගකීම මුදල් මණ්ඩලය විසින් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත.

ජාත්‍යන්තර සංචිත පවත්වාගෙන යාම සහ එහි සංයුතිය, රුපියලේ බාහිර ස්ථායීතාව පවත්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල පරාසය සහ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීමට අදාළ මුදල් මණ්ඩල බලතල සහ වගකීම් යනාදිය ආවරණය කරමින් ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා අවශ්‍ය නීතිමය රාමුව මුදල් නීති පනතෙන් සලසා ඇත. මෙහිදී වත්කම් වර්ග, ප්‍රතිපාර්ශව, මූල්‍ය උපකරණ හා නිකුත් කරන්නන් සම්බන්ධයෙන් වන පරාමිතීන් සම්බන්ධයෙන් මුදල් නීති පනතෙහි 67 වන වගන්තිය අදාළ වේ. තවද, සංචිතයෙහි සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීමටත් ද්‍රවශීලතාවය හා ආදායම් උපයා ගැනීම යන අරමුණු උදෙසා පියවර ගැනීමටත් සංචිත කළමනාකරණ කටයුතුවල විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට මුදල් මණ්ඩලයට හැකියාව ඇත.

## 18.1 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

ආරක්ෂාව, ද්‍රවශීලතාවය හා අපේක්ෂිත ප්‍රතිලාභ ද සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශ සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුවෙහි (FRMC-Foreign Reserves Management Committee) අධීක්ෂණය යටතේ ජාත්‍යන්තර සංචිතවල ආයෝජනය සිදු කරනු ලැබේ. ජාත්‍යන්තර සංචිත ප්‍රධාන මුදල් වර්ග කිහිපයකින් සමන්විත වන අතර, ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම් (Fixed Income Securities), මුදල් වෙළඳපොළ උපකරණ සහ රන් සංචිතවල ආයෝජනය කර ඇත. මෙම ස්ථාවර ආදායම් සුරැකුම් ආයෝජන කළඹ ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත රාජ්‍ය සුරැකුම්පත්, රජයන් සහතික කරන ලද සුරැකුම්පත්, රජයේ නියෝජිත ආයතන සහ අන්තර්ජාතික ආයතන මගින් නිකුත් කර ඇති සුරැකුම්පත්වලින් සමන්විත වේ. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංචිත කළමනාකරණය සඳහා සිදු කරනු ලබන ගනුදෙනු, ස්ථාවරභාවය හා ණය ලබාදීමට ඇති යෝග්‍යතාවය යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් කළමනාකරණය විසින් අනුමත කරන ලද ප්‍රතිපාර්ශව, මහ බැංකු, ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත වාණිජ බැංකු හා ආයෝජන ආයතන සමඟ සිදු කරනු ලැබේ. විදේශ ද්‍රවශීලතා අවශ්‍යතාවය, ණය සේවා ගෙවීම්, අවදානම් කළමනාකරණ පරාමිතීන්, ආදායම් උත්පාදන හැකියාව සහ මුදල් මණ්ඩලයේ විශේෂිත නියෝග යනාදී කරුණු මත සංචිත ප්‍රමාණය සතු වත්කම් හා ව්‍යවහාර මුදල් සංයුතීන් නිර්ණය කරනු ලබයි.

ගෝලීය මූල්‍ය වෙළඳපොළෙහි 2015 වසර තුළ සිදු වූ ප්‍රධාන සිදුවීම් සඳහා ලොව ප්‍රමුඛපෙළේ මහ බැංකුවල කටයුතු හේතු විය. වර්ෂය ආරම්භයේදීම යුරෝපා මහ බැංකුව විසින් ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහනක් හඳුන්වා දෙන ලද අතර, ජනවාරි මාසයේ දී ඉන්දියානු සංචිත බැංකුව විසින් අනපේක්ෂිත ලෙස බැංකු පොලී අනුපාත පහළ දමන ලදී. 2015 වර්ෂය මැද භාගයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් චීනයේ "රෙන්මින්බි" (Renminbi) මුදල් ඒකකය විශේෂ ගැනුම් හිමිකම් පැසට අලුත්ම මුදල් ඒකකය ලෙස 2016 ඔක්තෝබර් මාසයේ සිට ඇතුළත් කිරීමට ගත් තීරණය සිදු වූ විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැකිය. ඇමෙරිකානු ෆෙඩරල් බැංකුව විසින් වසර නවයකට පසු පළමු වරට බැංකු පොලී අනුපාත ඉහළ දැමීම, වර්ෂ අවසානයේ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළේ සිදු වූ විශේෂ සිදුවීමක් විය.

2015 වර්ෂය පුරාවට ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තුළ ඇති වූ අස්ථාවර තත්ත්වයන් සඳහා චීන ආර්ථික පසුබෑම කේන්ද්‍ර විය. වසරේ පළමු කාර්තුව තුළ ඇති වූ චීන ආර්ථික පසුබෑම, බොර තෙල් සහ භාණ්ඩ මිල පහත වැටීමටත් කොටස් වෙළඳපොළේ පහළ යෑමටත් බලපෑ අතර, එතුළින් ලෝක ආර්ථික වර්ධනය පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණක් විය. වසරේ තුන්වන කාර්තුව තුළ දී චීන මහජන බැංකුව විසින් එරටෙහි මුදල් ඒකකය වන යුආන් (Yuan) අවප්‍රමාණය කර වෙළඳපොළ බලවේගවලට විශේෂ කාර්යභාරයක් පැවරීම සහ චීන කොටස් වෙළඳපොළෙහි ඇති වූ ප්‍රබලම කඩාවැටීම ලෝක මූල්‍ය වෙළඳපොළ කෙරෙහි බලපෑම් ඇති කරන ලදී. චීන කොටස් වෙළඳපොළ තුළ දී "කළු සඳුදා" (Black Monday) ලෙස හඳුන්වන මෙතෙක් ඇති වූ දරුණුම වෙළඳපොළ අර්බුදය තුළින් චීන කොටස් වෙළඳපොළ සියයට 8.5 කින් පහළ වැටීමකට ලක් විය. මෙම කඩාවැටීම අනෙකුත් ගෝලීය කොටස් වෙළඳපොළවල් වන ටෝකියෝ, ලන්ඩන් සහ නිව්යෝර්ක් කොටස් මිල දර්ශකයන් ද සියයට 4-5 පහළ බැසීමකට හේතු විය.

2014 වසරේ ඇරඹි බොර තෙල් මිල පහත වැටීම තවදුරටත් පැවතින. මෙයට විසඳුමක් ලෙස OPEC සංවිධානය විසින් සැපයුම සීමා කිරීමක් බලාපොරොත්තු වූ නමුත් එය ද සිදු නොවූ අතර, බොර තෙල් මිල වසර ගණනක් තුළ දී අවම මට්ටමට පහත වැටිණි. තෙල් මිල තරම් නොවුව ද රත්තරන් මිල ද තවදුරටත් පහත වැටිණි.

ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු සංවර්ධිත ආර්ථිකයන් පොලී අනුපාත ඉහළ දැමීමේ තත්ත්වයක දී ආයෝජකයින් විසින් තම ආයෝජන නැගී එන වෙළඳපොළවලින් සාපේක්ෂ වශයෙන් අඩු අවදානම් සහිත, සංවර්ධිත වෙළඳපොළවල් වෙත යොමු කරන ලදී. චීන කොටස් වෙළඳපොළ කඩාවැටීමත් සමඟ ඇති වූ අහිතකර බලපෑම් ව්‍යාප්ත වීමේ අවදානමත් සමඟ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තුළ අස්ථාවර තත්ත්වයක් වර්ධනය වීම හේතුකොට ගෙන ආයෝජකයින්ගේ අවධානය ආරක්ෂිත වත්කම් වෙත යොමු වූ අතර, මේ හේතුවෙන් ආසියානු මූල්‍ය වෙළඳපොළ තුළින් ප්‍රාග්ධන අවප්‍රවාහයක් සිදු විය. මෙවැනි අභියෝගාත්මක තත්ත්වයක් යටතේ, 2015 වසර තුළ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 111.4 ක උපලබ්ධි ආදායමක්, විදේශ විනිමය ගනුදෙනු, මුදල් වෙළඳපොළ ආයෝජන සහ ප්‍රාග්ධන ඉපැයුම් සහ ස්ථාවර ආදායම් සුරැකුම් සඳහා ලද කූපන් ආදායම් මගින් උපයන ලදී.

2015 දී ශ්‍රී ලංකාවට එක්සත් ජනපද ඩොලර් මිලියන 1,500ක් ලබා ගැනීමට හැකි වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සහ ඉන්දීය සංචිත බැංකුව (Reserve Bank of India) අතර මුදල් හුවමාරු ගිවිසුම් දෙකකට අත්සන් තැබීය. මෙම ගිවිසුම් යටතේ කලාපීය සහයෝගීතාවය පිළිබඳ දකුණු ආසියානු සංවිධානයේ (SAARC) සාමාජික රාජ්‍යයන්හි මහ බැංකු මූල්‍ය පහසුකම යටතේ 2015 අප්‍රේල් මාසයේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 400 ක් හා විශේෂ මුදල් හුවමාරු ගිවිසුමක් යටතේ අතිරේක එක්සත් ජනපද ඩොලර් මිලියන 1,100 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා ගැනීමට හැකි විය. මූල්‍ය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් ශක්තිමත් වීමට මෙන්ම ප්‍රමුඛ වෙළඳ හවුල්කරුවන්ට අදාළ මූල්‍ය ඒකකයන්හි විචලනයන්ට සහ සාර්ව ආර්ථික මූලධර්මයන්ට සමගාමීව විනිමය අනුපාතික ස්ථාවරත්වය ශක්තිමත්ව පවත්වා ගැනීමේ අරමුණ සහිතව මෙම ගිවිසුම් වෙත එළඹිණ.

## 18.2 ආයෝජන ක්‍රියාකාරකම් විශ්ලේෂණය සහ පහසුකම් සැපයීම

වර්ෂ 2015 දී, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙළඳපොළ සහ ණය අවදානම් කළමනාකරණ කටයුතු ද ඇතුළුව මැදි කාර්යාල කටයුතු අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත මාරු කරන

ලදී. ඒ අනුව, සංචිත කළමනාකරණයට අදාළ පහත සඳහන් ප්‍රධාන කටයුතු කරගෙන යාම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ආයෝජන විශ්ලේෂණ සහ පහසුකම් සැලසීමේ අංශය (Investment Analysis Facilitation Division) පිහිටුවන ලදී.

### (අ) කාර්ය සාධන ඇගයීම්

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සමස්ත ප්‍රතිලාභ, වත්කම් සහ මුදල් ව්‍යාප්තිය සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරමින් සංචිත කළමනාකරණ කටයුතුවල කාර්ය සාධනය මාසිකව, කාර්තුමය සහ වාර්ෂික වශයෙන් අගයනු ලබන අතර, සංචිත මට්ටම සහ එහි ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණයක් ද සහිතව විදේශ සංචිත කළමනාකරණ කමිටුවට සහ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. තවද, ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන හරහා ඉපැයෙන ප්‍රතිලාභ, මුදල් මණ්ඩලය අනුමත කළ උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයට (Strategic Asset Allocation) අනුව බර තබන ලද අක්‍රිය කළඹකට සාපේක්ෂව මිනුම් ඇගයීමට ලක් කරයි. මෙම ඇගයීම් ක්‍රමය, ආදායම සංසන්දනයට අමතරව ඉදිරි කාර්යාලයේ අලෙවිකරුවන් විසින් ගනු ලබන අමතර අවදානම, ලැබෙන අමතර ප්‍රතිලාභ මගින් ප්‍රමාණවත් ලෙස ආවරණය වන්නේ ද යන්න පෙන්නුම් කිරීමෙන් සක්‍රිය කළමනාකරණ උපායමාර්ගයේ කාර්යක්ෂමතාවය තීරණය කිරීමට උපකාරී වේ.

### (ආ) භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියේ (Treasury Management System) පරිපාලනය

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන පරිශීලකයා මෙන්ම එදිනෙදා මෙහෙයුම් කටයුතු ඇතුළුව එහි පාලන කටයුතුවල ද භාරකාරත්වය උසුලන අතර, අනෙකුත් පරිශීලන දෙපාර්තමේන්තු, විදේශ විකුණුම්කරු සහ දේශීය හවුල්කරු අතර නිසි සම්බන්ධීකරණය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ද වගකීම දරයි. තවද, භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කරනු වස් ස්විෆ්ට් (SWIFT), තත්කාලීන මුදල් පියවීමේ පද්ධතිය (RTGS) සහ පොදු ලෙජරය (GL) වැනි අභ්‍යන්තර පද්ධති සමඟ මෙන්ම බ්ලූම්බර්ග් (Bloomberg) සහ රොයිටර්ස් (Reuters) වැනි බාහිර පද්ධති සමඟ ද එහි පූර්ණ සහ අඛණ්ඩ සම්බන්ධතාවය සහතික කිරීමේ වගකීම ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

### (ඇ) නව නිපැයුම් සහ වෙළඳපොළ පර්යේෂණ

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව එහි අභ්‍යන්තර භාවිතය සඳහා මෙන්ම කළමනාකාරිත්වයේ ප්‍රයෝජනය පිණිස නව මූල්‍ය නිපැයුම් සංකල්ප සහ වෙළඳපොළ තත්ත්වයන් පිළිබඳ වූ විවිධ පර්යේෂණ කරනු ලබයි. වර්ෂ 2015 දී ද, වෙළඳ පාර්ශ්වකරුවන් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැමිණ ඔවුන්ගේ නව මූල්‍ය නිපැයුම් පිළිබඳව මෙන්ම තත්කාලීන වෙළඳපොළ පිළිබඳව ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වන ලදී.

### (ඈ) මූල්‍යමය නොවන අවදානම් සහ අනුකූලතා සුපරීක්ෂණය

පසුගිය වර්ෂය තුළ, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ඉන්දියාව සමඟ ඇතිකර ගන්නා ලද ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුම් දෙකක් සඳහා පහසුකම් සපයන ලදී. තවද, ගනුදෙනුකරු හඳුනා ගැනීම / ගනුදෙනුකරු සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී වීම (Know Your Customer/Customer Due Diligence) පිළිබඳ විදෙස් වෙළඳ සහකරුවන්ගේ අවශ්‍යතාවලට අදාළ තොරතුරු, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව වෙත ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංචිත කළමනාකරණ කටයුතුවලට අදාළ මූල්‍ය නොවන අවදානම් සහ ඒ හා සබැඳි අවදානම් ප්‍රතිකර්ම සැකසීම සහ සුපරීක්ෂණය කරනු ලබන අතර එම කටයුතු අලුතෙන් පිහිටුවන ලද මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත කාර්තුමය පදනම මත වාර්තා කිරීම වර්ෂ 2015 අවසන් කාර්තුවේ සිට ආරම්භ කරන ලදී.

## 18.3 දේශීය විදේශ විනිමය වෙළඳපොළ

2015 වසරේ දී විනිමය අනුපාතිකයේ අධික විචලනයන් පාලනය කිරීමේ අරමුණින්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අඛණ්ඩ අධීක්ෂණයේ නිරත වෙමින්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සුමටව පවත්වා ගෙන යන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව 2015 වර්ෂයේ සැප්තැම්බර් 4 වැනි දින සිට විනිමය අනුපාතය තීරණය වීමට දේශීය විදේශ විනිමය වෙළඳපොළට වැඩි අවකාශයක් ලබාදීම තුළින්, විනිමය අනුපාතිකය තීරණය කිරීම සම්බන්ධයෙන් වැඩි නම්‍යතාවයක් ලබා දෙන ලදී. ඉහළ යන ආනයන වියදම තුළින් ශ්‍රී ලංකා රුපියලට ඇතිවන පීඩනය අඩු කිරීමේ අරමුණින් මෙය හඳුන්වා දෙන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පවත්වා ගෙන යා හැකි ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය වන එක්සත් ජනපද ඩොලර් මිලියන 189 මට්ටම 2015 වර්ෂය තුළදී ද නොවෙනස්ව පැවතිණි. 2014 වසරේ දී එක්සත් ජනපද ඩොලර් බිලියන 15.5 ක් වූ අන්තර් බැංකු ගනුදෙනු පරිමාව 2015 වසරේදී එක්සත් ජනපද ඩොලර් බිලියන 13.6 ක් දක්වා අඩු විය (II-17 වන සංඛ්‍යා සටහන). කෙසේ වෙතත්, එතැන් (Spot) සහ ඉදිරි (Forward) පදනම යටතේ වන විනිමය ගනුදෙනුවල සුළු වර්ධනයක් පෙන්නුම් කල අතර, පසු දින (Tom) සහ එදින (Cash) පියවීම් සිදුවන විනිමය ගනුදෙනුවල සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කෙරිණි. තවද, 2015 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය විකුණුම් ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 3,249.53 විය (II-18 වන සංඛ්‍යා සටහන).

**II-17 සංඛ්‍යා සටහන** — **අන්තර් බැංකු ගනුදෙනු පරිමාව - 2015**

එ.ජ.ඩොලර් මිලියන

| මාසය | එතැන් | පසු දින | ඊදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 81.00 | 147.55 | 75.35 | 654.51 | 958.41 |
| පෙබරවාරි | 159.10 | 144.53 | 93.30 | 484.65 | 881.58 |
| මාර්තු | 247.40 | 82.50 | 71.75 | 655.16 | 1,056.81 |
| අප්‍රේල් | 204.35 | 93.40 | 69.50 | 602.30 | 969.55 |
| මැයි | 248.05 | 70.75 | 71.00 | 515.53 | 905.33 |
| ජුනි | 463.10 | 95.25 | 166.75 | 511.94 | 1,237.04 |
| ජූලි | 268.90 | 105.10 | 106.05 | 515.34 | 995.39 |
| අගෝස්තු | 378.49 | 110.50 | 128.00 | 522.61 | 1,139.60 |
| සැප්තැම්බර් | 493.87 | 186.35 | 140.55 | 476.62 | 1,297.39 |
| ඔක්තෝබර් | 457.83 | 257.03 | 219.05 | 609.31 | 1,543.21 |
| නොවැම්බර් | 369.00 | 191.65 | 186.75 | 563.17 | 1,310.57 |
| දෙසැම්බර් | 498.93 | 135.75 | 48.48 | 614.96 | 1,298.11 |
| එකතුව | 3,870.00 | 1,620.35 | 1,376.53 | 6,725.60 | 13,592.48 |

මූලය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව

**II-18 සංඛ්‍යා සටහන** — **ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විදේශ විනිමය මිලට ගැනුම් සහ විකුණුම් - 2015**

එ.ජ.ඩොලර් මිලියන

| මාසය | ගැණුම් | විකුණුම් | ශුද්ධ ගැණුම්/(විකුණුම්) |
|---|---|---|---|
| ජනවාරි | - | 173.81 | (173.81) |
| පෙබරවාරි | 49.40 | 122.00 | (72.60) |
| මාර්තු | 18.10 | 101.65 | (83.55) |
| අප්‍රේල් | 60.50 | 159.50 | (99.00) |
| මැයි | 8.80 | 157.83 | (149.03) |
| ජුනි | 15.00 | 506.97 | (491.97) |
| ජූලි | - | 352.58 | (352.58) |
| අගෝස්තු | - | 447.25 | (447.25) |
| සැප්තැම්බර් | - | 523.80 | (523.80) |
| ඔක්තෝබර් | 27.60 | 305.55 | (277.95) |
| නොවැම්බර් | - | 306.00 | (306.00) |
| දෙසැම්බර් | - | 272.00 | (272.00) |
| එකතුව | 179.40 | 3,428.93 | (3,249.53) |

මූලය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව

## 19. නීති සහ අනුකූලතා කටයුතු

නීති සහ අනුකූලතා කාර්යයේ භූමිකාව ව්‍යාපාර අඛණ්ඩතාව සහ අවදානම් කළමනාකරණයට අදාළ වැදගත් අංශයක් ලෙස පසුගිය වසර කිහිපයේ දී හඳුනා ගැනුණි. අර්බුදයන් වළකාලීමෙහි ලා නීති සහ අනුකූලතා ක්‍රියාවලිය ඔස්සේ සිදු වන නිවාරණ කාර්යභාරය හේතුවෙන්, ශක්තිමත් අනුකූලතා ක්‍රියාවලියක් යනු විචලනතාවයෙන් වැඩි වන ගෝලීය මූල්‍ය ක්ෂේත්‍රයේ ගැටලු සහ අභියෝග ඵලදායී ලෙස විසඳා ගනු වස් බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනයන්හි අනිවාර්යයෙන් ස්ථාපිතව තිබිය යුතු අංගයක් බව බොහොමයක් ජාත්‍යන්තර ප්‍රමිති සැකසුම් ආයතන විසින් හඳුනා ගන්නා ලදී. අන්තර් ජාතික වශයෙන් සිදු වන සංවර්ධනයන් සළකා බලමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2015 පෙබරවාරි මාසයේදී මුදල් නීති පනතේ 33 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීති සහ අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. පරිපාලන කාර්යයන් සකසා අවසාන වීමෙන් පසුව දෙපාර්තමේන්තුවේ කාර්යයන් 2015 ජුනි මාසයේදී ආරම්භ කෙරිණි. මීට පෙර පැවති නීති දෙපාර්තමේන්තුව වසා දමන ලද්දේ 2006 වසරේදීය.

2015 වර්ෂය ශ්‍රී ලංකා මහ බැංකුවට අභියෝගාත්මක වසරක් වූයේ මහ බැංකුවට එරෙහිව නඩු ගණනාවක් ගොනු කරනු ලැබූ බැවිනි. කෙසේ වෙතත්, දෙපාර්තමේන්තුව විසින් එම නඩු කටයුතු සාර්ථක ආකාරයෙන් මෙහෙයවනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් විවිධ නෛතික අධිකාරයන් ඉදිරියේ කරුණු දැක්වීමට අමතරව, මහ බැංකුවේ අරමුණු ප්‍රශස්ත ලෙස ඉටු කර ගැනීමට හැකි වන ලෙසින් යෝග්‍ය අභ්‍යන්තර නීති පද්ධතියක් සැකසීම, නීති සහ අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කළ අතර නීති ගැටළු සම්බන්ධයෙන් උපදෙස් දීම ඔස්සේ මහ බැංකුවේ සේවාවන් අඛණ්ඩව සිදු කිරීමට ද පහසුකම් සලසා දෙන ලදී. නිදසුනක් ලෙස, අදාළ විධානයන් සහ ගැසට් නිවේදන රැසක් සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ නීති උපදේශන සැපයීම ඔස්සේ විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විනිමය පාලන නීති රීති ලිහිල් කිරීමේ ක්‍රියාවලියට සහාය වීමට දෙපාර්තමේන්තුවට හැකි වීම දැක්විය හැකිය.

වර්ෂය තුළදී, මූල්‍ය පද්ධති ස්ථාවරත්වය, මූල්‍ය වෙළඳපොළ ක්‍රියාකාරීත්වය සහ ගෙවීම් පද්ධතිය සම්බන්ධ නෛතික සහ ක්‍රියාත්මක කිරීමේ ගැටළු ඵලදායී ලෙස නිරාකරණය කිරීම සහ මෙරට මූල්‍ය පද්ධතියට අදාළ නීති පැනවීම උදෙසා අමාත්‍යංශ නියාමන අධිකාරයන්, අමාත්‍යංශ සහ රජයේ දෙපාර්තමේන්තු සමග එක්ව දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත වශයෙන් මූල්‍ය පද්ධතියට අදාල ගැටළු නිරාකරණය කිරීමටත්, මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා සුදුසු යථාවත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමටත් නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවට හැකි විය. ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පත සකසා අවසන් කිරීම රට තුළ සිදු වන මූල්‍ය ආයතන අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය පුළුල් කිරීම අරමුණු කර ගත් ප්‍රධාන කර්තව්‍යයක් විය.

නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව රජයේ නියෝජිත කාර්යයන් සිදු කරන අදාළ දෙපාර්තමේන්තු මෙන්ම මහ බැංකුවේ උපකාරක සේවා සපයන දෙපාර්තමේන්තු හරහා රටේත්, මහ බැංකු කාර්ය මණ්ඩලයේත් අවශ්‍යතා සපුරාලීමට මහ බැංකුවට හැකියාව ලැබිණි. මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා අනුකූලතා කාර්ය සංග්‍රහයක් හඳුන්වා දීමේ කාර්යයේ සහ මූල්‍ය ක්ෂේත්‍රයේ නව වර්ධනයන්ට අනුගත වන ආකාරයෙන් මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නීති සංශෝධනය කිරීමේ ක්‍රියාවලියෙහි නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව නිරතව සිටී.

## 20. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62 අ වගන්තිය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අරමුදල් මාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීම, ගෙවීම් බැරකම් පියවීම සහ සහභාගිත්ව ආයතනවලට පද්ධති නීතිරීති නිකුත් කිරීම සඳහා බලය පවරා ඇත. මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා 2002 දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. තවද, 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත බලාත්මක කිරීමත් සමඟ එම පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව සතු වගකීම් ඉටුකිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට පවරන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම මෙන්ම ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමන සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතු වේ. 2015 වසර තුළ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතුවලට අදාළ ක්‍රියාකාරිත්වය සාරාංශගතව පහත දැක්වේ.

### 20.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි (RTGS) මෙහෙයුම් කටයුතු

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන අතර කාල සංවේදී විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම් සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර, එම පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සහභාගිත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබාදීම ද සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

2015 වසර අවසානයේ දී සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 36 ක් විය. වසර තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මඟින් රුපියල් බිලියන 84,432 ක වටිනාකමින් යුතු ගනුදෙනු 322,234 ප්‍රමාණයක පියවීම් කටයුතු සිදු කරන ලදී. සහභාගිත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන ලද එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 23.28 ක් විය. සහභාගිත්ව ආයතනවල සහභාගිත්වයෙන් ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාර අඛණ්ඩතා අභ්‍යාසය දුරස්ථ ස්ථානයක පිහිටි ආපදා ප්‍රතිප්‍රාප්ති මධ්‍යස්ථානයේ සිට දෙවතාවක් සිදු කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි උපයෝජ්‍යතාව 2015 වර්ෂයේ දී සියයට 99.98 ක් ලෙස පවත්වාගෙන යන ලදී.

### 20.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම.

**(අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

2015 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සපයන ලද පසු මෙහෙයුම් කාර්යාල සේවා පහත දැක්වේ.

i. විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රති විකුණුම් ගනුදෙනු 17,588 කට අදාළ පියවීම් සිදු කළ අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 486.9 ක් විය.

ii. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ජාත්‍යන්තර සංචිත මෙහෙයුම් කළමනාකරණ කටයුතු සිදුකිරීමේ කාල සීමාව දීර්ඝ කිරීමත් සමඟ එම දෙපාර්තමේන්තුව මඟින් යොමු කරන ගනුදෙනු පියවීමට පහසුකම් සැලසීම උදෙසා සේවා මුර ක්‍රමය 2015 වසර පුරා තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

**(ආ) විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ සිදු කළ විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සලසා දෙමින් විවට වෙළඳපොළ සහභාගිත්ව ආයතනවල ද්‍රවශීල අවශ්‍යතා කළමනාකරණය සඳහා පහසුකම් සලසන ලදී. 2015 වසර තුළ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 750 ක් වූ ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 545 ක් වටිනාකම රුපියල් බිලියන 17,990 ක් වූ නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 5,413 ක් සහ රුපියල් බිලියන 23 ක් වූ නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු 35 ක් සිදු කිරීමට සහ පහසුකම් සැලසීමට දායක විය.

### 20.3 ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ජාත්‍යන්තර අන්තර්බැංකු මූල්‍ය සන්නිවේදන සංගමය (ස්විෆ්ට්) යනු සුරක්ෂිත හා ආරක්ෂාකාරී පරිසරයක් තුළ මූල්‍ය ගනුදෙනුවල ගෙවීම් උපදෙස් සහ වෙනත් අදාළ තොරතුරු හුවමාරු කිරීමේ සන්නිවේදන මාර්ගයක් වේ. 2015 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය සහ විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සලසමින් යවන ලද සහ ලැබුණු මුළු ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව, පිළිවෙළින්, 1,460,270 සහ 804,852 ක් විය. තම සේවාදායකයින් වෙත වැඩිදියුණු කරන ලද පහසුකම් සහිත වඩා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා සේවා සැපයුම්කරු විසින් ස්විෆ්ට් පද්ධතිය නව සංස්කරණයක් දක්වා (Version 7.1.10) වැඩි දියුණු කරන ලදී. ඒ අනුව, ස්විෆ්ට්

විසින් හඳුන්වා දුන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ද මෙම නව සංස්කරණය සාර්ථකව ස්ථාපනය කරන ලදී.

### 20.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදුකරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2015 වසරේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් 9 අතර සිදු වන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු පියවීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා වටිනාකම රුපියල් බිලියන 448.6 ක් වූ ගනුදෙනු 6,663 ක් සිදු කරන ලදී. එම යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 375.1 ක් විය.

ආසියානු නිෂ්කාශන සංගමයේ 44 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2015 වසරේ ජුනි මාසයේ දී බංග්ලාදේශයේ දී පැවැත් වූ අතර, නියෝජ්‍ය අධිපති ආසියානු නිෂ්කාශන සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු වන අධිපතිතුමා නියෝජනය කරමින් ද, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ආසියානු නිෂ්කාශන සංගමයේ විකල්ප අධ්‍යක්ෂවරියක ලෙස ද එම රැස්වීමට සහභාගි වූහ.

### 20.5 ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම

විවිධ ගෙවීම් මාධ්‍යයන් හරහා සිදු කරන සුළු පරිමාණ ගෙවීම් තත්කාලීන පදනම මත පියවීම සඳහා පොදු යටිතල පහසුකමක් ස්ථාපනය කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ආරම්භ කරන ලද කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයෙහි දෙවන අදියර වන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වන පොදු යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහය ලබා දෙන ලදී. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වන පොදු යාන්ත්‍රණය 2015 අගෝස්තු 21 වැනි දින ක්‍රියාත්මක කරන ලද අතර, 2015 වසර අවසන් වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු 6 ක් සහ මූල්‍ය සමාගම් 2 ක් එහි සාමාජිකත්වය ලබා ගෙන තිබුණි.

### 20.6 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අධීක්ෂණය

විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි නියාමන සහ අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, 2015 වසර තුළ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් සිදු කරන ලදී.

අ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝගයේ විධිවිධාන යටතේ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස කටයුතු කිරීමට මූල්‍ය ආයතන 3 ක් වෙත බලපත්‍ර ලබා දෙන ලදී.

ආ) ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයෙහි භාවිතය වැඩිකිරීම සඳහා චක්‍රලේඛ 4 ක් නිකුත් කරන ලදී.

i විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කරනු ලබන ගනුදෙනුවක උපරිම සීමාව රුපියල් මිලියන 5 ක් ලෙස ද අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු මගින්, ජංගම දුරකථන පදනම් කරගත් බැංකු කටයුතු මගින් සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයෙකුගේ ගනුදෙනුකරුවෙකු විසින් එම සාමාජිකයාගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මගින් සිදු කරන අරමුදල් පැවරීමකදී අය කළ හැකි උපරිම ගාස්තුව එක ගනුදෙනුවක් සඳහා රුපියල් 50 ක් ලෙස සහ බැංකු කවුන්ටරය වෙත පැමිණ සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ අනෙකුත් සාමාජිකයින්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් සිදු කරනු ලබන අරමුදල් පැවරීම් සඳහා අය කළ හැකි උපරිම ගාස්තුව එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 ක් ලෙස ද නියම කරමින් 2015 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ii ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හරහා අරමුදල් පැවරීමේ දී ගනුදෙනුකරුවකුගෙන් අය කළ හැකි ගාස්තුවල උපරිම සීමාව එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 50 ක් ලෙස නියම කරමින් 2015 අංක 02 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

iii තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා අරමුදල් පැවරීමේ දී ගනුදෙනුකරුවකුගෙන් අය කළ හැකි උපරිම ගාස්තුව එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 1,000 ක් ලෙස නියම කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතනවලින් අය කරන ගාස්තුව රුපියල් 600 සිට රුපියල් 450 දක්වා අඩු කිරීම සඳහා 2015 අංක 03 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

iv කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයෙහි (CCAPS) ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් එය ක්‍රියාත්මක කිරීමට උපකාරී වීම සඳහා එකී යාන්ත්‍රණය සමඟ සම්බන්ධතාව ගොඩනැගීම පිළිබඳ පහත සඳහන් කාලසීමාවන් නියම කිරීම සඳහා 2015 අංක 07 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

1. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු සඳහා ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන් සහ/හෝ

මූල්‍ය අත්පත්කරුවන් ලෙස ක්‍රියාකරන සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ස්වකීය යාන්ත්‍රණ (Switch) සහිත බලපත්‍රලාභී බැංකු 2016 මාර්තු 31 දින වන විට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත පොදු යාන්ත්‍රණය හා සම්බන්ධ විය යුතුය.

2. සියලුම බලපත්‍රලාභී බැංකු 2016 සැප්තැම්බර් 30 වන විට විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) හා සම්බන්ධ විය යුතුය.

3. විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර (POS) හරහා කරන ගනුදෙනු සඳහා ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන් සහ/හෝ මූල්‍ය අත්පත්කරුවන් ලෙස කටයුතු කරන බලපත්‍රලාභී බැංකු 2016 දෙසැම්බර් 31 වන විට විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර ආශ්‍රිත පොදු යාන්ත්‍රණය (Common POS Switch) හා සම්බන්ධ විය යුතුය.

4. ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා සපයනු ලබන බලපත්‍රලාභී බැංකු 2017 සැප්තැම්බර් 30 වන විට ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CMobS) හා සම්බන්ධ විය යුතුය.

ඇ) දෛනික සුළු පරිමාණ ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා සුරක්ෂිත සහ විශ්වාසදායී ගෙවීම් පද්ධතීන් පවත්වා ගෙන යෑම සහතික කිරීම සඳහා ණය කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන මාර්ගෝපදේශයන්ට සහ අනෙකුත් රෙගුලාසිවලට සේවා සැපයුම්කරුවන්ගේ අනුකූලතාවය පරීක්ෂා කිරීමට එතැන් පරීක්ෂණයක් සහ දුරස්ථ අවේක්ෂණ කටයුතු සිදු කරන ලදී.

ඈ) හදිසි අවස්ථාවක දී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

### 20.7 ජාතික ගෙවීම් කවුන්සිලය

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ 2006 දී පිහිටු වන ලද ජාතික ගෙවීම් කවුන්සිලය ක්‍රියාවෙහි යොදවන්නා ලෙස ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ජාතික ගෙවීම් කවුන්සිලය යනු ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන සහ නිරීක්ෂණ කමිටුවයි. 2015 වසරේ දී වැඩි බැංකු ප්‍රමාණයක් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා සැපයුම්කරුවන් නියෝජනය වන පරිදි ජාතික ගෙවීම් කවුන්සිලයෙහි සාමාජිකත්වය 29 දක්වා වැඩි කරන ලදී. නව තාක්ෂණය යොදා ගැනීම, නව ගෙවීම් ක්‍රමවේද සහ පද්ධති ස්ථායීතාව, සහ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම කෙරෙහි යොමු වූ නියාමනය ඇතුළත් වන පරිදි ගෙවීම් පද්ධතිවල මධ්‍යකාලීන සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති පෙරදැක්මක් සැදීමට අවශ්‍ය සාමූහික උපදේශක ක්‍රියාවලිය ජාතික ගෙවීම් කවුන්සිලය විසින් ආරම්භ කරන ලදී. මෙම ප්‍රතිපත්ති පෙරදැක්ම 2016 පළමු වන කාර්තුවේ දී මුදල් මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරනු ඇත.

### 20.8 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය විවරණිකාව (Payments Bulletin) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. තවද, අවශ්‍යතාව මත පදනම්ව, ගෙවීම් පද්ධති සහ වෙනත් සම්බන්ධිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්යමණ්ඩල දැනුම්වත් කිරීමේ අරමුණින් වැඩසටහන් 10 ක් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලදී.

## 21. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම පිළියෙළ කිරීමේ කටයුතු සම්බන්ධීකරණය, උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය සහ කාලීන වශයෙන් මහ බැංකුවට වැදගත් වන ප්‍රතිපත්ති අධ්‍යයනයන් සිදු කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත.

### 21.1 උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම හා නිරීක්ෂණ ක්‍රියාවලිය

7K+@2020.SL තේමාව යටතේ වූ 2015-2020 සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම, 2015 ජනවාරි මස 01 වන දින පැවති අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවයේ දී ඉදිරිපත් කරන ලදී. තවද, එක් එක් දෙපාර්තමේන්තුවල අරමුණු සහ ප්‍රතිපත්ති පිළිබඳව ද, එම අරමුණු කරා ළඟා වීමට අනුගමනය කළ යුතු උපක්‍රමයන් සහ ප්‍රගති සමාලෝචනයට යොදා ගන්නා මූලික කාර්යය සාධන දර්ශක පිළිබඳව ද මහ බැංකු කාර්ය මණ්ඩලය දැනුම්වත් කිරීම සඳහා උපාය මාර්ගික සැලසුමේ පිටපත් බෙදා දෙන ලදී.

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්, උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සියලු දෙපාර්තමේන්තු සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වන ලද අතර, උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (Strategic Plan Review Committee) සහ මුදල් මණ්ඩලය වෙත එම ප්‍රගතිය වාර්තා කරන ලදී. තවද, උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව සහ මුදල් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ නිර්දේශ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ දෙපාර්තමේන්තු වෙත දැනුම් දෙන ලදී. 2015 වර්ෂය තුළ දී, 2015 - 2020 සඳහා වූ උපාය මාර්ගික සැලැසුම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු දෙපාර්තමේන්තු සහ පළාත් කාර්යාල විසින් සියයට 97.7 ක ප්‍රගතියක් වාර්තා කරන ලදී.

තවද, 2016-2018 උපායමාර්ගික සැලසුම පිළියෙල කිරීමේ කටයුතු 2015 වසරේ දෙවන අර්ධය තුළ ආරම්භ කෙරිණි. උපායමාර්ගික සැලසුමේ සැකැස්ම මෙම වසර තුළ දී වෙනස් කරන ලද අතර, ඒ යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍ය කාලීන ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව, මහ බැංකුවේ මූලික පරමාර්ථය කරා ළඟා වීමට අදාළ වන අරමුණු සඵල කර ගැනීමට ක්‍රියාවට නැංවිය යුතු නව ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති පමණක් මෙම නව උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත. 2016-2018 සඳහා වන මෙම නව උපායමාර්ගික සැලසුමේ තේමාව ''මානව ප්‍රාග්ධන වර්ධනය සහ ශක්‍යතා ගොඩනැගීම'' යි. මෙයට අමතරව සියලු දෙපාර්තමේන්තු විසින් එක් එක් දෙපාර්තමේන්තුවට අදාළ කාර්ය සැලැස්මක් ද පිළියෙල කරන ලදී.

### 21.2. ප්‍රතිපත්ති අධ්‍යයනයන් සිදු කිරීම

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා වන නියාමන රාමුවක් සැකසීමේ කටයුතුවලට දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. "මූල්‍ය අන්තර්කරණය සඳහා වන ප්‍රතිපත්ති රාමුවක් ගොඩනැගීම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලද අතර සුරැකුම්කරණ නීතිය, විශ්‍රාම පාරිතෝෂික අරමුදල් නියාමනය සහ රාජ්‍ය සුරැකුම්පත් සඳහා ඉලෙක්ට්‍රොනික වෙළඳ සහ නිශ්කාෂණ පද්ධතියක් ගොඩනැගීම පිළිබඳ යෝජනාවලීන් සකස් කරන ලදී. තවද, ප්‍රතිපත්ති සම්බන්ධ ලිපිලේඛනවල ඉලෙක්ට්‍රොනික එකතුවක් වන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සඳහා වූ විද්‍යුත් පුස්තකාලය අඛණ්ඩව යාවත්කාලීන කරන ලද අතර මේ වන විට එහි ලිපි ලේඛන 805 ක් අඩංගු වේ.

## 22. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1950 අගෝස්තු මස 28 වන දින මහ බැංකුවේ ආරම්භයත් සමග පිහිටුවන ලද අතර, මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රජයේ නියෝජිත වශයෙන් රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම ඉටු කරයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, විසර්ජන පනතෙහි සඳහන් දළ ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම, නියමිත කාලයට ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදු කිරීම සඳහා ලංකාසෙකියු (LankaSecure) පද්ධතිය මගින් පහසුකම් සැලසීම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම වේ. මීට අතිරේකව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය, ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථායීතාව සහ රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ අපේක්ෂාවෙන්, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය හා සුපරීක්ෂණය කිරීමෙහි නියැලේ.

### 22.1 විසර්ජන පනතෙහි සඳහන් වන පරිදි රාජ්‍ය ණය ගැනීම් (දළ) අවශ්‍යතාවය සඳහා අරමුදල් රැස් කිරීම

2015 වසරේ දී, රජයේ දළ අරමුදල් අවශ්‍යතාවය මූල්‍යනය කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අරමුදල් රැස් කිරීමෙහි නිරත විය. ඉහත සඳහන් කළ ණය උපකරණ මගින් සිදු කරනු ලැබූ මූල්‍යන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ:

#### (අ) භාණ්ඩාගාර බිල්පත්

2015 වසර තුළ දී නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත මුළු වටිනාකම රුපියල් බිලියන 1,589.5 ක් විය. මෙම නිකුතු ප්‍රධාන වශයෙන්ම සතිපතා පවත්වනු ලැබූ ප්‍රාථමික වෙන්දේසි මගින් සිදු කරන ලදී. 2015 වසර තුළ දී කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 1,676.5 ක් විය. ඒ අනුව, මධ්‍යම හා දිගුකාලීන බැඳුම්කර සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලින් ලද අරමුදල් භාවිතා කරමින් රුපියල් බිලියන 662.6 ක් වූ භාණ්ඩාගාර බිල්පත් කලින් ගෙවා පියවන ලදී. 2015 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත්වලින් සිදු වූ ශුද්ධ විදේශ ගලා යෑම එ.ජ.ඩොලර් මිලියන 381.7 ක් විය.

#### (ආ) භාණ්ඩාගාර බැඳුම්කර

2015 වසරේ දී සිදු කළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 869.9 ක් විය. 2014 වසරේ දී ප්‍රාථමික වෙන්දේසීන් 06 කින් ඉපැයූ රුපියල් බිලියන 27.8 ට සාපේක්ෂව 2015 වසරේ දී වෙන්දේසීන් 37 කින් රුපියල් බිලියන 712.3 ක් උපයන ලදී. එම වසර තුළ දී රුපියල් බිලියන 511.7 ක භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරිනි. 2015 වසර තුළ දී භාණ්ඩාගාර බැඳුම්කරවලින් සිදු වූ ශුද්ධ විදේශ ගලා යෑම එ.ජ.ඩොලර් මිලියන 711.8 ක් විය.

#### (ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

2015 වසර තුළ දී එ.ජ.ඩොලර් මිලියන 2,491.4 ක් වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කරන ලදී. එ.ජ.ඩොලර් මිලියන 835.6 ක් වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වසර තුළ දී කල් පිරිනි.

#### (ඈ) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර

2015 වසර තුළ දී එ.ජ.ඩොලර් මිලියන 2,150 ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙන්දේසි දෙකක් මගින් නිකුත් කරන ලදී. රජයේ ණය ගැනීමේ වැඩසටහනට අනුව යමින් එ.ජ.ඩොලර් මිලියන 650 ක් ජූනි මාසය තුළ දී ද, ඉතිරි එ.ජ.ඩොලර් මිලියන 1,500 ක් 2015 නොවැම්බර් මාසය තුළ දී ද නිකුත් කරන ලදී. 2015 ජනවාරි මාසය තුළ දී රජය විසින් එ.ජ.ඩොලර් මිලියන 500 ක් නැවත ගෙවන ලදී.

2015 වසරේ දී පොලී අනුපාතිකය පහළ සහ ස්ථාවර අගයක පැවති පරිසරයක් තුළ, මූල්‍යනය කිරීමේ උපක්‍රමයක් ලෙස දිගුකාලීන ණය උපකරණ නිකුත් කිරීම තුළින්, 2014 වසර අගදී වසර 5.75 ක් වූ නොපියවූ ණය ප්‍රමාණයේ සාමාන්‍ය කල් පිරීමේ කාලය, 2015 වසර අගදී වසර 6.28 ක් දක්වා ඉහළ දැමීමට හැකි විය. 2015 මාර්තු මස සිට සියලුම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළට නිකුත් කිරීම වෙන්දේසි පදනම මත සිදු කරන ලදී. තවද, සාර්ථක හා විධිමත් දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් ඵලදා වක්‍රයේ දිගුකාලීන අන්තය සක්‍රිය කිරීමට සමත් වන ලදී.

### 22.2 රාජ්‍ය ණය සේවාකරණ

වසර තුළ දී සිදු කරන ලද සමස්ත ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,303.2 ක් වූ අතර, දේශීය ණය සේවාකරණය රුපියල් බිලියන 918.1 කින් සහ විදේශ ණය සේවාකරණය රුපියල් බිලියන 385.1 කින් සමන්විත විය.

### 22.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ රාජ්‍ය සුරැකුම්පත්වල ගනුදෙනු පියවීමේ පහසුකම් සැලසීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙකියු (LankaSecure) පද්ධතිය හරහා තත්කාලීනව හා අඛණ්ඩව සිදු කරන ලදී. 2015 දෙසැම්බර් 31 වන දින වන විට ලංකාසෙකියු පද්ධතිය තුළ පැවති නිර්ලේඛන සුරැකුම්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 4,363.2 ක් විය. ලංකාසෙකියු සහභාගිකරුවන්, සෘජු අලෙවි සහභාගිකරුවන් 33 දෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 8 ක්) සහ සෘජු සහභාගිකරුවන් 3 දෙනෙකුගෙන් සමන්විත විය.

### 22.4 රාජ්‍ය සුරැකුම්පත්වල ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම, ද්විතීයික වෙළඳපොළ පහසුවෙන් හැසිරවීමට උපකාරී විය. මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන්ට කාලීන හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් ප්‍රකාශනයන් යැවීමේ කාර්යය විද්‍යුත් තැපැල හරහා සිදුකිරීමත් සමඟ 2015 වර්ෂය තුළ ගනුදෙනු හා ගෙවීම් තවදුරටත් වැඩිදියුණු විය.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් 2015 වසර තුළ විද්‍යුත් තැපැල මගින් විද්‍යුත් ප්‍රකාශනයන් 2,955 ක් සහ සාමාන්‍ය තැපැල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 24,722 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 64,596 ක් සහ ගෙවීම් ප්‍රකාශන 49,274 ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන් වෙත යවන ලදී. තවද, මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාල ගිණුමක් තුළින් පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී. 2015 දෙසැම්බර් මස අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) මුළු ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 89,696 ක් විය.

### 22.5 ණය වෙළඳපොළ දියුණු කිරීම

2015 මාර්තු මස සිට මුදල් මණ්ඩලය මගින් ගනු ලැබූ තීරණයකට අනුව වෙළඳපොළ හරහා අරමුදල රැස් කිරීම මුළුමනින්ම සිදු කරනු ලැබුයේ වෙන්දේසි මගිනි. මේ හේතුවෙන් ඵලදා අනුපාත සම්පූර්ණයෙන්ම වෙළඳපොළ බලවේග මගින් තීරණය වූ අතර ක්‍රියාකාරී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළක් ගොඩනැගීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන වෙළඳපොළ හැසිරීම වඩාත් හොඳින් නිරූපනය කරන, දිගුකාලීන ද්‍රවශීලතාවයක් සහිත පාදක ඵලදා වක්‍රයක් රාජ්‍ය සුරැකුම්පත් සඳහා ගොඩනැගීම ද සිදු විය.

### 22.6 රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය

ක්‍රියාකාරී වෙළඳපොළ සහභාගිත්වයෙන් සහ වෙළඳපොළ නිර්මාණකරුවන් ලෙස රජයේ සුරැකුම්පත් සඳහා වූ ඉල්ලුමට ස්ථායී හා විශ්වාසදායී ප්‍රභවයක් ගොඩනැගීම හරහා රජයේ සුරැකුම්පත් වෙළඳපොළ ශක්තිමත් කරමින්, රජයේ සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන් මූල්‍ය වෙළඳපොළ තුළ ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි. ප්‍රාථමික අලෙවිකරු පද්ධතියේ ස්ථායීතාව සහ රජයේ සුරැකුම්පත්හි ආයෝජකයන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමට දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව අධීක්ෂණ කටයුතු මෙහෙයවනු ලබයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2015 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද නියාමන ක්‍රියාමාර්ගවල සාරාංශයක් පහත දැක් වේ.

#### (අ) විචක්ෂණශීලී නියාමන

(i) ප්‍රාථමික අලෙවිකරු පද්ධතියේ ස්ථායීතාව සහ රජයේ සුරැකුම්පත් ආයෝජකයන්ගේ සුරක්ෂිතතාව ශක්තිමත් කිරීමට, සියලුම ප්‍රාථමික අලෙවිකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමන සහ විධානයන්ට දක්වන අනුකූලතාවය තක්සේරු කිරීම.

(ii) ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් රුපියල් මිලියන 1,000 ට නොඅඩු අවම නියාමන ප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතු බවට සහ සියයට 10 ක අවම අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයක් පවත්වා ගත යුතු බවට 2015 ඔක්තෝබර් 28 රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අවම මූලික ප්‍රාග්ධනය සහ අවදානම මත බර තැබූ ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය සංශෝධනය යන විධානයන් නිකුත් කරන ලදී.

(iii) ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ගනුදෙනුකරුවන්ට, ප්‍රාථමික අලෙවිකරු පද්ධතියට සහ රජයේ සුරැකුම්පත් කර්මාන්තයට අනර්ථදායක නොවන ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ලෙස විශේෂිත විධාන 2 ක් නිකුත් කරන ලදී.

#### (ආ) ප්‍රාථමික අලෙවිකරුවන් පරීක්ෂණය

එතැන් පරීක්ෂණ හරහා ප්‍රාථමික අලෙවිකරුවන් විවිධ අවදානම් (වෙළඳ, ද්‍රවශීලතා, මෙහෙයුම් යනාදී) සඳහා

නිරාවරණය වීම සහ එවැනි අවශේෂ අවදානම් අඩු කිරීමට ඇති සම්පත්වල ප්‍රමාණාත්මකතාවය තක්සේරු කිරීම සිදු කෙරිණි. ඒ අනුව, 2015 වසර තුල දී අවදානම් මත පදනම් වූ එතැන් පරීක්ෂණ 13 ක් සම්පූර්ණ කරන ලදී. එවැනි අධීක්ෂණයන් මගින් ඉස්මතු කරන ලද ගැටලු නිවැරදි කිරීමට කාල සටහන් අනුව මෙහෙයුම් සැලසුම් ක්‍රියාත්මක කරවන්නට යෙදිණි. අදාළ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලැබෙන ත්‍රෛමාසික වාර්තා හරහා අධීක්ෂණ ගැටලු නිවැරදි කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී.

**(ඈ) දුරස්ථ පරීක්ෂණ**

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මාර්ගගත (online) දත්ත රැස් කිරීමේ සහ පරීක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් වන ෆින්නෙට් (FinNet) පද්ධතිය හරහා එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් සම්බන්ධයෙන් මෙන්ම එම සමස්ත කර්මාන්තය සම්බන්ධයෙන් අඛණ්ඩව දුරස්ථ පරීක්ෂණවල නියැලෙන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එවැනි අධීක්ෂණ කටයුතුවල සොයා ගැනීම් මත, අවශ්‍ය අවස්ථාවන්හි දී ක්ෂණිකව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී. ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූල්‍ය වාර්තාකරණ සඵලත්වය වැඩිදියුණු කිරීමට ෆින්නෙට් (FinNet) පද්ධතියට නොයෙකුත් වැඩිදියුණු කිරීම් ද හඳුන්වා දෙන ලදී.

**(ඇ) ප්‍රාථමික අලෙවිකරු ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම**

2015 වසර තුළ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රාථමික අලෙවිකරු ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ රැස්වීම් 5 ක් මහ බැංකු අධිපති සහ රාජ්‍ය ණය අධිකාරීගේ සහභාගිත්වයෙන් යුතුව සංවිධානය කරන ලදී. මෙම රැස්වීම් තුළින් ආර්ථික හා මූල්‍ය සංවර්ධනයන්, ප්‍රාථමික අලෙවිකරු කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය සහ වෙළඳපොළ සංවර්ධනයන් සහ රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම්වල කාර්යසාධනය කෙරෙහි බලපාන තවත් බොහෝ අංශ පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමට අවකාශය සැලසිණ.

### 22.7 ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් කටයුතු සම්බන්ධීකරණය

ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් ලබා ගැනීම තහවුරු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්, මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස් හා ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් යන ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් සිදු කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවන ලදී. 2015 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකාවේ වාර්ෂික ශ්‍රේණිගත කිරීම් සමාලෝචන කටයුතු සඳහා ද, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මෙම ආයතන සඳහා පහසුකම් සපයන ලද අතර ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීමේ සේවාවන් ඇගයීම් ද කරන ලදී.

**ඇමුණුම II - 2**

**රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන්**

1. ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්
2. ලංකා බැංකු ප්‍රාථමික අලෙවිකරු අංශය
3. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
5. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී.
6. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී.
7. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
8. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
9. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
10. මහජන බැංකු ප්‍රාථමික අලෙවිකරු අංශය
11. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
12. සම්පත් බැන්ක් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
13. සෙලාන් බැන්ක් පී.එල්.සී ප්‍රාථමික අලෙවිකරු අංශය
14. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ප්‍රාථමික අලෙවිකරු අංශය
15. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
16. වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්

## 23. ප්‍රාදේශීය සංවර්ධන

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කර 2002 ජනවාරි මාසයේදී ස්ථාපිත කරන ලද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, 2015 වසර තුළදී ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම, පොලී සහනාධාර වැඩසටහන්, ඇප ආවරණ යෝජනා ක්‍රම සහ ණය පරිපූරක සේවා සම්බන්ධීකරණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන අරමුණ වූයේ, රට තුළ තුලිත ආර්ථික වර්ධනය හා මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති සඳහා සහාය දැක්වීම ය.

ඒ අනුව, ණය ප්‍රතිලාභීන් ඉදිරියේ ඇති අභියෝගයන්ට වඩා හොඳින් මුහුණ දීමට හැකියාව ඇති කිරීම සඳහා කෘෂිකාර්මික, සත්ව පාලන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි මූල්‍ය අවශ්‍යතා ඇති පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා මූල්‍ය පහසුකම් සැපයීම තුළින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තම කාර්යභාරය ඉටු කරන ලදී. විශේෂයෙන්ම, විධිමත් මූල්‍ය අංශයෙන් බැහැරව සිටින පුද්ගලයින්ගේ මූල්‍ය ප්‍රවේශය හා මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සඳහා මුද්‍රිත, විද්‍යුත් හා ගුවන් විදුලි මාධ්‍ය භාවිතා කරමින් දැනුම්වත් කිරීමේ හා නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

මීට අමතරව, ආර්ථිකයේ පවත්නා ප්‍රවණතාවයන්ට අනුකූලව, 2015 දී කුඩා හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමවල පොලී අනුපාතයන් වෙනස් කිරීම, ව්‍යාපෘති වාර්තා සැපයිය යුතු ණය මුදල්වල සීමාව ඉහළ නැංවීම, ණය සඳහා ලබා දෙන සහන කාලය වැඩි කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී.

## 23.1 ණය/ණය ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය තුළ දී ණය යෝජනා ක්‍රම 13 ක් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී. (සංඛ්‍යා සටහන II - 19) මෙම ණය යෝජනා ක්‍රම අතරින් ණය යෝජනා ක්‍රම 4 ක් කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය අරමුණු කර ගෙන ද ණය යෝජනා ක්‍රම 5 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය අරමුණු කර ගෙන ද ක්‍රියාත්මක කරන ලදී. අනෙක් ණය යෝජනා ක්‍රම 4 ක්ෂුද්‍ර මූල්‍ය අංශය අරමුණු කර ගෙන ක්‍රියාත්මක කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රම හා ණය පරිපූරක සේවාවන් සඳහා අරමුදල් සපයන ලද්දේ ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර ණය දෙන ආයතන සහ සහභාගිත්ව මූල්‍ය ආයතනයි.

සමස්තයක් ලෙස ගත් විට, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2015 වර්ෂය තුළ දී ප්‍රතිලාභීන් 141,298 ක් සඳහා රුපියල් මිලියන 16,678.8 ක ණය මුදල් ප්‍රමාණයක් සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා මුදාහැර ඇත. මෙම ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 67.9 ක් කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය සඳහා ලබා දී ඇති අතර, පිළිවෙළින් සියයට 19.3 ක් හා සියයට 12.8 ක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමවලට අදාළ සමස්ත ප්‍රතිලාභීන්ගෙන් සියයට 65.2 ක බහුතරයක් කෘෂිකාර්මික අංශය නියෝජනය කරන අතර, පිළිවෙළින් සියයට 24.3 ක් සහ සියයට 10.5 ක් ක්ෂුද්‍ර මූල්‍ය අංශය ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ද නියෝජනය කරයි. මෙම වර්ෂය තුළ දී සියයට 67.8 ක ණය මුදල් ප්‍රමාණයක් පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම හරහා මුදාහැර ඇති අතර, සියයට 32.2 ක ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම හරහා මුදාහැර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ණය යෝජනා ක්‍රම පිළිබඳව සංක්ෂිප්ත සටහනක් පහත දක්වා ඇත.

## 23.2 කෘෂිකාර්මික හා පශු සම්පත් අංශය

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කිරීමේ සහ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ උපායමාර්ගික වැදගත්කම පෙරදැරි කරගෙන ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව එහි ප්‍රධාන ණය යෝජනා ක්‍රම දෙක වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) සහ මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීම නොකඩවා සිදු කරන ලදී. ඊට අමතරව, 2015 අගෝස්තු මස ශ්‍රී ලංකා රජය මගින් හඳුන්වා දුන් ''තේ කර්මාන්තශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය'' යටතේ පොලී සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීමට ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මැදිහත් විය.

- මෙම යෝජනා ක්‍රම මගින්, කෘෂි හා පශු සම්පත් අංශයේ ප්‍රතිලාභීන් 92,081 කට රුපියල් මිලියන 11,319.9 ක ණය ප්‍රමාණයක් මුදාහැර ඇත. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ණය යෝජනා ක්‍රම යටතේ මුදාහල සමස්ත ණය ප්‍රමාණයෙන්, සියයට 67.9 ක් මෙම අංශය සඳහා ලබා දී ඇත. මේ අනුව, 2015 දී ලබාදුන් මුළු ණය ප්‍රමාණය සහ ණය ප්‍රතිලාභීන් ගණන සලකා බලන කළ, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය තවදුරටත් ප්‍රමුඛතම ණය යෝජනා ක්‍රමය බවට පත්ව ඇත.
- වසර තුළදී, ගොවීන්ගේ කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා නව සපිරි ග්‍රාමීය ණය යේජනා ක්‍රමය මගින් ගොවීන් 90,533 ක් අතර රුපියල් මිලියන 7,137.5 ක ණය ප්‍රමාණයක් මුදාහැර ඇත. මේ අතරින්, 2014/2015 මහ කන්නය තුළ ගොවීන් 55,545 ක් අතර රුපියල් මිලියන 4,240.6 ක ණය ප්‍රමාණයක් මුදාහැර ඇති අතර 2015 යල කන්නය තුළ ගොවීන් 34,988 ක් අතර රුපියල් මිලියන 2,896.9 ක ණය මුදල් ප්‍රමාණයක් මුදාහැර ඇත.
- නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ සමස්ත ණය ප්‍රමාණයෙන් වැඩිම ණය ප්‍රමාණය (සියයට 19.1) අනුරාධපුර දිස්ත්‍රික්කය මගින් ලබාගත් අතර, පොළොන්නරුව (සියයට 12.4), හම්බන්තොට (සියයට 9.6) සහ බදුල්ල දිස්ත්‍රික්කය (සියයට 8.7) වශයෙන් ණය ලබා දී ඇත.
- 2015 ජූලි මස තුළදී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාරතමේන්තුව නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ගුදම් කුවිතාන්සි මූල්‍යයන යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ, රජයේ ගුදම් මගින් නිකුත් කළ ගුදම් කුවිතාන්සි ඇපයක් වශයෙන් තබා කුඩා ගොවීන්ට ලියාපදිංචි මූල්‍ය ආයතන මගින් කෙටි කාලීන ණය ලබාගත හැක.
- කිරි කර්මාන්තය ආශ්‍රිත සියලුම ආකාරයේ ක්‍රියාකාරකම්හි නියැලී සිටින කිරි ගොවීන්ගේ හා ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන පොලී සහන ණය යෝජනා ක්‍රමය වන මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් රුපියල් මිලියන 1,229.8 ක මුදලක් ප්‍රතිලාභීන් 1,424 ක් වෙත මුදාහැර ඇත. මුදාහරින ලද සමස්ත ණය මුදලින්, වැඩිම ණය ප්‍රමාණය (සියයට 21.9) කුරුණෑගල දිස්ත්‍රික්කය ලබා ගෙන ඇති අතර, පිළිවෙළින්

**II-19 සංඛ්‍යා සටහන**

**2015 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ණය යෝජනා ක්‍රම**

| | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුදල් සපයන ලද ආයතන | පුළුල් අරමුණ | මුළු අරමුදල් යෙදවීම (රු.මිලියන) | 2015 වසරේ මුදහළ අරමුදල් (රු.මිලියන) | මුදාහැරීමට ඇති ඉතිරි අරමුදල් (රු.මිලියන) | ණයකරුවන් ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය (වසර අවසානයේදී) |
|---|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය | | | | | | |
| 1.1 | තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (TDP - RF) | ශ්‍රී ලංකා රජය | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් HACCP* සහතිකය ලබා ගැනීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම | 1,100 | 8.3 | 152.9 | 9% |
| 1.2 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර | වී සහ කෙටි කාලීන භෝග වගාවන්හි නියුතු ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 7,137.5 | අදාළ නොවේ | 7% |
| 1.3 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී සහනාධාර පහසුකම් | වාණිජ මට්ටමේ කිරි ගොවිපළවල් පිහිටුවීම තුළින් කිරි සහ කිරි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිතභාවය ළඟාකර ගැනීමට සහාය වීම | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 1,229.8 | අදාළ නොවේ | 6% |
| 1.4 | තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය (WCLSTF) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර | ලියාපදිංචි කරන ලද තේ කර්මාන්ත සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමට සහායවීම | පොලී සහනාධාර සඳහා අනුමත අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 2,943.8 | අදාළ නොවේ | (හරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය +1.0% - 2.0%) |
| 2. | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශය | | | | | | |
| 2.1 | ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය (SEPI) | ශ්‍රී ලංකා රජය | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය සැපයීම | 250 | 29.7 | 18.3 | 9% |
| 2.2 | පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II (ANLS-Ph II) | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු පළාත තුළ ණය ප්‍රතිලාභීන් බවට පත් විය හැකි පුද්ගලයන්ගේ ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම සඳහා සහාය වීම | 800 | 203.6 | අවසන් කර ඇත | 9% |
| 2.3 | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ව්‍යසනයක බලපෑමකට ලක් වූ එවැනි ව්‍යාපෘති ඇරඹීම හෝ වැඩිදියුණු කිරීම | 12,317 | 2,889.6 | 390 | 8% |
| 2.4 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (SPEnDP) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහු වාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම්වල ආහාර බෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම | 474 | 84.6 | 54 | 7% |
| 2.5 | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන-චක්‍රීය අරමුදල | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ණය පහසුකම් සැපයීම | 253 | 11.7 | 2.2 | 10% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3. | ක්ෂුද්‍ර මූල්‍ය හා වෙනත් අංශ | | | | | | |
| 3.1 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SFLCP-RF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් ණය සැපයීම | 346 | 215.7 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙද වේ | 12% - 14% |
| 3.2 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (PAMP-RF) | ශ්‍රී ලංකා රජය | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සංවිධිත බැංකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මඟින් දිළිඳුබව පිටු දැකීම | 1,031 | 505.1 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙදවේ. | 12% |
| 3.3 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - අදියර II (PAMP II) | ශ්‍රී ලංකා රජය සහ ජපන් අන්තර් ජාතික සහයෝගිතා සංවිධානය (JICA) | | 2,000 | 86.8 | අවසන් කර ඇත. | 12% |
| 3.4 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (PAMP II - RF) | ශ්‍රී ලංකා රජය | | 2,764 | 1,331.7 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙදවේ. | සහභාගිත්ව මූල්‍ය ආයතන 10% |

* HACCP - උපද්‍රව්‍ය විශ්ලේෂණ අති අවදානම් පාලන ස්ථාන

පුත්තලම (සියයට 12.1), අනුරාධපුරය (සියයට 6.8) සහ හම්බන්තොට (සියයට 6.5) යන දිස්ත්‍රික්ක ඊළඟ වැඩිම ප්‍රතිශතයන්ට හිමිකම් පානු ලබයි.

- බොහෝ කිරි ගොවීන්/ව්‍යවසායකයින් හට ආදායම් උත්පාදනය සඳහා මාස 6 කට වඩා වැඩි කාලයක් ගතවන බැවින් 2016 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි දැනට පවතින 6 මසක් වූ සහන කාලය ව්‍යාපෘතියේ ස්වභාවය මත උපරිම මාස 12 දක්වා දීර්ඝ කරන ලදී.
- මෑතකදී හඳුන්වා දෙන ලද තේ කර්මාන්තශාලා හිමියන් සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රජයේ අරමුදලින් වසර 2 ක කාලයක් සඳහා සියයට 2 ක පොලී සහනාධාරය ලබා දීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. මෙම යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ ලියාපදිංචි වී ඇති තේ කර්මාන්තශාලාවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගැනීම සඳහා පහසුකම් සැපයීමයි. 2015 දෙසැම්බර් අවසන් වනවිට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 2,943.8 ක ණය මුදලක් ණය ප්‍රතිලාභීන් 79 දෙනෙක් වෙත මුදාහැර ඇත.
- රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්ෂුද්‍ර මූල්‍ය කොටසෙහි කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා නියෝජිත ආයතනයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් 2015 දෙසැම්බර් මාසයේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ දරිද්‍රතාව අඩු කිරීම සහ සුළු පරිමාණ ඉඩම් නොමැති ගොවීන්ගේ, විශේෂයෙන්ම, ග්‍රාමීය කුටුම්බයන්හි කාන්තාවන් හා තරුණයන්ගේ ජීවනෝපාය තිරසාර ලෙස වැඩිදියුණු කිරීමයි. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මේ සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලබයි.

## 23.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය

- ඉහළ විභවයකින් යුතු හා නැගී එන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය (SLS), පිබිදෙන උතුර ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය අදියර II (ANLS RF - ph II) , ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය (SEPI), කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (SPEnDP), සහ වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල් වීමේ වැඩසටහන චක්‍රීය අරමුදල (DZLiSPP - RF) යන ණය යෝජනා ක්‍රම 05 යටතේ කෘෂිකාර්මික, නිෂ්පාදන හා සේවා යන අංශයන් සඳහා රුපියල් මිලියන 3,219.3 ක මුදලක් ප්‍රතිලාභීන් 14,832 ක් අතරේ මුදාහැරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගන්නා ලදී.
- මෙම ණය යෝජනා ක්‍රම අතරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ණය සපයන ප්‍රමුඛතම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය වූ "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින් 12,317 ක් අතර රුපියල් මිලියන 2,889.6 ක් මුදා හැරිණි. එය, ශ්‍රී ලංකා මහ බැංකුව කුඩා හා මධ්‍ය පරිමාණ අංශය සඳහා මුදාහැර ඇති සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 90 කි. ණය මුදල් සැපයීමේ දී නව්‍ය හා නවෝත්පාදන ව්‍යාපාර, කාන්තාවන් සහ තරුණ ව්‍යවසායකයන් වෙත විශේෂ අවධානය යොමු කරන ලදී.
- ප්‍රතිපත්තිමය දෘෂ්ටිකෝණයට අනුව, තවදුරටත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ජනතාව අතර ප්‍රචලිත

කිරීමට ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී. ඊට අදාළව, ණය යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීමේ දී පවතින සමහර කොන්දේසි ලිහිල් කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකු ඒකක හා මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන උනන්දු කරවීම සහ සමාන අරමුණු සඳහා විවිධ ණය ඉල්ලුම්පත් බොහෝ ප්‍රමාණයක් සම්පූර්ණ කිරීම වැනි අනවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කිරීම අඩු කිරීම සඳහා අනුරූප ණය යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම හඳුන්වා දී ඇත.

- බහුවාර්ෂික බෝග වගාව තවදුරටත් දියුණු කිරීමට ඇති හැකියාව සහ ආදායම් උත්පාදනය සඳහා ගතවන දීර්ඝ කාල සීමාව සලකා බැලීමෙන් අනතුරුව සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ බහුවාර්ෂික බෝග වගාව සඳහා ලබා දී තිබූ මාස 6 ක සහන කාලය 2015 නොවැම්බර් මාසයේ සිට වලංගු වන පරිදි මාස 12 දක්වා දීර්ඝ කරන ලදී.
- යාන්ත්‍රිකකරණය හේතුකොටගෙන බොහෝ ව්‍යවසායකයින්, යෙදවිය හැකි අවම සේවා නියුක්තිකයින් සංඛ්‍යාවක් යොදා ගැනීමට පෙළඹීම නිසා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සපුරා ලිය යුතු, අවම පුද්ගලයින් සංඛ්‍යාවෙහි සීමාව (උදා: පුද්ගලයන් 5 දෙනෙකුගේ අවශ්‍යතාවය) සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදී. ඒ අනුව, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට සේවා නියුක්තයින් 100 කට අඩු කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සුදුසුකම් ලබයි. ඒ සමඟ පිරිවැය ඵලදායීතාවය සැලකිල්ලට ගනිමින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ, ව්‍යාපෘති වාර්තා සැපයීමේ අවශ්‍යතාවය රුපියල් ලක්ෂ 5 ණය මුදලේ සිට රුපියල් මිලියනය දක්වා ඉහළ නංවන ලදී. මෙම ක්‍රියාමාර්ග යන් තුළින් අපේක්ෂා කරනුයේ, මෙතෙක් පරිපාලනමය වශයෙන් පැවති දුෂ්කරතාවයන් අවම කිරීමත් ණය ලබාදීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමත්ය.
- උතුරු පළාතේ කෘෂිකාර්මික, පශු සම්පත්, ධීවර හා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ලබාදීම සඳහා ඇරඹි ''පිබිදෙන උතුර'' ණය යෝජනා ක්‍රමය අවුරුදු 6 කට වඩා වැඩි කාලයක් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, 2015 නොවැම්බර් මසදී සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සමඟ ඒකාබද්ධ කරන ලදී. 2015 වසර තුළදී පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය චක්‍රීය අරමුදල - අදියර II යටතේ රුපියල් මිලියන 203.6 ක මුදලක් මුදාහැර ඇත.
- විශේෂිත තාක්ෂණික ආයතන යටතේ වෘත්තීය සුදුසුකම් ලබාගත් තරුණ කොටස්වලට කුඩා පරිමාණ ව්‍යවසායයන් ආරම්භ කිරීමට "ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය" යටතේ රුපියල් මිලියන 29.7 ක් මුදාහැර ඇත. අනෙකුත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම වන කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන හා වියළි කලාපීය ජීවනෝපාය සඳහා සහාය වීමේ හා හවුල් වීමේ වැඩසටහන එක්ව 2015 වසරේ දී රුපියල් මිලියන 96.3 ක මුදලක් ප්‍රතිලාභීන් 709 ක් වෙත මුදාහැර ඇත.
- වෙළඳපොළේ පවතින අඩු පොලී අනුපාතිකයන් සැලකිල්ලට ගිනිමින් කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ලබා දෙන ණය සඳහා වන පොලී අනුපාතිකය 2015 මැයි මස සිට බලපාන පරිදි සියයට නවයෙ (9%) සිට සියයට හත (7%) දක්වා අඩු කරන ලදී.

## 23.4 ක්ෂුද්‍ර මූල්‍ය අංශය

අතිරේක ආදායම් උත්පාදන මාර්ගයන් ආරම්භ කිරීමට ණය පහසුකම් ලබාදෙමින් සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඔවුන් දැනුම්වත් කරමින් අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි. දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල, දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II, දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල අදියර II සහ සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන චක්‍රීය අරමුදල ණය ව්‍යාපෘතිය යන ප්‍රධාන ණය යෝජනා ක්‍රම මගින් මෙම අංශය සඳහා මූල්‍ය පහසුකම් සපයා ඇත.

- අදාල වසර තුළ මෙම ණය යෝජනා ක්‍රම මගින් රුපියල් මිලියන 2,139.5 ක මුදලක් ප්‍රතිලාභීන් 34,385 දෙනෙකු වෙත මුදාහැර ඇත.
- වෙළඳපොළ තුළ පවතින අඩු පොලී අනුපාතික සැලකිල්ලට ගනිමින්, දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II හා දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය චක්‍රීය අරමුදල - අදියර II යටතේ ලබා දෙන ණය සඳහා වන පොලී අනුපාතිකය 2015 නොවැම්බර් මස සිට බලපාන පරිදි සියයට 12 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී.

## 23.5 රන් භාණ්ඩ උකස් ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

2014 ජුනි 17 දින ආරම්භ කරන ලද උකස් ණය අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළේ ප්‍රවණතාවයන් සහ රත්‍රන් මිල වෙනස් වීම සලකා බලමින් 2015 දෙසැම්බර් මස අගදී අවසන් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ, සහභාගිත්ව මූල්‍ය ආයතනයන් විසින් උකස් අත්තිකාරම් ලෙස මුදාහරින ලද රුපියල් මිලියන 29,248.1 ක් සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආවරණය සපයා ඇත. 2015 වසරේ දී මුදාහරින ලද රන් භාණ්ඩ උකස් අත්තිකාරම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන 17,757.9 කි.

## 23.6 කුසලතා සංවර්ධනය හා ශක්‍යතා ගොඩනැගීම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්, මූල්‍ය අන්තර්ගතභාවයෙහි වැදගත්කම හඳුනා ගනිමින්,

විශේෂයෙන්ම, මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය, කුසලතා සංවර්ධනය ආදී කරුණු කේන්ද්‍ර කොට ගනිමින්, ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 278 ක් පවත්වා ඇත. මෙම මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් මගින් විධිමත් මූල්‍ය අංශ සමඟ සම්බන්ධවීමෙන් ලැබෙන වාසි, යහපත් බැංකු පුරුදු, නව මූල්‍ය උපකරණ හා සේවා, මූල්‍ය විනය ආදී කරුණු පිළිබඳව දැනුම්වත් කෙරිනි. එමෙන්ම, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ස්වයං ආධාරක කණ්ඩායම් ගොඩනංවමින්, ඔවුන්ව මූල්‍ය කළමනාකරණය සහ යහපත් මූල්‍ය පුරුදු සම්බන්ධව දැනුම්වත් කිරීමේ කාර්යයෙහි නිරත විය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වැඩසටහන්හි තොරතුරු පහත II - 20 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-20 සංඛ්‍යා සටහන** **2015 වසර තුළ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වැඩසටහන්**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය සාක්ෂරතාව | 101 |
| ව්‍යවසායකත්ව සංවර්ධනය | 57 |
| පුහුණු කරන්නන් පුහුණු කිරීම | 20 |
| ව්‍යාපෘති ඇගයීමේ වැඩමුළු | 58 |
| ගුවන් විදුලි වැඩසටහන් | 27 |
| අනෙකුත් දැන්වීම් | 15 |

# 24. අවදානම් කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය ශක්තිමත් කිරීමේ අරමුණින් 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 33 වගන්තිය යටතේ, 2015 පෙබරවාරි 09 වන දින අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පිහිටු වීමත් සමඟම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව අවදානම් කළමනාකරණ රාමුවක් හඳුන්වා දෙන ලදී. එනම් තෙවැදැරුම් ආරක්ෂක ක්‍රමයන්ය.[1] මෙහි දෙවන පෙළ ආරක්ෂක ක්‍රමය ලෙස අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. පළමු පෙළ ආරක්ෂක ක්‍රමයන් ලෙස කටයුතු කරන මෙහෙයුම් දෙපාර්තමේන්තුවලින් ස්වාධීන වූ වාර්තාකරණ පිළිවෙළක් යටතේ ස්වාධීනව අවදානම් කළමනාකරණ කාර්යය සිදු කිරීමේ වගකීම දෙවන පෙළ ආරක්ෂක ක්‍රමයක් වශයෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීමේ වගකීම දෙවන පෙළ ආරක්ෂක ක්‍රමයක් වශයෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. එනම්, විදේශ සංචිත ආයෝජන, සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජනවලට අදාළ මූල්‍ය අවදානම්ය. මෙයට අමතරව රාජ්‍ය ණය කළමනාකරණය හා මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්වලට අදාළ අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම ද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. මූල්‍ය අවදානම් කාණ්ඩයන්ට වෙළඳපොළ අවදානම් (පොලී අනුපාත අවදානම හා විනිමය අනුපාත අවදානම), ප්‍රතිපාර්ශව ණය අවදානම, ද්‍රවශීලතා අවදානම හා රාජ්‍ය ණය කටයුතුවලට අදාළ ප්‍රතිනිකුතු අවදානම ඇතුළත් වේ. මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අවදානම් කළමනාකරණය, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට කේන්ද්‍රගත කර ඇති අතර, මෙමගින් නිසි අවදානම් පාලන ආකෘතියක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කිරීම සඳහා බැංකුව තුළ ශක්තිමත් හා පුළුල් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් බිහි කිරීමට දායක වීම අපේක්ෂා කෙරේ.

දැක්ම හා මෙහෙවර ප්‍රකාශය පිළියෙළ කිරීම, මුදල් මණ්ඩලය විසින් අනුමත කළ කාර්යභාරයන්ට අනුකූලව මධ්‍ය කාලීන උපාය මාර්ගික සැලැස්ම පිළියෙළ කිරීම හා දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ ආකෘතිය පිළියෙළ කිරීමත් සමඟම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සිය කාර්යයන් ආරම්භ කරන ලදී. මේ සමඟම දෙපාර්තමේන්තුවට පවරන ලද අවදානම් කළමනාකරණ කාර්යයන් පියවරෙන් පියවර පවරා ගැනීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හා අවදානම් කළමනාකරණයට අදාළ නිපුණතා හා ශක්‍යතා ගොඩනැගීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. මෙයට හේතුව වන්නේ නවීන තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් හා විශේෂිත පුහුණු කාර්ය මණ්ඩලයක් මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වීමය. 2015 වර්ෂයට අදාළව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් හා අනෙකුත් කටයුතු පහත සඳහන් කර ඇත.

### (i) ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය අවදානම් කළමනාකරණ කාර්යය පවරා ගැනීම

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අවශ්‍ය මට්ටමේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හා නිපුණතා අත්පත් කරගැනීමත් සමඟ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ මධ්‍යම කාර්යාලය මගින් මෙතෙක් කළමණාකරණය කරනු ලැබූ කාර්යභාරයන් වූ විදේශ සංචිත ආයෝජනයන්ට අදාළ මූල්‍ය අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා අධීක්ෂණය කිරීමේ කාර්යය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. මේ අනුව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමක් වූ වෙළෙඳපොළ අවදානම හා ප්‍රතිපාර්ශව ණය අවදානම කළමණාකරණය කිරීම විදේශ සංචිත කළමණාකරණ කමිටුවේ අනුමැතිය සහිතව අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී.

අවදානමට ලක්කළ වටිනාකම (Value at Risk) හා විකරණය කළ පැවතුම් කාලය (Modified Duration) උපයෝගී කර ගනිමින් වෙළඳපොළ අවදානම ගණනය කරනු ලැබීය. අවදානමට ලක් කළ වටිනාකම යනු නිශ්චිත කාල පරාසයක්

1 පළමු පෙළ ආරක්ෂක ක්‍රමය මගින් මෙහෙයුම් දෙපාර්තමේන්තුවල දෛනික මෙහෙයුම් කටයුතුවලට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවල යෝග්‍යතාවය තහවුරු කරනු ලබයි. දෙවන පෙළ ආරක්ෂක ක්‍රමය ස්වාධීන අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් තුළින් (අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව) සිදු කරන පාලන කාර්යයන්වලින් සමන්විත වේ. තෙවන පෙළ ආරක්ෂක ක්‍රමය විගණකවරුන්ගෙන් සමන්විතවන අතර ඉදිරිපෙළ ව්‍යාපාරික කටයුතු හා පාලන කාර්යයන් ප්‍රමාණවත් මට්ටමේ නිපුණතාවයකින් තහවුරු කිරීම මෙමගින් සිදු වේ.

විශේෂ සටහන 16

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අවදානම් කළමනාකරණ රාමුව

ලොව පුරා ඇති මහ බැංකු ඔවුන්ගේ විවිධාකාර වූ ක්‍රියාකාරකම් ද, බාහිර පාර්ශවයන් සමඟ පවත්වන ගනුදෙනු ද හේතු කොට ගෙන පුළුල් අවදානම් පරාසයකට ලක්ව ඇත. එබැවින්, විචක්ෂණභාවයෙන් යුක්තව මෙම අවදානම් කළමනාකරණය කරගනු පිණිස 'ස්වාධීන කේන්ද්‍රීය අවදානම් කළමනාකරණ රාමුවක්' ස්ථාපිත කිරීම පිළිබඳව අවධානය යොමුව පවතී. සාධනීය අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් පැවතීම හේතූන් කීපයක් නිසා මහ බැංකුවකට අතිශයින්ම වැදගත් වේ.

පළමුව, මහ බැංකුවක සාමාන්‍යයෙන් මූලික අරමුණු වන මිල හා මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යැමට හා සිය මුදල් හා මූල්‍ය ප්‍රතිපත්තීන් පිළිබඳව පවත්නා විශ්වාසනීයත්වය රැක ගැනීමට මනා අවදානම් කළමනාකරණ රාමුවක් පැවතීම වැදගත් වේ.

දෙවනුව, මහ බැංකු ශේෂ පත්‍රයන් හා ප්‍රාග්ධනය මත බලපෑම් ඇති කළ හැකි අනිසි අවදානම් සාධක පාලනය කරමින්, ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් හා සංචිත පවත්වා ගැනීමට මනා අවදානම් කළමනාකරණ රාමුවක් උපයෝගී වේ.

තෙවනුව, විදේශ විනිමය ප්‍රතිපත්තීන් ඇතුළුව සිය මූල්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මගින් සමස්ත ආර්ථිකයෙහිම අවදානම් කළමනාකරු වශයෙන් මහ බැංකු කටයුතු කරන අතර, මනා අවදානම් කළමනාකරණ රාමුවක් තිබීම ආර්ථිකය අනපේක්ෂිත හා අහිතකර කම්පනයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ද, රටක රාජ්‍ය ණය යෝග්‍යතාව පිළිබිඹු කර දැක්වීමට ද ඉවහල් වේ.

සිව්වෙනුව, මහ බැංකු රාජ්‍ය වත්කම්හි භාරකරු වශයෙන් සලකනු ලැබේ. එබැවින්, විදේශීය මුදල් සංචිත සහ අනෙකුත් පොදු අරමුදල් කළමනාකරණය පවරා ඇති රාජ්‍ය ආයතනයක් සතු විය යුතු මූල්‍ය ප්‍රඥාව, විනිවිදභාවය හා යහපාලනය වැනි ගුණාංගයන්ට අනුගතව කටයුතු කරනු පිණිස පුළුල් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිතව තිබීම අත්‍යවශ්‍ය කරුණකි.

අවසන් වශයෙන්, අවදානම් පාලනය කරමින් මහ බැංකුවල කීර්තිනාමය රැකගැනීමටත්, ප්‍රතිපත්තීන් පිළිබඳ විශ්වාසනීයභාවයක් ඇති කිරීමටත් මනා අවදානම් කළමනාකරණ රාමුවක් මහ බැංකුවකට අත්‍යවශ්‍ය වේ.

### 2. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයෙහි විකාශනය

මෑතක් වන තෙක්ම, විශේෂයෙන් 2008 වසරෙහි ඇති වූ ලෝක ආර්ථික හා මූල්‍ය අර්බුදය පැනනගින තෙක්ම, 'අවදානම් කළමනාකරණය' ලෝකයේ අනෙකුත් මහ බැංකුවල වැඩි අවධානයට යොමු වූ මාතෘකාවක් නොවීය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ද එසේම විය. මූල්‍ය අර්බුද ඇති වීමට පෙර වකවානුවෙහි අවදානම් කළමනාකරණය වැඩි වශයෙන් සීමා වූයේ ශාස්ත්‍රීය භාවිතයටය. මෙම වකවානුවෙහි, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ද අවදානම් කළමනාකරණ රාමුව විමධ්‍යගත ස්වරූපයක් ගත් අතර, සෑම දෙපාර්තමේන්තුවක්ම තම අවදානම තමා විසින් කළමනාකරණය කර ගැනීමත්, ඉහළ කළමනාකරණයට වාර්තා කිරීමත් සිදු කරනු ලැබීය. කෙසේ වෙතත්, ලොව පුරා අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයන්හි බිඳවැටීම්වලින් ලද පූර්වාදර්ශයන් අනුව, පුළුල් පිළිගැනීමක් සහිත ප්‍රමිතීන්, නිර්දේශයන් හා ප්‍රශස්ත ක්‍රියාමාර්ගයන්ට අනුකූල වූ අවදානම් කළමනාකරණ රාමුවක ඇති වැදගත්කම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවධාරණය කර ගන්නා ලදී.

මේ අනුව, වර්ෂ 2000 හි මුල් භාගයේ දී නියෝජ්‍ය අධිපතිවරයකුගේ මූලිකත්වයෙන්, අවදානම් කළමනාකරණ රැස්වීම් පැවැත්වීම ඇරඹිණි. 2010 වසරේ මැයි මස, අධිපතිතුමාගේ සභාපතීත්වයෙන් අවදානම් කළමනාකරණ කමිටුවක් පිහිටුවීම මගින් වඩාත් විධිමත් ආකාරයට මෙම කටයුත්ත කරගෙන යැමට හැකි විය. මෙම කමිටුවේ සාමාජිකත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ වඩාත් අවදානමට පාත්‍ර විය හැකි දෙපාර්තමේන්තු 12 ක ප්‍රධානීන්ගෙන් සමන්විත වූ අතර, එමගින් පොලී අනුපාත, විදේශ විනිමය, ද්‍රවශීලතාව වැනි මූල්‍ය අවදානම් ද, ප්‍රතිපත්ති, ගෙවුම් හා පියවුම්, ආපදාවට ලක් විය හැකි බැංකු හා මූල්‍ය ආයතන, අනපේක්ෂිත ආපදා, තොරතුරු පද්ධති, බාහිර පරිසරය, මානව ප්‍රාග්ධන හා කළමනාකරණ සංකූලතා වැනි මූල්‍ය නොවූ අවදානම් ද සැලකිල්ලට ගන්නා ලදී.

### 3. ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අවදානම් කළමනාකරණ රාමුව

අවදානම් කළමනාකරණය පිළිබඳ ලොව පවතින නව ප්‍රවණතා හා ස්ථිරසාර හා ස්වාධීන අවදානම් කළමනාකරණ රාමුවක් තිබීමේ වැදගත්කම අවධාරණය කරගත් ශ්‍රී ලංකා මහ බැංකුව, කෙමෙන් කේන්ද්‍රීය අවදානම් කළමනාකරණ රාමුවක් වෙත යොමු වෙමින් පවතී. එහි ආරම්භක පියවර ලෙස මුදල් මණ්ඩලය විසින් 2015 වසරේ දී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහ බැංකුව තුළ ස්ථාපිත කරන ලදී. මෙම ක්‍රමවේදය තුළ සියලු මූල්‍ය අවදානම්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව තුළ කේන්ද්‍රගත කිරීම මගින් ද සියලුම මූල්‍ය නොවන අවදානම් විකේන්ද්‍රීයව අදාළ දෙපාර්තමේන්තු මගින් ද, සිදු කෙරේ. මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන අවදානම් කළමනාකරණ රාමුව ද්විත්ව ස්වරූපයක් ගනී.

මහ බැංකු විසින් කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් හා දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය පරිසරයෙහි පවතින සංකූලතා හා නව්‍ය වර්ධනයන් හේතුවෙන් මූල්‍ය නොවන අවදානම් රාශියක් පැනනගී. මහ බැංකුවක එදිනෙදා කාර්යයන්හි සිදුවන හදිසි බැඳවැටීමක් හෝ කීර්තිනාමයට සිදුවන හානියක් එහි කාර්යභාරය හා වගකීම පිළිබඳ පවත්නා වූ විශ්වාසනීයත්වයට තදින් බලපෑ හැක. එබැවින් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් මනා ලෙස පැවතීම තුළින් ආයතනයක් අනුමත කාර්ය පටිපාටීන්, නීතිරීති, නිර්දේශයන් හා යහපාලනයට අනුකූලව කටයුතු කරන බව සනාථ වේ. මෙම අරමුණු පෙරදැරි කොට, 2015 ඔක්තෝබර් මස අධිපතිතුමාගේ සභාපතිත්වයෙන් හා අවදානමට ලක්වීමට වැඩි ප්‍රවණතාවක් දක්වන තෝරාගත් දෙපාර්තමේන්තු කිහිපයක ප්‍රධානීන්ගේ සාමාජිකත්වයෙන් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කරන ලදී. මෙමගින් බැංකුව තුළ ඇති මූල්‍ය නොවන අවදානම් කේන්ද්‍රීයව කමිටු මට්ටමෙන් සාකච්ඡා කිරීමටත්, බැංකුවේ සමස්ත අවදානම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් අවකාශය සැලසේ.

**4. තෙවැදෑරුම් ආරක්ෂක ක්‍රමවේදය**

ශ්‍රී ලංකා මහ බැංකුව සිය නව අවදානම් කළමනාකරණ රාමුව යටතේ 'තෙවැදෑරුම් ආරක්ෂක ක්‍රමයක්' අනුගමනය කරනු ලබයි. මේ අනුව, ප්‍රථම පෙළ ආරක්ෂක ක්‍රමයේ වගකීම රඳා පවතින්නේ අදාළ දෙපාර්තමේන්තුවටය. මෙම මට්ටමේ පවත්නා අවදානම් බොහොමයක් මෙහෙයුම් අවදානම් ස්වරූපයක් ගනු ලබන බැවින් අවදානම පැනනගින දෙපාර්තමේන්තුව විසින්ම අධීක්ෂණය හා පාලනය කළ යුතුය. මෙයට හේතුව අදාළ දෙපාර්තමේන්තුවට සිය දෛනික මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මනා අවබෝධයක් පැවතීමයි. ප්‍රථම පෙළ ආරක්ෂක ක්‍රම මගින් අභ්‍යන්තර අවදානම් පද්ධති හා පාලන ක්‍රමවල සුරක්ෂිතභාවය තහවුරු කරනු ලබයි. දෙවන පෙළ ආරක්ෂක ක්‍රමයේ වගකීම රඳා පවතින්නේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මත වන අතර, මෙමගින් මූල්‍ය අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සිදුකරනු ලබයි. විදේශ සංචිත ආයෝජනයන්, ශ්‍රී ලංකා මහ බැංකුව කළමනාකරණය කරනු ලබන අභ්‍යන්තර අරමුදල්හි ආයෝජනයන්, මුදල් මෙහෙයුම්, රාජ්‍ය ණය කළමනාකරණය හා සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජනයන්ට අදාළ මූල්‍ය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ සිදු කෙරේ. තෙවන පෙළ ආරක්ෂක ක්‍රමය යටතේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහතික කිරීමේ ක්‍රමවේදය සඳහා වන වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

**අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය**

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අවදානම් තක්සේරුව, අධීක්ෂණය හා පාලනය, මිනුම් ලකුණු මත කාර්ය ඇගයුම හා වාර්තා කිරීම යන අංගවලින් සමන්විතය. අවදානම් තක්සේරුව මගින් අවදානම් හඳුනා ගැනීම සහ මැන ගැනීම කරනු ලැබේ. වෙළඳපොළ අවදානම මැන ගැනීමට විකරණය කළ පැවතුම් කාලය (Modified Duration), සංවේදීතා විශ්ලේෂණ (Sensitivity Analysis) සහ අවදානමට ලක් කරන ලද වටිනාකම (Value at Risk) වැනි මිනුම්දඬු භාවිතා වේ. ණය අවදානම මැන ගැනීමට දිගුකාලීන ප්‍රතිපාර්ශව ඇගයුම් ක්‍රමවේදයක් වන, ණය වර්ගීකරණය (Credit Rating) හා අභ්‍යන්තරව නිර්මාණය කරගන්නා ලද අවදානම් පරාමිති (Risk Parameters) යොදා ගැනේ. විදේශ සංචිත ආයෝජනයන් හා බැඳුනු අවදානම් පාලනය සහතික කරනු පිණිස, දීර්ඝකාලීන අධීක්ෂණයත්, මුදල් මණ්ඩලය විසින් අනුමත කළ විදේශ සංචිත කළමනාකරණ නිර්දේශයන්ට හා ප්‍රතිපාර්ශව ණය කළමනාකරණ ක්‍රමවේද නිර්දේශයන්ට ආයෝජනයන්හි ඇති අනුකූලතාව තහවුරු කිරීමත් සිදු වේ. මෙහිදී නිර්දේශ කඩකිරීම් සිදුව පවතී නම්, ඒවා ස්වාධීනව කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වගකීමකි. බැංකුව තුළ මූල්‍ය නොවන අවදානම් කළමනාකරණයේ දී අදාළ දෙපාර්තමේන්තු මෙබඳුම ක්‍රමවේදයක් අනුගමනය කරයි. දෙපාර්තමේන්තුවල පවතින මූල්‍ය නොවන අවදානම් ඒවායේ ඇති භව්‍යතාවය හා සිදුවුවහොත් ඉන් ඇතිවන බලපෑම යන කරුණු පදනම් කරගෙන සෑම කාර්තුවකට වරක්ම 'මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව' වෙත වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, ඉතා බරපතල ගණයේ අවදානම් එසැණින්ම කළමනාකාරිත්වය වෙත දැනුම් දීම අවදානම් හිමි දෙපාර්තමේන්තුව විසින් කළ යුතුය.

මෙම නව අවදානම් කළමනාකරණ රාමුව ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අවදානම් කළමනාකරණයට නැඹුරු සංස්කෘතියක් බිහිකිරීමටත්, ආයතනයේ සියලුම සේවකයන් අවදානම් හිමිකරුවන් හා නිලධරයන් වශයෙන් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට සක්‍රීයව සම්බන්ධ කර ගැනීමටත් ඉවහල් වේ. නව අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ මූලික මූලධර්ම වශයෙන් වාර්තා කරන පිළිවෙළෙහි හා අවදානම් කළමනාකරණ කාර්ය සංවිධානයෙහි අග්‍රගණ්‍ය යහපාලන ප්‍රමිති ළඟාකර ගැනීම දැක්විය හැකිය.

හා විශ්වාසදායී මට්ටමක් යටතේ ආයෝජන කළඹේ මුළු වටිනාකමින් අලාභ සිදු වීමේ අවදානමේ මිනුමයි. ඵලදායිතා වක්‍රයේ වෙනස්වීම්වලට අනුව ස්ථාවර ආදායම් හා මුදල් වෙළඳපොළ ආයෝජන කළඹයන්හි සංවේදීතාව මැනීමට විකරණය කළ පැවතුම් කාලය උපයෝගී කරගනු ලැබේ. ප්‍රතිපාර්ශව අවදානම් කළමණාකරණයට අදාළව ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරගෙන යන ලද ප්‍රතිපාර්ශව ණය අවදානම් කළමනාකරණ පද්ධතිය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. මූල්‍ය දර්ශක, ප්‍රතිපාර්ශව ණය වර්ගීකරණයන් හා වෙළෙඳපොළ නිරාවරණයන් පදනම් කරගෙන ප්‍රතිපාර්ශව ඇගයීම් හා තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ. මේ අනුව ෆිච් (Fitch), ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (Standerd & Poor's) සහ මූඩීස් (Moody's) යන ආයතන මගින් පසුගිය කාලය තුළ සිදු කළ ණය ශ්‍රේණිගතකිරීමේ වෙනස්වීම්වලට අදාළව ණය සීමාවන් ගණනාවක් සංශෝධනය කළ අතර, එම සංශෝධිත ණය සීමාවන්ට අනුකූලව ගනුදෙනු සිදුකිරීම සඳහා මෙම තොරතුරු ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. මීට අමතරව, ප්‍රතිපාර්ශව තෝරා ගැනීම්, ණය අවදානම් තක්සේරු කිරීම් හා අදාළ කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද සීමා සංශෝධනයන් විදේශ සංචිත කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**(ii) දෛනික වෙළඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම**

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ ද්‍රවශීලතාවය, කෙටි කාලීන පොලී අනුපාතිකයන්හි හැසිරීම, විදේශ සංචිතයන්හි වත්කම් වර්ග කිරීම (විනිමය වශයෙන් හා උපකරණ වශයෙන්), විදේශ විනිමය ගනුදෙනුකරුවන්ගේ කාර්යසාධනය, රාජ්‍ය සුරැකුම්පත්වලට අදාළව ඵලදායිතා වක්‍ර හැසිරීම හා භාණ්ඩාගාර අරමුදල් අවශ්‍යතා මත පදනම්ව වෙළඳපොළ දත්ත හා තොරතුරු විශ්ලේෂණය කර දෛනිකව අධිපතිතුමා වෙත වාර්තා කරනු ලැබේ. මෙම විශ්ලේෂණය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ලබාගන්නා තොරතුරු මත පදනම් වේ. මෙයට අමතරව, ගෝලීය මූල්‍ය වෙළඳපොළෙහි සිදුවූ විශේෂිත සිදුවීම් අධිපතිතුමා වෙත වාර්තා කරන ලදී.

**(iii) විදේශ සංචිත කළමනාකරණ කමිටුවට දක්වන දායකත්වය**

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ “නිරීක්ෂකයෙකු” ලෙස කටයුතු කළ අතර, නව අවදානම් මිනුම්, සංචිත කළමනාකරණ කළඹට අදාළව වෙළඳපොළ අවදානම් හා ණය අවදානම් සාධක සහ හිමිකාර ගනුදෙනු (Proprietary trading) යන සංකල්පය පදනම්ව ඉදිරිපත් කිරීම් කිහිපයක් වසර අවසාන භාගයේ දී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් හසුරුවන ලද අවදානම් කළමනාකරණ කාර්යයන් පවරා ගැනීමෙන් පසුව සිදු කරන ලදී. මෙයට අමතරව, මෙම කාලය තුළ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡා පත්‍රිකා කිහිපයක් ද විදේශ සංචිත කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**(iv) විශේෂ පැවරුම්/සංකල්ප පත්‍රිකා**

බැංකු ද්‍රවශීලතා, විදේශ සංචිත ගනුදෙනු කටයුතු, අභ්‍යන්තර අරමුදල්හි මෙහෙයුම් කටයුතු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී අනුපාත සම්පාදනය කිරීම වැනි විශේෂ පැවරුම් හා සංකල්ප පත්‍රිකා කිහිපයක් සකස්කොට අධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

**(v) මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව සඳහා දායකත්වය**

2015 ඔක්තෝබර් මස අධිපතිතුමාගේ සභාපතීත්වයෙන් ද අවදානමට ලක්වීමට වැඩි ප්‍රවණතාවයක් දක්වන තෝරාගත් දෙපාර්තමේන්තු කිහිපයක ප්‍රධානීන්ගේ සාමාජිකත්වයෙන් ද යුක්තව මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මූලික වී කටයුතු සංවිධානය කරන ලදී. සාමාජික දෙපාර්තමේන්තුවල මූල්‍ය නොවන අවදානම් වාර්තා කිරීමට නව ආකෘතියක් සකස් කරන ලද අතර, සියලු අවදානම් ඒකරාශී කොට සාරාංශ ගත වාර්තාවක් ලෙස මෙම තොරතුරු මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙම කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරන අතර, කමිටු රැස්වීම් සංවිධානය, වාර්තා පිළියෙළ කිරීම, අවදානම් පිළිබඳ තොරතුරු එක්රැස් කොට මූල්‍ය නොවන අවදානම් ආකෘතිය සකස් කිරීම හා කමිටුවට ඉදිරිපත් කිරීම ලේකම්ගේ වගකීම විය.

**(vi) අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම**

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය යටිතල පහසුකම් සපයා ගනු වස් බ්ලූම්බර්ග් පද්ධතිය (Bloomberg system) මගින් සේවාවන් ලබාගනු ලැබීය. මෙමගින් වෙළඳපොළ අවදානම, ප්‍රතිපාර්ශව අවදානම ආදිය ඇගයුමට ලක්කිරීමටත්, මූල්‍ය තොරතුරු, වෙළෙඳපොළ දත්ත ගෝලීය ප්‍රවෘත්ති හා ණය වර්ගීකරණ තොරතුරු ආදිය එසැණින් ලබා ගැනීමටත් ඉඩ සැලසේ. රොයිටර් පුවත් තිරය (Reuters) තුළින් ද තත්කාලීන ගෝලීය පුවත් ලබා ගැනේ.

**(vii) නිපුණතා සංවර්ධන හා දැනුම බෙදා ගැනීමේ ක්‍රියාකාරකම්**

දැනුම බෙදා ගනු වස්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ විෂය පථයට සම්බන්ධ ඉදිරිපත් කිරීම් හා ලිපි සකස් කිරීම් ආදිය සිදු කරයි. මෙබඳු ක්‍රියාකාරකම් තුළින් දෙපාර්තමේන්තුව තුළ දැනුම බෙදා ගැනීමේ වේදිකාවක් සකස් කර ඇත. ඊට අමතරව විදේශ පුහුණුවීම්වලට සහභාගී වූ නිලධාරීන් විසින් දැනුම බෙදා ගැනීමේ නිරත විය. තවදුරටත් දැනුම වර්ධනය කරගනු වස්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචිත කළමනාකරණය වැනි මාතෘකා ඔස්සේ විදේශීය ප්‍රවීනයන් විසින් කරනු ලැබූ සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබීය. මීට අමතරව පෘථුල අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කරන අනෙකුත් මහ බැංකුවල පුහුණුවක් ලබාගනිමින් මානව සම්පත් නිපුණතාවය වැඩිදියුණු කිරීමට කටයුතු සලසනු ලැබීය.

## 25. ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේ දී ම ප්‍රතිස්ථාපිත දෙපාර්තමේන්තු අතරින් එකකි. එමගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම; විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම; නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම හා අනෙකුත් පොදු පරිපාලන කටයුතු සිදු කිරීම; පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු; විදේශ පුහුණු හා විදේශ සංචාර සම්බන්ධයෙන් වන ගෙවීම් කටයුතු සිදු කිරීම; උත්සව සංවිධානය කිරීම; අභාවිත සහ යල්පිනූ භාණ්ඩ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල කටයුතු හා තැපැල් කාමර සේවාව ආදී පොදු සේවා සැපයීම සහ අධිපතිතුමාට අවශ්‍ය සේවා සපයා දීම ප්‍රධාන වේ.

**(අ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම:**

2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන්ම ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් මිලියන 159.03 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවා සැලසුම් කළ කාලය තුළ දී ප්‍රසම්පාදනය කරන ලදී. මහ බැංකුව සඳහා කලට වේලාවට භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සහතික කරනු පිණිස 2015 වර්ෂයේ දී ද ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 වර්ෂය සඳහා සැලසුම් කළ මහ බැංකුවේ සමස්ත ප්‍රසම්පාදන අවශ්‍යතාවලින් 88% ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට ලේකම් දෙපාර්තමේන්තුවට හැකි විය. තවද, පොදු වගකීම් රක්ෂණ ආවරණය ද ඇතුළු බැංකුවේ සියලුම දේපළ සඳහා සවල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. මීට අමතරව, දැනට පවතින ක්‍රමවේදයට අනුකූලව භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සඳහා අනෙකුත් දෙපාර්තමේන්තු විසින් පත් කරන ලද ප්‍රසම්පාදන මණ්ඩල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවලට ලේකම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වන ලදී.

**(ආ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම:**

දෙදහසකට ආසන්න ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙනුවෙන් මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය, වැන්දඹු හා අනත්දරු අරමුදල, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල සහ මහ බැංකු අර්ථසාධක අරමුදල යටතේ අදාළ ගෙවීම් කටයුතු සහ ඊට අදාළ ලිපිලේඛන කටයුතු ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ගෙන යන ලදී.

**(ඇ) නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම අනෙකුත් පොදු පරිපාලන කටයුතු සිදු කිරීම:**

ලේකම් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තයන්ගේ විදේශ සංචාර සඳහා පෞද්ගලික හා රාජකාරී නිවාඩු අනුමැති 432 ක් ලබා දෙන ලදී. මහ බැංකු සේවා නියුක්තයන්ගේ වෘත්තීය සංගම් හා වෙනත් සමිති සංවිධානවලට සපයනු ලබන සේවාවලට අදාළ ලිපිලේඛන කටයුතු සිදු කළ අතර නිවාඩු රීති සහ වෙනත් පරිපාලන රීති සම්බන්ධයෙන් කරන ඉල්ලීම් සඳහා වඩා විධිමත් ප්‍රතිචාර ලබා දීමට පියවර ගන්නා ලදී.

**(ඈ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු, විදේශ පුහුණු හා විදේශ සංචාර සම්බන්ධයෙන් වන ගෙවීම් කටයුතු සිදු කිරීම:**

සේවා නියුක්තයන් 43 දෙනෙකුගේ පශ්චාත් උපාධි කටයුතු සඳහා සහ සේවා නියුක්තයන්ගේ කෙටි කාලීන විදේශ පුහුණු සංචාර 430 ක් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කරනු ලැබූ අතර 2015 වර්ෂයේ දී පිළිගත් වෘත්තීය ආයතනවලට සේවා නියුක්තයන් විසින් සාමාජික ගාස්තු වශයෙන් කරන ලද ගෙවීම් 177 ක් ප්‍රතිපූරණය කරන ලදී.

**(ඉ) අභාවිත සහ යල්පිනූ භාණ්ඩ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල කටයුතු, උත්සව සංවිධානය කිරීම සහ තැපැල් කාමර සේවාව:**

2015 වර්ෂය තුළ දී අභාවිත සහ යල්පිනූ කාර්යාලයීය උපකරණ ඉවත් කිරීම උදෙසා මහ බැංකු අත්පොතෙහි දැක්වෙන ක්‍රමවේදයට අනුකූලව මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී සමීක්ෂණ මණ්ඩලයක කටයුතු සම්පූර්ණ කරන ලදී. 2015 වර්ෂය තුල දී දෙපාර්තමේන්තුව විසින් අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවය හා ඊට සමගාමීව දීර්ඝ සේවා තිලිණ ප්‍රදාන උත්සවය, 1996 බෝම්බයෙන් විපතට පත් වූවන් සැමරීමේ වැඩසටහන සහ ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමේ 65 වැනි සංවත්සරික දේශනය ඇතුළු විවිධ සැමරුම් උත්සව සම්බන්ධීකරණය සහ සංවිධානය කරනු ලැබීය. ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් කාමර සේවාව මගින් 2015 වර්ෂයේ දී දේශීය සහ විදේශීය වශයෙන් ලිපි 98,777 ක් ද, කුරියර් සේවා ලිපි 13,103 ක් ද යැවීම සඳහා පහසුකම් සලසන ලදී.

## 26. ආරක්ෂක සේවා

අදාළ වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කරමින් එහි සේවකයන්හට, ගොඩනැගිලිවලට, අනෙකුත් දේපලවලට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂාව සපයන ලදී. මහ බැංකු ආරක්ෂක සේවාව ශක්තිමත් කිරීම මූලික වශයෙන් ආරක්ෂක පද්ධති වැඩිදියුණු කිරීම සහ පුහුණුවීම් වශයෙන් අංශ දෙකකින් සමන්විත විය.

### 26.1 ආරක්ෂක පද්ධති වැඩිදියුණු කිරීම

**අ. කේන්ද්‍රගත ඒකාබද්ධ ප්‍රවේශ පාලන පද්ධතිය**

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව 2015 වර්ෂය තුළ දී නවීනතම කේන්ද්‍රගත ඒකාබද්ධ ප්‍රවේශ පාලන පද්ධතියක් සවිකිරීමේ වැඩ කටයුතු අවසන් කිරීමට හැකි විය.

**ආ. ගිනි අනතුරු මැඩපැවැත්වීමේ පද්ධතිය**

ගිනි ආරක්ෂණ පද්ධතියක් නව රථගාලෙහි ස්ථාපිත කිරීමේ කටයුතු මෙම වර්ෂය තුළ දී නිමකරන ලදී. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ පැවති යල්පැනගිය ගිනි ආරක්ෂණ පද්ධතිය වෙනුවට නව ගිනි සංඥා පද්ධතියක් ස්ථාපිත කරන ලදී.

2015 වර්ෂය තුළ දී රාජගිරිය බැංකු විදු පියසේ පිහිටි දත්ත උපස්ථ මධ්‍යස්ථානය සඳහා ගිනි මැඩපැවැත්වීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී. මීට අමතරව මහ බැංකු මූලස්ථානයේ හා අනෙකුත් සියලු පිටස්තර පරිශ්‍ර තුළ ස්ථාපිත කර තිබූ සියලු ගිනි නිවීමේ උපකරණ විධිමත් පදනමක් මත පරීක්ෂාකර, අවශ්‍ය අලුත්වැඩියා සිදුකර ප්‍රතිස්ථාපනය කරන ලදී.

**ඈ. සී.සී.ටී.වී.නිරීක්ෂණ පද්ධතිය**

වර්ෂය තුළ දී රාජගිරියේ පිහිටි නව දත්ත උපස්ථ මධ්‍යස්ථානය, ප්‍රධාන කාර්යාලයේ නව රථගාල, ප්‍රාදේශීය කාර්යාල සහ නිවාඩු නිකේතන සඳහා සී.සී.ටී.වී. නිරීක්ෂණ පද්ධතීන් ස්ථාපිත කිරීමට මූලික කටයුතු ආරම්භ කරන ලදී.

**ඈ. හදිසි අවස්ථාවන්හිදී රාජකාරී අඛණ්ඩව පවත්වා ගෙන යැමේ සැලැස්ම**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ හදිසි අවස්ථාවන්හිදී රාජකාරී අඛණ්ඩව පවත්වා ගෙන යාමේ පුහුණු කටයුතු සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සක්‍රියව සහභාගි වන ලදී.

**ඉ. ආරක්ෂක පද්ධතිය ඇගයීම**

මහ බැංකුවේ ඉල්ලීම පරිදි ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරන ලද විශේෂ කණ්ඩායමක් දැනට පවතින ආරක්ෂක පද්ධතිය පිළිබඳ ඇගයීමක් කර අදාළ නවීන තාක්ෂණය සහිත නව පද්ධතියක් නිර්දේශ කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

### 26.2 පුහුණුවීම්

**අ. ගිනි අනතුරු වැළැක්වීම, ගිනි නිවීම සහ ප්‍රථමාධාර වැඩසටහන්**

මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද ගිනි අනතුරු ආරක්ෂණ නිලධාරීන් 70 දෙනෙකු සඳහා කොළඹ ගිනි නිවීමේ ඒකකය, ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ගිනි වැළැක්වීම, ගිනි නිවීම, ප්‍රථමාධාර සහ ආපදා කළමනාකරණය පිළිබඳව දින දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ කොළඹ ගිනි නිවීමේ ඒකකය සමඟින් ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සමස්ත සේවා නියුක්තිකයන් උදෙසා ගිනි නිවීමේ සහ ගිනි අනතුරු සරඹ පෙරහුරුවක් ද පවත්වන ලදී. ගිනිනිවීම පිළිබඳ ක්ෂේත්‍රයෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කරනු පිණිස තෝරා ගන්නා ලද ආරක්ෂක නිලධාරීන් 03 දෙනෙකු මාලබේ (CINEC) සාගර විශ්වවිද්‍යාලයේ දී ගිනි නිවීමේ උසස් පාඨමාලාවකට සහභාගි කරවන ලදී.

**ආ. කුසලතාවයන් හා දක්ෂතාවයන් ඔප්නැංවීම**

ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතාවයන් සහ දක්ෂතාවයන් ඔප්නැංවීම සඳහා වැදගත් ස්ථානවල ආරක්ෂාව සැපයීම, ප්‍රභූ ආරක්ෂාව සැපයීම, ආරක්ෂක පරිවාර රාජකාරී සහ මහජන සම්බන්ධතාවය යන විෂයන් ඇතුළත් දින දෙකක නේවාසික වැඩමුළුවක් ජාතික වැවිලි කළමනාකාරිත්ව ආයතනයේ දී ආරක්ෂක නිලධාරීන් 30 දෙනෙකු සඳහා පවත්වන ලදී. ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතාවයන් වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් පිළියෙළ කරන ලදී. මෙම අධ්‍යාපන වැඩසටහන් ආරක්ෂක, තොරතුරු තාක්ෂණය, නාගරික කෘෂිකර්මාන්තය, ව්‍යවහාර මුදල්වල අඩංගු ආරක්ෂණ සලකුණු සහ නායකත්ව පුහුණුව ආදී අංග ආවරණය කරන ලදී. වර්ෂය තුළ දී දැනුම වැඩි කිරීමේ බලාපොරොත්තුවෙන් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු ආරක්ෂක සහ ආපදා කළමනාකරණය පිළිබඳ විදේශීය පුහුණු වැඩසටහන් පහකට සහභාගි කරවන ලදී.

**ඇ. පාලන මැදිරි කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණුව**

පාලන මැදිරි කාර්යයන්ට අදාළව කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වැඩිදියුණු කිරීම සඳහා තෝරා ගන්නා ලද ආරක්ෂක නිලධාරීන් 29 දෙනෙකුට ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදෙන ලදී.

**ඈ. අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුව**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගය ඇතිව සියලුම ආරක්ෂක නිලධාරීන් සඳහා අවි පරිහරණය සහ ජීව වෙඩි තැබීමේ පුහුණුවක් වර්ෂයේ අවසාන කාර්තුවේ දී ලබා දෙන ලදී.

## 27. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක.) සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රතිලාභීන් වෙත ලබා දීමට 2015 වසර තුළ දී ද පියවර ගන්නා ලදී. කාර්ය මණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ ණය ලබා දීම, සේවා දායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සහ ආපනශාලා පහසුකම් සැපයීම මෙම සේවාවන්වලට අයත් විය. 2015 වසර අවසාන වන විට සේවා නියුක්තයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,500 ක් පමණ විය.

2015 වසර තුළ දී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් සහ කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමයන් යටතේ වාහන ණය, පරිගණක ණය, වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 1,828 ක් ප්‍රදානය කරන ලදී. අයදුම්කරු විසින් අදාළ සියලුම ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් සඳහා නියමිත දින ගණන ඇතුළත ණය නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දෙනු ලැබූ ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් කාර්යක්ෂමව සේවා නියුක්තයන්ට ණය ලබා දීම අධීක්ෂණය කිරීමට හැකි විය.

මහ බැංකු ආපන ශාලාව මගින් බැංකු කාර්ය මණ්ඩලයට ආහාර සැපයීමේ කාර්යය තවදුරටත් කාර්යක්ෂම කිරීමට

පියවර ගන්නා ලදී. තවද, දියර කිරි සහ ඔසුපැන් සඳහා ඇති ඉල්ලුම සලකා බැලීම සඳහා පවත්වන ලද සමීක්ෂණයෙන් ලද ප්‍රතිඵල මත දෙපාර්තමේන්තුව මගින් උදෑසන සහ සවස තේ/ඔසුපැන් ලබාදීමට අමතරව දියර කිරි ද සපයනු ලැබීය. ඉදිරි 2016 වසර තුළ දී ආපනශාලා පහසුකම් මෙන්ම ආපනශාලා තුළ පරිසරය තවත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියලු මූලික විධිවිධාන සකස් කරන ලදී.

සියලුම ලියාපදිංචි ප්‍රතිලාභීන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව 2015 වර්ෂයේ දී ප්‍රතිපූරණය කරන ලද මුළු වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට 2 කින් ඉහළ ගොස් ඇත. මුදල් මණ්ඩලයේ අනුමැතිය මත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ හිමිකම් සීමාවන් 2016.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. වෛද්‍ය සායනය මගින් සපයනු ලබන වෛද්‍ය පහසුකම්, පිළිගත් පෞද්ගලික ආරෝග්‍යශාලාවක් මගින් තවදුරටත් මහ බැංකු සේවා නියුක්තයන් වෙත කාර්යාල වේලාවන් තුළ දී සපයන ලදී. තවද, සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කිරීමට ද පියවර ගන්නා ලදී. සෞඛ්‍ය සේවාවන් සම්බන්ධව සේවා නියුක්තයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුනක් සලකා බලන වර්ෂය තුළ දී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී.

## 28. සංඛ්‍යාන

2015 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව තම ප්‍රධාන කාර්යයන් වන, කෙටිකාලීන ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය හා තක්සේරු කිරීම; මිල හා වැටුප් දර්ශක, ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) සකස් කිරීම; මුදල් ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ දී ඉවහල් වන අනාගත දත්ත එක්රැස් කිරීම සඳහා සමීක්ෂණ පැවැත්වීම; දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩ පිළිවෙළ තුළින් දත්ත එක්රැස් කිරීම හා අවශ්‍ය පරිදි දත්ත සම්පාදනය කිරීම; ප්‍රකාශන හා පුවත්පත් නිවේදන මගින් සංඛ්‍යාන දත්ත යාවත්කාලීනව නිකුත් කිරීම සහ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් දර්ශක අතර ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පවත්වා ගැනීමට දායක වීම යනාදිය තවදුරටත් කරගෙන යන ලදී. තවද ආර්ථික පර්යේෂණ සඳහා ඉවහල්වන පොදු දත්ත ගබඩාවක් සකස් කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීමත්, දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සමග එක්ව ශක්‍යතාවයන් සංවර්ධනය කිරීමේ කර්තව්‍යයන් සඳහා දායක වීමත් සිදුකරන ලදී.

### 28.1 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය කිරීම

ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ඉලක්ක සපුරා ගැනීම පහසු කිරීම සඳහා, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික මිල උද්ධමනය හා ආර්ථික වර්ධනය කෙටිකාලීනව පුරෝකථනය කෙරේ. රටෙහි මුදල් ප්‍රතිපත්ති සැකසීමේ කටයුතු සඳහා මෙම ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. තවද, දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සමීක්ෂණවලින් පිළිබිඹු වන පරිදි යෙදවුම් හා නිමැවුම් මිල ගණන්හි සිදුවන මිල වර්ධනයන් සමගින්, නිෂ්පාදන හා පාරිභෝගික මිල විචලනයන් පදනම් කරගෙන උද්ධමනය කෙරෙහි බලපාන විචල්‍යයන්හි සිදුවූ හා සිදුවිය හැකි වෙනස්කම් අනුව යමින් උද්ධමන පුරෝකථනයන් නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබේ.

පුරෝකථන කාලරාමුව මත පදනම්ව, උද්ධමන පුරෝකථන ක්‍රම ගණනාවක් භාවිතා කෙරේ. කෙටිකාලීන උද්ධමන පුරෝකථනයන් සඳහා ප්‍රධාන වශයෙන්, මෑතකාලීන මිල ප්‍රවණතා සහ වෙළඳපොළ වර්ධනයන් හා බැඳුණු, කෙටිකාලීනව අපේක්ෂිත මිල විචලනයන් පදනම් කර ගැනේ. මැදි හා දිගුකාලීන පුරෝකථන සඳහා ආර්ථිකමිතික ක්‍රමවේදයන් පදනම් කර ගැනෙන අතර, උද්ධමනය කෙරෙහි ඉල්ලුම් හා සැපයුම් යන අංශවලින් ඇති බලපෑම පිළිබිඹු කරන නව විචල්‍යයන් පිළිබඳ නිරතුරුව අධ්‍යයනය කරනු ලැබේ.

මේ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 නොවැම්බර් මාසයේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) නමින් නව පාරිභෝගික මිල දර්ශකයක් නිකුත් කරන ලදී. ජා.පා.මි.ද. මගින් මිල ගණන්හි ප්‍රවණතා රැස්කිරීමේ ආවරණ කලාපය, සමස්ත දිවයිනම ඇතුළත් වන පරිදි වර්ධනය කෙරේ. කො.පා.මි.ද. මගින් ආවරණය වූයේ කොළඹ නාගරික ප්‍රදේශයන්හි මිල විචලනයන් පමණි. ප්‍රතිපත්ති සැකසුම් අවශ්‍යතා සඳහා ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. දෙකෙහිම මිල ප්‍රවණතාවයන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් නිරීක්ෂණය කරනු ලැබේ.

ආර්ථිකයේ ආංශික සංයුතිය ද ඇතුළත් වන පරිදි එක් එක් උප ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිතා කරමින් දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) වාර්ෂිකව හා කාර්තුමය වශයෙන් පුරෝකථනය කරනු ලැබේ. මූර්ත අංශයේ ආර්ථික දර්ශක පදනම් කරගත් පුරෝකථන සඳහා ආර්ථිකයේ උප ක්‍රියාකාරකම්වලට අදාළ ආර්ථික දර්ශකයන් ද ආකෘතීන් මත පදනම් වූ පුරෝකථන සඳහා සංඛ්‍යානමය ක්‍රමවේදයන් ද පුරෝකථනයන්හි නිරවද්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ. තවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය පදනම්ව ජාතික ගිණුම් සම්පාදනය කිරීමත් සමග හඳුන්වාදෙන ලද ආර්ථික ක්‍රියාවන්ගේ වර්ගීකරණයට අනුකූලව සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ආර්ථික දර්ශක පදනම් කරගත් පුරෝකථන ක්‍රියාවලිය ද යාවත්කාලීන කරන ලදී.

### 28.2 මිල හා වැටුප් දර්ශක ගණනය කිරීම

පළාත් නවය සඳහා වන පළාත් පාරිභෝගික මිල දර්ශක සහ සමස්ත දිවයිනම ආවරණය කරනු ලබන සංයුක්ත පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් මාසිකව සිදු කරන ලදී. පළාත් මට්ටමින් මිල විචලනයන් සන්සන්දනය කිරීම සඳහා, පළාත් පාරිභෝගික මිල දර්ශකයන් ගණනය කිරීමේ දී දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ මගින් රැස්කරනු ලබන මිල දත්ත භාවිතා කෙරෙන අතර ඊට අමතර වූ බාහිර මූලාශ්‍ර කිහිපයක් ද භාවිතයට ගැනේ.

ප්‍රාථමික වෙළඳපොළ මට්ටමේ, නිෂ්පාදක හා තොග මිල ගණන්හි විචලනයන් මැනීම සඳහා තොග මිල දර්ශකය (තො.මි.ද.) මාසිකව ගණනය කරනු ලැබේ. තො.මි.ද. සඳහා දත්ත, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ මගින් සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙතින් ලබාගැනේ.

මිල දර්ශකවලට අමතරව, ආර්ථිකයේ වැටුප් හා වේතන විචලනයන් මැනීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වැටුප් ප්‍රමාණ දර්ශකයන්ද ගණනය කරනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලබන අතර, විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලැබේ. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ මගින් රැස්කරනු ලබන දත්ත පදනම් කරගෙන සකසනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක මගින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලනයන් විශ්ලේෂණය කරනු ලැබේ.

පසුගිය වසර කිහිපය පුරාම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් කොළඹ දිස්ත්‍රික්කය සඳහා වන ඉඩම් මිල දර්ශකය සැදීම සිදු කළ අතර ඒ සඳහා අවශ්‍ය වන ඉඩම් මිල දත්ත, තක්සේරු දෙපාර්තමේන්තුව හරහා ලබා ගැනීම සිදු කෙරෙයි. මෙහිදී නේවාසික, වාණිජ හා කාර්මික ලෙස අංශ තුනක් යටතේ කොළඹ, දෙහිවල, හෝමාගම, කඩුවෙල සහ කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහ යටතේ වූ උප කොට්ඨාශ 50 කින් පමණ මිල දත්ත රැස්කිරීම සිදු කරනු ලබයි. මෙහිදී සමජාතීත්වය පවත්වාගෙන යාම පිණිස නේවාසික, වාණිජ හා කාර්මික යන අංශ තුනට වෙන වෙනම දර්ශක සම්පාදනය කරන අතර එම දර්ශක තුනෙහි සරල සාමාන්‍යය සමස්ත ඉඩම් මිල දර්ශකය ලෙස ගණනය කරනු ලැබේ. ඉඩම් මිල දර්ශකය අර්ධ වාර්ෂිකව සම්පාදනය කෙරේ.

## 28.3 ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීම

සමස්ත ශ්‍රී ලංකාවේ සහ එහි එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා 2008 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, සමස්ත දිවයිනෙහි සහ එක් එක් පළාත්වල ආර්ථික හා සමාජීය සංවර්ධනයන් පිළිබිඹු කරන බහුමාන දර්ශකයක් වන අතර, මෙම දර්ශකය ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහ පැවැත්ම සහ සමාජීය ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශක තුනෙන් සංයුක්ත වේ. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ගණනය කරනු ලබන අතර, අවසන් වරට ගණනය කර ඇත්තේ 2014 වර්ෂය සඳහාය. එසේම දෙපාර්තමේන්තුව මගින් මේ සඳහා අදාළ කරගනු ලබන විචල්‍යයන් වැඩි දියුණු කිරීම පිළිබඳව නිරන්තර විමසිල්ලෙන් පසුවන අතර දර්ශකය මගින් රටෙහි සමස්ත සෞභාග්‍යයේ නිරූපණතාවය වැඩි කිරීමට අවශ්‍ය වන ක්‍රමවේදී සංශෝධන සිදු කරනු ලබයි.

## 28.4 පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම

2015 වර්ෂයේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් දළ දේශීය නිෂ්පාදිතය සම්පාදනය කිරීමේ පදනම් වර්ෂය 2002 සිට 2010 ලෙස සංශෝධනය කර ඇත. ඒ අනුව ජාතික ගිණුම් ගණනය කිරීමේ ක්‍රමවේදාත්මක වෙනස්කම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. එම නව ක්‍රමවේදයට අනුගතව ගණනය කරන ලද ද.දේ.නි. අගයන් පළාත් මට්ටමින් සකස්කරගත් දර්ශක පදනම් කොටගෙන පළාත් මට්ටමට බෙදා හැරීමෙන් පළාත් දළ දේශීය නිෂ්පාදිත 2014 (පවත්නා වෙළඳපොළ මිල අනුව) ගණනය කරන ලදී. එලෙස නව දත්ත මාලාව පාදක කොටගෙන සකස් කරන ලද 2014 ප.ද.දේ.නි. දත්ත සහ 2013 සංශෝධිත ප.ද.දේ.නි. දත්ත, 2015 ඔක්තෝබර් මස ප්‍රකාශයට පත් කරන ලදී.

## 28.5 සංඛ්‍යාන සමීක්ෂණ

වර්තමාන ආර්ථික තත්ත්වයන් හඳුනාගැනීමට සහ ඉදිරි ප්‍රවණතා පුරෝකථනය සඳහා ඉවහල් වන කෙටිකාලීන වෙළඳපොළ ප්‍රවණතා සහ ඉදිරි ව්‍යාපාරික වාතාවරණය කලින් හඳුනාගැනීම සඳහා 2014 වසරේ දී ආරම්භ කරන ලද ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය 2015 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳව පූර්ව දැනුම් දීමේ දර්ශකයක් ලෙස ද ක්‍රියාකරනු ඇත. ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් (කෘෂිකාර්මික, කාර්මික හා සේවා) නියෝජනය කරන මහා පරිමාණ ව්‍යාපාර ඒකක මෙම සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය. ද.දේ.නි. ට ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් දක්වන දායකත්වය පදනම් කර ගනිමින් විනිශ්චයාත්මක නියැදිකරණය මගින් සමීක්ෂණයේ නියැදිය තෝරාගන්නා ලදී. වසර තුළ දී සමීක්ෂණය අඛණ්ඩව සිව් වරක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිඵල මත පදනම්ව ව්‍යාපාර තත්ත්වය, ලාභදායීත්වය, පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතාවය, විකුණුම්, ඉල්ලුම හා ධාරිතා උපයෝජ්‍යතාවය යන ව්‍යාපාර මත පිළිබඳ වූ දර්ශක ගණනය කරන ලදී. අදාළ සමීක්ෂණ ප්‍රතිඵල කාර්තුමය පදනමින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලද අතර විස්තරාත්මක වාර්තාවක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී. තවද, සාමාන්‍ය මහජනතාවගේ දැනුම්වත් වීම පිණිස සාරාංශගත ප්‍රතිඵල කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

ණය වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම පිළිබඳ ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණෙන් 2014 වසරේ දෙවන භාගය තුළ දී ආරම්භ කරන ලද ණය තත්ත්වය පිළිබඳ අර්ධ වාර්ෂික සමීක්ෂණය 2015 වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ ප්‍රවණතා හඳුනා ගැනීමට ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය ද ණය සැපයුම පිළිබඳ ප්‍රවණතා හඳුනාගැනීමට ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය ද වශයෙන් මෙම සමීක්ෂණය කොටස් දෙකකින් සමන්විත වේ. රටෙහි සියලුම බැංකු වලට අදාළව ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සැලසුම් කර ඇති අතර ආර්ථිකයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක, ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ නියැදි රාමුව සේවක භාරකාර අරමුදල මගින් ලබාගත් ආයතන

ලැයිස්තුවක් අනුව සකසන ලද අතර, නියැදි රාමුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක ලෙස වෙන් කිරීමෙන් අනතුරුව සසම්භාවී ස්තෘත නියැදියක් තෝරා ගන්නා ලදී. තවද, ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය 2015 වසරේ පළමු භාගයේ සිට බස්නාහිර පළාතට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන පළාත් වලට ද ව්‍යාප්ත කරන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල අර්ධ වාර්ෂික පදනමින් අභ්‍යන්තරිකව සිදුකරන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

තවත් වැදගත් සමීක්ෂණයක් වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, නිෂ්පාදන හා සේවා කටයුතුවලට අදාළව 2015 වසරේ මැයි මස සිට මාසිකව ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී වෘත්තීය ගැනුම්කරුවන්, ව්‍යාපාර පිළිබඳව තීරණ ගන්නන් හා ආර්ථික විශ්ලේෂකයන්ට කර්මාන්ත තත්ත්වයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වන නිරවද්‍ය හා කාලීන දත්ත ලබාදීම අරමුණු කරන ලදී. මෙම සමීක්ෂණයේ නිෂ්පාදන කටයුතුවලට අදාළව ඉලක්කගත සංගහනය ලෙස බස්නාහිර පළාතේ ස්ථානගත වී ඇති නිෂ්පාදන කර්මාන්තයන්හි ගැනුම් කළමනාකරුවන් තෝරා ගන්නා ලදී. මෙහි නියැදි ඒකක තෝරා ගැනීම සඳහා වූ නියැදි රාමුව සකස් කිරීමට අවශ්‍ය ආයතන ලැයිස්තුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද අතර සරල සසම්භාවී නියැදිකරණ ක්‍රමය මගින් බස්නාහිර පළාතේ විශාල නිෂ්පාදන සමාගම් 100 ක නියැදියක් මෙම නියැදි රාමුවෙන් තෝරා ගන්නා ලදී. තවද, සමීක්ෂණයේ සේවා කටයුතු සඳහා ආයතන 100 ක නියැදියක් විනිශ්චයාත්මක නියැදිකරණය මගින් තෝරා ගන්නා ලදී. සෑම මසකම අවසාන සතිය තුළ දී මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි. සමීක්ෂණයේ නිෂ්පාදන කර්මාන්ත කටයුතු සඳහා උප දර්ශක ලෙස නව ඇණවුම්, නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සහ ගැනුම් තොග ද; සේවා කටයුතු සඳහා උප දර්ශක ලෙස නව ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධ ඉදිරි අපේක්ෂාවන් ද ඇතුළත් වන පරිදි පෙර මාසයට සාපේක්ෂව සලකා බලන මාසයේ දර්ශකයන් ගණනය කරනු ලැබූ අතර අදාළ ප්‍රතිඵල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියට ආයක කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට වාර්තා කරන ලදී.

2014 වසරේ දී දක්නට ලැබුණ පොලී අනුපාතිකයන්ගේ අඩුවීම් සහ රන් මිල උච්ඡාවචනයන්, බලපත්‍රලාභී බැංකු, මූල්‍ය සමාගම් හා කල්බදු සමාගම් හැර අනෙකුත් උකස්කරුවන්ගේ ව්‍යාපාර සඳහා කළ බලපෑම ගවේෂණය කිරීමේ අරමුණ ඇතිව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් උකස්කරුවන්ගේ සමීක්ෂණය - 2014, තැපැල් සමීක්ෂණයක් ලෙස ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. මෙම සමීක්ෂණයේ මූලික වැඩ කටයුතු 2014 වසරේ දී සිදු කරන ලද අතර, දත්ත රැස්කිරීම, විශ්ලේෂණය සහ වාර්තා ලිවීම 2015 වසර තුළ දී නිම කරන ලදී. මෙම සමීක්ෂණයේ සොයාගැනීම් 2015 දී කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

2006 වසරේ දී ආරම්භ කරන ලද උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මාසිකව පවත්වන ලදී. මෙම සමීක්ෂණය මගින් මූල්‍ය ආයතන, රාජ්‍ය අංශයේ ආයතන හා පාසල් ආවරණය වන පරිදි 200 ක් පමණ පිරිසකගේ ප්‍රතිචාර ලබා ගැනේ. විද්‍යුත් තැපෑල හා සම්මුඛ පරීක්ෂණ හරහා මෙම තොරතුරු රැස්කිරීම සිදු කෙරේ. ප්‍රතිචාර දක්වන්නන් විසින් වර්තමාන උද්ධමන තත්ත්වය මෙන්ම ඉදිරි මාස 12 ක කාලය තුළ දී අපේක්ෂිත උද්ධමනය පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයනු ලැබේ. අදාළ මාසයේ සමීක්ෂණයේ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

රටෙහි රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි ප්‍රවණතාවන් නිර්ණය කිරීම සඳහා, රාජ්‍ය අංශයේ සියලුම ආයතන ආවරණය කරමින් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය (Annual Public Sector Employment Survey - APSES) පවත්වන ලදී. සේවා නියුක්තිකයින් 1000 හෝ ඊට වැඩි සියලුම මධ්‍යම රජයේ ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන ආවරණය කරමින් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ කාර්තුමය සමීක්ෂණය (Quarterly Public Sector Employment Survey - QPSES) පවත්වන ලදී. දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීමේ දී රාජ්‍ය සේවා උප අංශය මගින් එකතු කළ අගය ඇස්තමේන්තු කිරීම සඳහා QPSES සමීක්ෂණයෙන් ලබාගන්නා තොරතුරු දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබයි. සමීක්ෂණයේ තොරතුරු පදනම් කරගෙන වාර්ෂික හා කාර්තුමය විශ්ලේෂණ වාර්තා සකසන ලදී. තවද, ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළඳපොළ පිළිබඳව එක්රැස් කළ තොරතුරු රටෙහි සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායිතාව යන කාණ්ඩ යටතේ විශ්ලේෂණය කරන ලදී.

ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයන් සහ ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන්ගේ මූල්‍ය සාක්ෂරතාවය හා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ලෙස 2015 වසරේ දී ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණයක් දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන් මෙහි දී සමීක්ෂණ ජනගහණය ලෙස තෝරාගත් අතර සමීක්ෂණ නියැදිය දිස්ත්‍රික්ක 15 කින් සමානව තෝරාගත් 1500 ක ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන්ගෙන් සමන්විත විය. ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයන්ගේ සංගමයේ සාමාජික ආයතන සහ බැංකු නොවන මූල්‍යායතනවල සේවය ලබාගත් ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන් මෙහි දී තෝරාගත් නියැදියට ඇතුළත් විය. මෙම සමීක්ෂණයේ වැඩිදුර තොරතුරු හා සොයාගැනීම් මෙම වාර්ෂික වාර්තාවේ පළමු කොටසට අදාළ විශේෂ සටහනෙහි දක්වා ඇත.

### 28.6 දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ

1978 සිට, ක්‍රියාත්මක වෙමින් පවතින දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ දත්ත සමීක්ෂකයන් ලෙස ක්‍රියාකරන දිවයින පුරා විහිදුණ පාසල් ගුරුවරුන්ගෙන් සමන්විත ජාලයක් හරහා ක්‍රියාත්මක වෙයි. මෙම දත්ත

සමීක්ෂකයන් විසින් රටෙහි විවිධ ප්‍රදේශවල පැතිරුණු වෙළඳ මධ්‍යස්ථාන 106 ක් ආවරණය කරයි. මෙම ක්‍රියාවලිය යටතේ පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල හා මත්ස්‍ය නිෂ්පාදනවල නිෂ්පාදක මිල ගණන්, අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් සහ කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනවල අපේක්ෂිත අනාගත නිෂ්පාදන මට්ටම් සතිපතා, මාසපතා හා කාර්තුමය වශයෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලබයි. මෙම ජාලයට අමතරව පිටකොටුව මැනිං වෙළඳපොළ, මරදගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පැලියගොඩ මාළු වෙළඳපොළ යන ස්ථානවලින් තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව හා සතිපතා රැස්කිරීම සඳහා ගුරුවරුන් නොවන සමීක්ෂකවරුන් කිහිප දෙනෙකුගේ සේවය ද මෙම දීපව්‍යාප්ත වැඩපිළිවෙළ සඳහා ලබා ගැනේ. මෙම වැඩපිළිවෙළ යටතේ එක්රැස් කරනු ලබන දත්ත, මිල දර්ශක සම්පාදනය කිරීම, මිල විචලනයන් පුරෝකථනය කිරීම, ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් මගින් මිල මත ඇති කරන බලපෑම ඇගයීම, ජාතික ආදායම හා වියදම ඇස්තමේන්තු කිරීම සහ මිල හා වැටුප් දත්ත පොදු මහජනතාව වෙත සැපයීම වැනි විවිධ අරමුණු සඳහා යොදාගනු ලබයි. කළමනාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීමේ අරමුණින් 2015 වසරේ දී දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් වෙළඳපොළවල් කිහිපයකින් ආහාර ද්‍රව්‍ය පරාසයක තොග සහ සිල්ලර මිල දෛනිකව එකතු කිරීම ආරම්භ කරන ලදී.

දත්ත සමීක්ෂකවරුන් විසින් වාර්තා කරනු ලබන දත්තවල නිරවද්‍ය බව හා කාලීන බව ආරක්ෂා කිරීම සඳහා ස්ථානීය පරීක්ෂණ සහ එම දත්ත අඛණ්ඩව අධීක්ෂණය සිදු කරන ලද අතර "පෙර විමසුම් වැඩසටහන" සඳහා යොදාගනු ලබන දත්ත ආකෘතීන් ද සංශෝධනය කරන ලදී. මීට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද වෙළඳපොළවලින් සෘජුවම රැස්කරනු ලබන මිල ගණන් සමග සැසඳීම මගින් මෙම දත්තවල නිරවද්‍යතාව තවදුරටත් තහවුරු කරගනු ලබයි. දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම උදෙසා දත්ත සමීක්ෂකයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර ඉතා වැදගත් වන බැවින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදුන් අත්දැකීම් බෙදාහදා ගැනීමටත් ඒ හා සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීමටත් කොළඹ, අනුරාධපුර, මහනුවර, මාතර හා යාපනය යන ප්‍රදේශවල ප්‍රාදේශීය සම්මන්ත්‍රණ පහක් මෙම වසර තුළ දී පවත්වන ලදී. එසේම දත්ත සමීක්ෂකයන්ගේ ධාරිතාව ඉහළ නැංවීම ද මෙම සම්මන්ත්‍රණ මාලාවේ එක් අරමුණක් විය.

## 28.7 ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ දර්ශක අතර ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පවත්වා ගැනීම.

### "ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව" පිළිබඳව වන ශ්‍රේණිගත කිරීම ("Ease of Doing Business" Ranking)

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් "ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව" පිළිබඳව වන ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පිහිටුවීම සඳහා දායකත්වයක් දක්වන තම ප්‍රයත්නයන් තවදුරටත් ඉටුකරන ලදී. ඒ අනුව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් සිදුවෙමින් පවතින ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමට අදාළ රජයේ ආයතන සමග නිරන්තර සංවාද පැවැත්වීම, නව හඳුන්වාදීම් පිළිබඳව දැනුම්වත් කිරීමට තොරතුරු සපයන්නන් සඳහා රැස්වීම් සංවිධානය කිරීම, ව්‍යාපාර පවත්වාගෙන යාම හා සම්බන්ධ අංශවල නියුතු රාජ්‍ය හා පෞද්ගලික නිලධාරීන් සමග සාකච්ඡා කිරීමට ලෝක බැංකු දූත මණ්ඩල සඳහා පහසුකම් සැලසීම, ශ්‍රේණිගත කිරීම තුළ ස්ථානය වැඩි දියුණු කර ගැනීම හා සම්බන්ධ වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලාංකික සහභාගිත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ඉතාම වැදගත් වශයෙන් මෙම ශ්‍රේණිගත කිරීම සඳහා සලකා බැලෙන ක්ෂේත්‍රවල සිදුවන සංශෝධන පිළිබඳ තොරතුරු නියමිත වේලාවට ලෝක බැංකුව වෙත ලබාදීම යනාදිය සිදු කරනු ලැබිණි. 2015 දී ප්‍රකාශයට පත්කරන ලද ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ නවතම වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව විසින් දේශීය ව්‍යවසායකයන්ට ව්‍යාපාර පවත්වාගෙන යාම පහසු කිරීමට "ව්‍යාපාරයක් ආරම්භ කිරීම" හා "ඉදිකිරීම් සම්බන්ධ බලපත්‍ර ලබාගැනීම" යන ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳව වන ශ්‍රේණියේ වූ උප-අංශ දෙක යටතේ ක්‍රියාමාර්ග ගෙන ඇති බව ලෝක බැංකුව මගින් ස්ථිර කොට ඇත. තවදුරටත්, මෙම ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක වීම නිසා රටෙහි ගිය වසරේ සන්සන්දනාත්මක ස්ථානය වන 113 සිට මෙම වසරේ දී 107 දක්වා වර්ධනය විය.

රජයේ වැඩසටහන් හා ප්‍රමුඛතාවලට අනුකූලව, ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමේ සමස්ත අරමුණ පෙරදැරිව ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා නව මෙහෙයුම් යාන්ත්‍රණයක් මෙම වසර අගභාගයේ දී ස්ථාපිත කරන ලදී. ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳව වන ශ්‍රේණිය තුළ රටෙහි ස්ථානය ඉහළ නැංවීමට ගන්නා උපායමාර්ගික ක්‍රියාමාර්ග මෙම යාන්ත්‍රණය යටතේ ගවේෂණය කරනු ලබන අතර සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මෙහි ප්‍රධාන පාර්ශ්වකරුවකු වේ.

### අනෙකුත් ගෝලීය ශ්‍රේණිගත කිරීම්

ගෝලීය දර්ශක වන ලෝකව්‍යාප්ත පාලන දර්ශක (Worldwide Governance Indicators), ගෝලීය තරඟකාරිත්ව දර්ශකය (Global Competitiveness Index), ආර්ථික ස්වාධීනතා දර්ශකය (Index of Economic Freedom), දූෂණ පිළිබඳ සංජානන දර්ශකය (Corruption Perceptions Index), මානව සංවර්ධන දර්ශකය (Human Development Index) සහ ලෝක ආර්ථික ස්වාධීන දර්ශකය (Economic Freedom of the World) අඛණ්ඩව නිරීක්ෂණය කරමින් මෙම දර්ශකයන්හි ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ස්ථානය පිළිබඳ තොරතුරු කළමනාකාරිත්වය වෙත දැනුම් දෙන ලදී. එසේම ඉහත සඳහන් දර්ශක සම්පාදනය කරනු ලබන ආයතන වෙත සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව ශ්‍රී ලංකාව පිළිබඳ සාර්ව ආර්ථික තොරතුරු සතිපතා මෙන්ම මාසිකව ද

අඛණ්ඩව සපයන ලදී. තවද, රාජ්‍ය සහයෝගය සහිත අපනයන ණය සඳහා ආර්ථික සහයෝගිතාවය හා සංවර්ධනය සඳහා වන සංවිධානයේ (Organization for Economic Co-operation and Development - OECD) හවුල්කාර රටවල්වල අවදානම් වර්ගීකරණය ඇගයීම ද සිදුකරන ලද අතර, පවත්නා ගැටලු නිරාකරණය කර ගැනීමට ද්විපාර්ශ්වීය සාකච්ඡා ක්‍රියාවලියක් යෝජනා කෙරේ.

### 28.8 සංඛ්‍යාන තොරතුරු බෙදාහැරීම

ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන්, වෘත්තිකයන්, ශිෂ්‍යයන් හා මහජනතාවට සමාජ ආර්ථික දත්තවල මෑත කාලීන විකාශනය පිළිබඳ තොරතුරු පුළුල් පරාසයකින් ලබාදීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. මෙම වසර තුළ දීත්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශනයන් ලෙස "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2015 - xxxvii වෙළුම" 2015 අප්‍රේල් මාසයේ දී, භාෂා ත්‍රිත්වයෙන්ම නොකඩවා සිව්වන වතාවට ප්‍රකාශයට පත් කළ අතර, "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2015 - xxxviii වෙළුම" 2015 ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2015" ප්‍රකාශනය සංයුක්ත තැටියක් ලෙසත් 2015 වසරේ දී ප්‍රකාශයට පත්කරන ලදී. ඊට අමතරව 2015 වසරේ දී සතිපතා හා මාස්පතා ආර්ථික දර්ශක ද ප්‍රකාශයට පත් කරන ලදී. තවද 2015 වසර තුළ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා යන ප්‍රකාශන සඳහා පරිච්ඡේද දෙකක් සම්පාදනය කරන ලද අතර, මාසික විවරණිකාව සඳහා ද ක්‍රමවත් දායකත්වයක් දක්වනු ලැබීය. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ දත්ත එහි අභ්‍යන්තර වෙබ් අඩවිය හරහා පරිශීලනය කළ හැකි ලෙස සැකසීමෙන් අනතුරුව, අභ්‍යන්තර දත්ත පරිශීලකයන් සඳහා තවදුරටත් ප්‍රයෝජනවත් වන ආකාරයෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල දත්ත ඇතුළත් කර ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී. ප්‍රතිපත්ති පර්යේෂණ කටයුතු සඳහා සහාය වීම මෙහි ප්‍රධාන අරමුණ වූ අතර අනෙකුත් දෙපාර්තමේන්තු ද මේ සඳහා සම්බන්ධ කරගනිමින් පවත්නා දත්ත ගබඩාව තව දුරටත් පුළුල් කර ගැනීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව දැනටමත් පියවර ගෙන ඇත.

## 29. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ

2015 සැප්තැම්බර් මස 25 දින පැවැත්වූ අංක 23/2015 දරන මුදල් මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයට අනුව, 2015 ඔක්තෝබර් මස 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටවන ලදී. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වන්නේ, ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පතේ VI සහ VII කොටස් මගින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් නියම කර ඇති වගකීම් ක්‍රියාත්මක කිරීම, යහපාලනය සුරක්ෂිත කිරීම සඳහා මුදල් මණ්ඩලය මගින් අනුමත කළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම, ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල විනිවිදභාවය හා ස්ථායීතාවය තහවුරු කිරීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙහි මූලික ගැටලු හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, අදාළ වගකිව යුතු පාර්ශව වෙත තොරතුරු සැපයීම, දිළිඳුකම පිටුදැකීමේ ජාතික උපායමාර්ගික සැලසුම්වලට උපකාරී වන ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීම, බිම් මට්ටමේ මූල්‍ය සාක්ෂරතාව හා මූල්‍ය අන්තර්ගතය පිළිබඳ දැනුම ඉහළ නැංවීම, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම, කාර්යක්ෂමව සම්පත් වෙන්කිරීම සහ කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා විධිමත් මූල්‍ය ආයතන සමඟ සම්බන්ධතා ඇති කිරීමයි.

### ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ වගකීම්

ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පත ප්‍රකාරව ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල නියැලීම පිණිස සුදුසුකම් ලත් සමාගම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලත් නියමයන් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීම සහ කලින් කල ස්ථානීය පරීක්ෂණයකට භාජනය කිරීම, මුදල් මණ්ඩලය වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල බලපත්‍ර අවලංගු කිරීම හෝ වසා දැමීම සහ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ප්‍රගතිය සහ ගැටලු පිළිබඳව මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීමයි.

පාර්ලිමේන්තුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය කෙටුම්පත සම්මත කිරීමෙන් පසු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ කිරීමට නියමිතයි. කෙසේ වුවද, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සඳහා ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ පිළියෙළ කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සඳහා රීතීන් හා නියාමනයන් පිළියෙළ කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සම්බන්ධ තොරතුරු රැස්කිරීම, දෙපාර්තමේන්තුවට අදාළ මෙහෙයුම් අත්පොත සකස් කිරීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්හි කාර්ය මණ්ඩලය සඳහා හැකියා වර්ධන වැඩසටහන් පැවැත්වීම යන මූලික කාර්යයන් දැනටමත් ආරම්භ කර ඇත.

# 30. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත වෙනුවට 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ප්‍රතිස්ථාපනය කිරීමත් සමඟ මුදල් ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 1988 වසරේ දී ස්ථාපනය කරන ලදී. මුදල් සමාගම් පනත අහෝසි කරමින් 2011.11.09 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිස්ථාපනය කරන ලද 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත මගින් වර්තමානයේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ කටයුතු පාලනය කරනු ලැබේ. 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත බලාත්මක වීමත් සමග කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය ද මෙම දෙපාර්තමේන්තුව යටතට පත් විය. පරීක්ෂණ හා අඛණ්ඩ සුපරීක්ෂණ මගින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම, නියාමන අනුමැතීන් ලබා දීම, විධානයන් සහ විචක්ෂණ අවශ්‍යතා නිකුත් කිරීම, අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර හා අනවසර තැන්පතු රැස් කිරීම් විමර්ශනය කිරීම, මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ මහජන පැමිණිලි සඳහා යොමු වීම, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ.

2015 වසර අවසානය වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 46 ක් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 70 ක් පැවතිණ. එම බලපත්‍රලාභී මුදල් සමාගම් හා ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනවල නම් මෙම කොටස අවසානයේ දක්වා ඇත. 2015 වර්ෂයේ දී නිකුත් කරන ලද නියාමන අවශ්‍යතා මෙම වාර්තාවේ තුන්වැනි කොටසෙහි දක්වා ඇත.

## 30.1 බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීමේ අරමුණ වනුයේ, අධීක්ෂණය කරනු ලබන ආයතනවල සුරක්ෂිතභාවය හා ශක්තිමත්භාවය (ක්ෂුද්‍ර-විචක්ෂණ අධීක්ෂණ) සහ සමස්ත බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් පද්ධතියේ ස්ථායීතාවය (සාර්ව-විචක්ෂණ අධීක්ෂණ) ප්‍රවර්ධනය කිරීමයි. පරීක්ෂණ, අඛණ්ඩ සුපරීක්ෂණ සහ අර්බුද නිරාකරණය යන අංගයන්ගෙන් අධීක්ෂණ ක්‍රියාවලිය සමන්විත වේ. 2015 වර්ෂය තුළ දී ආයතනවල කාර්යක්ෂමතාව සහ අඛණ්ඩ පැවැත්ම ඉලක්ක කර ගැනීම සඳහා අවදානම ඉලක්ක කරගත් අධීක්ෂණ ක්‍රමවේදයක් ප්‍රතිසැලසුම් කරන ලදී.

### (අ) පරීක්ෂණ

2015 වර්ෂය තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 34 ක පරීක්ෂණ සිදු කරන ලදී. ණය අලාභ සඳහා ප්‍රමාණවත් නොවන වෙන් කිරීම්, අභ්‍යන්තර පාලනයේ දුර්වලතා, ආයතනික යහපාලන විධානයට අනුකූල නොවීම්, සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු, සේවාවන් කිහිපයක් මත වන සංකේන්ද්‍රණ අවදානම් සහ ආයතනවල ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම මෙම පරීක්ෂණවල ප්‍රධාන සොයාගැනීම් විය. පරීක්ෂණ වාර්තා සහ මුදල් මණ්ඩලය අනුමත කරන ලද නිර්දේශ, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කාලසටහනක් පදනම් කරගත් ක්‍රියාකාරී සැලැස්මක් සහිතව අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත ඉදිරිපත් කර බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් එම දුර්වලතාවයන් එකඟ වූ කාල රාමුව තුළ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා නිරන්තරයෙන් පසු විපරම් සිදු කරන ලදී.

### (ආ) අඛණ්ඩ සුපරීක්ෂණ

i. සුපරීක්ෂණය සිදු කරනු ලබන්නේ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් කාලාවර්ථීතව ඉදිරිපත් කරනු ලබන වාර්තා පදනම් කර ගනිමින් සමාගම්වල මූල්‍ය ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීම මගින් සහ විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් හා පුවත්පත් වාර්තාවල ඇතුළත් වෙනත් මූල්‍ය තොරතුරු විමර්ශනය කිරීම මගිනි.

ii. අනතුරු කල්තියා හඳුනා ගැනීමේ සංරචක සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය මගින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, වෙන්කිරීම්, ආයතනික යහපාලනය සහ කළමනාකරණය මත ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීමට සුපරීක්ෂණය යොදා ගනු ලබයි. එම සොයා ගැනීම් අනුව, එකඟ වූ කාලරාමුව තුළ දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගැනීමට සමාගම් කටයුතු කළ යුතු වේ.

### (ඇ) අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග

2008 වර්ෂයේ ද්‍රවශීලතා අර්බුදය ඍණාත්මක ලෙස බලපෑ සමාගම් කිහිපයක් තවදුරටත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා හිඟයන්ට මුහුණපාන ලදී. සමාගමක් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙනස් කරන ලදී. මීට අමතරව, සමාගම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල, ජ්‍යෝෂ්ඨ කළමනාකාරිත්වය සහ බාහිර විගණකවරුන් සමඟ නිරන්තර රැස්වීම් පවත්වන ලදී. දුර්වල සමාගම් දෙකක් සඳහා ප්‍රාග්ධනය යෙදවීම සඳහා සුදුසු ආයෝජකයන් සමඟ මහබැංකුව සාකච්ඡා පවත්වන ලදී.

## 30.2 නියාමන අනුමැතීන් ලබාදීම

(අ) 2015 වර්ෂය තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, ණයකර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය

ඇමුණුම II-3

## නීති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන (2015 වර්ෂය අවසානයට)

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
4. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්
6. එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
   (පෙර ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්)
7. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
8. එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (පෙර ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී)
9. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
10. ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
11. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
12. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
13. කලම්බෝ ට්‍රස්ට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර කැපිටල් එලයන්ස් ෆිනෑන්ස් පීඑල්සී)
14. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
16. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
17. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
18. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
19. විලච් ෆිනෑන්ස් පීඑල්සී
20. ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්
21. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
22. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
23. ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්
24. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
25. බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
26. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී
27. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
28. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
29. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
30. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
31. යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
32. රිච්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්
33. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
34. සමිට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර ජෝර්ජ් ස්ටුවර්ට් ෆිනෑන්ස් පීඑල්සී)
35. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
   (පෙර දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්)
36. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
37. සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්
38. සියපත ෆිනෑන්ස් පීඑල්සී
39. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
40. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
41. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
42. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
43. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී*
44. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
45. සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්)
46. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද කළමනාකරණ නියෝජිතයෙකු විසින් කළමනාකරණය කෙරෙන අතර, ප්‍රතිව්‍යුහගත කෙරෙමින් පවතී. ඒ අතරතුර තැන්පතු රැස් කිරීම අත්හිටුවා ඇත.

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු
1. අමානා බෑන්ක් පීඑල්සී
2. එම්සීබී බෑන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී
6. නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී
7. පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී
8. මහජන බැංකුව
9. යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
10. ලංකා බැංකුව
11. සම්පත් බෑන්ක් පීඑල්සී
12. සෙලාන් බෑන්ක් පීඑල්සී
13. හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු
1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
2. සණස ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී
3. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ්
4. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
5. ශ්‍රී ලංකා සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ්

(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
3. එස්එම්බී ලීසිං පීඑල්සී
4. ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්
5. යුනිසන්ස් කැපිටල් ලීසිං ලිමිටඩ් (පෙර ලාෆ්ස් කැපිටල් ලිමිටඩ්)
6. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
7. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ්

(ඈ) සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම හැර ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්

ඉහළ නැංවීමට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීමට, නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට සහ නව ශාඛා 84 ක් විවෘත කිරීමට අනුමැතීන් ලබා දෙන ලදී. තවද, සමාගම් ඒකාබද්ධවීම් තුනක් 2015 වර්ෂය තුළ දී සම්පූර්ණ කරන ලදී. ඒවා නම්, බාට්ලීට් ෆිනෑන්ස් පීඑල්සී හා ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී ඒකාබද්ධ වීම, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් හා එම්බීඑස්එල් සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ් ඒකාබද්ධ වීම සහ ටීකේඑස් ෆිනෑන්ස් හා ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ් ඒකාබද්ධ වීමය.

(ආ) මීට අමතරව, කල්බදු මූල්‍යකරණ පනත යටතේ ආයතන 5 ක් එනම්; ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී, එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්, එම්බීඑස්එල් සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ්, බාට්ලීට් ෆිනෑන්ස් පීඑල්සී සහ ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත නිකුත් කර තිබූ බලපත්‍ර 2015 වර්ෂය තුළ දී අවලංගු කරන ලදී. මේවා සිදු වූයේ ප්‍රධාන වශයෙන්ම එම සමාගම්වල උපායමාර්ගික තීරණ හේතුවෙනි.

## 30.3 විධානයන් හා විචක්ෂණශීලී අවශ්‍යතා නිකුත් කිරීම

(අ) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම, වැසීම හා ස්ථානය වෙනස් කිරීම සම්බන්ධ විධානය: බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම, වැසීම හා ස්ථානය වෙනස් කිරීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගයන් ශක්තිමත් කිරීමට සහ දියුණු කිරීමට නව නියාමන රාමුවක් සැලසුම් කරන ලදී. මෙම විධානය 2016 වර්ෂයේ ජනවාරි මස නිකුත් කරන ලදී.

(ආ) මෝටර් වාහන සඳහා ලබා දෙන ණය සම්බන්ධයෙන් වන වටිනාකම් මත ණය අනුපාත විධානය: වාහන ණය සඳහා අධික ලෙස නිරාවරණය වීමෙන්/මූල්‍ය පද්ධතිය තුළ ඇති විය හැකි අවධානම අවම කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ලබා දෙන උපරිම ණය පහසුකම් ප්‍රමාණය වාහනවල වෙළඳපොළ වටිනාකමින් සියයට 70 ක් නොඉක්මවන ලෙස නියම කරමින් 2015 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි විධානයන් නිකුත් කරන ලදී.

## 30.4 අනවසරයෙන් පවත්වා ගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය

2015 වසර තුළ දී, මුදල් ව්‍යාපාර පනතේ 42 වගන්තිය යටතේ පුද්ගලයන්/ආයතන 11 ක් සම්බන්ධයෙන්, එම පුද්ගලයන්/ආයතන අවසර නොමැතිව මුදල් ව්‍යාපාර සහ මහජනයාගෙන් තැන්පතු භාර ගැනීමෙහි නිරත වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා පරීක්ෂණ සිදු කරන ලදී. එක් ආයතනයක් මුදල් ව්‍යාපාර පනත උල්ලංඝණය කර ඇති බවට තීරණය කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති කාර්යාලය වෙත යොමු කරන ලදී. තවද ආයතන 2 ක් අවසර නොලත් මුදල් ව්‍යාපාරවලට සම්බන්ධ වී නොමැති බව අනාවරණය වූ බැවින් එම ආයතනවල විමර්ශන කටයුතු අවසන් කරන ලදී. 2015 අවසානය වන විට, පරීක්ෂණ කටයුතු 15 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

## 30.5 මහජනයා දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ මහජන පැමිණිලි හැසිරවීම

බැංකු නොවන මූලය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව අනවසර මූල්‍ය ආයතනවල සහ ආයෝජන ක්‍රමවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 14 ක් සහ විද්‍යුත් මාධ්‍ය දැන්වීම් 18 ක් ප්‍රචාරය කරන ලදී. බලපත්‍රලාභී බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් ලැයිස්තු හා වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා 12,000 ක් පමණ මහජනයා අතර බෙදා දෙන ලදී. තවද, බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව, ප්‍රධාන වශයෙන් අසාධාරණ පාරිභෝගික සැලකීම් සහ ලබාගත් ණය සඳහා සහන ඉල්ලීම් සම්බන්ධව මහජනතාවගෙන් නැගෙන පැමිණිලි විසඳීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වන ලදී. එවැනි චෝදනා අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.

## 30.6 අසාර්ථක වූ මූලය ආයතන සම්බන්ධයෙන් ඇති නඩු කටයුතු සඳහා පහසුකම් සැපයීම

**(i)** ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය

- ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ සුරක්ෂිත තැන්පත්කරුවන් කිහිප දෙනෙකු විසින් ගොනු කරන ලද අංක SC.FR 191/2009 දරන නඩුවෙහි කටයුතු 2015.08.04 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවසන් කරන ලද අතර ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ සුරක්ෂිත තැන්පත්කරුවන්ගේ තැන්පතු ආපසු ගෙවීම සඳහා 2015.08.03 දින මහ බැංකුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි පියවර ගැනීමට මහ බැංකුවට නියෝග කරන ලදී.

- එම ක්‍රමවේදයට අනුව මහා භාණ්ඩාගාරය මගින් ලබා දුන් ණය මුදල් මගින් සුරක්ෂිත තැන්පත්කරුවන්ගේ ඉතිරි තැන්පතු ප්‍රමාණයෙන් සියයට 41 ක් අදියර 3 කින්; එනම් පළමු අදියර ලෙස රුපියල් මිලියන 2 ට වඩා අඩු ශේෂයන් සඳහා ද දෙවන අදියර ලෙස රුපියල් මිලියන 2 ත් රුපියල් මිලියන 10 ත් අතර ශේෂයන් සඳහා ද තෙවන අදියර ලෙස රුපියල් මිලියන 10 ට වඩා වැඩි ශේෂයන් සඳහා ද ගෙවීම් කළ යුතුය. ඒ අනුව, පළමු අදියරෙහි තැන්පතු ආපසු ගෙවීම සඳහා 2015.07.21 දින රුපියල් මිලියන 544.3 ක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් අතර 2015 ජූලි හා

අගෝස්තු මාසවල දී සුරක්ෂිත තැන්පත්කරුවන් 2,536 දෙනෙක් සඳහා ආපසු ගෙවීම් සිදු කරන ලදී.

- තවද, දෙවන අදියරෙහි තැන්පතු ආපසු ගෙවීම සඳහා 2015.12.14 දින රුපියල් මිලියන 3,945.6 ක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් අතර, අදාළ සුරක්ෂිත තැන්පත්කරුවන් වෙත ආපසු ගෙවීම් 2015 දෙසැම්බර් මස ආරම්භ කරන ලදී.

**(ii)** වෙනත් අනවසර මූල්‍ය ආයතන

ද ෆිනැන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනයන්හි තැන්පත්කරුවන් විසින් 2015.03.01 දින ඉදිරිපත් කරන ලද නඩුව අනුව එම සමාගම් 2 හි ස්වාධීන තැන්පත්කරුවන්ගේ සංගම්වලින් දෙදෙනෙකු බැගින් නියෝජනය වන පරිදි ද ෆිනැන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සාමාජිකයන් 4 දෙනෙකු පත් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කරන ලදී. මහ බැංකුව විසින් 2013.10.23 දින ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලසුම ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම සඳහා උසාවිය විසින් නව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තවදුරටත් නියෝග කරන ලදී. ඒ අනුව, එම අධ්‍යක්ෂ මණ්ඩලය තැන්පතු ආපසු ගෙවීම සඳහා වර්තමානයේ සැලසුම් සකස් කරමින් පවතී.

(iii) මීට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වර්ෂය තුළ දී නඩු 16 ක් සම්බන්ධ උසාවි කටයුතු සිදු කළ අතර, එයින් නඩු 2 ක් අවසන් කරන ලදී.

## 31. පුහුණු හා සංවර්ධන

බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි මතු වෙමින් පවතින නව අවශ්‍යතා සපුරාලීමට සහ ගෝලීය මූල්‍ය අංශයේ නවීන තාක්ෂණික සංවර්ධනයන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ වෘත්තීය නිපුනතාව ඉහළ නැංවීමට, බැංකුවේ පුහුණු කාර්යය ශක්තිමත් කිරීමේ අරමුණින් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලය විසින් 2015 ජූලි මස ස්ථාපිත කරන ලදී. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ බැංකුවේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා උපායමාර්ග සකස් කිරීම, වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බුද්ධිමය ශක්‍යතාව වර්ධනයට පහසුකම් සැපයීම, බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා විදේශීය/දේශීය කෙටි කාලීන පුහුණු අවස්ථා සලසා දීම සහ කාර්ය මණ්ඩලයේ දැනුම හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ. කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සමස්ත වෘත්තීය සංවර්ධනය සහතික කිරීමේ අරමුණින් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව බැංකුවේ පුහුණු කටයුතු මෙහෙයවනු ලබයි.

### කෙටි කාලීන පුහුණු අවස්ථා

2015 වර්ෂය තුළ දී මහ බැංකු කාර්ය මණ්ඩලයේ නිපුණතා ඉහළ නැංවීමේ අරමුණින් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව බැංකුවේ කාර්ය මණ්ඩලයට සුදුසු කෙටි කාලීන විදේශීය හා දේශීය පුහුණු අවස්ථාවන් 1508 ක් සපයන ලදී. යටකී පුහුණු අවශ්‍යතා 2014 වර්ෂයේ අවසානයේ දී සිදු කරන ලද වාර්ෂික නිපුණතා හඳුනා ගැනීමේ අභ්‍යාසය හරහා හඳුනා ගන්නා ලදී.

### කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා

පිළිගත් ජාත්‍යන්තර පුහුණු ආයතන සහ එංගලන්ත මහ බැංකුව, ජර්මන් මහ බැංකුව, ඉන්දියා මහ බැංකුව, මැලේසියානු මහ බැංකුව, ඇමෙරිකාවේ ෆෙඩරල් සංචිත බැංකුව යන ප්‍රධාන මහ බැංකු මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ අධ්‍යයන චාරිකා සඳහා 2015 දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා 309 ක් සපයන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, දකුණු හා නැගෙනහිර ආසියානු රටවල පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (SEACEN), ජාත්‍යන්තර පියවීම් බැංකුව (BIS) වැනි ජාත්‍යන්තර ආයතන සහ පර්යේෂණ ආයතන විසින් ඉදිරිපත් කරන ලද පුහුණු අවස්ථා සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහභාගි විය. පහත අංක II-21 සංඛ්‍යා සටහන, 2015 දී ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා ලබා දී ඇති කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා පිළිබඳ විස්තර පෙන්වයි.

**II-21 සංඛ්‍යා සටහන** **කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා - 2015**

| ක්ෂේත්‍රය | පුහුණු වැඩසටහන් ගණන | පුහුණු අවස්ථා ගණන |
|---|---|---|
| මුදල් ප්‍රතිපත්තිය, ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යානය | 64 | 77 |
| මූල්‍ය පද්ධති ස්ථාවරත්වය | 48 | 65 |
| අවදානම් කළමනාකරණය, නීති හා අනුකූලතා | 31 | 42 |
| ආයෝජන කළඹ කළමනාකරණය | 22 | 25 |
| මහ බැංකු කටයුතු | 6 | 16 |
| තොරතුරු තාක්ෂණය/ගෙවීම් හා පියවීම් | 9 | 22 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 3 | 4 |
| මානව සම්පත් කළමනාකරණය | 4 | 6 |
| ක්ෂුද්‍ර මූල්‍ය | 5 | 7 |
| වෙනත් | 23 | 45 |
| **එකතුව** | **215** | **309** |

ශ්‍රී ලංකා මහ බැංකුව, පුහුණු වැඩසටහන් හරහා ලබාගත් දැනුම හා අත්දැකීම් භාවිතා කරමින් සිදු කළ යුතු විවිධ පැවරුම් අදාළ නිලධාරීන්හට ලබාදීම මගින් කෙටි කාලීන විදේශ පුහුණුවල සඵලතාව ඇගයීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙම කටයුතු බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය විසින් පත් කරන ලද පුහුණු අනු කමිටුවක් විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, එවැනි පැවරුම් 159 ක් කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් විසින් 2015 දී නිම කරන ලදී. 2015 දී නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලද පැවරුම් පිළිබඳ විස්තර පහත සංඛ්‍යා සටහන II-22 තුළ සාරාංශ ගත කොට ඇත.

**II-22 සංඛ්‍යා සටහන** — **2015 වසර තුළ දී කෙටි කාලීන විදේශ පුහුණුව ලැබූ නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලද පැවරුම්**

| කාණ්ඩය | පැවරුම් ගණන |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ | 12 |
| පර්යේෂණ ලිපි, දේශන හා වැඩමුළු හරහා දැනුම හුවමාරු කර ගැනීම හා කාර්යමණ්ඩල දැනුම්වත් කිරීම | 97 |
| පද්ධති හා ක්‍රියාපටිපාටි වැඩිදියුණු කිරීම සඳහා වන යෝජනා | 50 |
| **එකතුව** | **159** |

## කෙටි කාලීන දේශීය පුහුණු අවස්ථා

2015 දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව කෙටි කාලීන දේශීය පුහුණු අවස්ථා 1,199 ක් බැංකුවේ කාර්ය මණ්ඩලයට ප්‍රධාන වශයෙන් බැංකු විදු පියෙසේ දී සහ වෙනත් පිළිගත් දේශීය පුහුණු ආයතන තුළ දී ප්‍රධාන වශයෙන් නීතිය, ගෙවුම් ශේෂය, ආර්ථික විද්‍යාව හා වාණිජ්‍ය, ගිණුම්කරණය, ආයෝජන, කළමනාකරණය, ලේඛන කටයුතු පිළිබඳ කාර්යයන්, ගෙවීම් හා පියවීම් පද්ධතිය, මානව සම්පත් කළමනාකරණය, විගණනය, බැංකු හා මූල්‍ය ආයතන අධීක්ෂණය, මූල්‍ය වෙළඳපොළ, ක්ෂුද්‍ර මූල්‍ය යනාදී ක්ෂේත්‍ර පිළිබඳව ලබා දී ඇත. බැංකු විදු පියෙස සහ අනෙකුත් පුහුණු ආයතන මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙළින් 669 ක් සහ 530 ක් විය.

## වැඩමුළු සහ දැනුම හුවමාරුව

පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව බැංකු විදු පියෙසත් සමඟ එක්ව නායකත්වය, අභිප්‍රේරණය, සන්නිවේදන කුසලතා හා වාර්තා ලිවීම යන ක්ෂේත්‍ර ආවරණය කරමින් කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින් වැඩමුළු 4 ක් 2015 දී සංවිධානය කරන ලදී. මීට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද මාසික ආර්ථික සංසද මාලාවක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයට දැනුම වර්ධනය කර ගැනීම සඳහා පහසුකම් සලසමින් වසර තුළ දී ආර්ථික විද්‍යාව, බැංකු කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳ කාලීනව වැදගත් විවිධ මාතෘකා පිළිබඳ ක්ෂේත්‍රයේ විශේෂඥයින් විසින් දේශන 12 ක් පවත්වන ලදී.

## පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව 2015 වසර තුළ දී සිය පශ්චාත් උපාධි හැදෑරීමට මාණ්ඩලික පංතියේ නිලධාරීන් සඳහා පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කළේය. පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව එක්සත් රාජධානියේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ, ඕස්ට්‍රේලියාවේ සහ ජපානයේ පිළිගත් විශ්වවිද්‍යාල තුළ සිය ආචාර්ය උපාධිය ආරම්භ කිරීමට නිලධාරීන් දෙදෙනෙකුට සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි ආරම්භ කිරීමට නිලධාරීන් 19 කට පහසුකම් සපයන ලදී. එක් නිලධාරියෙක් 2015 දී මෙරට විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධිය හැදෑරීම ආරම්භ කළේය. මේ අතර, සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ නිලධාරියෙක් සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කළ නිලධාරීන් 21 ක් වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජකාරී කටයුතු සඳහා නැවත පැමිණියහ. පහත සංඛ්‍යා සටහන් අංක II-23, 2011 සිට 2015 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළ හා සම්පූර්ණ කළ නිලධාරීන් සංඛ්‍යාව පෙන්වයි.

**II-23 සංඛ්‍යා සටහන** — **ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළ හා සම්පූර්ණ කළ නිලධාරීන් සංඛ්‍යාව (2011-2015)**

| සුදුසුකම | 2011 | | 2012 | | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ |
| ආචාර්ය උපාධිය | 2 | 2 | 4 | 2 | 6 | 0 | 5 | 2 | 3 | 1 |
| විද්‍යාපති/ ශාස්ත්‍රපති උපාධිය | 17 | 10 | 18 | 17 | 11 | 19 | 24 | 11 | 19 | 21 |